57 වන කාණ්ඩය
11 වන කලාපය

බදාදා
1964 සැප්තැම්බර් 2

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

තියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අත්තගීත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [නී. 2393]

විසර්ජන කෙටුම්පත් පණත, 1964-65 [දහහත්වන වෙන් කළ දිනය] [නී. 2408] :

88 වන ශීර්ෂීය කාරක සභාව විසින් සලකා බලන ලදි.

කල්තැබීමේ යෝජනාව [නී. 2636]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [නී. 2655]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 57
இல. 11

புதன்கிழமை,
2 செப்டம்பர், 1964

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2393]

APPROPRIATION BILL, 1964-65 [ஒதுக்கப்பட்ட பதினேழாம் நாள்] [ப. 2408]:
குழுவில் ஆராயப்பெற்றது
தலைப்பு 88

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2636]

வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 2655]

Volume 57
No. 11

Wednesday,
2nd September, 1964

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 2393]

APPROPRIATION BILL, 1964-65 [*Seventeenth Allotted Day*] [Col. 2408]:
Considered in Committee
Head 88

ADJOURNMENT MOTION [Col. 2636]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 2655]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1964 සැප්තැම්බර් 2 වන බදාදා

සූ. හා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා (ගරු ගියු ප්‍රනාන්දු) මූලාසනාරූඪ විය.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

விஞ்க்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

බීඩි ඔතන කොළ සහ බීඩි දුම්කොළ: ආනයනය සහ බෙදා හැරීම

පීඩි සුට්ටුම් ඉලෙකළුම් පීඩිප් පුකෙයිලෙයුම්: இறக்குமதியும் விநியோகமும்

BEEDI WRAPPERS AND BEEDI TOBACCO: IMPORTS AND DISTRIBUTION

7. ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1960 අගෝස්තු මාසය දක්වා වෙළඳුන් කී දෙනෙක් බීඩි ඔතන කොළ හා බීඩි දුම්කොළ ආනයනය කළෝද? (ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් එතුමා ඉදිරිපත් කරනවාද? (ඉ) ඒ එක් එක් වෙළෙන්දාට බීඩි ඔතන කොළ හා බීඩි දුම්කොළ ආනයනය කිරීම සඳහා අවසර දෙන ලද වාර්ෂික ප්‍රමාණය කුමක්ද? (ඊ) මේ එක් එක් අය පිළිබඳ විස්තර එතුමා ඉදිරිපත් කරනවාද? (උ) 1960 අගෝස්තු මාසයෙන් පසු අද දක්වා අළුතින් වෙළෙන්දන් කීදෙනෙකුට බීඩි ඔතන කොළ හා බීඩි දුම්කොළ ආනයනය කිරීමට අවසර දී තිබේද? (ඌ) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා ඒ එක් එක් වෙළෙන්දාට අවසර දෙන ලද ප්‍රමාණය වැනි විස්තර එතුමා ඉදිරිපත් කරනවාද? (එ) 1960 අගෝස්තු මාසය දක්වා බීඩි ඔතන කොළ හා බීඩි දුම්කොළ ආනයනය කළ සමහර වෙළෙන්දන් මෙම බඩු ස්වදේශීය කර්මාන්තකරුවන් අතර සාධාරණව බෙදා දීම වෙනුවට ඒවා සඟවා ස්වදේශීය සුළු කර්මාන්තකරුවන්ට අධික මිලකට විකුණූ බව එතුමා දන්නවාද? (ඒ) අයුතු සහගත වෙළෙන්දන් කවුරුන්ද යන්න සොයා බැලීම සඳහා එතුමා මෙම කාරණය ගැන පරීක්ෂණයක් පවත්වනවාද? (ඔ) බීඩි ඔතන කොළ හා දුම්කොළ මෙරටට ගෙන්වා සාධාරණ මිලකට බෙදා දීමට හැකි වන අන්දමේ වැඩ පිළිවෙළක් එතුමා සකස් කරනවාද?

உள்நாட்டு, வெளிநாட்டு வர்த்தக விநியோக அமைச்சரைக் கேட்ட விஞ: (அ) 1960, ஆகஸ்ட் மாதம்வரை பீடி சுற்றும் இலைகளையும் பீடிக்குரிய புகையிலையையும் இறக்குமதி செய்த வியாபாரிகள் எத்தனைபேர்? (ஆ) அவர்களது பெயர்களும் முகவரிகளுமென்ன? (இ) இவ்வியாபாரிகள் ஒவ்வொருவரும் வருடாந்தம் எவ்வளவினதான பீடி சுற்றும் இலைகளையும், பீடிக்குரிய புகையிலையையும் இறக்குமதி செய்வதற்கு அனுமதிக்கப்பட்டனர்? (ஈ) அவை ஒவ்வொன்றினதும் விபரங்களை அவர் கூறுவாரா? (உ) 1960, ஆகஸ்ட் மாதத்திற்குப் பின்னர் இற்றைவரை பீடி சுற்றும் இலைகளையும் பீடிக்குரிய புகையிலையையும் இறக்குமதிசெய்வதற்குப் புதிதாய் அனுமதியளிக்கப்பட்ட வியாபாரிகள் எத்தனை பேர்? (ஊ) அத்தகையவர்களது பெயர்கள், முகவரிகள், அவர்கள் ஒவ்வொருவருக்கும் இறக்குமதி செய்வதற்கு அனுமதியளிக்கப்பட்ட தொகை ஆகிய விபரங்களை அவர் கொடுப்பாரா? (எ) 1960, ஆகஸ்ட் மாதம் வரை பீடி சுற்றும் இலைகளையும், பீடிக்குரிய புகையிலைகளையும் இறக்குமதி செய்த வியாபாரிகளிற் சிலர் உள்ளூரில் பீடி உற்பத்தி செய்பவர்களுக்கு அவற்றைச் சம அளவினதாய் விநியோகிப்பதற்குப்பதிலாக அவற்றைப் பதுக்கிவைத்து சிறிய அளவில் பீடி உற்பத்தி செய்பவர்களுக்கு ஆகக்கூடிய விலைகளில் விற்றார்களென்பதை அவர் அறிவாரா? (ஏ) முறையீனமான அத்தகைய வியாபாரிகள் யாரென்பதைக் கண்டறிவதற்கேதுவாக இவ்விடயம் சம்பந்தமாய் விசாரணையொன்று நடாத்துவதற்கு அவர் வகைசெய்வாரா? (ஐ) பீடி சுற்றும் இலைகளையும், பீடிக்குரிய புகையிலைகளையும் இறக்குமதி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

செய்து நியாயமான விலைக்கு அவற்றை விநியோகிப்பதற்கேற்ற திட்டமொன்றினை அவர் வகுப்பாரா?

asked the Minister of Internal and External Trade and Supply: (*a*) How many traders imported beedi wrappers and beedi tobacco up to August 1960? (*b*) What are their names and addresses? (*c*) What was the annual quota of beedi wrappers and beedi tobacco allowed to be imported by each trader? (*d*) Will he give details of each case? (*e*) How many traders have been allowed newly to import beedi wrappers and beedi tobacco after August 1960 to date? (*f*) Will he furnish information such as their names, addresses and quota allowed to each such trader? (*g*) Is he aware that certain traders who imported beedi wrappers and beedi tobacco up to August 1960, instead of distributing these equitably among the local manufacturers sent them underground and sold them to small scale manufacturers at exhorbitant prices? (*h*) Will he cause an inquiry to be held into this matter with a view to ascertaining who those unconscionable traders are? (*j*) Will he draw up a scheme by which these beedi wrappers and beedi tobacco could be imported and distributed at a reasonable price?

ටී. බී. තෙන්නකෝන් මයා. (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ரீ. பி. தென்னகோன்—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Internal and External Trade and Supply)

(අ) (ආ) (ඉ) සහ (ඊ) බීඩි දුම්කොළ හා බීඩි ඔතන කොළ ආනයනය බලපත්‍ර පාලනය යටතට ගනු ලැබුවේ 1962 ඔක්තෝබර් 10 වැනි දින නිසා මෙම තොරතුරු ලබා දීමට නොහැක. කෙසේ වුවද 1963 පහත සඳහන් ආනයනකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කරන ලදි.

නම සහ ලිපිනය	බීඩි දුම්කොළ (රාත්තල් වලින්)	බීඩි ඔතන කොළ (රාත්තල් වලින්)
ජේ. එම්. ආරියරත්න, 399, ප්‍රින්ස් ඔf ජ් වේල්ස් මාවත, කොළඹ 14.	1,50,268	3,75,670
ඒ. අබ්දුල්ලාකුට්ටි, 56, දුම්රිය පාර, ලුනුවිල	86,801	2,17,002
එන්. බී. අබ්දුල් හfපූර්, 102/2, ආදුරුප්පු වීදිය, කොළඹ 13	1,35,865	3,39,662
එස්. අබ්දුල් කාඩර්, 192, පරණ යෝන් වීදිය, කොළඹ 13	1,80,764	4,51,910
බාරති සහ සමාගම, 355, පේරාදෙනිය පාර, මහනුවර	14,225	35,562
ඒ. එම්. ප්‍රනාන්දු සහ සහෝදරයෝ, පරණ යොන් වීදිය, බේරුවල	6,854	17,135
ඥානමලර් ස්ටෝරුව, 69, ආදුරුප්පු වීදිය, කොළඹ	40,013	1,00,032
ඕ. ඊ. මොහොමඩ් හුසේන්, 59, ආදුරුප්පු වීදිය, කොළඹ	1,58,291	3,95,727
කමලා ස්ටෝර්ස්, 15, සමුද්‍ර වීදිය, කොළඹ 13	1,73,864	4,34,660
එම්. තාඩි, මඩවල පාර, කටුගස්තොට	6,197	15,472
රාජා ස්ටෝර්ස්, 3, කෙලින් වීදිය, බේරුවල	159	397
රාජා ස්ටෝර්ස්, 47, ආදුරුප්පු වීදිය, කොළඹ	73,731	1,84,327
එස්. සින්නතුරේයි සහ සහෝදරයෝ, 44, තුන්වන හරස් වීදිය, කොළඹ	95,344	2,38,360
කේ. අම්බලවානර්, 130, සෙන්ට්‍රල් පාර, කොළඹ 13	64,302	1,60,755
ටී. කේ. නාඩාර්, 36, පන්නල පාර, දන්කොටුව	7,374	18,435
ජී. එස්. කේ. කන්දයියා පිල්ලේ, 539, කෙළින් වීදිය, කඳාන	3,908	9,770
එන්. එම්. නාගලිංගම්, 59, වාඩිවන්වෙල පාර, කටුගස්තොට	16,263	40,657
මහා ලක්ෂ්මී ස්ටෝර්ස්, 102, ආදුරුප්පු වීදිය, කොළඹ 13	61,129	1,52,822
තුර් සහ සමාගම, 21, ආදුරුප්පු වීදිය, කොළඹ 13	27,001	67,502
වී. ජී. රාමසාමි පිල්ලේ සහ පුත්‍රයෝ, වෙල්වතුරේයි	47,881	1,19,702
සදානන්ද බීඩි සමාගම, 597, ත්‍රිකුණාමල වීදිය, මාතලේ	8,158	20,395
ජේ. පී. පොක්කලාල් රම්සිටි කර්මාන්තශාලාව, 98, විවේකානන්ද හිල්, කොළඹ 13	16,446	41,115

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු නම සහ ලිපිනය			වාචික පිළිතුරු බීඩි දුම්කොළ (රාත්තල් වලින්)		බීඩි ඔතන කොළ (රාත්තල් වලින්)
ජී. සන්තරසිවාම්, 37, ආදුරුප්පු වීදිය, කොළඹ	...	...	67,389	...	1,68,472
එම්. පී. සයිමොන් සහ පුත්‍රයෝ, 37, ආදුරුප්පු වීදිය, කොළඹ	...	...	94,613	...	2,36,532
ඒ. තිරුනාවුක්කරාසු, 49, ආදුරුප්පු වීදිය, කොළඹ	...	...	10,239	...	25,597
තුරේයි බීඩි සමාගම, 31 සහ 33 ආදුරුප්පු වීදිය, කොළඹ 13	...	...	4,469	...	11,172
අලියා බීඩි සමාගම, 130, ආදුරුප්පු වීදිය, කොළඹ	...	...	2,26,254	...	5,65,635
එම්. පරරාජසිංහම්, 61, කේ. කේ. ඇස්. පාර, යාපනය	...	...	1,649	...	4,122
කේ. ඇස්. සුබ්‍රමානියම් සහ පුත්‍රයෝ, 2, 4, සහ 8 අම්බගමුව පාර, ගම්පොල	...	...	20,549	...	51,372

(උ) සහ (ඌ) පහත සඳහන් සුළු නිෂ්පාදකයන් 19 දෙනාගෙන් එක් එක් අයකුට බීඩි දුම්කොළ සහ බීඩි ඔතන කොළ ආනයනය සඳහා රුපියල් 10,525 සහ රුපියල් 49,735 ක වටිනාකමට 1963 සිට බලපත්‍ර සංවර්ධන අධ්‍යක්ෂගේ නිර්දේශයන් පරිදි නිකුත් කර ඇත:

1. බියට්‍රිස් පෙරේරා ගුණතිලක, 620, මිරිහාන, නුගේගොඩ.
2. එන්. සකලසූරිය මහතා, හේන්පිටිගෙදර, දිවුලපිටිය.
3. ජේ. බණ්ඩාරනායක මහතා, ගලවිල පාර, හෝමාගම.
4. අමරදාස වල්පොල මහතා, මිල්ලැව, හොරණ.
5. එම්. සිරිසේන මහතා, දුම්බර බීඩි නිෂ්පාදනායතනය, පුතු හපුව.
6. ඩී. ජී. එච්. සිරිසේන මහතා, මහනුවර බීඩි සමාගම, හල්ලෝළුව, නුවර.
7. ඒ. ඩී. සේදිරිස් මහතා, දුම්මලදෙනිය, වරකාපොල.
8. එච්. කේ. සාදිරිස් මහතා, ලංකා බීඩි කර්මාන්ත, තව්ගල, වරකාපොල.
9. ඩී. පී. ඒ. විල්සන් මහතා, තව්ගල, වරකාපොල.
10. එච්. කේ. පියසේන මහතා, මංගල බීඩි කර්මාන්ත ශාලාව, තව්ගල, වරකාපොල.
11. ඩබ්ලිව්. ජේම්ස් ප්‍රනාන්දු මහතා, විජය රාජා බීඩි සමාගම, දුම්මලදෙනිය, වරකාපොල.
12. කේ. ඩී. මේදිරිස් මහතා, ප්‍රේමා බීඩි කර්මාන්තශාලාව, දුම්මලදෙනිය, වරකාපොල.
13. වී. අරුනගිරි මහතා, 42, කෙලින් වීදිය, වරකාපොල.
14. ජේ. මාටින් සිංඤෝ මහතා, තලගම, අඹේපුස්ස.
15. ඒ. එල්. ඒ. හස්න මහතා, රාජා ස්ටෝරුව, බම්මත්තා, නාරංගොඩ.
16. යූ. එම්. ඊබ්‍රහිම් මහතා, 2 කොටස, කෙලින් වීදිය, මාරුතාමුනෙයි, කල්මුනෙයි.
17. ඩබ්ලිව්. සී. සෝමපාල මහතා, වරසේන, හිලෝගම, දිම්බුල්ලාව.
18. කේ. එම්. එම්. මීරා ලෙබ්බේ, ලසිට් බීඩි සමාගම, සලබොඩගම.
19. ජේ. ඒ. ඇල්බට් පෙරේරා, නෝත්ත, කොහිල ගෙදර.

(එ) බීඩි කර්මාන්තය සඳහා වන අමු ද්‍රව්‍යවල ඇති හිඟය හා ඒවායේ දැනට පවත්නා අධික මිල ගණන් ගැන සුළු නිෂ්පාදකයන් විසින් මා වෙත කරුණු ඉදිරිපත් කර ඇත. (ඒ) ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් බීඩි කර්මාන්තය හා සම්බන්ධ ගැටළු ගැන පරීක්ෂා කිරීම සඳහා කාරක සභාවක් පත් කර ඇත. මේ පැමිණිලි කෙරෙහි ඒ කාරක සභාවේ අවධානය යොමු වනු ඇත. (ඔ) මේ කාරක සභාවේ නිර්දේශයන් ලැබුණු වහාම, බීඩි දුම්කොළ සහ බීඩි ඔතන කොළ විශේෂයෙන් සමුපකාර සංවිධාන මගින් ආනයනය කර සාධාරණ මිල ගණන් පිට බෙදා හැරීම සඳහා යෝජනා ක්‍රමයක් ඇති කිරීමේ යෝග්‍යතාවය පරීක්ෂා කර බලනු ලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කේ. එම්. පී. රාජරත්න මයා. (වැලිමඩ)
(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)
(Mr. K. M. P. Rajaratna—Welimada)

මම දැනගන්න කැමතියි, බීඩි එතීම සඳහා කඩුම්බේරිය කොළ පාවිච්චි කරන වාද කියා. කඩුම්බේරිය කොළ පාවිච්චි කරනවාය කියා අපට ආරංචියි. එසේ නම් කොපමණ ප්‍රමාණයක් පාවිච්චි කරනවාද කියා මම දැනගන්න කැමතියි.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ඒ ගැන දැන්ම උත්තරයක් දෙන්න බැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

උත්තර ලබාගෙන දවල් වරුවෙදි අපට දන්වන්න පුළුවන්ද?

ගරු ටී. බී. ඉලංගරත්න (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ ரீ. பி. இலங்கரத்ன—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சர்)
(The Hon. T. B. Ilangaratne—Minister of Internal and External Trade and Supply)

අපි වියදී කර බලන්නම්. ඒ ගැන නිලධාරීන්ගෙන් අසා බලන්න ඕනෑ.

සිරිසේන මයා.
(திரு. சிரிசேன)
(Mr. Sirisena)

බීඩි දුම්කොළ සහ බීඩි ඔතන කොළ මේ රටට ආනයනය කිරීමට බලය දී තිබෙන්නේ වැඩි වශයෙන්ම පුරවැසිකම් නැති කුට වෙළෙන්දන් කීප දෙනකුට බව ගරු ඇමතිතුමා දන්නවාද? අලුත් ව්‍යාපාරිකයන් ගණනාවක්ම දැන් මේ රටේ බිහි වී සිටිනව. නමුත් ඔවුන්ට බීඩි දුම්කොළ සහ බීඩි ඔතන කොළ නොමැතිකම නිසා ඒ සඳහා අධික මිල ගෙවා ඉහත කී වෙළඳුන්ගෙන් ඒවා ලබා ගන්නට සිදු වී තිබෙනව. ඒ හේතුකොට ගෙන ඔවුන්ගේ කම්කාන්තය බොහෝ දුරට අඩපණ වී රැකී රක්ෂාවල යෙදී සිටි විශාල සංඛ්‍යාවකට රක්ෂා නැතිව ගොස් තිබෙන නිසා බීඩි එතීමේ යෙදෙන ලාංකික කම්කරුවන්ගේ යහපත තකා බීඩි දුම් කොළ සහ බීඩි ඔතන කොළ ගෙන්වීමේ බලපත්‍ර ලාංකික වෙළඳුන්ට නිකුත් කිරීම පිණිස ගරු ඇමතිතුමා කටයුතු යොදන වාද?

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

පුරවැසිකම් නොමැති අයට බලපත්‍ර තිබෙන බව බොහෝ දුරට පෙනී යනව. බඩු ගෙන්වීමේ ව්‍යාපාරය ස්වදේශිකයන් අතට දීම සඳහා දැනට ගරු ඇමතිතුමා වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනව. ඒ නිසා බීඩි දුම්කොළ සහ බීඩි ඔතන කොළ ගෙන්වීම සම්බන්ධයෙනුත් යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්න ඉඩ ඇති බව මේ අවස්ථාවේදි ප්‍රකාශ කරන්න පුළුවන්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙ පිළිතුරේ සඳහන් වුණේ එසේ නොවෙයි. ස්වදේශිකයන්ට බඩු ගෙන්වීමට නියම කර ගෙන යනවය කියලයි එතුම කීවෙ. මොකක්ද මේ "නියම කරනව" කියන්නෙ? ඒ පිළිබඳව යම් කිසි ප්‍රතිපත්තියක් තියෙනවද? විදේශිකයන්ට නොව ස්වදේශිකයන්ට බඩු ගෙන්වීම සීමා කරන එකේ ප්‍රතිපත්තියක් තියෙනවද? ප්‍රතිපත්තියක් තියෙනව නම් කවදද එය ඇති කළේ, කියා මා දැන ගන්න කැමතියි. එවැනි ප්‍රතිපත්තියක් තියෙනව නම් අද වන තුරු ඒ මගින් කර තිබෙන්නෙ මොනවද?

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ප්‍රතිපත්තියක් තියෙනව.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

කවදද ඒක ඇති කළේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ප්‍රශ්නයක් වශයෙන් එය ඉදිරිපත් කළොත් සොයා බලා කියන්න පුළුවනි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මෙයටම අදාළ අතුරු ප්‍රශ්නයක්, මා ඇසුවේ.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

දින හරියට මතක නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

පිටරට වෙළඳුන්ට ඔක්කොම වෙළඳාම භාර දීල දැන් තවත් ප්‍රශ්නයක් අහන්න ඕනෑ කියනවා, උත්තර දෙන්න.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

දින හරියට මතක නැහැ. ප්‍රශ්නයක් වශයෙන් ඇසුවොත් සොයා බලා හරියටම කියන්න පුළුවනි. [බාධා කිරීම්]

කුරුවිට ගම්කාර්ය සභාව : වෙළඳ පොලක් ඉදි කිරීමට ඉඩම් කොටසක්

குருவிற்ற கிராமச் சபை : சந்தை யொன்றுக்கான இடம்

KURUWITA V. C. : LAND FOR MARKET SITE

1. ඩී. පී. ආර්. වීරසේකර මයා. (රත්නපුරය)
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)
(Mr. D. P. R. Weerasekera—Ratnapura)

ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කුරුවිට නගරයේ සියලුම ඉඩම් දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති නිසා කුරුවිට ඉරිදා පොළ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක පවත් වාගෙන යන බව එතුමා දන්නවාද ? (ආ) මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ස්ථිර වෙළඳ පොලක් ඉදි කිරීමට අපහසු බව එතුමා දන්නවාද ? (ඉ) කුරුවිට ගම්කාර්ය සභාව සඳහා වෙළඳ පොලක් ඉදි කිරීමට ඉඩම් කොටසක් බදු ගැනීමට කරන ලද ඉල්ලීම් ගැන වහාම ක්‍රියා කිරීමට එතුමා වගබලා ගන්නවාද ?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா : (அ) நகரில் கிடைக்கக் கூடியதாயுள்ள காணிகளனைத்தும் புகையிரதப் பகுதிக்குச் சொந்தமாயிருப்பதால் தற்பொழுது குருவிற்றவில் நடைபெறும் ஞாயிற்றுக் கிழமைச் சந்தை புகையிரதப் பகுதியினருக்குரிய காணியிலேயே நடைபெறுகிற தென்பதை அவர் அறிவாரா ? (ஆ) இதன் விளைவாய் சந்தைக்கென நிரந்தரமான ஓர் இடத்தைத் தாபிக்க முடியாதென்பதை அவர் அறிவாரா ? (இ) சந்தைப் பகுதிக்கெனக் குருவிற்ற கிராமச் சபைக்குக் காணிப்பகுதியொன்றினைக் குத்தகைக்குக் கொடுக்கும்படி செய்யப்பட்ட வேண்டுகோளை அவர் விரைவிற் கவனிப்பாரா ?

asked the Minister of Communications : (*a*) Is he aware that the present Kuruwita Sunday Fair is held on Railway land as all available land in town belongs to the Railway ? (*b*) Is he aware that as a result no permanent market place can be built ? (*c*) Will he see that the request made for the lease of a block of land for a market site to the Kuruwita V. C. is expedited ?

පී. ආර්. රත්නායක මයා. (ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. பீ. ஆர். ரத்னாயக்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. P. R. Ratnayake—Parliamentary Secretary to the Minister of Communications)

(අ) කුරුවිට නගරයට අයත් සියලුම ඉඩම් දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති බව කීමට නුපුළුවන. නමුත් දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති රූඩ් 1 යි, පර්චස් 38.5ක බිම් ප්‍රමාණයක් කුරුවිට ගම්කාර්ය සභාවට ඉරිදා පොලක් පැවැත්වීමට හා ළිඳක් තැනීම සඳහා බදු දී තිබේ. (ආ) මම නොදනිමි. (ඉ) (අ) කොටසේ සඳහන් කොට ඇති පරිදි ඉල්ලා ඇති බිම් කොටස ඉරිදා පොලක් හා ළිඳක් තැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. ආර්. රත්නායක මයා.]

සඳහා දැනටමත් ගම්කාර්ය සභාව වෙත බදු දී තිබේ. මෙම ඉඩමේ යටෝක්ත ගම් සභාව විසින් අනවසරයෙන් ගොඩනැගිලි තැනීම හේතුකොටගෙන මෙම මුළු ඉඩමම නැවතත් මැනීමට ඇති බැවින් මෙහි සවිර වෙළඳපොලක් ආරම්භ කිරීම පිළිබඳව ඉදිරිපත් කොට ඇති ඉල්ලීම සම්බන්ධව කටයුතු ප්‍රමාද වී ඇත.

මහවල වත්ත නිවාස ක්‍රමය

மஹவல-வத்த வீடமைப்புத் திட்டம்

MAHAWALA-WATTE HOUSING SCHEME

2. ඩී. පී. ආර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මසකට රුපියල් 30 බැගින් විසි අවුරුදු කුලියට සිත්නවීමේ ක්‍රමයට දෙන ලද මහවල වත්තේ ගෙවල් දැන් මසකට රුපියල් 30 බැගින් 40 අවුරුදු කාල පරිච්ඡේදයකට වෙනස් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) කාල පරිවේඡදය අවුරුදු 40 කට දීර්ඝ කර ඇති හෙයින් එතුමා මාසික කුලිය රුපියල් 15 දක්වා අඩු කරනවාද?

தொழில் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) 20 வருட காலத்திற்கு வாடகைக் கொள்வனவுத் திட்டத்தின்கீழ் 30 ரூபா மாதாந்த வாடகைக்குக் கொடுக்கப்பட்ட மஹவலவத்தயிலுள்ள வீடுகள் தற்பொழுது 40 வருடகாலத்திற்கு 30 ரூபா மாதாந்த வாடகை நியதியில் மாற்றப்பட்டுள்ளனவென் பதை அவர் அறிவாரா? (ஆ) காலவரை யறையை 40 வருடங்களாகக் கூட்டியுள்ளமை பால் மாதாந்த வாடகையை 15 ரூபாவாக அவர் குறைப்பாரா?

asked the Minister of Labour and Housing: (*a*) Is he aware that the 20-year rent purchase scheme at Rs. 30 per month in respect of the Mahawala-watte houses has now been altered to a 40-year scheme of Rs. 30 per month? (*b*) Since the period has been extended to 40 years will he reduce the monthly rental to Rs. 15?

ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති)

(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்தன —தொழில், வீடமைப்பு அமைச்சர்)

(The Hon. M. P. de Zoysa Siriwardena—Minister of Labour and Housing)

(අ) නැත. මෙම නිවාසවල වැය අන්තිම වශයෙන් ගණන් බලා නැති හෙයින් සවිර කුලිය ගෙවා නිම කළ යුතු කාල සීමාවට හෝ සවිර වශයෙන් කිව නොහැක. දැනට කර ඇති වියදම් අනුව අවුරුදු 25 කින් ගෙවා නිමවීම සඳහා රු. 33ක මාසික කුලියක් අය විය යුතු අතර රු. 30 බැගින් ගෙවා නිම කිරීමට ගත වන කාලය අවුරුදු 30 කි. (ආ) පැන නොනගී.

ඩී. පී. ආර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

මෙහි සුළු පැටලීමක් තියෙනව. කලින් මෙම නිවාසවලට අවුරුදු 20කදී ගෙවා නිම කරන්න පුළුවනි. මේ ළඟදි ලියවිල්ලක් යවා තිබෙනව, අවුරුදු 40ක් ගෙවන්න වුවමනා ආකාරයට. එසේ ගෙවීමොත් වටිනාකම මෙන් දෙගුණයක් හොවන්න සිදු වෙනව. මේ ගැන පරීක්ෂා කර බලා යම් වරදක් සිදු වී තිබෙනව නම් එය හරි ගස්සනවද?

ගරු ද සොයිසා සිරිවර්ධන

(கௌரவ டி சொய்சா சிறிவர்தன)

(The Hon. de Zoysa Siriwardena)

එහි වරදක් සිදු වී තිබෙන්න පුළුවනි. අවුරුදු 20 කත් 40 කත් වෙනසක් තිබෙන බව මා පිළිගන්නව. ඒ ගැන සොයා බලනව.

කුරුවිට ගම්කාර්ය සභාව: වාහන නවතා තැබීමේ ස්ථානයක්

குருவிற்ற கிராமச்சபை: வாகனங்கள் நிற் பாட்டுவதற்கான இடம்

KURUWITA V. C.: LAND FOR PARKING SITE

3. ඩී. පී. අර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කුරුවිට නගරයේ වාහන නවතා තැබීමට ඇති එකම ස්ථානය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavánaham.org

කටුකමීබි ගසා කොටු කර ඇති ප්‍රයෝජනයට නොගන්නා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩමක් බව එතුමා දන්නවාද? (ආ) මෙම ඉඩම වහන නවතා තැබීමේ ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම පිණිස කුරුවිට ගම්කාර්ය සභාවට බදු දෙන ලෙස කලින් සිටි ඇමතිවරයා නිර්දේශ කළ බව එතුමා දන්නවාද? (ඉ) අවුරුදු දෙකකට වැඩි කාලයක් තිස්සේ කටයුතු නොකර පවත්නා මෙම කාරණය ඉක්මන් කිරීමට එතුමා වගබලා ගන්නවාද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) புகையிரதப் பகுதிக்குச் சொந்த மானதும் முள்ளுக்கம்பியினால் அடைக்கப் பட்டதுமான பாவிக்கப்படாத காணித் துண்டொன்றுதான் குருவிற்றப் பட்டணத்தில் வாகனங்கள் நிறுத்திவைக்கக்கூடிய ஒரேயொரு இடமென்பதை அவர் அறிவாரா? (ஆ) வாகனங்கள் நிறுத்திவைக்கும் இடமாகப் பாவிப்பதற்கெனக் குருவிற்றக் கிராமச் சபைக்கு இக்காணியைக் குத்தகைக்குக் கொடுக்கவேண்டுமென முன்னைய அமைச்சரால் சிபார்சு செய்யப்பட்டதென்பதை அவர் அறிவாரா? (இ) கடந்த இரண்டு வருட காலமாகக் கவனிக்கப்படாதுள்ள இவ் விடயத்தினை அவர் விரைவுபடுத்துவாரா?

asked the Minister of Communications: (*a*) Is he aware that the only piece of parking space in Kuruwita town is a block of unused Railway land which is barbed-wired and enclosed? (*b*) Is he aware that the previous Minister recommended that this land be leased out to the V. C. Kuruwita to be used as a parking lot? (*c*) Will he see that this matter which is pending for over 2 years is expedited?

පී. ආර්. රත්නායක මයා.
(திரு. பீ. ஆர். ரத்னயக்க)
(Mr. P. R. Ratnayake)

(අ) මම නොදනිමි. වාහන නවතා තැබීම සඳහා සුදුසු එකම ස්ථානය මෙය බව කිව නොහැක. (ආ) මම නොදනිමි. (ඉ) කුලී කාර් සහ අනිකුත් වාහන නවතා තැබීමට ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා, කුරුවිට දුම්රිය ස්ථානය අසල පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම බදු ගැනීමට ගම්කාර්ය සභාවෙන් 1962 ජනවාරි මස අයදුම්පතක් ඉදිරිපත් කරන ලදි. මෙය දෙපාර්තමේන්තු කරුණු උඩ ප්‍රතික්ෂේප කරන ලදි. 1964 ජූනි මස තවත් අයැදුම්පතක් ලැබුණි. එය ලැබුනේ මෙම ස්ථානය බස් නැවතුම්පොලක් වශයෙන් පාවිච්චි කිරීම සඳහාය. මෙම අයදුම්පත සතුටුදායක ලෙස සලකා බලා මේ ඉඩම බස් නැවතුම් පොලක් වශයෙන් පාවිච්චි කිරීමට කැමැත්ත ප්‍රකාශ කර, 64.8.18 වැනි දින ගම්කාර්ය සභාවට ලියා යවා ඇත.

සිරිසේන මයා.
(திரு. சிரிசேன)
(Mr. Sirisena)

හිනිදුම ගරු මන්ත්‍රීතුමා (හෙන්රි ඩබ්ලිව්. දිසානායක මයා.) වෙනුවෙන් මා අහනව, 4 වන ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

එම ප්‍රශ්නය අහන්න ගරු මන්ත්‍රීතුමාට බලය දීල තියෙනවද?

සිරිසේන මයා.
(திரு. சிரிசேன)
(Mr. Sirisena)

එහෙමයි.

එච්. කේ. ජිනදාස මහතා: කෘත්‍රිම අවයවයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රය

திரு. எச். கே. ஜினதாஸ: செயற்கை உறுப்பொன்றுக்கான விண்ணப்பம்

MR. H. K. JINADASA: APPLICATION FOR ARTIFICIAL LIMB

4. **සිරිසේන මයා.** (හෙන්රි ඩබ්ලිව්. දිසානායක මයා.—හිනිදුම වෙනුවට)

(திரு. சிரிசேன—திரு. ஹென்றி டபிள்யு. திஸநாயக்க—ஹினிதும சார்பாக)

(Mr. Sirisena on behalf of Mr. Henry W. Dissanayake—Hiniduma)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නාකියාදෙණියේ, දිග්දොල වතුයායේ එච්. කේ. ජිනදාස මහතා කෘත්‍රිම අවයව ලබාගැනීම සඳහා 1961.4.9 වැනි දින ප්‍රදේශයේ පාර්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

මේන්තු මන්ත්‍රීවරයාගේ මාර්ගයෙන් කොළඹ, විකලාංග චිකිත්සාගාරය භාර ශල්‍ය වෛද්‍යවරයා වෙත ඉල්ලුම් කළ බව එතුමා දන්නවාද? (ආ) විකලාංග චිකිත්සාගාරය භාර ශල්‍ය වෛද්‍යවරයා චිකිත්සාගාරයට පැමිණෙන ලෙස ජිනදාස මහතාගෙන් ඉල්ලමින් 1961.4.14 වැනි දින ඔහුගේ අංක ඔසී/2ආර්/33/61 දරන ලිපිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාවද පිටපතක් සහිතව ජිනදාස මහතාට යැවූ බව එතුමා දන්නවාද? (ඉ) ඊට ස්වල්ප දිනකට පසුව ජිනදාස මහතා චිකිත්සාගාරයට ගොස් එහිදී ඔහුගේ මිනුම් දුන් බව එතුමා දන්නවාද? (ඊ) ජිනදාස මහතාට කෘත්‍රිම අවයව තවමත් සපයා දී නැති බව එතුමා දන්නවාද? (උ) ප්‍රමාදයට හේතුව කුමක්ද? එය ඔහුට නිකුත් කරන්නේ කවදාද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) நாக்கியாதெனிய, டிக்தொலத் தோட்டத்தைச் சேர்ந்த திரு. எச். கே. ஜினதாஸ என்பவர், செயற்கை உறுப்பொன்று கோரி, அப்பகுதிப் பாராளுமன்ற உறுப்பினருக்கூடாகக் கொழும்பிலுள்ள உறுப்புக் கேட்டுப் பிணியாய் நிலையப் பொறுப்பு அதிகாரிக்கு 9.4.61 அன்று விண்ணப்பித்தாரென்பதை அவர் அறிவாரா? (ஆ) திரு. ஜினதாசாவைப் பிணியாய் நிலையத்திற்கு வரும்படி கேட்டுப்பிணியாய் நிலையம் திரு. ஜினதாஸாவுக்கு OC/2R/33/61 ஆம் இலக்கங்கொண்ட கடிதமூலம் 14.4.1961 அன்று அறிவித்ததுடன் பாராளுமன்ற உறுப்பினருக்கும் அக்கடிதத்தின் பிரதியொன்றை அனுப்பியதென்பதை அவர் அறிவாரா? (இ) அகன்பின்னர், திரு. ஜினதாஸா பிணியாய் நிலையத்திற்குச் சென்று அவரது அளவுகளை அங்கு கொடுத்தாரென்பதை அவர் அறிவாரா? (ஈ) திரு. ஜினதாஸாவுக்கு இன்னமும் செயற்கை உறுப்பு வழங்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (உ) இக்கால தாமதத்திற்கான காரணமென்ன? எப்பொழுது அது வழங்கப்படும்?

asked the Minister of Health: (*a*) Is he aware that Mr. H. K. Jinadasa of Digdola Estate, Nakiyadeniya, applied through the M. P. of the area for an artificial limb from the Surgeon-in-Charge, Orthopædic Clinic, Colombo, on 9.4.1961? (*b*) Is he aware that the Orthopædic Clinic wrote to Mr. Jinadasa with a copy to the M. P. on 14.4.1961 by his No. OC/2R/33/61 requesting Mr. Jinadasa to call over at the clinic? (*c*) Is he aware that Mr. Jinadasa visited the clinic shortly after and gave his measurements there? (*d*) Is he aware that the artificial limb has so far not been supplied to Mr. Jinadasa? (*e*) What is the cause for this delay and when will it be issued?

ගරු බදිඋද්දීන් මහ්මූද් (සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍ය)

(கௌரவ பதியுத்தீன் மஹ்மூது—சுகாதார அமைச்சர்)

(The Hon. Badiuddin Mahmud—Minister of Health)

(*a*) Yes. (*b*) Yes. (*c*) Yes. (*d*) An artificial limb has now been supplied. (*e*) Does not arise.

විසර්ජන කෙටුම්පත් පණත, 1964-65

ஒதுக்கீட்டு மசோதா, 1964-65

APPROPRIATION BILL, 1964-65

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.—

[ප්‍රථම සැප්තැම්බර් 1]

88 **වන ශීර්ෂය.—අභ්‍යන්තර හා බාහිර වෙළඳාම සහ සැපයීම පිළිබඳ අමාත්‍යවරයා**

1 **වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,94,343**

1 **වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප් රු. 1,87,360**

தலைப்பு 88.—உள்நாட்டு வெளிநாட்டு வியாபார விநியோக அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 2,94,343

உப தலைப்பு.—ஊழியர் கோப்பும் சம்பளங்களும், ரூ. 1,87,360

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

HEAD 83.—MINISTER OF INTERNAL AND EXTERNAL TRADE AND SUPPLY

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 294,343

Sub-head 1.—Cadre and salaries, Rs. 187,360

ඉදිරිපත් කරන ලද සංශෝධනය—[සැප්තැම්බර් 1.]

"That the Vote be reduced by Rs. 10 in respect of Sub-head 1. item "Minister". [කේ. එම්. පී. රාජරත්න මයා.]

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

වෙළඳ ඇමතිතුමාගෙ වැය ශීර්ෂය යටතෙ කරුණු කිපයක් ඉදිරිපත් කරන්න තියෙනව. අනෙකුත් කරුණු ඉදිරිපත් කරන්නට ප්‍රථමයෙන් ගරු වෙළඳ ඇමතිතුමාටත්, ඔබතුමාටත් එක් වැදගත් කාරණයක් ගැන මතක් කරන්නට කැමතියි. රාජාසන කථා විවාදය පැවැති අවස්ථාවේදී—මා හිතන්නෙ ජූලි මාසේ 2 වැනිදය කියලයි—සමුපකාර තොග වෙළඳ ආයතනය සම්බන්ධයෙන් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) එක් වැදගත් ප්‍රශ්නයක් මතු කළා. එදා එතුමා මේ ගරු සභාවට කරුණු වගයක් ඉදිරිපත් කළා, මානික්කම් නමැති එක්තරා වෙළඳ ව්‍යාපාරිකයෙක් මහනුවර පළාතේ ලක්ෂ ගණන්—

ගරු වී. බී. ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මහනුවරද?

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

කොළඹ වෙන්න ඇති. මට වැරදුනා නම් කරුණා කර ඒ ගැන මා කමා කරන්න. ව්‍යාපාරිකයගෙ නම නම් මට මතකයි. ඔහු ඉන්නෙ කොළඹ වෙන්න ඇති. සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් පමණක් ගෙන්විය යුතු දෙයක් වන පින් මාළු තොගයක්—ලක්ෂ ගණන් මාළු පින්—ලංකාවට ගෙන්වා ගත් බවත් ඒ මගින් විශාල ජාවාරමක් ගෙන ගිය බවත් එතුමා සඳහන් කළා. ඒ අවස්ථා වේදී ගරු වෙළඳ ඇමතිතුමා විසින් කියන්නට යෙදුනෙ, මානික්කම් නමැති ඒ වෙළඳ ව්‍යාපාරිකයා ඒවා ගෙන්වා ගත්තේ විවෘත බලපත්‍ර ක්‍රමය අනුව හෙවත් "ඕපන් ජෙනරල් ලයිසන්ස්" ක්‍රමය අනුවය කියලයි. ඒක එහෙම නොවෙයිද? ගරු වෙළඳ ඇමතිතුමා පිළිගන්නව ඇති ඕපන් ජෙනරල් ලයිසන්ස් නැමති විවෘත බලපත්‍ර ක්‍රමය අනුව පින් මාළු ගෙන්වා ගන්නට යෙදුණු බවක් එදා එතුමා ප්‍රකාශ කළ බව. මගෙ කථාව පටන් ගන්න විට ඔබතුමාටත් ගරු වෙළඳ ඇමතිතුමාටත් කරුණක් ඉදිරිපත් කරන්නට තිබෙනවය කිව්වෙ මුලින්ම මේ ප්‍රකාශය අනුව ගරු වෙළඳ ඇමතිතුමා මේ ගරු සභාවේ වර ප්‍රසාද කඩ කිරීම සම්බන්ධයෙනුයි. එතුමා මේ ගරු සභාවට අසත්‍ය ප්‍රකාශයක් කළා. ඒ පිළිබඳව ඔබතුමාටත් ගරු වෙළඳ ඇමතිතුමාටත් කරුණු ඉදිරිපත් කරන්න යනව. ගරු වෙළඳ ඇමතිතුමා පිළිගත්තා කියලයි මා හිතන්නෙ එදා ඕ. ජී. එල්. හෙවත් විවෘත බල පත්‍ර ක්‍රමය අනුව මානික්කම් නැමැත්තා පින් මාළු ගෙන්වා ගත් නිසා ඒ සම්බන්ධයෙන් එතුමට කිසිම දෙයක් කරන්න ඉඩක් තිබුණෙ නැහැ යන්න. පින් මාළු ජාති ගෙන්වන්නෙ විවෘත බල පත්‍රය ක්‍රමය අනුව නොව විශේෂ බලපත්‍ර ක්‍රමය අනුවයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ දවස්වල නොවෙයි, කලින් ගෙන්නුවෙ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඔබතුමා එහෙම කියනව නම් මා එය පිළිගන්නව. කරුණා කර ලියකියවිලි, කඩදාසි ඉදිරිපත් කරන්න. ගරු ඇමතිතුමා කියනව නම් අපි ඒක පිළිගන්නව. ගරු ඇමතිතුමාට ඒ සැලකිල්ල අපි දක්වනව. කරුණා කර මානික්කම්ට දුන් බලපත්‍රය සම්බන්ධ කඩදාසි සියල්ලන්ම ගරු ඇමතිතුමා පිළිතුරු කථාව කරන විට මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. එතුමගෙ ඒ පිළිතුරු කථාවෙන් පස්සෙ වව් වුණොත් මම තවත් කරුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

කීපයක් ඉදිරිපත් කරන්නම්. එසේ කරන්න මා බලාපොරොත්තු වෙනව. ගරු වෙළඳ ඇමතිතුමා මේ කියන කඩදාසි ඉදිරිපත් කරන්න පොරොන්දු වූ නිසා ඒ ප්‍රශ්නය එතැනින් නවත්වනව.

ඊළඟට ගන්න යන ප්‍රශ්නය මෙයයි. මේ ආණ්ඩුවෙ වෙළඳාම ලාංකික කිරීමේ ප්‍රතිපත්තිය කුමක්ද? අපට පෙනෙන හැටියට ඉතාමත් දරුණු වංචනික ප්‍රතිපත්තියක් ගෙන යනව වෙළඳාම ලාංකික කිරීම සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් ගරු වෙළඳ ඇමතිතුමාට මගේ පළමුවන චෝදනාව ඉදිරිපත් කරනව. සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවේ කාල සීමාව තුළ දී එක් වර්ෂයක් හැර සෙසු කාල සීමාව තුළ දී ගරු ඉලංගරත්න ඇමතිතුමා මේ රටේ වෙළඳ ඇමති ධුරය දැරුව. වෙළඳ අංශය මේ ඇමතිතුමාගෙන් පිට තිබුණේ එක අවුරුද්දක් තුළදී පමණයි.

පූ භා. 10.15

වෙළඳ අංශය මේ ඇමතිතුමාගෙන් පිට තිබුණත් මේ එතුමා භාරයේ පැවතුනේ සාමාන්‍ය අමාත්‍යාංශයක් නොවෙයි. එතුමාට වගකීම පැවරී තිබුණු අමාත්‍යාංශය මගින් වුවද මේ වැඩ කටයුතු කරන්න පුළුවන්කම තිබුණා. වෙළෙඳාම ලාංකික කිරීම සම්බන්ධයෙන් ගැසට් පත්‍ර මාර්ග යෙන් නොයෙකුත් අවස්ථාවලදී නොයෙකුත් ප්‍රකාශ කරන ලද නමුත් අද වනතුරු එකම එක හරි පියවරක්වත් ගෙන නැති බව මතක් කරන්නට සිදු වී තිබෙනවා. මහජනයා මුළා කිරීම පිණිස නම් වරින් වර නොයෙකුත් ප්‍රකාශ කර තිබෙන බව ඇත්තයි. මේ ගැන සවිස්තරව කරුණු කියන්නට ප්‍රථමයෙන් එක කාරණයක් ගැන මතක් කරන්නට කැමතියි. දැනට අපේ ආනයන හා අපනයන වෙළෙඳාමේ තත්ත්වය කුමක්ද?

මෙරටට බඩු ගෙන්වීමේ තත්ත්වය මොකක්ද? මෙරටට රෙදිපිළි ගෙන්වීමෙහි යෙදී සිටින සියලු දෙනාම ඉන්දියානු ජාතිකයෝ. සම්මාන පුරවැසිකම් ලැබූ අයත් ඉන්දියානු ජාතිකයන් හැටියටමයි, අප ගණන් ගන්නේ. අතිරේක ආහාර ද්‍රව්‍ය ගෙන්වීමෙහි යෙදී සිටින්නෝත් ඉන්දියානු ජාතිකයෝ. ඔව්, සම්පූර්ණයෙන්ම වාගේ ඒ අයත් ඉන්දියානු ජාතිකයෝ. ඔවුන් අතර පාරම්පරික පුරවැසියන් නැහැ. ගොඩනැගිලි උපකරණ ගෙන්වන අය අතර නම් ලාංකික ද්‍රවිඩ පිරිසක් ඉන්නවා. ඒ අයගෙනුත් වැඩි දෙනා ඉන්දියානු ජාතිකයෝ. පාරම්පරික ලාංකිකයන් හැටියට ද්‍රවිඩ උදවිය ටික දෙනකු සිටිතත් එතැනත් සිංහලයන් නැහැ. අපේ ආනයන හා අපනයන වෙළඳාමෙන් සියයට 57ක් පෞද්ගලික වෙළෙඳ සමාගම් මගින් කෙරෙන අතර භවුල් ව්‍යාපාර මගින් සියයට 17ක ප්‍රමාණයකුත්, පුද්ගලයන් විසින් සියයට 10ක ප්‍රමාණයකුත්, වෙනත් අය විසින් සියයට 15 ක ප්‍රමාණයකුත් කෙරෙනවා. වෙළෙඳ සමාගම්වලින් 24ක් ලාංකික වන අතර අනික් 76ම විදේශිකයන් අතේ පවතිනවා. භවුල් ව්‍යාපාරවලින් 27ක් ලාංකික වන අතර 73ක් පවතින්නේ විදේශිකයන් අතේයි. තනි පුද්ගලයන්ගෙන් 58ක් ලාංකික වන අතර 42ක් විදේශිකයි. මෙයින් පැහැදිලි වන තත්ත්වය කුමක්ද? 1963-64 අවුරුද්දේ අයවැය ලේඛනය සාකච්ඡා කරද්දීත් මේ රටේ වෙළෙඳාම විදේශිකයන් අතේ පැවතුණා. තවමත් මේ රටේ වෙළෙඳාම පවතින්නේ විදේශිකයන් අතේයි. විශේෂයෙන්ම ඉන්දියානු ජාතිකයන්ටයි, මේ රටට බඩු ගෙන්වීමේ වෙළඳාමේ අයිතිය තියෙන්නෙ. පිටරටට බඩු යැවීමේ වෙළඳාමේ අයිතිය ගැන අමුතුවෙන් කියන්න වුවමනාවක් නැහැ. පිටරටින් මේ රටට බඩු ගෙන්වීමේ අයිතිය ලාංකිකයන්ට මේ තරම්වත්—සියයට 2ක්, 3ක් වත්— තිබුනත් පිටරටට බඩු පැටවීමේ වෙළඳාමේ අයිතිය ඒ තරම්වත් නැහැ. මේ තත්ත්වය වෙනස් කරන්න මේ ආණ්ඩුව මොකක්ද කළේ? අකුරණ පළමු වැනි මන්ත්‍රීතුමා (ඩී. ජී. එච්. සිරිසේන මයා.) අද මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුව. බීඩි කොළ ගෙන්වීමේ අයිතිය තියෙන්නෙ විදේශිකයන්ටය, ස්වදේශිකයන්ටත්—ලාංකිකයන්ටත්—ඒ අයිතිය දෙනවද කියා ඒ මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. වෙළඳ ඇමතිතුමා වෙනුවෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් කියන්නට යෙදුණා, ඒ අවසරය දීමට නියම කරගෙන යනවාය කියා. ඔව්දාම නියම කරගෙන යනව. රට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විපතේ. ඉන්දියානුකාරයන් ලක්ෂ ගණන්, කෝටි ගණන් මුදල් මේ රටින් සූරා කනවා. බඩු මිල ඉහළ නැගිනවා. මිනිසුන්ට ලැබෙන ආදායම, වේතනය කිසි සේත් ප්‍රමාණවත් නැහැ, බඩු මිල ඉහළ නැගින අන්දමට. අන්තිමේදී දොස් තබන්නෙ මේ රටේ අහිංසක, පාරම්පරික ලාංකික වෙළෙන්දන්ටයි. ඒ වෙළෙන්දන්ගෙනුත් තදින් පසර වදින්නෙ අහිංසක සිංහල වෙළෙන්දන්ටයි. හැම දේටම වඟ කිව යුත්තා හැටියට, මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් මේ සභාව තුළදීත්, යන යන වෙනත් තැන්වලදීත් පෙන්වා දෙන්නෙ ලාංකික සිංහල වෙළෙන්දයි.

ගරු සභාපතිතුමනි, මේ රටට බඩු ගෙන්වීමේ වෙළඳාමේ අයිතිය සම්බන්ධයෙන් හොඳ විස්තරයක් දැන ගන්න පුළුවන්, 1963 නොවැම්බර් මස 8 වැනිදා, අංක 13,814 දරණ ගැසට් පත්‍රයෙන්. ඒ ගැසට් පත්‍රයේ සඳහන් වී තිබෙනවා, 1963 වර්ෂයේදී ලංකාවට බඩු ගෙන්වීම සඳහා දී තිබෙන අයිතිය පිළිබඳ විස්තර. Import quotas released to the trade during 1963. ඒ අවසරය ලැබී තිබෙන අයගේ නාම ලේඛනයක් මේ ගැසට් පත්‍රයේ තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ නාම ලේඛනය කියවීම බොහොම වැදගත්, මේ තත්ත්වය හොඳට තේරුම් ගැනීමට. පිටු සිය ගණනක පමණ නම් ලැයිස්තුවක් මෙතන තියෙනවා. මේ නම් වට්ටෝරුව මම කියවන්න අදහස් කරන්නෙ නැහැ. නමුත් මට තමුන්නාන්සෙට එකක් කියන්න පුළුවන්. ඔබතුමා මේ නම් ලැයිස්තුව කියෙවිවොත්, ලංකාවට බඩු ගෙන්වීමට අවසරය ලැබී ඇති වෙළඳුන්ගේ නම් ලැයිස්තුව මදුරාසියේ ඡන්ද කොට්ඨාශයක ඡන්දදායකයන්ගේ නම් ලැයිස්තුවක් වගේම බව පැහැදිලි වෙනවා ඇති. මදුරාසියේ ඡන්ද කොට්ඨාශයක ඡන්ද දායකයන්ගේ නම් ලැයිස්තුවක් සහ මේ වෙළඳුන්ගේ නම් ලැයිස්තුවත් අතර කිසි වෙනසක් නැහැ. 1963 දී තත්වයයි, මේ. ඒ සම්බන්ධව මේ සභාවේදී අපි විවේචනය කළ නිසා, මේ සභාවෙන් පිටතදී මහජනයා ඇති කළ විවේචනය නිසා සහ උද්ඝෝෂණය නිසා, රට මුළා කිරීමට ඉලංගරත්න වෙළඳ ඇමතිතුමා එදා තවත් ගැසට් නිවේදනයක් නිකුත් කළා.

ගරු ටී. බී. ඉලංගරත්න
(கௌரவ ரீ. பி. இலங்கரத்ன)
(The Hon. T. B. Ilangaratne)

හිටපු අයගෙ නම්, ඒ තියෙන්නෙ. අළුත් අයගෙ නම් නොවෙයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඒක මම හිමින් විස්තර කරන්නම්. හදිසි වන්න එපා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

විස්තර කරන්න පහසු වන්නයි, මම කිව්වෙ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මා ගැන අනුකම්පා හිතන්න එපා. ගරු සභාපතිතුමනි, මේ සභාව ඇතුළතත් පිටතත් ඇති වූ මහජන උද්ඝෝෂණය නිසා 1964 ජනවාරි මස 11 වැනිදා තවත් ගැසට් පත්‍රයක් නිකුත් කළා. වෙළඳාම ලාංකික කිරීම සම්බන්ධයෙන් මහජන උද්ඝෝෂණයක් ඇති වුණු නිසයි ඒ අන්දමේ ගැසට් නිවේදනයක් නිකුත් කළේ. මොකක්ද මෙම නිවේදනයෙ තිබුණෙ? මම එම නිවේදනයෙන් කොටසක් පමණක් මේ ගරු සභාවට කියවන්නම්:

Miscellaneous Departmental Notices
Import Control Trade Notice No. 7

තුන් වැනි කොටස:

Newcomers.

A scheme for the registration of newcomers to the import trade will also be announced in due course.

කල් යාමේදී, අලුත් උදවියට අවසර පත්‍ර දීමට වැඩ පිළිවෙළක් සකස් කරනවාය කියා දැනුම් දී තිබෙනවා. ඇමතිතුමා වෙනුවෙන් මෙම දැනුම්දීම කරන්නෙ, අත්සන් කර තිබෙන්නෙ. ආනයන අපනයන පාලක මහත්මයයි. මම දැන් නගන චෝදනා මේ ආණ්ඩුවේ වෙළඳ ඇමතිවරයාගේ වංචනික ප්‍රතිපත්තිය ගැනයි. මම එසේ චෝදනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

නගන්නෙ මෙන්න මේ කාරණය නිසයි. මෙම ගැසට් නිවේදනය 1963 ජනවාරි 11 වනදා නිකුත් කළ නමුත් අද 1964 සැප්තැම්බර 2 වනදා වනතුරුවත් මෙම අලුත් උදවිය භාර ගත්තද? ඒ අයට අවසර දුන්නද? නැහැ. අපට ඒ අයගේ නම් ලැයිස්තුව කරුණා කර දෙන්න. එවිට අපට පෙන් වන්නට පුළුවන් කොයි කොයි උදවියටද අවසර දී තිබෙන්නෙ, කොයි කොයි උදවියටද අවසර දී නැත්තෙ කියා. ඇත්ත වශයෙන්ම ඇමතිවරයා විසින් නිකුත් කළ මෙම ගැසට් නිවේදනයට පසු අපේ රටේ සිටින පාරම් පරික වෙළඳුන් ඉතාමත්ම සතුටට පත් වුණා, ආනයන අපනයන වෙළඳාමට අපටත් ඇතුල් වෙන්නට අවස්ථාවක් ලැබෙන වාය කියා. නමුත් කනගාටුයි කියන්න, එම වෙළඳුන්ගේ නම් ලැයිස්තුව දිහා බලන විට පෙනී යන්නෙ, හරියට මදරාසියෙ ඡන්ද දායකයන්ගෙ නම් ලැයිස්තුවක් වාගෙයි.

ගරු සභාපතිතුමනි, ආනයන අපනයන වෙළඳාමට අවසර පත්‍ර දුන්නෙ කොහොමද? 1960 වර්ෂයේදී ලංකාවට බඩු ගෙන් වූ යම්කිසි පිරිසක් සිටිනවා නම් ඒ පිරිසට එක්තරා ප්‍රමාණයක් අනුව, මෙම පාලනයට යටත්ව, බඩු ගෙන්වීමට අවසර දී තිබෙනව. ඒ අයගේ නම් පමණයි මෙම ලැයිස්තුවට ඇතුළත් වෙන්නෙ. නමුත් 1960 අවුරුද්දෙදි වෙළඳාම තිබුණෙ, සියයට අනූපහකටත් වඩා ඉන්දියානුවන්ගෙ අතෙයි. මෙරට සිටින විදේශිකයෝයි—ඉන්දියානු කාරයෝයි—මෙරට වෙළඳාම අල්ලාගෙන සිටින්නෙ. අන්න ඒ හේතුව නිසා තමයි 1963 දී මේ අන්දමේ ගැසට් නිවේදනයක් නිකුත් කළේ. නමුත් ලාංකික වෙළඳුන් අලුතෙන් ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් ආරම්භ කරනවාය කීවාට මෙම වෙළඳ ඇමතිතුමා ආනයන හා අපනයන නිලධාරීන්ට දන්වා තිබෙනවා, ගැසට් නිවේදනය තිබුණාට මේ ගැන කිසි දෙයක් කරන්නට එපාය කියා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මේ කථාව සම්පූර්ණ බොරුවක්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

සම්පූර්ණ බොරුවක්ය කියනවා නම් අප නගන චෝදනාවලට පිළිතුරු දෙන්න. අප කියන දේවල්වල ඇත්ත නැත්ත කියා දෙන්න. මෙම ගැසට් නිවේදනය අනුව එය නිකුත් කළාට පසුව, අලුතෙන් ලියාපදිංචිවූ වෙළඳුන්ගේ—මෙරටට බඩු ගෙන්වන්නට අවසර දුන් අයගේ—නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මම කියන්නෙ දැනට එය සංවිධානය කර ගෙන යන බවයි. නවත්වා දමා නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

1963 සිට නවමත් සංවිධානය කරගෙන යනව. නවමත් කියන්නෙ අලුතෙන් සංවිධානය කර ගෙන යන බවයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

බොහොම අමාරු කටයුත්තක්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඉන්දියානුකාරයන්ට මෙරට වෙළඳාම, පිටරටින් බඩු ගෙන්වීමට සම්පූර්ණයෙන් ඉඩ දී තිබෙනව. ඒ අයට අවසර පත්‍ර ගන්න බොහොම ලෙහෙසියි. නමුත් ලාංකිකයන්ට අවසර දෙන්න ඇමතිවරයාට බොහොම අමාරුයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මේ රටේ ආර්ථික තත්ත්වය පරිහානියට නෙයන අන්දමට සංවිධානය කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා ආර්ථික පරිහානියක් ඇති නොවන විධියට සංවිධානය කරන්නට කල්පනා කරන නමුත් බඩු මිල රොකට් එකක් වාගේ ඉහළ යනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කරවලවලින් හොඳ පාඩමක් ඉගෙන ගත්ත.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

කරවල වලින් පාඩු වුණේ ස. තො. සෙ. සංවිධානය කර තිබෙන වැරදි ආකාරය නිසා. නමුත් මෙයින් අදහස් කරන්නේ ඒක නොවෙයි. දැනට ඉන්දියානු වෙළඳුන්ට තිබෙන අවසරය, මෙරටට බඩු ගෙන්වීමට තිබෙන අවසරය, මෙරට ලාංකික පාරම්පරික වෙළඳුන්ට පවරා දීමෙන් එවැනි තත්ත්වයක් ඇති වෙන්නෙ නැහැ. එම නිසා එය හා සංසන්දනය කිරීම වැරදියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අවසර පත්‍ර ලබාගෙන ඉන්දියානු වෙළඳුන්ට දෙනවා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

එහෙම දීලා තිබෙනවා නම්, ඉදිරියට දෙනවා නම් ඒ අයට තදබල දඬුවම් දෙන්න ඕනෑ. ඒක බරපතළ වරදක්. එවැනි තත්ත්වයක් ඇති වෙනවාය කියා ලාංකික වෙළඳුන්ට අවසර නොදී සිටීම වරදක්. අන්න ඒ කාරණය ඇමතිතුමා හිතට ගන්න ඕනෑ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අප දැනට සංවිධානය කර ගෙන යනවා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

හැම දේම ඔය අන්දමටයි කරන්නෙ. මෙරට වෙළඳුන් අවසර පත්‍ර ඉන්දියානුවන්ට දෙනවා කියා අවසර නොදී සිටීමෙන් ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. මේ ගැන කළ යුතුව තිබෙන්නෙ එසේ කරන වෙළඳුන්ට තදබල ලෙස දඬුවම් දීමයි. ඇත්ත වශයෙන් ඒ අන්දමට යම් පුද්ගලයකු ක්‍රියා කරනවා නම් එය අප තදින්ම හෙළා දකිනවා.

පූ. හා. 10.30

තමන් අවසර ගෙන එය වෙනත් කෙනකුට දෙනවා නම් එය බලවත් වරදක්. එවැනි අයට තද දඬුවම් දී කටයුතු කරන්න ඕන. එසේ කරන්නේ නැතිව, මේ ගැසට් නිවේදනයේ සඳහන් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීමට—වෙළඳාම ලාංකික නොකිරීමට—මෙය කාරණයක් හැටියට ඉදිරිපත් කරනවා නම් එය වැරදියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

වෙළඳාම ලාංකික කිරීම සංවිධානාත්මක පියවරක් උඩ කළ යුතුයි. බඩු හිඟ නොවන විදියටත්, ආර්ථික පරිහානියක් නොවන විදියටත් කළ යුතුයි. නැති නම් විශාල පාඩුවක් වෙනවා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් ඒ සංවිධානය සම්පූර්ණ වෙන්නේ අපි මැරුණුදාටයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඔබතුමා එපමණ ඉක්මනින් මැරෙන්නේ නැහැ. ඔබතුමාට අපි දීර්ඝායු පතනවා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ශත වර්ෂයක් පමණ ගත වේවි, එය සම්පූර්ණ වන විට. මම මැරෙන්නෙ නැති වුණාට ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ලාංකික වෙළෙන්දා මැරෙනවා. ඒකයි, අපේ කණගාටුව. මේ ඇමතිතුමා කරන ලදැයි කියන ප්‍රකාශයක් ප්‍රවෘත්ති පත්‍ර කිපයක වාර්තා වී තිබුණා. එවා වැරදියයි කියා නැති නිසා මම ඒ ගැන කියන්නම්. ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා, නිවන් දක්නා තුරු පළිගන්නවාය කියා. මෙන්න නිවන් දක්නා තුරු මේ රටේ පාරම්පරික වෙළෙන්දාගෙන් පළිගන්නවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මම කවදාවත් එහෙම කිව්වෙ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

පසු ගිය පාර්ලිමේන්තු වාරය අවසන් කොට දිග නිවඩුවක් දී සති තුනක් පමණ ගියාට පසු ඔබතුමා නුවරඑළියේ රැස්වීමක දී—මා හිතන්නේ රක්ෂණ සංසථාවේ ශාඛාවක් විවෘත කිරීමකදී—කිව්වේ නැද්ද මම කළුකඩකාරයින් වෙනුවෙන් කථා කළාය කියා?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒක වෙනම එකක්. මම මිනිසුන්ගෙන් පළිගන්නවා යයි කිව්වේ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

බොහොම සන්තෝෂයි, එහෙම කිව්වේ නැති නම්, නමුත් එසේ ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණා. එය වැරදි යයි කියා තිබුණේ නැහැ. ඒ නිසයි, මම කිව්වේ. එය බෙරු ප්‍රකාශයක් යයි කියනවා නම් ඒ ගැන අපි හැප්පෙන්නේ නැහැ.

ටී. විලියම් ප්‍රනාන්දු මයා. (නුවරඑළිය)
(திரு. ரீ. வில்லியம் பெர்ணாண்டோ—நுவரெலிய)
(Mr. T. William Fernando—Nuwara Eliya)

ඇමතිතුමා රක්ෂණ සංසථාවේ ශාඛාවක් විවෘත කිරීමට නුවරඑළියට පැමිණියේ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

නැත නුවරඑළිය නොවේ නම් රාගල වෙන්න ඇති. එය සුළු ප්‍රමාද දෝෂයක්. නමුත් ඇමතිතුමා දන්නවා එසේ කී බව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මම කළු කඩකාරයින්ට විරුද්ධව කථා කළා මිස ලාංකික වෙළඳුන්ට විරුද්ධව කථා කළේ නැහැ. ඉන්දියානු හෝ වේවා ලාංකික හෝ වේවා කළුකඩකාරයින්ට විරුද්ධවයි, මා කථා කළේ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඔබතුමා මට චෝදනා කළා, මා මේ සභා වේදී දීර්ඝ කථාවක් කර කළුකඩකාරයින් වෙනුවෙන් කථා කළාය කියා. මම මේ සභ වේදි කථා කළේ ලාංකික වෙළඳුන් වෙනුවෙනුයි. මම ජෑෆපජීලා වෙනුවෙන් කථා කළේ නැහැ. හෙබ්ටුල්ලාබෝයි, ජෑෆපර්ජී වැනි අය වෙනුවෙන් මම කථා කර නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ අයත් ලාංකිකයින්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මම ඒකටත් එන්නම්. හොඳ ලාංකික යෝ. එක කකුලක් ලංකාවේ; අනික ඉන්දියාවේ. ඔබතුමා සුනේත්‍රාදේවී පිරිවෙනේ රැස්වීමකදී—අගමැතිනියත් සිටි රැස්වීමක දී—එදා සිටි මුදල් ඇමති හැටියට ප්‍රකාශයක් කළේ නැද්ද, සම්මාන පුරවැසියන් නිසා මේ රටට වෙළඳාමෙන් ලෙකු හානියක් වුණාය කියා?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒක ඇත්ත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් ජෑපර්ජී ලාංකිකයයි කියන්නේ ඔහු තමුන්නාන්සේගේ යාළුවෙක් නිසාද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

නීත්‍යානුකූලව ඒ අය පුරවැසියන්. පුර වැසි භාවය ලබාගත් උදවිය. ජෑපර්ජීත් සමඟ මගේ ඇති යාළුකමක් නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මේ රටින් මධ්‍යම ආසියාවේ රටවලට වෙළඳ දූත පිරිසක් ගිය වේලාවේදී ඒ දූත පිරිසට ජෑපර්ජීත් ගියේ මේ රටේ වෙළෙන්දන් වෙනුවෙන් වෙන යන්නට කෙනෙක් නොසිටි නිසාද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මේ රටේ වෙළඳාම කරන උදවියයි, ගියේ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ජෑපර්ජීත් එකයි, චෙට්ටිනාඩ් සමාගමත් එකයි; සුප්පයියා නාඩාරුත් එකයි; ඒ සියලු දෙනාම ඉන්දියානුකාරයින්. මේ රටේ වෙළෙන්දන් වෙනුවෙන් ජෑපර්ජීයි, ගියේ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ජෑපර්ජී පමණක් නොවෙයි, තවත් කීප දෙනෙක් ගියා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඒ කීප දෙනාත් සමඟ ජෑපර්ජීත් ගියා; තමුන්නාන්සේත් ගියා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ආණ්ඩුවේ ප්‍රතිපත්තිය උඩ වෙළඳ දූත පිරිසක් ගියා. ඒ පිරිසට ආණ්ඩුවේ අයත් පෞද්ගලික වෙළෙන්දනුත් අයත් වුණා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මගේ චෝදනාව ඔබතුමාට පමණක් නොවෙයි. මුළු ආණ්ඩුවටමයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

හෙට අනිද්දා ඉරාණය, ඉරාකය වැනි රට වලටත් පෞද්ගලික වෙළඳුන් යනවා ඇති.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මේ බණ්ඩාරනායක ආණ්ඩුව ඇති වුණාට පසුව, ආණ්ඩුවේ වෙළඳ නියෝජිත පිරිසක් හැටියට ගියේ ඔබතුමාගෙ නාය කත්වයෙන් ගිය පිරිසයි. එයට ජෑපර්ජී ගිය එකයි මා කියන්නෙ. මේ වංචනික ප්‍රතිපත්තිය අනුව තව දුරටත් මහජනයා මුළා කරන්න කර තිබෙන්නේ මොකක්ද? ලාංකික වෙළඳුන් ලියාපදිංචි කිරීමේ අළුත් ක්‍රමයක් ඇති කර තිබෙනවා. 1964 අගෝස්තු 27 වැනි බ්‍රහස්පතින්දා ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර තිබෙනවා. මෙම අලුත් ක්‍රමය හොඳයි. 1963 ජනවාරි 11 වැනි සිකුරාදා ගැසට් පත්‍රයේ පළ කළ අලුත් අය ලියා පදිංචි කිරීමේ ක්‍රමය අපි නරකයි කියන්නෙ නැහැ. එයත් හොඳයි කියනවා. මේ දැන් දමා තිබෙන්නෙ වඩත් හොඳ ක්‍රමයක්. මෙහි 1 වැනි පරිශිෂ්ටයේ කොන්දේසි කියවා බලන විට අපට සතුටට පත් වන්න පුළුවන්. සියයට සියයක් සතුටට පත් වන්න බැරි වුණත් එක්තරා ප්‍රමාණයකට සතුටට පත් වන්න පුළුවන් නමුත් සිදු වන්නේ කුමක්ද? මෙහි තිබෙනවා රුපියල් 250 ක් ගෙවා ලාංකික වෙළඳුන් හැටියට ලියා පදිංචි කරන්න වැඩ පිළිවෙළක්. ඒක බෙහොම හොඳයි. සියයට සියයක් ලාංකික සේවකයින්ම වෙන්න ඕනෑ. සියයට සියයක් ලාංකික කොටසක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

කරුවන් සිටින්නට ඕනෑ. ඔය අන්දමට හොඳ ඒවා තිබෙනවා. නමුත් මෙය ක්‍රියාත්මක වන්නේ 1965 ජනවාරි 1 වැනි වැනිදා සිටයි. එතකොට 1963 ජනවාරි 11 වැනිදා සිට 1965 ජනවාරි 1 වැනිදා දක්වා අවුරුදු 2ක් තුළ මොකක්ද සිදු වෙන්නෙ? මට අනුමානයක් නැතිව කියන්න පුළුවන්, මේක බොරුවක්ය කියල. මෙහි වංචාව මම පෙන්වන්නම්. ලාංකිකයින් හැටියට ලියාපදිංචි කරනවා. නමුත් අවසර පත්‍ර ලැබෙන්නේ කාටද? ආනයන අපනයන වෙළඳාමට අවසර පත්‍ර ලැබෙන්නේ 1960 වෙළඳාම කළ උදවියටයි; මදුරාසි ඡන්ද ලේඛනයේ සිටින අයටයි. පාරම්පරික ලාංකිකයෝ කියා රුපියල් 250 ක් ගෙවා ආනයන අපනයන කොමසරිස්තුමා යට තේ ලියාපදිංචි වන එක පමණයි වෙන්නෙ. එවැනි නිවේදනයක් තමයි වෙළඳ ඇමතිතුමා කර තිබෙන්නෙ. ලියාපදිංචි වුණා කියා මහජනයාට සන්තෝෂ වෙන්න පුළුවන්ද? නමුත් එපමණයි ලැබී තිබෙන්නෙ.

ගරු සභාපතිතුමනි, අවසානයකට විවාහ නොවූ සමහර වයස්ගත කාන්තාවන් සිටිනවා. තරුණයෙක් පාරෙන් ගියොත් කියනවා අහලෙන් ගියත් සතුටුයි කියල. ඒ වගේ පාරම්පරික වෙළඳුන්ට ලියපදිංචි වෙන්න කියනවා. වෙළඳාමක් නැතත් ඒකත් සතුටක්. වෙළෙන්දෙක් හැටියට ලියාපදිංචි වෙන්න රුපියල් 250 ක් ගෙවන්න ඕනෑ.

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)
(Mr. J. R. Jayewardene—First Colombo South)

බලාපොරොත්තුවක් පමණයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඔව්, බලාපොරොත්තුව පමණයි. මේ ගැසට් නිවේදනය අනුව ලියාපදිංචි වුණාට පසුව 1960 වෙළඳාම් කළ ක්‍රමය අනුව ආනයන අපනයන බලපත්‍ර දුන් ප්‍රතිපත්තිය අහෝසි කර දමා ජනවාරි මාසයේ 1 වැනි දා සිට මේ ලියාපදිංචි වන ලාංකික අයට මේ රටට බඩු ගෙන්වීමට අවසර දෙනවාද නැද්ද කියා අද අපි දැනගන්නට කැමතියි. අපට දැනගන්නට ඕනෑ කරන්නේ ඒකයි. අපට ඒකට උත්තරයක් දෙන්න. 1965 ජනවාරි පළමු වැනි දා සිට මේ රටට බඩු ගෙන්වීමේ අවසරය මේ ලියාපදිංචි වන ලාංකික අයට දෙනවා නම් ලාංකික කිරීමේ ප්‍රතිපත්තියේ තවත් පියවරක් ගත්තා කියා අපට කියන්න පුළුවන්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කර තිබෙන හරියට ටිකක් ප්‍රශංසා කරන්න.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මොකවත් කර නැහැනෙ. 1963 ජනවාරි මාසයේ ගැසට් නිවේදනය අනුව පාරම්පරික වෙළඳුන් 10 දෙනෙකුටවත් අවසර දුන්නා නම් අපට ප්‍රශංසා කරන්න තිබුණා. ඉන්දියානු වෙළඳුන් 10 දෙනෙකුගේවත් වෙළඳාම නතර කළා නම් අපට ප්‍රශංසා කරන්න තිබුණා. නමුත් වෙළඳ ඇමතිතුමා මේක කළේ නැහැ. වෙළඳ ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ මම දන්නවා. මේ සම්බන්ධයෙන් විශාල සංවිධානයක් තිබෙනවා. මා දන්න නිසයි කියන්නෙ. මේ ගැසට් නිවේදනය අනුව ලියාපදිංචි කරන වෙළඳුන්ට ආනයන අපනයන බලපත්‍ර දෙන්නෙ නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මේ ආනයන බලපත්‍ර සම්බන්ධවත් ඒ වාගේම විදේශ විනිමය වෙන් කිරීම සම්බන්ධවත් කමිටුවක් පත් කර තිබෙනවා. මගේ අමාත්‍යාංශයෙන් පමණක් නොවෙයි තවත් අංශ කිපයක උසස් නිලධාරීන් හතර පස් දෙනෙකු ඒ කමිටුවට පත් කර තිබෙනවා. ඒ කමිටුව තමයි මේවා ක්‍රියාත්මක කිරීමාදී සෑම දෙයක්ම කරන්නෙ. මා පෞද්ගලික වශයෙන්වත්, අමාත්‍යාංශයට සීමා වූ බලතලවලින් මේ සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජාවිච්චි කරන්නෙ නැහැ. ඒ කමිටුවේ රෙකමදාරු අනුව සොයා බලලයි ක්‍රියා කරන්නෙ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා ඒ පිළිතුර දීම ගැන මා සන්තෝෂ වෙනව. ඔය පිළිතුර දෙන බව මම දන්නව. ඔය පිළිතුර ගැන මා කරුණු දෙකක් මතු කරනව. පළමුවැනි කාරණය මේකයි. මහජන ඡන්දයෙන් පත්වූ ඇමතිවරයෙක් ප්‍රතිපත්ති සම්බන්ධ වැඩ පිළිවෙළක් නිලධාරීන්ට භාර දුන්නාය කියා මේ ගරු සභාවේ පළමුවැනි වතාවට කියනව. මේ රටේ කොයි ඇමතිවරයාද ප්‍රතිපත්ති සකස් කිරීම නිලධාරීන්ට භාර දුන්නෙ? නිලධාරීන්ට භාර දෙන්නෙ ප්‍රතිපත්ති ක්‍රියාවෙ යොදවන්නයි. ඕක තමයි අපට වෙලා තියෙන වරද. ඒ වැඩේ කරන්න තමන්ට වුවමනා නැහැ; තමන්ට ලාංකික කරන්න වුවමනා නැහැ. ඒ නිසා කමිටුවකට භාර දී තිබෙනව. එහෙම නොවෙයි; අපේ ප්‍රතිපත්තිය මේකයි, අස වල් කාල සීමාව ඇතුළත මේක ලාංකික කිරීමයි අපේ ප්‍රතිපත්තිය, ඒ කාල සීමාව තුළ කරදරයක් නොවන අන්දමට මේක ලාංකික කරන්ට වුවමනාය කියායි කොමිටියට කියන්න ඕනෑ. එහෙම නිවේදනයක් කර නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ප්‍රතිපත්ති තීරණය කරන්නත්, උපදෙස් ගන්නත්—

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ප්‍රතිපත්ති තීරණය කිරීම නිලධාරීන්ට භාර දෙනව නම් ඔබතුමා ඇමතිවරයකු හැටියට සිටීම ලජ්ජාවට කාරණයක්. කරුණා කර ඔය ස්ථානයෙන් ඉල්ලා අස් වී නිලධාරීන්ට භාර දෙන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සෑම දෙනෙකුගෙන්ම උපදෙස් ගන්න ඕනෑ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ප්‍රතිපත්ති තමන් තීරණය කරන්න ඕනෑ. ප්‍රතිපත්ති ආණ්ඩුව තීරණය කරන්න ඕනෑ. නිලධාරීන්ට කිව යුතුව තිබෙන්නෙ ඒ ප්‍රතිපත්ති ක්‍රියාවෙ යොදවන්නයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කාගෙනුත් අහලයි තීරණය කරන්නෙ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

කාගෙන් ඇහුවත් අපට කමක් නැහැ. ඇමති මණ්ඩලයෙන් අසන්න ඕනෑ බව නම් අපි දන්නව. අපෙන් ඇසුව නම් අපිත් කියනව. විරුද්ධ පාර්ශ්වය අවවාද අනුශාසනා දෙන්න බැරිය කියා කවදාවත් කියා නැහැ.

දැන් මගේ චෝදනාව ඔප්පු වුණා. මේ ගැසට් නිවේදනය අනුව රුපියල් 250 ක් අරගෙන ලාංකික වෙළඳුන් ලියාපදිංචි කළාට අනිත් අවුරුද්දෙ ඔවුන්ට ආනයන බලපත්‍ර දෙන්නෙ නැහැ. ඇමතිතුමාගෙ කටින්ම ඒක ඔප්පු වුණා. කට බොරු කිව්වත් දිව බොරු කියන්නෙ නැහැ. ඇමතිතුමාගෙ කටින්ම ඒක ඔප්පු වුණා. මේවාට ඇඟිලි ගසන්න නිලධාරීන්ට භාර දී තිබෙනවාලු. නිලධාරීන් ඇඟිලි ගහපු තැන් මම තව ටිකකින් පෙන්වන්නම්. ලාංකිකයන්ට අවසර පත්‍ර දෙන විට වෙළඳාම ලාංකික කිරීමට මැදහත්වීමට ඇමතිතුමා කැමති නැහැ. ඒවා නිලධාරීන්ට භාර දී ඇමතිතුමා අත් දෙක සුද්ධ කර ගෙන තිබෙනව. ඒ විධියට ආනයන අපනයන වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම කමිටුවකට භාර දී තිබෙනව. මේකට සමාව දෙන්න බැහැ. මේකට නොරිවෙන ලෙස මා පාරම්පරික ලාංකික වෙළඳුන්ගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනව. පාරම්පරික ලාංකික වෙළඳුන්ට කරුණු පැහැදිලි කර දීමට මා ඇමතිතුමාගේම ප්‍රකාශය ප්‍රයෝජනයට ගන්නව. තමන් ඇඟිලි ගහන්නෙ නැත කියා නිලධාරීන්ට ඇඟිලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ගහන්න ඉඩ දී තිබෙනවා. නමුත් මේ ආණ්ඩුවේ ඇමතිවරුන් ඉන්දියන් වෙළෙන්දන්ට, ජෑfපර්ජීලාට, හෙබ්තුල්ලා බෝයිලාට වාසි වන විධියට ඇඟිලි ගහපු තැන් මම පෙන්වන්නම්.

පූ. භා. 10.45

දැන් මේ රටට අතිරේක ආහාර ද්‍රව්‍ය ගෙන්වනවා. වර්ෂයකට රුපියල් 8 කෝටි යක පමණ වටිනාකමට අල, ලුනු, මිරිස් ආදී අතිරේක ආහාර ද්‍රව්‍ය ගෙන්වනවා. මේ ද්‍රව්‍ය ආනයනය කිරීම කාටද අයිතිව තිබෙන්නෙ? ජෑfපර්ජීලාත් ඔවුන් සමග ඥාති සම්බන්ධකම් තිබෙන හෙබ්තුල්ලා බෝයිලාත් ආදී බෝරා සින්දි වෙළඳ ව්‍යාපාරිකයන්ටයි මේක අයිතිව තිබෙන්නෙ. ජෑfපර්ජීල එක වෙළඳ ව්‍යාපාරිකයන් කොටසක්; හෙබ්තුල්ලා බෝයිල ඔවුන්ට ඥාති සම්බන්ධකම් ඇති තවත් වෙළඳ ව්‍යාපාරිකයන් කොටසක්. ඒ ඔක්කොම මේ රටේ ධනය හූරා කන කෝටිපතියෝ. මේ වෙළඳාමෙන් තමයි, විනිමය මුදල් යනාදියේ විශාල වංචා තොගයක් සිදු වෙන්නෙ. ඒ සමගම මේ වෙළඳාමට දී තිබෙන්නෙ විවෘත බලපත්‍රයි. අලුත් ප්‍රතිපත්ති අනුව ඒක නැති කරන්ට යනවද කියා මා දන්නෙ නැහැ. ඒක අද වෙළඳ ඇමතිතුමා කියයි. අද වන තුරු මේ වෙළඳාම කෙරෙන්නෙ විවෘත බලපත්‍ර ක්‍රමය උඩයි. මේ අතිරේක ආහාර ද්‍රව්‍ය ගෙන්වන අපනයන වෙළඳාම සින්දි බෝරා ඉන්දියානු හස්ත ග්‍රහණයෙන් මුදා ගන්ට ඇමතිතුමා විසින් කියන ලද කොමිටිය වැඩ පිළිවෙළක් සකස් කළා. අපනයන ප්‍රතිපත්ති කාරක සභාව "Import Policy Control Committee" ඇති කළ ඒ වෙනස කුමක්ද? මිරිස්, අර්තාපල්, අල, රතු ලුනු යනාදියේ වෙළඳාම ස.තො.සෙ.ට දෙන්ට මේ කාරකසභාව තීරණයක් ගත්ත. ඒ තීරණයට වෙළඳ අමාත්‍යාංශයත් අනුකූලතාව දැක්කුව. වෙළඳ අමාත්‍යාංශයත් ඒ තීරණය පිළි ගත්ත. මුදල් අමාත්‍යාංශයත් ඒ තීරණය පිළිගෙන මේ අවුරුද්දේ නොවැම්බර් මාසයේ 1 වැනිදාට ඒ ද්‍රව්‍ය පිළිබඳ වෙළඳාමේ සම්පූර්ණ අයිතිය සමුපකාර තොග වෙළඳායතනයට භාර දෙන්ටයි, කාරක සභාව තීරණය කළේ.

එහෙත් මොකක්ද සිද්ධ වුණේ? මේක කරන්ට යන කොට ජෑfපර්ජීල නිකම් හිටියෙ නැහැ. මේ සින්දි බෝරකාරයෝ, එක කකුලක් ඉන්දියාවෙත්, අනික් කකුල ලංකාවෙත් තබාගෙන සිටින සම්මාන පුර වැසිකම් ලැබූ පිරිස නිකම් හිටියෙ නැහැ. ඔවුන් යටිකුට්ටු ව්‍යාපාර පටන් ගත්ත. අල්ලස් දීමේ ව්‍යාපාරය පටන් ගත්ත. ඔවුන්ගෙ දූෂණ ව්‍යාපාරය පටන් ගත්ත. කෙසේ හෝ මේ ව්‍යාපාරය කඩාකප්පල් කරන්ට. මොකක්ද සිද්ධ වුණේ? ජෑfපර්ජී ඉන්ටර්නැෂනල් නමැති සමාගමක් තිබෙනවා.

මේ ප්‍රශ්න ගැන මතක් කරන මේ අවස්ථාවේ මුදල් ඇමතිතුමාටත් බරපතල චෝදනා වගයක් එල්ල කරන්ට තිබෙනවා. අද එතුමා ලංකාවේ නැහැ; මේ සභාවේ නැහැ. මම පිටිපස්සෙන් ගහන මිනිහෙක් නොවෙයි. නැති වෙලාවේ කියල යන මිනිහෙක් නොවෙයි. එම නිසා මුදල් ඇමතිතුමා සම්බන්ධයෙන් මතක් කළ යුතු කරුණු මා අද මතක් කරන්නෙ නැහැ. මුදල් ඇමතිතුමා මේ සභාවට එන තුරු බලාගෙන සිටිනවා, ඒවා ඉදිරිපත් කරන්න, එතුමාට පිළිතුරක් දෙන්න පුළුවන් වන අන්දමට. එතුමාත් ජෑfපර්ජී ඉන්ටර් නැෂනල් සමාගමත් අතර තිබුණු සම්බන්ධයක් ගැන මා අද කියන්නෙ නැහැ. මුදල් ඇමතිතුමා ආවට පසුව මම ඒවා කියන්නම්. වෙළඳ ඇමතිතුමා ගැනයි අද කියන්නෙ. නැති අය ගැන කියන එක සිංහල ගතියක් නොවෙයි. අපේ පොත්වල සඳහන් වී තිබෙනවා, දඩයම් කරන විටත්, දඩ සතාට සංඥාවක් දීලයි, සිංහලයන් දඩයම් කරන්නෙ, කියා. අළුත් ක්‍රමය අනුව හැංගිසිට රෑ හඳපානේ වතුර බොන්ට ආවිට වෙඩි තබන සිරිතක් සිංහල ක්‍රමයේ නැහැ.

මා කලින් සඳහන් කරමින් සිටි ජෑfපර්ජී ඉන්ටර්නැෂනල් සමාගම ලාංකික එකක් නොවෙයි. එහි සමහර කොටස් විදේශික යන්ටත්, මේ ප්‍රෝඩාවෙන් ලාංකිකකම් ලබාගත් උදවියටත්—මුදල් ඇමතිතුමා කියන හැටියට ලංකාණ්ඩුව පිළිගත්ත ලාංකිකයන්ටත්—අයිතියි. 1960 සිට මේ සමාගම වෙළඳාම නැතිව අයින් ගහල ඉදල මේ මෑතදී නැවතත් වෙළඳාමට ආව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1960 දී මේ ජෑfපර්ජී ඉන්ටර්නැෂනල් සමාගම වෙළඳාමක් කරන්ට අවසථාවක් නැතුව අභාවයට යන්ට ගියා. දැන් නැවතත් ඒ අය එළියට ඇවිත් සිටිනව. කොහොමද මේක සිද්ධවුණේ? වෙළඳ ඇමති අංශයේ අද වන තුරුම තිබෙන ප්‍රතිපත්තියක් තමයි ලෝකයේ සමහර රටවලින් බඩු ගෙන්වීමට ලාංකිකයන්ට පමණක් අවසර දීම. එයින් එක් රටක් ජපානයයි. ජෑfපර්ජී ඉන්ටර්නැෂනල් සමාගම ජපානයෙන් නයිලෝන් නෙට් රෙදි ගෙන්වීමට අවසර ඉල්ලුව. නමුත් ජපානයෙන් බඩු ගෙන්වන්නට ඉඩ දෙන්නේ ලාංකික සමාගම්වලට පමණක් නිසාත්, ජෑfපර්ජී ඉන්ටර්නැෂනල් සමාගම ලාංකික සමාගමක් නොවන නිසාත් ආනයන අපනයන කොමසාරිස්තුමා ඒ සඳහා ඒ සමාගමට අවසර දුන්නේ නැහැ. තමාට දී තිබෙන ප්‍රතිපත්තියේ වෙනසක් කිරීමට කිසිදු පියවරක් ගන්නේ නැතිව ඒ සමාගමට යථෝක්ත අවසරය දීම ප්‍රතික්ෂෙප කිරීම ගැන මම ආනයන අපනයන කොමසාරිස්තුමාට ප්‍රසංශා කරනව. විශෙෂයෙන් එවැනි නිලධාරීන්ට අපි ප්‍රසංශා කළ යුතුයි. මුදල් ඇමතිතුමා මෙහි නැති වුණත් මගේ ඒ කථාව සම්පූර්ණ කිරීමක් වශයෙන් මුදල් ඇමතිතුමා කර ඇති දේ කනගාටුවෙන් වුණත් කියන්න සිදු වී තිබෙනව. එය කිරීමට අදාළ වූ කරුණු මම දැන් කියන්නෙ නැහැ. මුදල් ඇමතිතුමාගෙන් ලියමනක් ගියා මේ අවසරය දෙන්නය කියා. ඒ කියන්නෙ ජෑfපර්ජී ඉන්ටනැෂනල් සමාගමට ජපානයෙන් බඩු ගෙන්වීමට අවසර දෙන්නය කියා. අවසර දුන්න. එතකොට ඒකට ඇඟිලි ගහන්න පුළුවන් වුණා. ඔය එකක්.

ඊ ළඟට අර්තාපල් සහ රතුලූනු, නොවැම්බර් මාසෙ 1 වෙනිදා සිට ස. තො. සෙ. මගින් ගෙන්වීමට තීරණය කර තිබුණ. බෝරා වෙළඳුන් සහ සින්දි වෙළඳුන් ඒ අවස්ථාවෙදි මොකද කෙළේ? වහාම ගිහින් ඇමතිවරයා අල්ලගත්ත. මම කෙළින්ම චෝදනා කරනව වෙළඳ ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් අනුග්‍රහයක් දීම ගැන. ස. තො. සෙ. සාමාන්‍යාධිකාරී සහබිදීන් මහතා ආනයන ප්‍රතිපත්ති කාරක සභාවට—Import Policy Control Committee නමැති කාරක සභාවට—ලිපියක් යැව්ව, මේ වෙළඳාම ස. තො. සෙ. ට පවත්වාගෙන යන්න බැරිය කියා. තමා ඒ තනතුර භාරගෙන සති දෙකක් යන්නත් කලින් මේ විධියේ ලිපියක් යවා ඒ වැඩේ කඩාකප්පල් කළා. ආනයන ප්‍රතිපත්ති කාරක සභාව විසින් යෝජනා කර තිබුණා, නොවැම්බර් මස 1 වැනි දින සිට ඒ වෙළඳාම ස. තො. සෙ. ට ගත යුතුය කියා. වෙළඳ ඇමතිතුමාගෙ අනුදැනුම ඇතිවයි එය වෙනස් කරන්නය කියන ලිපිය මේ නිලධාරියා විසින් යවා තිබෙන්නෙ. මම ඒ නිලධාරියාට දොස් කියන්නෙ නැහැ. ඒ මොකද? ස. තො. සෙ. ට මේ වෙළඳාම කරන්න බැරිය කියන ඒ ලිපිය යවා ඇත්තේ වෙළඳ ඇමතිතුමාගේ අනුදැනුම ඇතිවයි. නොවැම්බර් මාසෙ 1 වැනි දිනට එය ස. තො. සෙ. ට ගැනීමට තීරණය කර ඇති නමුත් ඒ සම්බන්ධයෙන් තවමත් කිසිම වැඩ පිළිවෙළක් යොදා නැහැ. මේ කෝටි අවේ වෙළඳාම සින්දි වෙළඳුන්ට සහ බෝර වෙළඳුන්ට සදහටම ගෙන යාමේ වැඩ පිළිවෙළට වෙළඳ ඇමතිතුමා අවසර දී තිබෙනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
මම අවසර දී නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් ඇයි ඒ වෙළඳාම ස. තො. සෙ. කරන්න බැරිය කියා ලිපියක් ලිව්වෙ? සහබිදීන් මහතා සාමාන්‍යාධිකාරී වෙන්නට කලින් ඒ ආනයන ප්‍රතිපත්ති කාරක සභාවෙ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළා. ඒ කාරක සභාව විසිනුයි අර්තාපල් සහ රතු ලූනු ගෙන්වීම නොවැම්බර් 1 වැනි දා ස. තො. සෙ. මගින් කළ යුතුය කියා යෝජනා කෙළේ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඔය කියන විධියෙ අවසරයක් අපි දුන්නෙ නැහැ. සොයා බලා කරුණු කියන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මම දන්නව සහබිඳින් මහත්මයා ඔය තරම් අත්තනෝමතික විධියේ ලිපියක් ලියන්නෙ නැති බව. ඒ මහතා ඒ තරම් අඥාණ කෙනෙක් නොවෙයි. මම ඒ මහතා අඳුණනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සෑම ලියමනක්ම ලිවීමේදී මගෙන් අසා නොවෙයි ලියන්නෙ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඇයි නැත්තෙ? මෙය ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නයක්. නිලධාරියෙක් තනියම එවැනි තීරණයක් ගන්නෙ නැහැ.

පූ. භා. 10.55

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. දැන් නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායක තැන්පත් ඩී. ඒ. රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

සභාපතිතුමනි, මේ විධියේ අත්තනෝමතික තීන්දුවක් නිලධාරියකු විසින් තම තනි මතය උඩ ගත්තොත්—ඇමතිවරයා ඒ තීරණයට විරුද්ධ නම්—ඒ නිලධාරියාට ඒ තනතුරේ ඉන්න බැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

නිලධාරීන් විසින් ලියනු ලබන සෑම ලිය මනක්ම ලියන්නෙ මගෙන් අවසර අර ගෙන නොවෙයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

සභාපතිතුමනි, මෙය සාමාන්‍ය ලියමනක් නොවෙයි. මෙය ප්‍රතිපත්තිය පිළිබඳ වැද ගත් තීරණයක් ඇති ලියමනක්. මේ ගරු සභාවේදී ඇමතිතුමා විසින්ම ප්‍රකාශ කර තිබෙනවා, වෙළඳාම ලාංකික කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමට ආනයන ප්‍රතිපත්ති කාරක සභාවට භාර දුන්නා කියා. නොවැම්බර් 1 වැනි දින සිට අර්තාපල් සහ රතු ලූනු ගෙන්වීම ස.තො.සෙ. මගින් කළ යුතුය කියන තීරණය ගෙන ඇත්තේ ඒ කාරක සභාව විසිනුයි. සහබිඳින් මහත්මයත් ඒ තීරණය ගත් කාරක සභාවෙ හිටපු සාමාජිකයෙක්. තමුන්නාන්සෙ අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමතිවරයා වුණාට පසුවයි, ඔහු ස.තො.සෙ. සාමාන්‍යාධිකාරී තැන වශයෙන් පත් කළේ. ඉස්සෙල්ල කොමිටියෙ හිටපු තැනැත්ත සාමාන්‍යාධිකාරී වශයෙන් පත් වුණාට පසු කොහොමද මෙවැනි ලියමනක් එවන්නෙ? ස.තො.සෙ. ට මේක කරන්න බැහැ කියල කොහොමද එයා කියන්නෙ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මම ඒ ගැන දන්නෙ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

එහෙම කිවට මම පිළිගන්නෙ නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මම ඒ ගැන දන්නෙ නැති නම් මොනව කරන්නද? මම කියන්නෙ දන්නෙ නැහැ කියලයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ගරු ඇමතිතුමාට මම චෝදනා කරනවා. [බාධා කිරීමක්] එහෙම නම් මේ රටේ වැඩ කටයුතු තමුන්නාන්සෙ නිලධාරීන්ට භාර දීල ඉවරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඒ ගැන සොයල බලන්නම්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
මේක වුණේ තමුන්නාන්සෙ පත් වුණාට පසුවයි, අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඒ මහත්මය පත් කළෙත්, මා ආවාට පස්සෙ තමයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
ඔව්. මේ ඇමතිතුමා එහෙනම් කර තිබෙන්නෙ කුමක්ද? මේ ඇමතිතුමා නිලධාරීන්ටයි, රාජකාරිය බාර දිල තියෙන්නෙ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඔව්; එහෙම තමයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
ගරු සභාපතිතුමනි, මම එකක් කියන්නම්, ඒ මහත්මය ඇමතිතුමා නොදනුවත්ව, එතුමගෙන් අහන්නෙ නැතුව එතුමාගෙන් අවසරය ලබා ගන්නෙ නැතුව මෙවැන්නක් කර තිබෙනව නම් තව දුරටත් ඔහුට මෙහි සාමාන්‍යාධිකාරී හැටියට ඉන්න බැහැ. ඒ මහත්මය මමත් හඳුණන කෙනෙක්. මේක සුළු ප්‍රශ්නයක් නොවෙයි. මේක ලොකු වංචාවක්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
එවැනි ලිපියක් යවා තිබෙන බවක් මා දන්නෙ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
සොයා බලන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
සොයා බලන්නම්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
මේ විධියෙ ලිපියක් යවල තියෙනව නම්, ඔහුට මෙම සාමාන්‍යාධිකාරී පදවියෙ ඉන්න බැහැ. අපනයන ප්‍රතිපත්ති කොමිටියෙ ඔහු සේවය කළ බව අපි දන්නව. අර්තාපල් යනාදි අල වර්ග, ලුණු යනාදි දේවල් [බාධා කිරීමක්] ස.තො.සෙ.න් කරන්න ඕනෑ කියා මුලදී ඔහු එකඟ වුණා. ස.තො.සේ. සාමාන්‍යාධිකාරී වුණාට පස්සෙ ඒ අදහස වෙනස් වුණේ කොහොමද? එවැනි ලිපියක් ලියන්න හේතු වුණේ මොකද?

මෙවැන්නක් නොදැන කළා නම්, ඔහු වැඩ කරන්න දන්නෙ නැහැ. එහෙනම් මෙවැනි කොමිටිවලට පත් කරන නිලධාරීන්ගෙන් වැඩක් නැහැ. යම් යම් කටයුතු නිලධාරීන්ට භාර දී හොඳට කරනවාය කියා තමුන්නාන්සෙ කියනව. නමුත්, මේ විධියට නම් නිලධාරීන් මොකවත් දන්නෙ නැහැ. මා කැමති නැහැ ඒ විධියට කියන්න. මේ කොමිටිවල තවත් මහත්වරු සිටිනව. නිලධාරී මහත්වරුන්ට එවැනි දෝෂාරෝපණයක් කරන්න, මා කැමති නැහැ. නිලධාරීන්, ඇමතිවරුන්ට වුවමනා හැටියට වැඩ කරන උදවියයි. බොහොම කලාතුරකින් තමයි, ඇමතිවරුන්ට පිටුපා වැඩ කරන නිලධාරියකු දකින්න ලැබෙන්නෙ. තමන්ට පිටුපා වැඩ කරනව නම් එවැන්නන්ගෙ අත්තනෝමතික ක්‍රියා කලාපය නතර කරන්න ඇමතිතුමාට බලය තියෙනව. එවැනි ක්‍රියා පටන් ගත් තැනදීම ලොප් කර දමන්න ඇමතිවරුන්ට පුළුවන්කම තියෙනව. මේ සම්බන්ධ සම්පූර්ණ විස්තරයක් අපට වුවමනා කරනව. මා කරන්නෙ බරපතළ චෝදනාවක් බව කියන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

බෝරා වෙළෙන්දෝයි, සින්දි වෙළෙන්දොයි, ඉන්දියන් කාරයොයි තමා, මේ ආණ්ඩුව අල්ලගෙන ඉන්නෙ. බෝරා කාරසින්ටත්, සින්දි කාරසින්ටත්, ඉන්දියන් කාරසින්ටත් මේ රටේ මිනිසුන්ට කරන්න බැරි දේවල් කරන්න පුළුවන්කම තියෙනව. මේ රටේ මිනිසුන්ට ඡන්දයෙන් කරන්න බැරි දේවල් බෝරාකාරසින්ටත් සින්දිකාරසින්ටත් ඉන්දියන්කාරසින්ටත් කරන්න පුළුවනි. මේ ආණ්ඩුව වර්ණනා කරන්නෙ ඒ අයයි. ඒ මිනිස්සු කළුකඩකාරයො හැටියට හඳුන්වා දී අද්වන තුරු එක ඇමතිවරයකුවත් කතා කර නැහැ. අපි මේ රටේ පාරම්පරික වෙළඳුන් වෙනුවෙන් කතා කළාම, සිංහල වෙළඳුන් වෙනුවෙන් කතා කළාම අපට දොස් කියනව, "කළුකඩකාරයන් ආරක්ෂා කරනව" කියා. මේ රටේ සිංහල වෙළෙන්දො නොවෙයි, කළුකඩකාරයො වෙන්නෙ. ඒ මිනිස්සු යන්තමින් මුදලක් හොයා ගෙනයි, වෙළඳ ව්‍යාපාරවල යෙදෙන්නෙ. සිංහල වෙළෙන්දන්ගෙන් සියයට අනූනවය හමාරක්ම ණයගැතියි. ඒ අයට හරි විධියේ මූල ධනයක්වත් නැහැ. රෝල් කර කරයි. ඔවුන් වෙළඳාම ගෙනියන්නෙ. ඔවුන් වෙළඳාම් කරන්නෙ බෝරාකාරසින්ගෙන්, සින්දි කාරසින්ගෙන් සහ ඉන්දියන්කාරසින්ගෙන් බඩු අරගෙනයි. එතනයි, කළුකඩය තියෙන්නෙ. එතනි නුයි, බඩු මිල වැඩි වන්නෙ. එතනයි, ලාබය තියෙන්නෙ. එතනයි, සූරා කෑම පවතින්නෙ. අපනයන කටයුතු තියෙන්නෙ විදේශික වෙළෙන්දන් අතෙයි. ඒ අයට ගහන්නෙ නැහැ. තමුන්නාන්සේ ඒ අය ගැන කිසි දෙයක් කියන්නෙ නැහැ. ගරු අගමැතිනියවත් ඒ අය ගැන කිසිවක් කියන්නෙ නැහැ. ආණ්ඩුව කිසිම දෙයක් කියන්නෙ නැහැ, ඒ මිනීසුන් ගැන. ගහන තරමක් ගහන්නෙ අහිංසක සිංහල කඩකාරසින්ටයි. ගහන්නෙම සිංහල සුළු වෙළෙන්දන්ටයි. සිංහල කියන එක වැරදියි. සිංහල කිව්වට මා එයින් අදහස් කළේ ලාංකිකයන් ගැනයි. මුස්ලිම් සුළු වෙළෙන්දොත් ඉන්නව. යෝනක ජාතික සුළු වෙළෙන්දොත් ඉන්නව. ඒ වගේම ද්‍රවිඩ ජාතික සුළු වෙළෙන්දත් ඉන්නව. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් කියන හැම කොටස්වලටම අයිති අහිංසක සුළු වෙළෙන්දන් ඉන්නව. ඒ ඔක්කොම මේ රටේ අයයි; ලාංකික වෙළෙන්දොයි. අන්න ඒ අයටයි පහර ගහන්නෙ. ඒ අයට එතකොට තැනක් නැහැ. වෙළඳාම කරගෙන යන බෝතල් කටේ ඉඩක් නැහැ. ඒ බෝතල් කට දැන් අල්ලගෙන ඉන්නෙ බෝරාකාරයෝ. ඔවුන් අද මේ ආණ්ඩුවෙ ගජ මිත්‍රයෝ. ඒකයි අපි කියන්නෙ මේක කඩන්න කියල. හැමදා මත් කියන්නෙ මේක කඩන්න ඕනෑ කියලයි. අපනයන වෙළඳාම ලාංකික කරන්න ඕනෑය කියල අපි හැමදාම කියන්න ඕනෑද? ඒ කොයි හැටි වෙතත් තවමත් ඒ සම්බන්ධයෙන් හරි පියවරක් ගත්තෙ නැහැ. මගේ හතරවැනි චෝදනාව ගරු ඉලංගරත්න ඇමතිතුමා වෙත මා එල්ල කරන්නෙ ඒ කාරණය උඩයි. ගරු ඉලංගරත්න ඇමතිතුමා රටේ මහජනතාව මුළා කර දැම්මා. ගරු ඉලංගරත්න ඇමතිතුමා මේ රටේ මහජනතාවට බොරු කළා. එතුමා එකක් කියනව, කරන්නෙ තවත් එකක්. මේ රටේ පාරම්පරික වෙළෙන්දා, පාරම්පරික වෙළඳ පරම්පරාව, විශේෂයෙන්ම සිංහල වෙළඳ පරම්පරාව අතු ගා දැම්මෙ කවුද? මේ රටේ පාරම්පරික වෙළඳ පරම්පරාව අතුගා දැමීම පිකිරි බණ්ඩාර ඉලංගරත්න ගරු වෙළඳ ඇමතිතුමාගේ ප්‍රධාන පරමාර්ථයත් දැඩි අධිෂ්ඨානයත් වෙලා තිබෙන බව මා කියනව.

පූ.භා. 11

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඕවා පිළිගන්නෙ නැහැ, අද රටේ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
අධිෂ්ඨානය පමණක් නොවෙයි ක්‍රියා කලාපයත් වෙලා තියෙන්නෙ ඒකයි. මේ වකවානුවේ වෙළඳ ඇමතිවරයා හැටියට මේ ඇමතිතුමා කර තිබෙන්නෙ ඒකයි. මේ රටේ පාරම්පරික වෙළෙන්දන්—විශේෂයෙන්ම සිංහල වෙළඳ පරම්පරාවක් ඉන්නව නම්, වෙළඳ පිරිසක් ඉන්නව නම්, ඒ අය—නැති වන තැනටයි කටයුතු කර තිබෙන්නෙ. පරම්පරාවය කිව්වෙ ඒ වෙළඳ පිරිසටයි. ලාංකික ජාතික සුළු වෙළෙන්දන් 2,80,000ක් තරම ඉන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එයින් වැඩි හරියක් සිංහල ජාතික සුළු වෙළෙන්දෝ. එතුමා ඒ පිරිස අතුගා දැමීමට, වළලා දැමීමට, මරා දැමීමට ආ කෙනෙකු හැටියටයි මගෙ පිළිගැනීම. සුළු වෙළෙන්දන්ගෙන් පළිගැනීමටයි ඒතුමා ක්‍රියා කරන්නෙ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
අමූලික බොරුවක්. පව හැල්ලක්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
අපි චෝදනා කරනව. අපි අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනව එතුමට.අපි සටන් කරනව ඊට විරුද්ධව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
වෙළෙන්දන්ගෙන් පළිගැනීමක් නැහැ. හැබැයි, කළුකඩකාරයින් නම් විනාශ කරනව.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
ඒ නිසා තමයි ජෆ්පර්ජී මහත්මයට ඉඩ දී තිබෙන්නෙ, ජපානයෙන් නයිලෝන් දැල් ගෙන්වන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
නීත්‍යානුකූලව ඉඩ දිය යුතු කාටත් ඉඩ දෙනව.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
ජෆ්පර්ජී ඉන්ටර්නැෂනල් කියන සමාගම ලාංකික සමාගමක් නොවෙයි. ඉතින් කොහොමද ඒක නීත්‍යානුකූල වෙන්නෙ? ඒක මා ප්‍රසිද්ධියේ කියනව චෝදනාවක් හැටියට. වංචනික ලෙස නයිලෝන් දැල් ගෙන්වන්න අවසර දී තිබෙනවා නේද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
වංචනික කියන්නෙ ඇයි? වංචාවක් කළාය කියන එක සාධාරණ එකක් නොවෙයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
ගරු ඇමතිතුමා වංචාවක් කළාය කියනවා නොවෙයි. ජෆ්පර්ජී ඉන්ටර්නැෂනල් එකට ජපානයෙන් නයිලෝන් දැල් ගෙන් වන්න ලැබුණු එක වංචාවක්. ජෆ්පර්ජී ඉන්ටර්නැෂනල් එක ලාංකික සමාගමක් නොවෙයි. සියේට සියයක්ම ලාංකිකයන්ට පමණයි ජපානයෙන් නයිලෝන් දැල් ගෙන්වන්න පුළුවන්. එතකොට ලාංකික නොවන—නොන් සිලනීස් කියන අය—ගෙන්වන්නෙ කොහොමද ජපානයෙන්? ඒ අයට කොහොමද අවසර ලැබෙන්නෙ? මේවට අපට උත්තර දෙන්න ඕනෑ. කළුකඩකාරයින්ට විරුද්ධව සටන් කරන වය කිව්වට කළුකඩකාරයෝ ගරු ඉලංගරත්න ඇමතිතුමාගේ මිත්‍රයෝ. ජෆ්පර්ජී තරම් කළුකඩකාරයෙක් මුළු ලංකාවෙම නැතැයි කියනව මම.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
මගෙ මිත්‍රයෝ නොවෙයි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
හෙප්තුල්ලාබෝයි වැනි අයත් මේ රටේ නැහැ. එහෙත් විමලසේන, විපුලසේන, රාජපක්ෂ වැනි අය ලාංකිකයො. දකුණෙන් ගිහිල්ලා බොහොම දුක් විඳගෙන වෙළඳාමක් ආරම්භ කර කඳුකර පළාත්වල වැඩ කරගෙන යන ඒ පින්වතුන්ට අපි කවුරුත් ප්‍රසංශා කරනව. තමන්ගේ ගම් පළාත් පවා අත් හැර දමලා මීට අවුරුදු පණහකට හැටකට උඩදී කඳුකර පළාත්වලට ගිහිල්ලා, නෑදෑයන් ගෙනුත් ඇත් වෙලා, මූලික ධනයක් පවා නැතිව, වත්කමක් නැතිව, සුළුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

වෙළඳාමක් පටන් ගෙන, විදේශිය වෙළෙන්දන්ටත්, ඉන්දියන් කාරයින්ටත් විරුද්ධව කෙලින්ම මුහුණට මුහුණ දී සටන් කර, ටිකින් ටික වැඩි දියුණු වෙමින් අද යම්කිසි තත්ත්වයක් ඇතිව කටයුතු කරන යම් කිසි පිරිසක් ඉන්නව නම් ඒ උදවියට අපි ඇත්තෙන්ම ප්‍රසංශා කරනව. උඩරට වතුකරයේ අද සිංහලකමක් තිබෙනවා නම්, එසේ තිබෙන්නේ දකුණෙන් ගිය සිංහල වෙළෙඳුන් නිසයි. ඒ ගැන අප ඒ අයට ප්‍රශංසා කරනවා. අද ඒ අයට විරුද්ධව උඩරට පහත රට බලවේග ඇවිත් තිබෙනව. නමුත් අප ඒ අයට ගරු කරනවා. ඒ අයගෙන් වැරදි සිදු වන්නට ඇති. මනුෂ්‍යයන් හැටියට කාගෙනුත් වැරදි සිදු වෙනවා. ඒ අය රහත් වෙලා නැහැ. ඒ අය ගියේ හම්බ කරන්නටයි. ඒ නිසා ඒ අයගෙනුත් වැරදි සිදු වෙන්නට ඇති. වැරදි තිබුණත් ඒ ජාතික වෙළෙඳුන් දකුණෙන් ගොස් උඩරට නගර වල සිංහලකමට තැන ලබා දුන්නා. එම නිසා ඒ ජාතික වෙළෙඳුන්ට නැවත වතාවක් ප්‍රශංසා කරනවා. අපේ ඉලංගරත්න ඇමතිතුමා නම් ඒ අයට විරුද්ධව ක්‍රියා කරනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සම්පූර්ණයෙන්ම බොරු. මමත් ඒ අයට ප්‍රශංසා කරනවා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඉලංගරත්න ඇමතිවරයා ඒ අයට විරුද්ධව නිවේදන නිකුත් කරනවා. ඒ අයවලුන් කළුකඩකාරයන් හැටියට හඳුන්වනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සම්පූර්ණයෙන්ම බොරු.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

කළුකඩකාරයන්ට විරුද්ධව සටන් කරනවාය කියා ගරු ඇමතිතුමා කීවා. එසේ කියමින් මධ්‍යම ආසියා රටවලට, ලංකාවේ වෙළෙඳ නියෝජිතයන් වශයෙන්, සින්දි සහ බෝරා වෙළෙඳුන් කැඳවාගෙන ගියා. මේ රටේ ඉන්න නොම්මර එකේ කළුකඩකාරයන් සින්දි වෙළෙඳුන් සහ බෝරා වෙළෙඳුන් නේද? නමුත් අපේ වෙළෙඳ නියෝජිතයන් වශයෙන් පිටරට කැඳවාගෙන යන්නේ ඒ අයයි. හැම විදේශික වෙළෙන්දෙක්ම කළුකඩකාරයෙක්. ඔවුන් එකිනෙකාගේ වෙනස තිබෙන්නේ දශම ගණන්වලින් පමණයි. ඒ ඔක්කොම සූරාකන්නෝ. ඒ ඔක්කොම මේ රටට ආදරයක් නැති මිනිස්සු. ඒ ඔක්කොම අල්ලස් දූෂණවල යෙදෙන, නිලධාරීන්ට නිසි ලෙස රාජකාරියක් කරන්නට ඉඩ නොදෙන, ආදායම් බදු දෙපාර්තමේන්තුවට හොර කරන, පුළුවන් තරම් මැරකම්වල යෙදෙන, අයයි. ඔවුහු මේ රට සූරාකන්නෝ. සියලුම වංචා කෙරෙන්නේ ඔවුන් අතිනුයි. නමුත් අපේ වෙළෙඳ ඇමතිතුමා මධ්‍යම ආසියාවේ වෙළෙඳ නියෝජිතයන් වශයෙන් යවන්නෙත් ඒ අයයි. ඒ අය පමණද මේ රටේ වෙළෙඳුන් වශයෙන් ඉන්නේ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ගරු මන්ත්‍රීතුමා එහෙම කථා කරන එක වැරදියි. වෙළෙඳ මණ්ඩලයේ සභාපතිතුමා විසින් තේ අපනයනය කිරීමේ කටයුතු ගැන සොයා බැලීම සඳහා යෑම පිණිස නියෝජිතයන් කීප දෙනකු නම් කළා. අප ඒ අයට අවසර දුන්නා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මොකටද වෙළෙඳ මණ්ඩලයෙන් ඇහුවේ? මේ වගේ මිනිසුන් මධ්‍යම ආසියාවට ගෙන ගියේ මොකටද? රට සූරාකන කළුකඩකාරයන් ගෙන ගියේ මොන එකකටද? ඔවුන් ගෙන යන්නේ නැතිව ඇමතිතුමායි, නිලධාරීනුයි ගියා නම් මදිද? ඒ අයට ඒ වැඩ කරගෙන එන්න බැරිද? මොකටද මේ වංචාකාර හොරුන් එක්කර ගෙන ගියේ? තේ පිටරට යවන වෙළෙඳාම් රජය අතට ගන්නා ලෙස 1960 සිටම අප ඉල්ලා සිටියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ක්‍රමානුකූලව ඒක කරනවා.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
මෙතෙක් කල් ඒක කරන්න බැරි වුණා. හැබැයි මේ දැනට තිබෙන ක්‍රමයෙන් වංචා කෙරෙන බව ගරු මුදල් ඇමතිතුමා අදත් කීවා. [බාධා කිරීමක්]

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
පෞද්ගලික වෙළඳුන් එවන ලෙස සමහර රටවල් ඉල්ලා සිටියා. [බාධා කිරීමක්] ඒ රටවල් තේ ගන්නෙ නැත්නම් මොකද කරන්නෙ?

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
එහෙම නොයැව්වා නම් ඒ රටවල් අපේ තේ ගන්නෙ නැද්ද? මොකද කරන්නෙ තේ නොගෙන? ලංකාව වෙන රටවලින් බඩු ගන්නෙ නැද්ද? රුසියාවෙන්, චීනයෙන්, තව තවත් රටවලින් බඩු ගන්නෙ නැද්ද? රුසියාවේ, චීනයේ පෞද්ගලික වෙළඳුන් නැහැ. නමුත් ඒ රටවලුත් වෙනත් රටවල් සමඟ වෙළඳාම් කරනවා. සමාජවාදය ගැන කථා කරන ඉලංගරත්න ඇමතිතුමා නම් කියන්නේ, කුමන පෞද්ගලික වෙළඳුන්ගෙන් බඩු ගන්නදැයි ඒ රටවල් අහනවාය කියලයි. [බාධා කිරීමක්]

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තේ අපනයනය ආණ්ඩුවට ගැනීමට සංවිධානය මදි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
හැමදාම අපේ ඉලංගරත්න ඇමතිතුමා කථා කරන්නෙ සංවිධානය ගැනයි. දෙවි භාමුදුරුවනේ, අවුරුදු 4 ක්, 5 ක්, තිස්සෙ කරපු සංවිධානය මොකක්ද කියා අපට කියන්නකෝ. මේවා ලාංකික කිරීමට කරල තියෙන සංවිධානය මොකක්ද? මම කියන්නම්, කරල තියෙන සංවිධානය මොකක්ද කියා. නැදැයෝ ටික ගියා සතොසෙට, සතොසෙ හොරකම් වැඩි වුණා; අල්ලස් දූෂණ වැඩි වුණා. ඒ සංවිධානය නම් හොඳට කෙරුණා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
පෙට්‍රල් ගත්ත. කරවල ගත්ත.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
ගරු සභාපතිතුමනි, විනිමය වංචාවක් කළ සමාගමක් තමයි, ඒ. එෆ්. ජෝන්ස් සමාගම. ඒ සමාගම තමයි, තේ වෙන්දේසියෙදි බාල තේ පෙන්වා අඩු මිලකට තක් සේරු කරවා වටිනා තේ පිට කළේ. ආනයන—අපනයන කොමසාරිස්තුමා මේක දැනගෙන මේ ගැන පරීක්ෂා කිරීම සී. අයි. ඩී. එකට භාර දුන්න. කෙළින් කටයුතු කළ නිසා මම නැවත වතාවක් ඒ මහත්මයට ස්තුති කරනව. ඒ. එෆ්. ජෝන්ස් සමාගම විනිමය වංචාවක් කරනවය කියා මේක සී. අයි. ඩී. එකට භාර දුන්නම මොකද කළේ? මේක යට ගැහුව. ඇයි? ඒ. එෆ්. ජෝන්ස් සමාගමේ ඉන්නෙ අපේ ඇමතිතුමාගෙ හොඳම මිත්‍රයා—කල්‍යාණ මිත්‍රයා—සෙනෙට් මන්ත්‍රී නඩේසන් මහත්මයා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
සම්පූර්ණ අසත්‍ය චෝදනාවක්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
යහළුවෙක් නොවෙයිද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඔය සම්බන්ධයෙන් මගේ කිසිම දැනීමක් හෝ මා කළ යට ගැසීමක් නැහැ. සම්පූර්ණ අසත්‍ය චෝදනාවක්. මේ සභාව තුළ ඔය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉලංගරත්න]

විධියේ චෝදනා කිරීම බොහොම වැරදියි. මම දන්න හැටියට යට කළෙත් නැහැ. වැරදි තියෙනව නම් යට ගහන්න ඉඩ දෙන්නෙත් නැහැ. කථා කිරීමේ නිදහස තිබුනට මේ සභාව තුළ ඔය විධියේ චෝදනා ඉදිරිපත් කිරීම යුක්තිසහගත නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

අපි කැමතියි, ඒ. එෆ්. ජෝන්ස් සමාගමේ සිද්ධිය සම්බන්ධයෙන්, ආනයන-අපනයන කොමසාරිස්තුමා—මයිල්වාගනම් මහත්මයා—සී. අයි. ඩී. එකට ඉදිරිපත් කළ ලිපි හා සී. අයි. ඩී. වාර්තාව ඇතුළත් ලිපි ගොනු මේ සභාවට ඉදිරිපත් කරනව නම්. ඒවා මේ ගරු සභාව පරීක්ෂා කර බලන්න ඕනෑ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ කාලයෙ මම වෙළඳ ඇමති වශයෙන් හිටියෙත් නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඔබතුමා හිටිය කාලයෙදි තමයි, හොරකම කෙරුණෙ. ඔබතුමා ගිය පසු තමයි, සී. අයි. ඩී. එකට දැනුම් දුන්නෙ. 1960-63 කාලයෙදි වෙළඳ ඇමති හැටියට හිටියෙ නැද්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

හිටිය. ඔය ගැන මගේ කිසි සම්බන්ධකමක්, දැනීමක් නැහැ. ඔය වාර්තාව ගැන මම දන්නෙත් නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මේ සභාවට වාර්තාව ඉදිරිපත් කරන්න. ඇත්ත නැත්ත දැන ගන්න අපි සන්තෝෂයි. මම වැරදි චෝදනාවක් කරල තියෙනව නම් සමාව ඉල්ලල අස් කර ගන්නම්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

වහන්න හරි, චෝදනාව පිළිගන්න හරි මම කැමති නැහැ. තියෙනව නම් වාතීව ඉදිරිපත් කරන්න කියන්නම්. නමුත් වාර්තාව ඉදිරිපත් කරන්න කලින් චෝදනා කිරීම වැරදියි.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මම මේ සභාවේ කවදාවත් මුසාවක් කියන්නෙ නැහැ. සමාව ඉල්ලල මගේ චෝදනාව අස් කර ගන්න ලැස්තියි, ලිපි ලේඛන මේ සභාවට ඉදිරිපත් කරල මගේ කිම වැරදි බව පෙන්නුවොත්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තවත් ඉදිරියට ඉල්ලුවොත් සම්පූර්ණයෙන් ඉදිරිපත් කරනව. මාව ඒකට ඇදීමයි නරක.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා කියන දේ මම නොපිළිගන්නෙ නැහැ.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා. (කොට්ටාව)
(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ඇමතිතුමා ඒ පරීක්ෂා කිරීම කල් ඇතිව කරන්න එපායැයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඕනෑ කඩදාසියක් මම ඉදිරිපත් කරන්නම්. රහස් කඩදාසි මා ළඟ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

අද මේ රටේ වෙළඳුන්ට වෙලා තියෙන්නෙ මේකයි. බඩු මිල වැඩි වීමට හේතුව මේකයි. වෙළඳාම අල්ලගෙන ඉන්න සියලු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙනාම විදේශිකයොයි. මේ වෙළඳාම ලාංකික කිරීමට මේ ආණ්ඩුව කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ පියවර ගන්න තුරු අපට අද තියෙන මේ දුකෙන් බේරෙන්න බැහැ. මේ දුක අපට දිගටම විඳින්න වෙනව. දවසින් දවස් මේ දුක වැඩි වෙනව. දවසින් දවස අපේ පරිභාණිය වැඩි වෙනව. බඩු මිල වැඩි වෙනව. ඒක කාටවත් නවත්වන්න බැහැ. අප වෙළඳ ඇමතිතුමාට චෝදනා කරන්නෙ මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ඇමතිවරයා කිසිම දෙයක් කර නැති නිසයි. එපමණක් නොවෙයි, මේ ඇමතිවරයාගේ කාල සීමාව තුළ දී මේ රටේ කළු කඩකාරයන්ට, මේ රට සූරා කන වෙළඳුන්ට, හැම වරප්‍රසාදයක්ම හැම අයිතිවාසිකමක්ම දී තිබෙනව.

ප්‍රූ. භා. 11.15

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ජෝන් සහ සමාගම පිළිබඳව නිලධාරීන් ගෙන් මට වාර්තාවක් ලැබී තිබෙනව. ගරු මන්ත්‍රීවරයා සඳහන් කළ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නෙ මට පෙර සිටි මුදල් ඇමතිතුමාටයි. එම නිසා ඒ ගැන කිසිවක් කියන්නට මම දන්නෙ නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් කරුණාකර ඒ කඩදාසි ඉදිරිපත් කරන්න. එසේ ඉදිරිපත් කරන ලෙස අප ඉල්ලා සිටිනව. චෝදනාවක් කළා නම් ඒ චෝදනාවෙහි ඇති ඇත්ත නැත්ත විසඳා ගැනීමට එම කඩදාසි ඉදිරිපත් කිරීම වැදගත් බව මම කියා සිටිනව. අපේ ප්‍රකාශයන් සත්‍යද, අප අතර වැරදි අවබෝධයක් ඇති කරගෙන තිබෙනවාද, කියා එවිට අපට නිරවුල් කර ගන්නට ලැබෙනව. යම් විධියකින් අප ප්‍රකාශ කරන දෙයෙහි වරදක් තිබෙනවා නම්, අසත්‍යයක් තිබෙනවා නම්, ඒ ගැන අප සමාව ඉල්ලන්න සූදානම්.

ගරු සභාපතිතුමනි, සෑහෙන කාලයක් මගේ කථාවට අරගෙන තිබෙන නිසාත්, තවත් ගරු මන්ත්‍රීවරුන් කථා කිරීමට බලාපොරොත්තුව සිටින නිසාත් වැඩිදුර කථා කිරීමට මම අදහස් කරන්නෙ නැහැ. නමුත් තවත් කරුණු රාශියක් කියන්නට තිබෙනව. අවසාන වශයෙන් තවත් එක් කරුණක් ගැන පමණක් සඳහන් කරනව.

ගරු සභාපතිතුමනි, මේ ඇමතිවරයා ගෙන් මම ඉල්ලා සිටින්නෙ මෙයයි. මෙම වැඩ පිළිවෙළ තව දුරටත් මේ ආකාරයෙන් ගෙන යන්න එපා. මේ රටේ පාරම්පරික වෙළඳුන් මරන්න එපා. මේ රටේ ජීවන මිල පහත දැමීමට වුවමනා නම්, මේ ප්‍රශ්නය විසඳන්නට කල්පනා කරනවා නම්, මේ රටේ බඩු සුලභ කරන්න ඕනෑ. මේ රටේ ජනතාවට සහනය සැලසීම සඳහා ගත යුතු පියවරවල් තිබෙනව. මූලික වශයෙන් මේ රටේ විදේශිකයන් සතුව තිබෙන වෙළඳාම ස්වදේශිකයන්ට පැවරීමට, ඉන්දියානුවන්, සම්මාන පුරවැසියන් අල්ලා ගෙන සිටින බඩු ගෙන්වීමේ ව්‍යාපාරය මෙරට වෙළඳුන්ට පැවරීමට කට යුතු යොදන්න ඕනෑ. එම නිසා ඇමතිතුමා මෙම තනතුරේ සිටින කාල සීමාව තුළ දී කුමක් කිරීමට අදහස් කරනවාද කියා අපට දන්වන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

ඩඩ්ලි සේනානායක මයා. (දැදිගම)
(திரு. டட்லி சேனநாயக்க—டெடிகம)
(Mr. Dudley Senanayake—Dedigama)

Mr. Chairman, I do not propose to traverse the very valuable ground covered by the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna), but I want to raise as briefly as possible certain very important matters pertaining to the co-operative movement and Co-operative Wholesale Establishment. The activities of this establishment are very important in that they have an impact on the cost of living as far as the people are concerned, and I believe it is expected by the Government to be one of the chief instruments through which the cost of commodities is to be kept down.

It is not necessary for me to emphasize the fact that one of the chief problems of the country which the people are groaning under is the cost of living. Firstly, I would like

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩඩ්ලි සේනානායක මයා.]

to know what the policy of the Hon. Minister is as regards the co-operative movement and the functions of the Co-operative Wholesale Establishment. I know of innumerable instances where the co-operative unions of various areas had established their union stores. Some of them are running very satisfactorily. For instance, I can talk about the Beligalkorale union store which is not confined to my electorate alone. I think the electorate of the Member for Galigomuwa is also in Beligalkorale.

There is a Beligalkorale store at Ambepussa. It has been running very satisfactorily for quite a long time. Now it is sought to start a C.W.E. store at Warakapola. Ambepussa and Warakapola are hardly a mile from each other.

Now, what is the policy? Is it the policy of the Minister to do away with all the union stores and replace them by C.W.E. stores? If that is the policy, then they are doing away with one of the chief objectives of the co-operative movement.

The co-operative movement was intended to be a people's movement where the people formed their societies. There were the individual stores formed by various co-operative societies. These stores societies formed a co-operative union for a larger area consisting of delegates or representatives from the different societies in the villages. In certain cases, these unions formed their union stores. Now that was how the movement was built up.

An original function of the C.W.E. store was undoubtedly to feed the retail shops of these various societies. Here you have a union store successfully functioning. By establishing a C. W. E. store almost cheek by jowl with it you intend to completely eliminate the union store. What is your objective? What is your policy? Is it your policy to replace this people's movement by a bureaucratic movement? That is a very important matter and I would like the Minister to give his mind to it.

Then as regards the activities of the C.W.E. itself, I wish to know from the Minister whether they have come to a decision about political rights. It is unfortunate that I myself had to bring up this matter. I believe the Government is considering the granting of political rights to a certain section of Government servants. I believe it is not the intention of the Government to give political rights to all Government servants but only to a certain section. However, we have not been apprised of their decision on the matter as yet.

You have a Chairman of the C.W.E. who was made chairman because he was my opponent at elections. The Hon. Minister shakes his head. I ask him what his other qualification is to become Chairman of the C.W.E. If you make him a member of the intended Press Council that would be more to the point because he was a journalist. His acquaintance with co-operatives or trade is nil. The village boutique-keeper probably knows more about trade than this gentleman. But, of course, the Minister is entitled to give his political patronage to one who obliged him by being my opponent at the elections—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I had nothing to do with the nomination.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

You had nothing to do; I know the lot you did—and who obliged him by filing an election petition which he had not the courage to proceed with.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I am very sorry—I want to assure the hon. Leader of the Opposition that I had absolutely nothing to do with the election petition against him.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
Never mind about all that. I wish you had proceeded with it.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
I never wanted to proceed with it. I had absolutely no involvement in any election petition other than my own.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
It is strange that this very Mr. Jafferjee who was mentioned came to see me and told me that if Mr. Ilangaratne's petition is withdrawn, mine too will be withdrawn.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
I had nothing to do with such a proposal.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
It is very strange.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
In fact, I was told that Mr. Jafferjee was financing my opponent in the election petition. I had nothing to do—

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
Never mind all that. I only say it is strange ; and I hope Mr. Jafferjee conveyed to the Hon. Minister my reply.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
I never sent an emissary nor will I employ Mr. Jafferjee as my emissary for anything. I had nothing to do with it.

රෝයි රාජපක්ෂ මයා. (හක්මන)
(திரு. ரோய் ராஜபக்ஸ—ஹக்மன)
(Mr. Roy Rajapakse—Hakmana)
They are all rumours.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
All right I accept what the Hon. Minister said.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
I want to tell the hon. Leader of the Opposition that I had absolutely nothing to do with his election petition, though he had much to do with my election petition.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
Of course, I had a lot to do.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
Yes, I know. I had nothing to do with yours.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
I felt that he was thoroughly guilty and I did everything possible to see that that election petition was proceeded with. I never deny what I have done.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
On the other hand, I never showed any interest in your election petition.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Well, we will get on to the next point.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I had nothing to do with your election petition.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Now this gentleman was made chairman for the reasons I mentioned earlier. He goes on with his political activities—I have not complained of it before—and addresses political meetings as Chairman of the C. W. E., an institution which is supplied with funds by the Government. The other day the Prime Minister announced his candidature at Kegalla as my opponent at a public S. L. F. P. meeting at Kegalla. I wonder whether the Hon. Minister himself was present when the announcement was made. I like to know, because there will be many people who are in institutions financed through Government funds who will like to be in the political arena today.

Is this special treatment of an individual or is it the policy of the Government that all individuals in these positions can take part in politics and be announced as future candidates? Is it the policy of the Government to permit these people to carry on electioneering, hold public meetings at the present moment, and get their candidatures announced by no less a person than the Prime Minister? If that is the policy, say so, because there are many others who are in institutions helped from Government funds who are prevented from doing so.

I now want to read the observations of the Auditor-General on some of the activities of the C. W. E. The Auditor-General's Report is very interesting reading in view of the fact that the Government's chief instrument for holding prices is the C. W. E. The Budget speech we recently heard proposed to devolve on this C. W. E. the task of holding the prices of commodities. No wonder prices keep on rising!

This is what the Auditor-General says:

"*Shortages in stocks and losses in transit.*

Shortages in stocks in a large number of depots brought to light in periodical and annual verifications were not correctly accounted. The shortages were not investigated with a view to fixing responsibility."—

Not investigated, and value not recovered, where necessary, from those responsible!

"Instead book balances were merely adjusted to tally with the verified balances."

ප. භා. 11.30

In short—cooked! When shortages are reported no investigations are made. All you do is, you cook the books, and, hey presto, the whole thing is balanced. This is what the Auditor-General states in his latest report:

"In several instances losses in transit of goods from one depot to another had not been reported to the head office for investigation although instructions issued by the head office required that such losses should be reported. The procedure followed in these instances was for the receiving depot taking to the books the quantities stated by the issuing depot as having been despatched and treating the losses as issues."

What is the procedure when you discover losses in transit? You treat the losses as issues and, hey presto, your books are balanced. You have to read these reports.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have read and I have asked for a report.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

What more report? The Auditor-General has reported and the P.A.C. will soon report.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have asked for an explanation. What is to be done?

කේ. හේරත් මයා. (නිකවැරටිය)
(திரு. கே. ஹேரத்—நிக்கவரட்டிய)
(Mr. K. Herath—Nikaweratiya)

Give it to somebody else who can do it.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

Can you do it ?—[*Interruption*].

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

I will read on:

"The stock in trade at December 31. 1962, had not be n correctly valued. Certain items of textiles had been valued above cost on the ground that their market value had increased.

Some items which the annual board of survey r ported as shopsoiled or damaged had been given the same value as goods in good condition."

There are innumerable cases of utter mismanagement, incorrect estimates, and so on. Here is what the Auditor-General says about the estimates:

"In December, 1961, the Permanent Secretary instructed that the main consideration in coming to a d:cision regarding the opening of retail shops which the board of directors has to take into account is the profi'ability of the business done in the shop. The estimates prepared by the Establishment for the board to consider the profitability of opening retail shops varied widely from the results. Actual sales in some of the depots fell by more than 50 per cent. of the estimated sales figures. The expenditure on staff alone exceeded the total estimated cost of running the depots."

The estimates on staff alone exceeded the whole estimate of the expenditure of running the shops! But there I am thankful to the Hon. Minister because a lot of my constituents have got emp'oyment. You see how the expenditure on staff alone has exceeded the total expenditure estimated. A number of people from the Dedigama electorate have been given employment. The unemployment problem, has thus been beautifully solved. What I am about to read now is from the Auditor-General's Report. There was a probe demanded into the activities of the C. W. E. What was the demand?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා. (අවිස්සාවේල්ල)
(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவலை)
(Mr. D. P. R. Gunawardena—Avissawella)

Who were the signatories?

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

I will first deal with the demand and then come to the signatories. Some are sure to blush now. They asked for a Select Committee on the working of the Co-operative Wholesale Establishment. This was the demand:

"That a Select Committee of this House be appointed to inquire into the working of the Co-operative Wholesale Establishment with a view to—

(1) reorganizing the existing organization for the purpose of making it a more efficient and satisfactory instrument for importing essential commodities and distributing the same to the public ;

(2) eliminating waste, corruption, and favouritish."

Then follows the usual formula about calling for papers, etc.,I shall not read that.

I now come to the signatories. They are—Dr. N. M. Perera, Dr. S. A. Wickremasinghe, Mr. P. G. B. Keuneman, Mr. Leslie Goonewardene, Mr. D. B. R. Gunawardena and Mr. D. P. R. Gunawardena.

Now, what is the Hon. Minister's view on that Motion ? Will he allow that probe ? Will the coalition partners demand for that probe to which they have put their signatures—Dr.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩඩ්ලි සේනානායක මයා.]

N. M. Perera, Dr. Colvin R. de Silva and Mr. Leslie Goonewardene of the Coalition smaller half ?

In the light of that demand and in the light of the strong strictures made in the Auditor-General's Report, I like to know whether the Hon. Minister will agree to that Select Committee as well. That is all I wish to say.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)
(கலாநிதி டப்ளியு. தகனுயக்க—காலி)
(Dr. W. Dahanayake—Galle)

The subject of the cost of living is affected most by the activities of two departments that function under the Minister of External and Internal Trade. These two departments are the Department of the Controller of Imports and Exports and the Co-operative Wholesale Establishment and they must take the greater part of the blame for the soaring cost of living. The case against these two departments has been stated again and again on the Floor of this House and I think there is a cast-iron case against them.

I wish first of all to refer you to the illustration that was mentioned by the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) I had in the course of a speech made on the 2nd of July raised the question of the import licence given to Manickam and Bro. of 34, 4th Cross Street, Colombo 11. I pointed out on that occasion that the importation of tinned fish was for a long time the monopoly of the C. W. E. but suddenly in some mysterious manner an import licence was given to Manickam & Bro. Who gave that import licence ? Why was it given ? Were there other applicants for this import licence ? Was there a shortage of tinned fish at the time that this import licence was given ? All these are very pertinent questions to which the Hon. Minister should obtain satisfactory replies.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

May I be permitted to give the information about it now ? I have got the information just now.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனுயக்க)
(Dr. W. Dahanayake)

Yes.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

The hon. Member for Welimada raised this question today and the hon. Member for Galle raised it some time back and has raised it now too. I got the following information from my officials just now.

Manickams were given a licence to import tinned fish for about Rs. 1 million against their outstanding order which was placed when tinned fish came under Open General Licence. This was covered by a letter of credit in favour of their overseas suppliers with whom they had a contract. They were entitled to get this licence. Their imports for about 8 months in 1962-63 amounted to over Rs. 2½ million when this trade was under Open General Licence. After we introduced the import quota system as from 1.1.64 we refused an import quota for 1964 to Manickams because they had already been given a licence for their outstanding orders when it was under O. G. L. That is the position.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனுயக்க)
(Dr. W. Dahanayake)

The Hon. Minister will notice that in the statement that he made certain dates are not clearly given. There was a time when the system of Open General Licence operated. Then not only Manickam & Bros. but various other firms which imported tinned fish as well as other articles were unable to import to the full extent of their quotas. Then there came a ban on the importation of tinned fish.

After the ban started to operate Manickam and Bro. were given the balance of their quota which balance had been due to them at the time that the O. G. L. system existed. What is the purpose of the ban ?

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

After the ban came into operation were there not others who had claims for a balance of the amount allowed under their import licences ? Manickam & Bro. were favoured and granted an allocation of Rs. 16 lakhs for the import of tinned fish. My information is that the amount of imported fish allowed to Manickam & Bro. was to the value of Rs. 16 lakhs and not Rs. 10 lakhs as stated by the Hon. Minister. The Hon. Minister has not been given correct dates. What was the time-lag between the stoppage of the system of Open General Licences and the fish importation order of Manickam & Bro. ? Were there others who were entitled to balances ?

ප්‍රූ. භා. 11.45

However that may be, what took place shows that the concession that was given to Manickam & Bro. was not in the best interests of the consumers. Manickam & Bro. virtually got a monopoly along with the C. W. E. At the time Manickam & Bro. imported Rs. 1½ million worth of tinned fish, the only tinned fish available in the market was the C. W. E. tinned fish and the Manickam variety. I stated on the Floor of this House that this firm of Manickam & Bro. sold a case of tinned fish worth Rs. 40 for Rs. 80 and handed to the purchaser a bill for Rs. 48. I also said on the Floor of this House that that fact can be proved.

You will now see why we charge the Controller of Imports and Exports with being one of the chief agents of the black market in Ceylon. I want to ask a plain question. If there was a shortage of tinned fish, why did the C. W. E. not import more tinned fish ? Why was it that at this particular time co-operative societies in the country were given at the rate of one tin per ten ration books per month ? If you had ten ration books in your family, you could have got one tin of tinned fish per month from a co-operative store. But the market had always a glut of the Manickam variety—of course, at a very much higher price. Within a month or two, V. Manickam & Bro. made a profit of over Rs. 1 million on this deal.

The Hon. Minister told us a little while ago that all these executive actions of giving import licences are done at a staff level by the Department of the Controller of Imports and Exports. I accept that statement.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

There is a committee too of officials other than those of my Ministry.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனயக்க)
(Dr. W. Dahanayake)

I accept that statement and I ask the Hon. Minister to investigate the doings of this committee. This is not the only occasion on which belated import licences have been given. I will give you another classic instance. Nearly four years ago there was a ban on the importation of wristlets and watches but three years after the ban a Borella man succeeded in persuading the Controller of Imports and Exports to grant him a licence to import the balance that was supposed to be outstanding at the time that the Open General Licence prevailed. Then the other businessmen started inquiring as to how this could have happened and the answer that was given was that it was a belated import licence and that the firm concerned had a claim to it three years before when the previous system prevailed. I think that when you abolish a system and get on to a new system—when you abolish the system of Open General Licence and ban the importation of an article—unless the goods are in transit or have come to the port you do not allow future orders. But, in the case of Manickam's fish deal and the Borella man's wristlet deal, that salutary rule was violated with the result that the Pettah circles started whispering things against this Government. We heard these

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

whispers and we asked for a full probe. The department of the Controller of Imports and Exports seems to be always acting in a topsyturvy manner.

Take the question of textile imports. The Hon. Minister had, at a certain stage, desired to bring down the prices of textiles. It was a laudable desire on his part. He summoned a meeting of all the traders concerned and as a result of these negotiations the Controller of Imports and Exports issued a notice stating that quotas could be given on the basis of imports made before 1960. Now, Sir, that point is very significant. Why did he fix the date 1960 ? Why did he say that quotas for the future would be given on the basis of imports prior to 1960 ? And what was the result of fixing this limit ? What had actually happened was that a large number of Ceylonese by descent came into the trade after 1960. These Ceylonese by descent formed themselves into an association and made several representations to the Hon. Minister. Among other things they said that they would be able to sell popular varieties of poplins and fabrics at about Re. 1.50, per yard, because their c.i.f. price is about a rupee per yard. So, these Ceylonese traders by descent undertook to import textiles and sell the popular varieties at Re. 1.50 per yard. We know that the price of a yard of poplin today is between Rs. 3.50 and Rs. 4. What happened ? The Controller of Imports issued a notice stating that quotas would be given on the basis of imports prior to 1960. This regulation of the Controller of Imports shut out completely the traders who were Ceylonese by descent. That is the point I wish to make and that is the point the Hon. Minister should make a careful note of How did it come about that the Controller of Imports and Exports laid down a rule which eliminated the traders who were Ceylonese by descent ? How did it come about that the order of the Controller of Imports and Exports also prevented the possibility of the sale of poplins at Re. 1.50 per yard ?

My good Friend, the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) referred to a Gazette notification which gives a list of those who received textile quotas. I have gone through that list and I find that not even 5 per cent. of those in that list are Ceylonese by descent. Our grievance against the Controller of Imports and Exports is that in mystic fashion he does two things: (1) he massacres the Ceylonese traders ; (2) he raises the cost of living.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

With regard to textile quotas, in 1964 quotas have been given only to Ceylonese.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

That is 1964. What about the years 1961, 1962 and 1963 ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

That is another matter. In 1964, quotas have been given only to Ceylonese. There is no discrimination between the co-called Ceylonese by descent and others. All have been taken as Ceylonese in giving these quotas.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனயக்க)
(Dr. W. Dahanayake)

May I know how you fix the quotas ? Is it not on the basis of previous imports ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

Yes.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனயக்க)
(Dr. W. Dahanayake)

Ah ! There comes the rub. If you fix the quotas on previous imports the Ceylonese traders by descent

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

would be shut out. The sting, they say, is in the tail. You see how the old system works? We except the Controller of Imports to help us in reducing the cost of living.

I want to put a straight question to the Hon. Minister, a question over which he must ponder well before he replies. I do not want an off-hand reply from him. On most of the popular varieties of textiles there is a c.i.f. price which is under Re. 1. There are the varieties that are much in demand, long cloth, white cloth, poplins and fabricks. The price of all these varieties is below Re. 1, c.i.f. Why cannot they be sold in this country at Re. 1.50 a yard? That is the question to which I ask for an answer from the Hon. Minister.

අනික් කාරණය සතොසෙ ව්‍යාපාරය ගැනයි. අද උදේ වරුවේ මේ ගරු සභාව තුළ සතොසෙ ව්‍යාපාරය ගැන ඉතාමත්ම දරුණු විවේචන රාශියක් ඇති වුණා. සතොසෙ ව්‍යාපාරයේ පවතින අසතුටුදායක තත්ත්වය අද මේ රටේ අස්සක් මුල්ලක් නැර සිටින ජනතාව විසින් පිළිගෙන තිබෙන සත්‍යයක්. සතොසෙ ව්‍යාපාරයේ ඇති ඒකාධිකාරියත්, කාර්යශූර නැති කමත් නිසා අද මේ රටේ දුප්පත් ජනතාවට ජීවත්වීමට පිළිවෙලක් නැතිව ගොස් තිබෙනවා. රටේ වෙළඳාමෙන් බොහෝ අංශ රාශියක් සතොසෙට භාර ගත්ත. හොඳ අදහසින් භාර ගත්තට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මේ ඒකාධිකාරය භාර දී තිබෙන්නෙ කාටද? කිසිම කායශ්‍රීරත්වයක් නැති අවංකකමින් සම්පූර්ණයෙන් තොර පුද්ගලයන්ගෙන් පාලනය වන ආයතනයකටයි. අද එය ඔප්පු වී තිබෙනවා. මීට පෙර පසු ගිය අවුරුදුවලදීත් ඒක ඔප්පු වුණා. ඒ වාගේම මේ ගරු සභාවෙදීත් මින් පිටතදීත් එය ඔප්පු වී තිබෙනවා. සමුපකාර තොග වෙළඳ ආයතනය විසින් ගෙන යනු ලබන කළු කඩ ප්‍රතිපත්තිය නිසා, වැරදි වැඩ පිළිවෙළ නිසා, දවසින් දවසම පාරිභෝගිකයාගේ ජීවන වියදම රොකට් එකක් අහසට නඟින්නාක් මෙන් ඉහළ නඟිනවා.

නුවරඑළියෙ රැස්වීමකදී ගරු ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා කළු කඩකාරයන් නැති කරනවය කියා. ගරු වෙළඳ ඇමතිතුමා කළු කඩකාරයන් යයි කියන්නෙ කාටද? සතොසෙ ව්‍යාපාරයට පස්සා දොරෙන් ඇවිත් බඩු ගැනීම සඳහා, සතොසෙ විසින්ම බිහි කර තිබෙන්නා වූ කොටසකටයි. ශත 50 කට මහජනයාට ගත හැකි බඩුව අද ශත 75ක් ගෙවා ගැනීමට මහජනයාට සිදු වී තිබෙන්නෙ සතොසෙ ආයතනය විසින් ගෙන යනු ලබන කළු කඩ ව්‍යාපාරය නිසයි. සතොසෙට ඒකාධිකාරය තිබෙන නිසා ඕනෑම අවස්ථාවකදී සතොසෙට පුළුවනි, මේ රටේ බඩු නැත කියන තත්ත්වයක් ඇති කිරීමට. ඒ මොකද? ඒ ඒකාධිකාරය දී තිබෙන්නෙ අවංක පුද්ගලයන්ට නොවෙයි. ඒ ඒකාධිකාරය නිසා යම් කිසි අවස්ථාවක යම් කිසි බඩුවක් රටේ නැත කියන තත්ත්වයක් ඇති කර තමන්ගේ මිත්‍රයන් වන කළු කඩකාරයන්ට පිටි පස්සා දොරෙන් ඒ බඩුව විකුණා, උසස් මිලකට—සාධාරණ මිලට වඩා උසස් මිලකට—පාරිභෝගිකයාට ගැනීමට සැලැස්වීමේ ඉඩක් සතොසෙට තිබෙනවා. පිටි පස්සා දොරෙන් ඒ බඩු විකුණනවා නම් අන්න එතෙන්දි සතොසෙ ව්‍යාපාරය කළු කඩකාරයන් බිහි කිරීමේ ව්‍යාපාරයක් වෙනවා. ඔය පිළිවෙළට කළු කඩකාරයන් බිහි කරන්නෙ කවුද? ඒ ව්‍යාපාරය කරගෙන යන්නෙ කවුද?

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) උදේ කිව්වා, තමන්ගේ නෑදෑයන් සතොසෙට බඳවා ගැනීමට වෙළඳ ඇමතිතුමා ලක්ෂණ ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවය කියා. විරුඬ පාර්ශ්වයේ ගරු නායකතුමා කිව්වා, දේශපාලන අපේක්ෂකයෙකුත් තමන්ගේ මිත්‍රයකුත් වන තැනැත්තෙකු වෙළඳ ඇමතිතුමා සතොසෙ සභාපති හැටියට දාගෙන ඉන්නවාය කියා. ඔය විධියට බලන විට මේ කළු කඩ ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා මේ රටේ ඇති මූලික ව්‍යාපාරය මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ නෑදෑයන් විසින් පාලනය කරනු ලබන කළුකඩ සතොසෙ ව්‍යාපාරයයි.

ගරු සභාපතිතුමනි, මෙන්න මේ කාරණයට ගරු ඇමතිතුමා පිළිතුරක් දෙනවා ඇත කියා මම බලාපොරොත්තු වෙනවා. දැන්වීමක් ප්‍රසිද්ධ කර ඒ මගින් ඉල්ලුම් පත්‍ර කැඳවා, සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා, සාධාරණ මණ්ඩලයක් ලවා පරීක්ෂා කරවී මෙන් පසු තෝරා ගන්නා ලද සේවකයන් සේවයට බඳවා ගත් ස.තො.සේ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ශාඛාවක් තිබෙනවය කියනව නම් එය තිබෙන්නෙ ලංකාවේ කොයි ප්‍රදේශයේ දැයි අහන්න කැමතියි.

සමුපකාර තොග වෙළඳ සේවයේ එකම ශාඛාවකටවත් සේවකයන් බඳවා ගැනීමේ දී එවැනි සාධාරණ වැඩ පිළිවෙළක් අනුගමනය කර තිබෙනවය කියන්න පුළුවන් කමක් නැහැ. කොහේවත් ඒ විධියට සේවකයන් අරගෙන නැහැ. යම්කිසි ඡන්ද දායක කොට්ඨාශයක ස.තො.සේ. ආයතනයේ ශාඛාවක් විවෘත කරන්නට යෙදුණොත් එය පොදු ආයතනයක් හැටියට සැලකෙන නැනක් නිසා, අඩු වශයෙන් එය පිහිටුවන ප්‍රදේශයේ ඉන්න තරුණ තරුණියන්ට යම්කිසි රක්ෂාවක්වත් ලබා ගැනීමට—සාධාරණ මෙන්ම අපක්ෂපාත සම්මුඛ පරීක්ෂණයක් මගින්—අවස්ථාවක් ඇති වෙන්න ඕනෑ. තම තමන්ගෙ සුදුසුකම් අනුව මිස වෙනත් පක්ෂග්‍රාහී හේතු උඩ තනතුරු නොදෙන තත්ත්වයක් තිබෙන්නටම ඕනෑ. එහෙත් කවර ස්ථානයක හෝ වෙළඳ ශාඛාවක් ඇති කරන්නට පටන් ගත්තත් එවැනි ප්‍රසිද්ධියක් ඒ සම්බන්ධයෙන් දෙන්නෙ නැහැ. සේවකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් දැන්වීමක්වත් පළ කරන්නෙ නැහැ. අපක්ෂපාත, සාධාරණ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සේවකයන් බඳවා ගත්තේ ස.තො.සේ. ආයතනයක් තිබෙනවද කියා ප්‍රශ්න කරන්න කැමතියි. මා නම් කියන්නෙ කොහේවත් නැහැ කියලයි. උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කරනව නම් බදුල්ලෙ ස.තො.සෙ. ශාඛාව විවෘත කළාට පස්සෙ බදුල්ලෙ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාණන්ගෙ කාර් එක පදවන ටියැදුරු මහත්මයට එතන මුරකරු හිටියට පත්වීම දුන් ආකාරය ගැන සඳහන් කරන්න පුළුවනි. එයා දවාලට එලවනව මන්ත්‍රීතුමාගේ කාර් එක. රෑට ස.තො.සේ. ශාඛාව මුර කරනව. මා නියෝජනය කරන කෙට්ඨාශයේ නම් තවමත් ස.තො. සෙ. ශාඛා එකක්වත් නැහැ. එහෙත් එය ඌවේ සිදු වුණ දෙයක් ගැනයි කිවවෙ. ඉතින් ඕවත් වැඩද?

අ. භා. 2.30

මෙන්න මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන නිසා තමයි, අද එන්න එන්නම දූෂණ වැඩි වෙමින් පවතින්නෙත්. එළි වන විට රෙදි බේල් පිටින් පිට වෙලා ගිහිල්ල. කොහොමද මේව සිද්ධ වෙන්නෙ? මේවට මොකද කරන්නෙ? කෙළඹ සිට බදුල්ලට එන අතර මග බලංගොඩදී වාහනයක් ඇල්ලුවය කියනව. මොකක්ද එහි ප්‍රතිඵලය? ඇල්ලූ කෙනෙක්වත් ඇල්ලූ දෙයක්වත් නැහැ? ඇල්ලූ එක් කෙනත් නැහැ. ඇල්ලූ බඩුත් නැහැ. මොකද කියල ඇහුවම මන්ත්‍රීතුමා ඇවිල්ල බේරගෙන ගියයි කියනව. ඔන්න ඔහොමයි වෙන්නෙ. මොකක්ද මේකෙ තේරුම කියල කාගෙන්ද අහන්නෙ?

පී. ආර්. රත්නායක මයා.
(திரு. பீ. ஆர். ரத்ணயக்க)
(Mr. P. R. Ratnayake)

බදුල්ලේ මන්ත්‍රීතුමා (ඩී. එච්. බණ්ඩාර මයා.) ඒවා කළාය කියනවද?

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

බොරු චෝදනා ඉදිරිපත් කරන්න හොඳ නැහැ. ඔප පු කරන්න පුළුවන් නම් ඔප්පු කරන්න ඕනෑ.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

කරුණා කරල මගෙ කථාව කරගෙන යන්න මට ඉඩ දෙන්න. මා කථා කළාට පස්සෙ කථා කරන්න.

පී. ආර්. රත්නායක මයා.
(திரு. பீ. ஆர். ரத்ணயக்க)
(Mr. P. R. Ratnayake)

බදුල්ලේ මන්ත්‍රීතුමා පැමිණ බේරා ගත්තය කියලද ඔය කියන්නෙ?

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

කොයි දේ කිව්වත් කමක් නැහැ, බොරු චෝදනාවල් ගේන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

මෙය ශුද්ධ කළ යුතුව තිබෙනව. සමුපකාර තොග වෙළඳ ආයතනයේ නායකයට ඡන්දාපෙක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වීමේ අභිලාෂය ඇතිව එය සාර්ථක කර ගැනීම සඳහා තමන්දරණ තනතුරෙන් වාසියක් ලබමින් දේශපාලන වේදිකාවට නගින්න ඉඩ දෙනව නම් අනෙක් තැන්වල ඉන්න නායකයින්ටත් ඒ අයිතිවාසිකම ලබා ගන්න ඉඩ දෙනවද? මේ ආණ්ඩුවෙ ප්‍රතිපත්තිය ස.තො.සේ. නායකයට දේශපාලන වේදිකාවට නගින්න ඉඩ දීම නම් ඒ ප්‍රතිපත්තිය රජයේ සේවයේත් රජයෙන් පාලනය වන වෙනත් ආයතනවලත් ඉන්න වෙනත් අය සම්බන්ධයෙන් අනුගමනය කරන්න කැමතිද, ලෑස්තිද කියා අහන්න කැමතියි. අනෙකුත් ආයතනවලත් මණ්ඩලවලත් සිටින නායකයින්ටත් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවද කියා අහන්න කැමතියි. රටට බඩු බාහිරාදිය සපයන ඒකාධිකාරයක් රජය විසින් සමුපකාර තොග වෙළඳ ආයතනයට දී තිබෙනව. රජයේ ප්‍රතිපත්තිය එය නම් ඒ අනුව කටයුතු කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් එතන නායකයට පමණක් විශේෂ දේශපාලන අයිතිවාසිකම් දීමත්, එම අයිතිවාසිකම් වෙනත් උදවියට නොදීමත් ගැන ප්‍රශ්න නොකර බැහැ. සුළු සේවකයන්ටත්, රජය මගින් පවත්වාගෙන යනු ලබන මණ්ඩලවල ඉන්න අයටත් දේශපාලන අයිතිවාසිකම් හෙවත් දේශපාලන කටයුතුවල යෙදීමේ නිදහස දෙන්න පුළුවන් විධියට ප්‍රතිපත්තියක් පිළිගන්න යන බවට ආරංචියක් තිබෙනව. ඒ නිසා ඒ ගැන පිළිතුරක් තමුන්නාන්සෙගෙ පිළිතුරු කථාවෙන් අපි බලාපොරොත්තු වෙනව. ඒ නිදහස දෙනව නම් දෙනතුරු ඒ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදන්න අදහස් කරනව වෙන්න ඇති.

අනෙක් ප්‍රශ්නය අහන්නෙ, බීඩි ආනයන අපනයන ප්‍රතිපත්තිය ගැනයි. බීඩි එතීමට ගන්න කඩුම්බේරිය කොළ ලක්ෂ ගණන් වටිනා තොග අවුරුදු පතා පිටරටින් ගෙන්වනව. මේ වර්ෂයේ පළමු වන හය මාසයේදී රුපියල් ලක්ෂ දහයක් පමණ වෙන් කර තිබුණු බව මම දන්නවා.

බීඩි එතීමට සුදුසු, ඉන්දියාවෙන් ගෙන්වන කොළවලට සමාන, කඩුම්බේරිය කොළ අද පහළ ඌවේ තිබෙන බව අපි දන්නව. කෑලෑ දෙපාර්තමේන්තුව අද ඒ ගැන විශේෂයෙන් තටම තටමා වැඩ පිළිවෙළක් ගෙන යනව. තටමන්න වුවමනාවක් නැහැ. දකුණු ඉන්දියාවෙ තිබෙන කඩුම්බේරිය කොළමයි එහෙත් තියෙන්නෙ. මා ඒවා සොයා බලා තියෙනව. මා ළඟ ඒ ගැන විස්තර අඩංගු රිපෝර්තුවක් තියෙනව. එහෙත් අද එය ගෙනැවිත් නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

දැනට තිබෙන කඩුම්බේරිය ගස් දෙතුන් වරක් කප්පාදු කළහොත් සමහර විට නියම කොළ ලැබෙන්නට පුළුවනි.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

ඉන්දියාවේ තිබෙන කඩුම්බේරිය ගස් මයි, ලංකාවෙ තිබෙන්නෙත්. කිසිම වෙනසක් නැහැ. හැබැයි බූව සහිත කඩුම්බේරිය වර්ගයකුත් තිබෙනවා. ඒ වගේම බූව නැති නියම කඩුම්බේරියත් තිබෙනවා. දැනට ඒ කඩුම්බේරිය වැවීම පිණිස අක්කර 2,000 ක් වෙන් කොට තිබෙනවා. බීඩි කර්මාන්ත සංගමයකුයි, එහි කඩුම්බේරිය වවන්නේ. නමුත් ඒ සංගමයේ සිටින අයගෙන් සියයට 99 දෙනකු පමණ විදේශිකයන් බව මතක් කරන්න කැමතියි. ලංකාවේ අයට තවම මේ වැඩ ගැන පුරුද්දක් නැතිවා වෙන්නට පුළුවනි. ඉහතින් කියන ලද සංගමය දැන් මූලික වශයෙන් අක්කර 2,000ක කඩුම්බේරිය වවාගෙන යනවා. පසුගිය අවුරුද්දේදීද ඒ සඳහා ක්‍රියා මාර්ගයක් ගන්නා ලද නමුත් ඇට සිටුවීම වර්ෂා කාලයේදී සිදු නොවුණු නිසා ඒ වර්ෂයේ වැවිල්ල සාර්ථක වුනේ නැහැ. කෙසේ හෝ වේවා, උඩරට තේ වතුවල දැනට ඇති වී තිබෙන ප්‍රශ්නය වගේ ප්‍රශ්නයක් ඇති විය හැකි වන පරිදි වැරදි පියවරක් ගත යුතු නැති බව මතක් කරන්නට කැමතියි. නියපොත්තෙන් කැඩිය හැකි ගස පොරොවෙන් කපන තත්ත්වයකට පත් කරන්න නම් එපා. ලාංකිකයන් කාට හෝ වේවා කඩුම්බේරිය වැවීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිසියම් වැඩ පිළිවෙළක් යොදන ලෙස මතක් කරන්නට කැමතියි. එක්කෝ සමුපකාර සමිතිවලට මේ සඳහා අවස්ථාවක් ලබා දිය හැකියි. එහෙම නැත්නම් තරුණයන්ගේ සමිති පිහිටුවා රජයෙන්ද ආධාර දී කඩුම්බේරිය වැවීමට අවස්ථාවක් දිය හැකියි. එහෙමත් නැත්නම් පෞද්ගලික වශයෙන් වැඩ කරගෙන යා හැකි ස්වදේශිකයන්ට මේ සඳහා අවස්ථාව දිය හැකියි. හැබැයි, ඉන්දියානු සංගම් මගින් මේ වැඩේ කර ගෙන ගියත් පිටරට ඇදී යන විශාල මුදලක් ලංකාවේ ඉතිරි වෙනවා. දැනට රුපියල් 20 ලක්ෂයක තරම් මුදලක් බිඩ් කොළ ගෙන් වීම සඳහා පිටරටට ඇදී යනවා. ඒ මුදල ලංකාවේ නතර කර ගන්නට පුළුවන් නම් එය වැදගත් කාරණයක්. කම්කරු දෙපාර්තමේන්තුව දැන් මේ කඩුම්බේරිය කොළ ගැන පර්යේෂණ පවත්වා ඒවා නියම කඩුම්බේරිය කොළ බව තීරණය කර තිබෙනවා. අවුරුදු 2 කට පෙර අවසන් තීරණය දී තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)
(Mr. Lakshman Jayakody—Divulapitiya)

මේ ගැන එක කාරණයක් ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි. කඩුම්බේරිය කොළ ගැන මෙන්ම බීඩි අපනයනය වැනි සියලුම කරුණු ගැන පරීක්ෂා කර බැලීම පිණිස කොමිටියක් පත් කරගෙන කටයුතු කරගෙන ගියා. මමත් ඒ කොමිටියේ සාමාජිකයෙක්. කඩුම්බේරිය කොළ ගැන අප නොයෙකුත් වාර්තා ලබා ගත්තා. ගරු මන්ත්‍රීතුමා කියන කඩුම්බේරිය කොළ නම් පාවිච්චියට ගත නොහැකි බව කෘෂිකර්ම දෙපාර්ත මේන්තුව තීරණය කර තිබෙනවා.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා කී කාරණය ගැන පිළිතුරු දෙන්න කැමතියි. එතුමා සඳහන් කළෙ යම්කිසි කොතැකු විසින් එතුමාට කී දෙයකුයි. නමුත් මේ කාරණයේදී මා නැවත වරක් කියන්නේ, ලංකාවේ තිබෙන කඩුම්බේරිය කොළ, [illegible] ඉන්දියාවේ තිබෙන කඩුම්බේරිය කොළත් අතර කිසිම වෙනසක් නැති බවයි. පේරාදෙණියේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ ඒ ගැන පර්යේෂණ පවත්වා එවැනි තීරණයකට පැමිණ තිබෙනවා.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

කොළවල සමානකමක් තිබෙන්නට පුළුවනි. තේක්ක වවන විට බුරුමයේත් ලංකාවෙත් වවන්නේ එකම වර්ගයේ තේක්ක ඇටයි. නමුත් ලංකාවේ තේක්කත්, බුරුමයේ තේක්කත් අතර වෙනසක් තිබෙනවා. ඒ වගේ එකම වර්ගයේ කඩුම්බේරිය ඉන්දියාවේත් ලංකාවේත් වවන නමුත් ඒවායේත් වෙනසක් ඇති වෙන්නට පුළුවනි.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

තේක්ක වැවිල්ල වගේ නොවෙයි, මේක. ඉන්දියාවේ තිබෙන්නේ ලංකාවට හැතැප්ම 20 ක් ඈතින්. ඒ නිසා ගරු ඇමතිතුමා මේ ගැන තව දුරටත් සොයා බලන්න. මා කියන කථාව ඇත්තදැයි දැන් වුණත් කැළෑ දෙපාර්තමේන්තුවට දුර කථනයෙන් කථා කර බලන්නට පුළුවනි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ලංකාවේ කඩුම්බේරිය තුන් හතර වරක් කප්පාදු කළොත් සමහර විට අවුරුදු 5 කින් 6කින් වුවමනා කරන නියම කොළ ලැබෙන්නට පුළුවන් වේවි.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

තේ වවනවා වගේ කරන්න ඕනෑද? නමුත් දැන් බීඩි කර්මාන්තකරුවන්ගේ සංගමයක් මේ වැවිල්ල සඳහා රුපියල් 25,000ක් තරම වියදම් කර තිබෙනවා. ඉන්දියාවේ තිබෙන කඩුම්බේරිය කොළම ලංකාවේ කඩුම්බේරිය ගසෙන්ද ලැබෙන බව [illegible] කියනවා. ක්‍රමවත් සැලැස්මක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

අනුව පර්යේෂණ පවත්වා රපෝර්තු ලබා ගෙන බලන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, කෑලෑ දෙපාර්තමේන්තුවත් මේ ගැන වග කියනවා නම් කෙළින්ම ඉදිරියට යන්න. එවිට අපේ පිටරට ඇදී යන විශාල මුදලක් මේ රටේ ඉතිරි කර ගන්න පුළුවනි. එපමණක් නොව, සැහෙන පිරිසකට රක්ෂා ලබා දෙන්න පුළුවනි. බීඩි කොළ ගෙන්වීම සඳහා දැනට හය මසකට වරක් රුපියල් දස ලක්ෂයක් පමණ වියදම් කරන්නට සිදු වී තිබෙනවා. පිටරටින් බීඩි කොළ ගෙන්වීමට කොපමණ මුදලක් වෙන් කර තිබෙන බව කියා මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි. උදාහරණයක් වශයෙන් කියනවා නම්, අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා පිටරටින් බීඩි කොළ ගෙන්වනවා. සෑම හය මාසයකට වරක්ම බීඩි කොළ ගෙන්වීම සඳහා රුපියල් දස ලක්ෂයක් වෙන් කරනවා. මේ සම්බන්ධයෙන් අවංක පියවරක් ගත්තොත් පළමු වැනි පියවරේදීම මේ මුදල රුපියල් පන් ලක්ෂයකින්වත් අඩු කර ගන්නට පුළුවන්.

ඊළඟට මට කියන්නට තියෙන්නෙ ට්‍රැක්ටර් යන්ත්‍ර සම්බන්ධවයි. තෙත් කලාපයෙන් වියළි කලාපයෙන් සමතලා බිම්වල ගොවි කර්මාන්තය සඳහා—කුඹුරු කර්මාන්තය සඳහා—විශේෂයෙන් වියළි ප්‍රදේශයේ සමතලා බිම්වල කුඹුරු කර්මාන්තය සඳහා ඉතාමත් විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා, ට්‍රැක්ටර් යන්ත්‍රයෙන්. හරකුන් ලවා ගන්න වැඩ ඒ ට්‍රැක්ටර් යන්ත්‍රවලින් කිරීමෙන් සියයට හතළිහක පමණ වාසියක් ලැබෙන බව මම කියන්න සතුටුයි. අද සමතලා ප්‍රදේශවල කුඹුරු හාන්නෙත්, ගොයම් කපා පාගන්නෙත් ට්‍රැක්ටර් යන්ත්‍රයෙන්. එම නිසා ගොවියාට විශාල සහනයක් ලැබෙනවා. ට්‍රැක්ටර් යන්ත්‍රයෙන්. විශේෂයෙන් ඉක්මනින් දියුණු වෙන්න යන මයියංගනය, උතුරු-මැද, දකුණු ඌව වැනි ප්‍රදේශවල හරක් කවා ගැනීමට අද තණ බිම් නැහැ. සමහර විට මේ ප්‍රශ්නය ගැන කියන විට මේ ගැන නොදන්නා මන්ත්‍රීවරු හිනහ වෙන්න පුළුවන්. ඕනෑ තරම් තණ පිට්ටනි තියෙනවය කියන්න පුළුවන්. පස්සර මන්ත්‍රීතුමා මගේ කීම ගැන එකඟ වෙනවා. මම ඒ ගැන සන්තෝෂයි. උදාහරණයක් වශයෙන් කියනවා නම්, ඇති මොලේ ව්‍යාපාරයේ ගොවියකුට සාවච්චි කරනවා. අද තත්ත්වයේ හැටියට තමන්ගේ හරකුන්ට තණ කවා ගැනීමට හැතැප්ම 10ක්, 15ක් දුර ඔවුන් ගෙන යන්න සිදු වෙනවා. එහෙම ගෙන යන්න ඔවුන්ට පුළුවන්කමක් නැහැ. එසේ ගෙන යාමට විශාල මුදලකුත් වියදම් වෙනවා. එසේ ගෙන ය මෙදි හරකුන් නැති වෙනවා. එම නිසා අද වියළි කලාපයේ කෘෂිකාර්මික ප්‍රදේශවල මී හරකුන් පාවිච්චි කිරීම සියයට 90 කින් අඩු වෙලා තියෙනවා. තව අවුරුදු දෙකක් යන විට මී හරකුන් පාවිච්චි කිරීම සම්පූර්ණයෙන්ම නැති වෙලා යනවා.

එපමණක් නොවෙයි, නවීන ලෝකයේ ඉදිරි ගමන අනුව කෘෂිකාර්මික කටයුතු වලට යන්ත්‍ර පාවිච්චි කිරීම අද ශීඝ්‍ර ලෙස වැඩි වෙනවා. නවීන ප්‍රතිපත්ති අනුව මුළු ලෝකයේම කෘෂිකර්මය සඳහා අද යන්ත්‍ර යොදවනවා. ඒ නිසා වී ගොවිතැනට ට්‍රැක්ටර් යන්ත්‍රය අවශ්‍යමයි. එක ට්‍රැක්ටර් යන්ත්‍රයක් සඳහා තමුන්නාන්සෙට විදේශීය අරමුදල්වලින් වියදම් කරන්න වන්නෙ රුපියල් 10,000 ක් පමණයි. රුපියල් 10,000 ක් වියදම් කර ගෙන්වන ට්‍රැක්ටර් යන්ත්‍රයක් අබලන් වීමට පෙර ඒ යන්ත්‍රයෙන් රුපියල් 50,000 කට වැඩි සේවයක් ගන්නට පුළුවන් බව සොයාගෙන තිබෙනවා. ඒ සේවය ලැබෙන්නෙ වීවලිනුයි. ඒ පිළිවෙළට ඒ මුදලට සියයට පන් සියයක ආදායමක් වී නිපදවීමෙන් ලබා ගන්න පුළුවන්. ට්‍රැක්ටරයක් ලබා ගන්න රුපියල් 10,000 ක් වියදම් කළාම ඒ වෙනුවට රුපියල් 50,000 ක ආදායමක් එන්නෙ වීවලිනුයි. ලංකාවේ නිපදවන සෑම වී බුසලක් නිසාම එහි වටිනාකම හා සමාන විදේශීය අරමුදලක් ඉතිරි කර ගන්න පුළුවන් බව කවුරුත් දන්න කරුණක්. ඒ නිසා ට්‍රැක්ටර් යන්ත්‍ර ගෙන්වීමේ තහනම ලිහිල් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවේදී ට්‍රැක්ටර් යන්ත්‍ර ගෙන්වීම නවත්වා තිබෙනවා, විදේශීය අරමුදල් පිළිබඳ ප්‍රශ්නය නිසා. ඒ පිළිබඳ නීති රීති ඒ තරම්ම තද කරන්ට එපා. ට්‍රැක්ටර් යන්ත්‍රයක්, කාර් එකක් ලොරියක් වගේ දෙයක් නොවෙයි. එය අපේ රටට අවශ්‍ය මයි. විශේෂයෙන් නොදියුණු ප්‍රදේශවල —ලොරි යන්න බැරි පාරවල—ලී, දර ආදි බඩු බාහිරාදිය ගෙන යාමටත් ට්‍රැක්ටර් යන්ත්‍ර අවශ්‍ය වෙනවා. ඒ නිසා ට්‍රැක්ටර් යන්ත්‍ර ගෙන්වීම නැවත ආරම්භ කරන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ට්‍රැක්ටර් යන්ත්‍රවලට අවශ්‍ය අතිරේක කොටස් ලබා ගැනීමත් පහසු නැහැ. ඒවා ගෙන්වන්නෙත් නැහැ. මේ නිසා ඒ ප්‍රදේශවල ඇති වේගත යන තත්ත්වය ඉතාම භයානකයි. ට්‍රැක්ටර් මගින් අක්කරයක් සී සෑම සඳහා ගන්න මුදල ක්‍රමයෙන් වැඩි වේගත යනවා. දැන්ට අවුරුද්දකට පෙර මහියංගනය ප්‍රදේශයේ ට්‍රැක්ටරයක් මගින් කුඹුරු අක්කරයක් හා දීමට රුපියල් 30 යි, අය කළේ. නමුත් දැන් රුපියල් 50 ක් ඉල්ලනවා. ට්‍රැක්ටර් අළුතෙන් ගෙන්වන්නෙ නැති බවත්, අමතර කොටස් අළුතෙන් ගෙන්වන්නෙ නැති බවත් ට්‍රැක්ටර් අයිතිකාරයෝ දන්නවා. ඒ නිසා ට්‍රැක්ටර් අයිතිකරුවන් අය කරන ගාස්තු වැඩි කරනවා. මේකෙන් වෙන්නෙ ගොවිතැන් කිරීමට හරකබාන්න් ට්‍රැක්ටරයෙන් නැති වීමයි. එම නිසා ඇමතිතුමා මේ පිළිබඳව ඉක්මනින් පියවරක් ගත යුතු බව මතක් කර සිටිනවා. එසේ නැති වුණොත්, ට්‍රැක්ටර් ගෙන්වන්නෙ නැති වුණොත්, වියලි කලාපය දියුණු කිරීමට පුළුවන් වෙන්නෙ නැහැ. ලක්ෂ ගණනක්, දහස් ගණනක් නොගෙන්නුවත් සීමා සහිත ප්‍රමාණයක්, අවශ්‍යම ප්‍රමාණයක් ගෙන්වීමටත්, අනික් බඩු ගෙන්වීමටත්, යම්කිසි සහනයක් සලසා දෙනවා ඇත කියා මම බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් එක් කාරණයක් ගැන සඳහන් කරන්නට කැමතියි. එනම්, සතොසේ ආයතනය ගැනයි. අපේ යුතුකමක් තිබෙනවා, අපේ අයිතිවාසිකමක් තිබෙනවා මෙවැනි අවස්ථාවකදී සතොසෙ ආයතනය වැනි සථානවල කෙරෙන දූෂණ සොයා බැලීම සඳහා යම්කිසි පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලා සිටීමට. මෙම වැදගත් අවසථාවෙදි මා රජයෙන් ඉල්ලා සිටිනවා, වැඩිකල් නොගොස්, ළඟදීම, සතොසේ ආයතනයේ කෙරෙන දූෂණ සොයා බැලීමට යම්කිසි කොමිටියක් නැත්නම් මණ්ඩලයක් පත් කරන ලෙස මීට නිසි පිළිතුරු පසුව දෙනවා ඇත කියා අවසාන වශයෙන් බලාපොරොත්තු වෙනවා.

අ. භා. 2.45

එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මුතූර් පළමුවන)

(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

கௌரவ தலைவரவர்களே, உள்நாட்டு, வெளிநாட்டு வர்த்தக விநியோக அமைச்சரின் மானியத்திலே சில குறிப்புக்களைக் கூற நான் ஆசைப்படுகின்றேன். எனக்கு முன் பேசிய கௌரவ காலிப் பிரதிநிதி (கலாநிதி டபிள்யு. தஹநாயக்க) அவர்களும், எனது மதிப்புக்குரிய எதிர்க்கட்சித் தலைவர் (திரு. டட்லி சேனநாயக்க) அவர்களும், சற்று முன் பேசிய கௌரவ மஹியங்கனைப் பிரதிநிதி (திரு. லி. பி. ஜே. செனிவிரத்ன) அவர்களும் உள்நாட்டு வெளிநாட்டு வர்த்தக விநியோக அமைச்சரின் கீழுள்ள பல இலாகாக்களிலும் எவ்வளவு ஊழல்கள் நிறைந்திருக்கின்றன என்பதைப் பற்றி அழகாகவும் ஆணித்தரமாகவும் எடுத்துக் கூறினார்கள். எனவே, நான் நீண்ட நேரத்துக்குப் பல பிரச்சினைகளைக் கிளப்பிக் கொண்டிருக்காமல் வேறு சில விஷயங்களையும், எனது தொகுதி சம்பந்தமான சில முக்கிய அம்சங்களையும் பற்றி பேச விரும்புகின்றேன்.

கௌரவ வெலிமடைப் பிரதிநிதி (திரு. கே. எம். பீ. ராஜரத்ன) அவர்கள் பேசும் பொழுது வர்த்தகர்களுடைய நிலையைப் பற்றிக் குறிப்பிட்டார். இந்த நாட்டில் வர்த்தகர்களாக இருக்கக் கூடியவர்கள், இருக்க வேண்டியவர்கள் சிங்களவர்களாகவே இருக்க வேண்டும் என்ற தொனியில் அவர் பேசினார். அது அவ்வளவு நல்லதல்ல என்பதை நான் அவருக்கு எடுத்துக் கூற வேண்டியிருக்கின்றது. பல ஆண்டுகளாக எங்களது நாட்டில் வாசம் செய்து இந் நாட்டு மக்களுக்கு எவ்வளவோ அரும்பெரும் தொண்டுகளையெல்லாம் செய்தது மாத்திரமன்றி, வர்த்தகத்துறையை மிகவும் சிறப்பான நிலைக்குக் கொண்டு வந்ததுடன் இந்த நாட்டிலேயுள்ள இலங்கையர்கள் வர்த்தகத் துறையில் நல்ல அனுபவம் பெறக்கூடிய வழிகளையும் எடுத்துக் காட்டிய எங்களுடைய அண்டை நாட்டவர்களாகிய இந்திய வர்த்தகர்களை நாங்கள் ஒருபோதும் மறக்கக் கூடாது. இந்திய வர்த்தகர்களை கௌரவப் பிரதிநிதிகளிற் பலர் கண்டிக்கின்றார்கள். அவர்களை இந் நாட்டில் வர்த்தகம் செய்ய விடக் கூடாது என்று கூறுகிறார்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

கள். ஆனால், அவர்கள் இந்த நாட்டுக்குச் செய்து வரும் நன்மைகளைப் பற்றியும் அவ்விதம் பேசியவர்கள் மறக்காமலிருந்தால் நன்றாக இருக்கும் என்று நான் கூற விரும்புகின்றேன்.

இலங்கையர் மட்டும் வர்த்தகத்தைக் கையாண்டு, எல்லா வர்த்தகத்தையும் தேசியமயமாக்கி எங்கள் நாடு தாழ்கவே முன்னேறக் கூடிய நிலை வரும்வரை இந்திய வர்த்தகர்களை மதித்து நடக்க வேண்டும் என்று கௌரவ அமைச்சரவர்களுக்கு எடுத்துக் கூற விரும்புகின்றேன். கடுமையான கட்டுப்பாடுகளை விதித்து, வர்த்தகத்தைக் கட்டுப்படுத்தினால் கள்ள மார்க்கட்டும், ஊழல்களும்தான் பெருகும் என்பதையும் நான் இங்கே குறிப்பிட வேண்டியிருக்கின்றது. ஏனெனில், நாங்கள் எவ்வளவு கடுமையான சட்டங்களை வகுக்கின்றோமோ அவ்வளவு விரைவாக கொள்ளை இலாபமடிக்கும் நோக்கத்துடன் இருப்பவர்களும் தங்களுடைய தொழிலைச் செய்து கொண்டே போவார்கள். எனவே, வர்த்தகம் சம்பந்தமான விஷயத்தில் கௌரவ அமைச்சர் மிகவும் நியாயமான முறையில் நடந்து இந்த நாட்டிலுள்ள இலங்கையர்களான வர்த்தகர்களை, அவர்கள் தமிழர்களாக இருந்தாலும் சரி, சிங்களவர்களாக இருந்தாலும் சரி, இஸ்லாமியர்களாக இருந்தாலும் சரி, அவர்கள் நல்ல நிலையை அடையும் வரையில் இந்திய வர்த்தகர்களுக்கு துரோகம் செய்யாமலும், அவர்களுடைய தொழில்களை அநீதியான முறையில் பறிக்காமலும் இருக்க வேண்டுமென்று அரசாங்கத்தையும், கௌரவ அமைச்சர் அவர்களையும் கேட்டுக் கொள்ளுகின்றேன்.

அடுத்ததாக கூட்டுறவு மொத்த விற்பனை நிலையம் பற்றியும் பலர் இங்கே பேசினார்கள். விசேடமாக கௌரவ எதிர்க்கட்சித் தலைவரவர்களும், கௌரவ காலிப் பிரதிநிதி அவர்களும் இன்று இந்த ஸ்தாபனம் எவ்வளவு கேவலமான முறையில் நடைபெறுகின்றது என்பது பற்றிப் பல உதாரணங்களைக் கூறி விளக்கினார்கள். இந்தச் சந்தர்ப்பத்தில், நீங்கள் இந்தக் கூட்டுறவு மொத்த விற்பனை ஸ்தாபனங்களை எந்தக் கொள்கையடிப்படையில் நிறுவினீர்கள் என்று கேட்க விரும்புகின்றேன். கூட்டுறவு மொத்த விற்பனவு ஸ்தாபனம் நன்மைகளைச் செய்வதற்குப் பதிலாக கெடுதல்களையே கூடுதலாகச் செய்து

கொண்டு வருகின்றதென்பதை இச்சபையிலே நான் ஆணித்தரமாகக் கூற வேண்டியிருக்கிறது. இந்த ஸ்தாபனத்தில் இடம் பிடிப்பவர்கள் பலர் அரசாங்கக் கட்சியைச் சார்ந்த பல அங்கத்தவர்களது உறவினர்களாகவோ அல்லது அரசாங்கக் கட்சி அங்கத்தவர்களுக்குப் பந்தம் பிடிப்பவர்களாகவோதான் இருக்கிறார்கள். இப்படியானவர்கள்தான் இந்த ஸ்தாபனத்திலே தங்களுடைய சுயநலத்தை வலுப்படுத்திக் கொண்டிருக்கிறார்கள். ஊழல்கள் நிரம்பிய எத்தனையோ பல நோக்குக் கூட்டுறவுச் சங்கங்களும் சமாஜங்களும் கூட்டுறவு மொத்த விற்பனவு ஸ்தாபனங்களும் இந்த நாட்டில் இருந்து கொண்டிருக்கின்றன. இவைகளைத் திருத்த கௌரவ அமைச்சர் அவர்கள் முயற்சிகளை மேற்கொள்ள வேண்டும். கூட்டுறவு மொத்த விற்பனவு ஸ்தாபன நிலையங்கள் எந்தெந்த இடங்களில் நிறுவப்பட வேண்டுமென்று மக்கள் விரும்புகிறார்களோ அந்தந்த இடங்களில்தான் அவைகள் நிறுவப்பட வேண்டும். அதைவிட்டு விட்டு இத்தகைய நிலையங்களைச் சிலரைத் திருப்திப் படுத்தும் நோக்கத்துடன் நிறுவுவது தவறான செயலாகும். சில தனிப்பட்டவர்களுக்குச் சலுகைகள் செய்யும் முகமாகத்தான் இத்தகைய நிலையங்கள் பல இடங்களில் நிறுவப்படுகின்றன. உதாரணமாகத் திருமலையை எடுத்துக் கொள்வோம். தென்கிழக்கு ஆசியாவிலேயே புகழ் வாய்ந்த ஒரு பட்டினமாகத் திருமலை திகழ்கின்றது. இத்தகைய முக்கியத்துவம் வாய்ந்த ஒரு பட்டினத்திற்கு ஒரு கூட்டுறவு மொத்த விற்பனவு நிலையம் வேண்டுமென்று பல மாதங்களாக அப்பகுதி மக்கள் கிளர்ச்சி செய்து கொண்டு வருகிறார்கள். ஆனால் இப் பகுதி மக்களது கோரிக்கை இதுவரை கவனிக்கப்படவில்லை. ஆனால் திருமலையிலும் பார்க்கச் சிறிய சிறிய கிராமங்களில் கூட்டுறவு மொத்த விற்பனவு நிலையங்களை அமைக்க கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுத்து வருகின்றார்கள். ஒரு மாவட்டத்தில் உள்ள எல்லா மக்களும் நன்மையடையக் கூடிய விதத்தில் இத்தகைய நிலையங்களைக் கௌரவ அமைச்சர்ர் அவர்கள் திறக்க நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். இந்தச் சந்தர்ப்பத்திலே நான் பல கூட்டுற

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வுச் சமாஜங்களைப் பற்றிய நடவடிக்கைகளைக் குறிப்பிட வேண்டியிருக்கிறது. சில கூட்டுற வுச் சங்கங்களைச் சிலர் தமது சுயநலத்திற் காக தமது ஏக போக உரிமையாகப் பாவிக் கிறார்கள். இது சம்பந்தமாகப் பல தடவை களில் பல கேள்விகளையும் எழுத்து மூல மாக நான் இச்சபையிலே கேட்டுள்ளேன். எனது தொகுதியிலுள்ள பல சங்கங்களைப் பற்றியும் பல நோக்குக் கூட்டுறவுச் சங்கங் களைப் பற்றியும் அவை செயற்படும் விதம் பற்றி விசாரணை நடத்தும்படியும் நான் இச்சபையிலே கேட்டிருக்கிறேன். ஆனால் என்னுடைய பல கேள்விகளுக்குத் திருத்திகரமான பதில் இன்றுவரை இச் சபையிலே சமர்ப்பிக்கப்படவில்லை. இந்த ஊழல்கள் சம்பந்தமாக எத்தனையோ கேள்வி களை இச்சபையிலே நான் கேட்டும் திருப்தி கரமான பதில் கிடைக்கவில்லை என்பதை மிகுந்த வருத்தத்துடன் நான் கூற வேண்டி யிருக்கிறது. தனிப்பட்ட எவர் மீதும் எனக் குக் கோபம் கிடையாது. பலநோக்குக் கூட் டுறவுச் சங்கங்கள் நல்ல முறையில் வளர வேண்டுமென்பதே எனது நோக்கமாகும். இந்தச் சங்கங்கள் நல்ல முறையில் நாட்டிற் குத் தொண்டுபுரிய வேண்டும் என்பதே எனது ஆசை. ஊழல்கள் மிகுந்த சங்கங் களைப் பரந்த நோக்கத்தோடு சீர் திருத்தி கௌரவ அமைச்சர் அவர்கள் பொது மக்க ளுடைய பாராட்டுதல்களைப் பெற வேண்டும். பொது மக்கள் பாராட்டக் கூடிய முறையில் ஊழல்கள் மிகுந்த சங்கங்களைக் கௌரவ அமைச்சர் அவர்கள் சீர் திருத்த வேண்டும். கெட்டவர்கள் அதிலே தலை நீட்டிக் கொண்டி ருந்தால், அவர்கள் யாராயிருந்தாலும் சரி, உங்களுடைய கட்சியைச் சேர்ந்தவர்களா யிருந்தாலும் சரி, உங்களுடைய அனுதாபி களாக இருந்தாலும் சரி அவர்களை அகற்ற நீங்கள் தயங்கக் கூடாதென்று நான் தயவா கக் கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்துப் பல நோக்குச் சங்கங்களை நீங்கள் திறக்கின்றீர்கள். இவற்றைத் திறக் கும்போது என்ன அடிப்படையில் திறக்க வேண்டுமென்பது பற்றிப் பரிசீலனை செய்ய வேண்டும். உதாரணமாக, கிண்ணியாக் கிரா மத்தை எடுத்துக் கொள்வோம். மூதூர்த் தொகுதியிலே கிண்ணியா ஒரு பெருங் கிராமம். அதோடு இரண்டு பிரதிநிதிகளை இச்சபைக்கு அனுப்பியிருக்கும் பாக்கியத் தையும் அது பெற்றிருக்கிறது. இங்கே 16 பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் இருக்கின் றன. இவற்றின் புள்ளிவிவரங்களையும் இப் பகுதிப் பொதுமக்களின் தேவையையும் கவ னிக்கும்போது இப்பதினாறு சங்கங்களும் போதுமென்பது என்னுடையது மட்டுமல்ல, கூட்டுறவு உத்தியோகத்தர்களுடையவும் அபிப்பிராயமாகும். இச்சந்தர்ப்பத்தில் திறமையாகச் செயல்பட்டுக் கொண்டிருக்கும் சில பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களைச் சிலர் பிரிக்க முயற்சித்துக் கொண்டிருக்கின் றார்கள். காரணம், சுய நலம். இன்னும் சில ரைப் பொறுத்த வரையில், இரண்டு மூன்று பேர் சேர்ந்து ஒரு குறிப்பிட்ட அரசியல் வாதியைப் பிடித்து ஒரு சங்கத்தை அமைக்க முயற்சிக்கிறார்கள். இதற்குக் காரணம் தாங் களும் கொழுக்க வேண்டுமென்பதுதான். ஆகவே நான் தயவாகக் கேட்டுக் கொள்வ தென்ன வென்றால், தற்பொழுது திறமை யாகச் செயற்பட்டுக் கொண்டிருக்கும் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்களை பிரிக்க விடாதீர்கள் என்பதுதான். யாராவது இவ்விட யம் சம்பந்தமாக உங்களை நாடி வந்தால் அவர் களை மாத்திரம் கேட்டுவிட்டு இவ்விஷயத் தைத் தீர்மானிக்காமல் இரண்டு பகுதியாரை யும் விசாரித்து, இதன் உண்மைகளை அறிந்து, ஒரு முடிவு செய்ய வேண்டுமென்று நான் உங்களை வற்புறுத்திக் கேட்டுக் கொள்ளு கிறேன்.

கிண்ணியாக் கிராமத்தைப் பற்றித்தான் திரும்பவும் குறிப்பிட விரும்புகிறேன். அங்கே ஏராளமான விவசாயிகள் இருக்கிறார்கள். இவர்கள் கமத்தைத் தங்களுடைய தொழிலா கக் கொண்டிருக்கிறார்கள். இங்கே இரண்டு பிரிவினர் தங்களுக்குப் பல நோக்குக் கூட்டுற வுச் சங்கம் வேண்டுமென்று கேட்டார் கள். பக்கிரான்வெட்டை, புலிபிடித்தவெட்டை ஆகிய இவ்விரு பிரிவிலும் உள்ளவர்கள் கேட்ட இவ் வேண்டுகோளை திருகோணமலை மாவட்டக் கூட்டுறவு உதவி ஆணையாளர் பரி சீலனை செய்து அவர்களுடைய கோரிக்கை நியாயமான தெனக் கண்டு, அவர்களுக்கு இச் சங்கங்களைக் கொடுக்க வேண்டுமென்று சிபா ரிசு செய்தார். அந்தச் சிபாரிசு தலைமைக் காரியாலயத்துக்கு வந்தபோது அவற்றில் ஒன்று அங்கீகரிக்கப்பட்டது. மற்றது நிரா கரிக்கப்பட்டு விட்டது. சில அரசியல்வாதி கள் தலையிட்டு இவ்விஷயத்தைக் கெடுத்து விட்டார்களென்பதை நான் இங்கு மிகவும் மனவருத்தத்துடன் சொல்ல வேண்டியிருக் கின்றது. இதே நேரத்திலே இன்னும் சிலர்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[மொஹமட் அலி மயா.]

தங்களுக்குக் காணியிருப்பதைத் திட்டவட்ட மாகக் காட்ட முடியாத நிலையிலிருப்பவர்கள் வானூர், சூரங்கல், ஆனைப்போட்டா ஆகிய மூன்று இடங்களில் சங்கங்களை அமைத்தார் கள். இவை மூன்று சங்கங்களும் உடனடியா கப் பதிவு செய்து கொடுக்கப்பட்டது. இச் சங்கங்கள் சிலவற்றுக்குக் கடன் கொடுப்ப தற்கு திருகோணமலை மாவட்ட கூட்டுறவு உதவி ஆணையாளர் கூட திருப்தி தெரிவிக்க வில்லை. இன்னும் பல காரணங்களைக் காட்டி உடனடியாகக் கடன் கொடுக்கக்கூடிய சூழ் நிலை ஏற்படவில்லை என்று சிபார்சு செய்தார் கள். ஆனால், சட்டத்துக்கு மாறுக கொழும் புத் தலைமைக் காரியாலயத்திலிருந்து கமத் தொழில் அதிகாரி அவர்கள் கடன் கொடுக் கும்படி உத்தரவிட்டார்கள். ஆனால், வழமை யான முறை என்னவென்றால், பலநோக்குக் கூட்டுறவுச் சங்க மொன்றுக்குக் கடன் தேவையானால் அச்சங்கம் அம்மாவட்டக் கூட்டுறவு உத்தியோகத்தருக்கு விண்ணப் பிக்க வேண்டும். அதைப் பரிசீலனை செய்து அவர் அதனைத் தலைமைக் காரியாலயத்துக்கு அனுப்ப வேண்டும். அதை இங்கு நன்றாகப் பரிசீலனை செய்தபின் கடன் கொடுக்க முடியுமா, முடியாதா என்ற முடிவுக்கு வர வேண்டும்.

අ. භා. 3

ஆனால், இன்று எமது தொகுதியிலே, பல நோக்குக் கூட்டுறவுச் சங்கங்களைப் பொறுத்த வரையிலே இங்கிருந்தே அவர்களுக்குக் கட்டளை போகின்றது. சட்டத்துக்கு மாறுக, தலைகீழாக இது நடைபெறுகின்றது. சுருக்க மாகச் சொல்லப்போனால், இந்த இலாகாவில் உள்ளவர்கள், யாரினதோ வேண்டுகோளை நிறைவேற்ற நேர்மைக்கு மாறான வழிவகை களைக் கையாளுகின்றனர். எனவே, யாரையா வது—பாரபட்சமில்லாத உத்தியோகத்தர் களையோ, அல்லது இந்தச் சபையிலுள்ள இரண்டு மூன்று அங்கத்தவரையோ கொண்ட ஒரு கமிட்டியை நியமித்து எனது தொகுதி யிலே உங்கள் இலாகாவின் கீழுள்ள பல சங்கங்கள் பற்றி நீதியான முறையில் விசா ரணை நடாத்த வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

You are all unofficial members.

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

அடுத்து கிண்ணியா பலநோக்குக் கூட்டுற வுச் சமாசத்தைப் பற்றி நான் சிறிது கூற வேண்டியிருக்கின்றது. அந்தச் சமாசத்தின் தலைவரான கௌரவ மூதூர் இரண்டாவது அங்கத்தவர் (ஜனப் ஏ. எல். அப்துல் மஜீது) அவர்கள் இச்சந்தர்ப்பத்தில் இங்கிருக்கின் றார். அவர் இதனை நன்றாகக் கேட்டுக்கொள்ள வேண்டுமென வேண்டிக்கொள்கின்றேன்.

கிண்ணியா கூட்டுறவுச் சமாசத்தில் பல ஒழுங்கீனங்கள் நடந்து கொண்டிருக்கின்றன. அந்தச் சமாசத்தில் நீங்கள் உங்கள் கட்சி யைச் சேர்ந்த பாராளுமன்ற அங்கத்தவர் ஒருவரை நியமித்திருக்கின்றீர்கள். இவ்விதம் செய்ய முடியுமா என்று நான் உங்களைக் கேட்க விரும்புகின்றேன்.

Can an Hon. Minister nominate a member of his party as a member and president of a particular multi-purpose co-operative union ?

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා. —(මුතූර් දෙවන මන්ත්‍රී)
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாம் அங்கத்தவர்)
(Mr. A. L. Abdul Majeed—Second Mutur)

In regard to this matter, I want to explain.

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

I am not giving way.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

I was not nominated by the Minister but I was elected by the co-operative delegates. I was not nominated by the Minister.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have not nominated any Member of Parliament.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

I was not nominated; I was elected. You can verify that.

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

I will prove that you were nominated. I raised the question some time back and the Minister told me that he nominated him to a particular union.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have never done so.

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

In the interests of the co-operative movement I would earnestly appeal to you to appoint a committee or send a good officer from Colombo to go into all these matters and check any irregularities that have taken place. I have nothing against my good Friend, but in the interests of the co-operative movement I am only appealing to you as the Minister in charge of this department to remedy all these defects and to correct all these irregularities.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have appointed all Members of Parliament as unofficial members.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

Let him help to correct these mistakes by making concrete suggestions. He can easily walk into the union. Let him do so. What is the use of coming to this House and speaking about these minor matters?

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

These are not minor matters. These are matters that should be brought up in this House.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

You can ask about these things from the Commissioner of Co-operative Development. He will tell you everything.

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

கௌரவ அக்கிராசனரவர்களே, இது பற்றி நான் பேசும்பொழுது என்னுடைய நண்பருக்குக் கோபம் வரப்பார்க்கின்றது என்று நினைக்கின்றேன்.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

It is not that I am against the hon. Member. I want him to give concrete suggestions to improve the union.

මොහමඩ් අලි මයා.
(ஜனப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

அவருக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் இருக்கின்றது. தன்னுடைய சந்தர்ப்பம் வரும் பொழுது அவரும் பேசலாம். நான் பேசும் பொழுது எங்கே தன்னுடைய ஊழல்கள் வெளிவந்துவிடுமோ என்று அவர் பயப்படுகிறார் போலும். எப்படியிருந்தாலும் இந்தச் சபையிலே பேச அவருக்கு உரிமை இருக்கின்றது. அப்படித் தனக்குச் சந்தர்ப்பம் கிடைக்கும் பொழுது அவர் பேசலாம். அவ்விதம் பேசி தான் அப்படி நடந்திராவிட்டால், அப்படி நடக்கவில்லை என்பதை நிரூபிக்கலாம். அதற்கும் இடமிருக்கிறது.

கௌரவ அக்கிராசனரவர்களே, நான் இப்படியான சில குறிப்புக்களை ஏற்கெனவே கூறியிருக்கிறேன். நான் உங்களைக் கேட்டுக் கொண்டதைப் போன்று, நீதியின் சார்பில்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලී මයා.]

எங்களுடைய கூட்டுறவு இயக்கத்தின் நல்ல நோக்கத்தைப் பற்றி ஒரு விசாரணைச் சபையை நியமித்து அங்கே அனுப்பினால் அங்குள்ள நிலைமையை நன்முக அறிய முடியும் என்பதை இச்சபையிலே பகிரங்கமாகவும் ஆணித்தரமாகவும் எடுத்துக் கூறுகின்றேன்.

அடுத்ததாக என்னுடைய தொகுதியில் எத்தனையோ பயிற்றப்பட்ட கூட்டுறவு மாணவர்கள் இருக்கின்றார்கள். அவர்கள் பயிற்றப்பட்டு கூட்டுறவு சம்பந்தமாகத் திறமையான அனுபவங்களைப் பெற்றிருக்கிறார்கள். ஆனால் இந்த பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களில் காலி இடங்கள் ஏற்படும் பொழுது தகுதியற்றவர்களையும், மிகவும் குறைந்த கல்வியறிவு உள்ளவர்களையும், கணக்குவழக்குகளைச் சரியாக வைத்திருக்கத் தெரியாதவர்களையும் நியமனம் செய்கிறார்கள். எனவே, இந்த பல நோக்குக் கூட்டுறவுச் சங்கங்களில் ஏற்படும் காலி இடங்களை நிரப்பும் பொழுது பயிற்றப்பட்டவர்களுக்கு விசேட சலுகை கொடுக்க வேண்டும் என்று கௌரவ அமைச்சரவர்களைக் கேட்டுக் கொள்கின்றேன். இது மாத்திரமல்ல. சில பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களில் குற்றப்பட்டவர்களைக்கூட மனேஜர்களாக நியமித்திருக்கிறார்கள். இப்படியான பிழைகளையெல்லாம் நீங்கள் பரிசீலனை செய்ய வேண்டும் என்பதுதான் என்னுடைய விருப்பமும் வேண்டுகோளுமாகும்.

அடுத்ததாக, என்னுடைய தொகுதியில் இரண்டு குடியேற்றத் திட்டங்கள் இருக்கின்றன. அவையாவன அல்லி, கந்தளாய் என்பனவாகும். அத் திட்டங்களில் குடியேறியுள்ள ஏராளமான மக்கள் தங்களுடைய உணவுக்குத் தேவையான பொருட்களையும், மற்றும் அத்தியாவசியச் சாமான்களையும் பெற்றுக் கொள்ள சமீபத்தில் பலநோக்குக் கூட்டுறவுச் சங்கக்கடைகள் இல்லாமல் பெரிதும் கஷ்டப்படுகின்றார்கள். தம்பலகாமம் மேற்குக் கொலனியிலுள்ள குடியேற்றவாசிகளுக்கும், பரவிப் பாஞ்சான் பகுதியிலுள்ள குடியேற்றவாசிகளுக்கும், முள்ளிப்பொத்தானையிலுள்ள மக்களுக்கும் தேவையான சௌகரியங்களைச் செய்து கொடுக்குமுகமாக அவர்களுக்கு பல நோக்குக் கூட்டுறவுச் சங்கக்கடைகளை அமைத்துக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

இன்று தூரதிருஷ்டவசமாக என்னுடைய தொகுதிக்கு இரண்டு பிரதிநிதிகள் இருக்கின்றோம். அதில் ஒருவர் அரசாங்கக் கட்சியைச் சேர்ந்தவராகவும், நான் எதிர்க் கட்சியைச் சேர்ந்தவனாகவும் இருக்கின்றோம். சில நேரங்களில் நான் விடுக்கும் கோரிக்கைகள் பெரியவர்களுடைய காதுகளில் விழாமற் போய்விடுகின்றது. மற்றப்பகுதியினர் அதைப் பயன்படுத்தி அவர்களுடைய நன்மைகளைப் பலப்படுத்தும் நோக்கத்துடன் எவ்வளவோ சுயநலத் திட்டங்களையெல்லாம் இந்த இயக்கத்தின் பேரால் செய்துவருகின்றார்கள். இவற்றையெல்லாம் நீங்கள் நன்முகப் பரிசீலனை செய்ய வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

இவை தவிர, இன்னும் சில உதாரணங்களை நான் கூற வேண்டியிருக்கின்றது. நீண்ட நேரம் பேசாமல் என்னுடைய பேச்சைச் சுருக்கமாக முடித்துக் கொள்ள விரும்புகிறேன். திருமலைப்பகுதி மக்கள் தமக்கு ஒரு மக்கள் வங்கி வேண்டுமென்று நீண்டகாலமாகக் கேட்டுக்கொண்டிருக்கிறார்கள். கௌரவ அமைச்சர் அவர்கள் இன்சூரன்ஸ் கூட்டுத்தாபனக் கிளையொன்றைத் திறந்து வைக்கும் பொருட்டுத் திருமலைக்கு வந்தபோது பல பிரமுகர்களும் பொது மக்களும் அவரைச் சந்தித்துத் திருமலைக்கு ஒரு மக்கள் வங்கிக் கிளை திறக்கப்படவேண்டுமென்று வற்புறுத்தினார்கள். அதற்கு அமைச்சர் அவர்கள் திருமலையில் கூடிய விரைவில் மக்கள் வங்கிக் கிளை ஒன்றை நிறுவுவதாக வாக்குறுதி அளித்தார்கள்.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

The People's Bank is not under me now.

මොහමඩ් අලී මයා.
(ஜனாப் முகம்மது அலி)
(Mr. Mohamed Ali)

திருமலையில் மக்கள் வங்கிக் கிளை திறக்கப்படுவது சம்பந்தமாக இன்றைய நிதியமைச்சர் அவர்களையும் அப்பகுதி மக்கள் தொடர்பு கொண்டிருக்கிறார்கள். இந்தக் கோரிக்கை நிறைவேற்றப்பட வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன். இந்த மக்கள் வங்கிக் கிளை திருமலையில் திறக்கப்படும் பொழுது திருமலைப் பட்டினத்திலேயே ஸ்தாபிக்கப்பட வேண்டும். நல்ல நோக்கத்தோடு நல்ல அதிகாரிகளைக் கொண்டதாக இந்த வங்கிக் கிளை ஸ்தாபிக்கப்பட வேண்டுமென்று திருமலை மாவட்ட மக்கள் சார்பாக நான் அரசாங்கத்தைக் கேட்டுக் கொள்ளுகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

திருமலையில் கூட்டுறவு சமஷ்டி வங்கி யொன்று இருக்கிறது. இந்த வங்கியானது அப்பகுதி மக்களுக்கு அரும்பெரும் சேவை செய்து வருகின்றது. இது ஒரு mobile bank— அதாவது நடமாடும் வங்கியாகவும் சேவை செய்து வருகின்றது. பல கிராமங்களுக்கு இந்த வங்கி தமது சேவையின் நிமித்தமாக விஜயம் செய்கிறது. இவ்விதம் இந்த வங்கி கிராமங்களுக்கு விஜயஞ் செய்யும்போது பல கூட்டுறவுச் சங்க மானேஜர்கள் பல தவறு களைச் செய்கிறார்கள். இவர்கள் ஒழுங்கீனமான முறையில் சிறு பிள்ளைகளின் பெயரில் கூடச் செக்குகளைப் போட்டு மாற்றுகிறார்கள். நெல் வயல் இல்லாதவர்கள், நெல் என்றால் என்ன வென்றே தெரியாதவர்களின் பெயரில் செக்கு களைப் போட்டு சில மானேஜர்மார்கள் பணத்தை மாற்றிக் கொள்ளுகிறார்கள். இப்படி யாக 350 ரூபா 450 ரூபா என்று செக்குகளை மாற்றிக் கொடுப்பவர்களுக்குப் பத்து ரூபா இனமாகக் கொடுக்கப்படுகிறது. இப்படிச் செக்குகளை மாற்றுபவர்களை யார் என்று வங்கி ஊழியர்களுக்கும் அறிந்து கொள்ள முடியா மல் இருக்கிறது. செக்கில் பெயரைப் போட்ட தும் வங்கி ஊழியர்கள் அதை மாற்றிக் கொடுத்து விடுகிறார்கள். இப்படியாக ஊழல் கள் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்கள் பல வற்றில் இருக்கின்றன. மூதூர் தொகுதியில் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் சில வருடாந்தக் கூட்டங்களையே நடாத்துவதில்லை. அந்தச் சங்கங்களுக்கு கணக்கு வழக்குகளும் இல்லை. இப்படியான சங்கங்களின் மானேஜர் கள் தண்டிக்கப்படாமல் இருக்கிறார்கள். குற்றப்பட்டவர்களையும் பாதுகாக்கச் சிலர் இருப்பதுதான் இவர்கள் தண்டிக்கப்படாமல் இருப்பதற்குக் காரணமாகும். கூட்டுறவு இயக் கம் நல்ல முறையில் வளர, என்னுடைய தொகுதியிலும் திருமலை மாவட்டத்திலுமுள்ள மக்கள் நல்ல பலனைப் பெற கூட்டுறவுச் சங்கங் களில் உள்ள ஊழல்கள் களையப்பட வேண்டும். இந்த இயக்கத்தில் குற்றஞ் செய்தவர்கள் தண்டிக்கப்பட வேண்டும்.

அடுத்ததாக இன்னுமொரு விடயத்தைப் பற்றிப் பேச விரும்புகிறேன். அதாவது கிண்ணியா பல நோக்குக் கூட்டுறவு சமாஜத் தினர் பல கொந்தராத்துக்களை எடுத்திருக்கி றார்கள். கிண்ணியா படகுப் பாதையையும் இவர்களே கொந்தராத்து எடுத்திருக்கிறார் கள். இந்தப் படகுப் பாதையை எடுத்தவர் கள் அந்தச் சேவையை ஒழுங்கான முறை யில் நடத்துவதாக இல்லை. உரிய தவணைப்படி பணத்தை அரசாங்கத்திற்குச் செலுத்துவ தாகவும் இல்லை. இந்தத் துறையை நடத்து வதற்குப் பல நேர்மையான சங்கங்கள் கேள் விப் பத்திரங்களை அனுப்பியிருந்தன. அப்படி யிருந்தும் இப்படகுச் சேவை திரும்பவும் கிண்ணியா பல நோக்கு கூட்டுறவுச் சமாஜத் திற்கே கொடுக்கப்பட்டிருக்கிறது. அதில் நிறைய ஊழல் நிறைந்து கொண்டிருக்கின் றன. இது சம்பந்தமாகத் திருகோணமலை மாவட்ட அரசாங்க அதிபரிடமிருந்து அறிக்கை யொன்றைக் கோரி அவ்வறிக்கை யைப் பார்த்தீர்களானால் அதிலிருந்து நீங்கள் உண்மையை அறிந்து கொள்ள முடியும்.

ஏ. ஸ. 3.15

கிண்ணியா கூட்டுறவுச் சமாசம் மூதூரில் இருந்து ஏராளமான நெல்லை ஏற்றுமதி செய்து கொண்டிருந்தது : அதில் ஆயிரக் கணக்கான புசல் நெல் ஏற்றுமதி செய்கையில் குறைந் திருக்கின்றது. இதனால் தாக்கப்பட்டவர்கள் கிண்ணியா மாவட்டத்திலுள்ள அரிசி ஆலைக் காரர்களே. இது சம்பந்தமாக நான் இங்கே பல கேள்விகளைக் கேட்ட போது அவற்றுக்கு நீங்கள் இவ்விஷயத்தைக் கவனிப்பதாகப் பதிலளித்திருக்கிறீர்கள். இலாகாவைச் சேர்ந்த வர்களும் இவ்விஷயத்தில் தக்க நடவடிக்கை எடுப்பதாக உறுதி கூறி இருக்கின்றார்கள். இதனைத் தெரிதப்படுத்தும்படி நான் உங்களைத் தயவுடன் கேட்டுக்கொள்ளுகிறேன்.

நான் குறிப்பிட்ட அதே சமாசம் பல பாட சாலைக் கட்டடங்களின் கட்டுமான வேலையை யும் மற்றும் பல கட்டட வேலைகளையும் அர சாங்கத்திடமிருந்து பாரமெடுத்தும் அவ் வேலையைத் திருப்திகரமாகச் செய்யவில்லை. இவ்வாறு தனிப்பட்ட கொந்தராத்துக்காரர் செய்திருந்தால் நீங்கள் உடனே அவர்களை அகற்றி அடித்துத் துரத்தியிருப்பீர்கள். ஆனால், சமாசங்கள் இப்பிழையைச் செய்யும் போது அதனைப் பார்த்துக் கொண்டிருக்கி றீர்களென்பதைச் சொல்ல நான் மனவருத் தப்படுகிறேன் ; வேதனைப்படுகிறேன்.

நான் இக்கௌரவ சபையின் நேரத்தை அதிகமாக எடுக்க விரும்பவில்லை. நான் இங்கே குறிப்பிட்ட பல நோக்குக் கூட்டுற வுச் சங்கங்கள் சம்பந்தமான விஷயங்களையும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

නාන් ඉඩකු එදුත්තුක් කූරිය ඒනිය කුරෙ කණියුම් තයවු සෙය්තු, උංකළුඩෙය කවනත්තුක්කෙටුක්කුම්පඩියුම්, එන්නුඩෙය තොකුති මක්කළුඩෙය නලනික් කරුතියුම් උංකළුඩෙය නේර්මෙයෙක් කරුතියුම් පල නෝක්කුක් කූට්ටුරවුච් සංකංකළිලුළ්ළ ඌළල්කළෙ අකර්ත්තුවතෙතොටු, නාන් ඉච්චපෙයින් අංකත්තවන් එන්ර මුරෙයිලේ කේට්ටිරුක්කුම් කේළ්විකළුක්කුච් චුණංකාමල් පතිලළිත්තු, ඉක්කූට්ටුරවු ඉලාකාවෙත් තිරුත්ති අමෙත්තු අතු නල්ල මුරෙයිලේ මක්කළුක්කුච් චේවෙ සෙය්යක් කූඩිය මුරෙයිලාක්කුම්පඩියුම් නාන් කෙළරව අමෙච්චර් අවර්කළිඩම් කේට්ටුක් කොළ්ළුකිරේන්. අත්තුඩන් කාලි තොඩක්කම් ඉංකු කාත්තිරුන්ත එනක්කු ඉන්නෝරත්තිර් පේසච් චන්දර්ප්පම් තන්ততර්කාකක් කෙළරව අක්කිරාසනර් අවර්කළුක්කුම් එනතු නන්රි යෙත් තෙරිවිත්තු එන්නුඩෙය පේච්චෙ මුටිත්තුක් කොළ්ළුකිරේන්.

ගරු ටී. බී. එම්. හේරත් (ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති)

(කෙළරව ඊ. පි. එම්. හේරත්—කිරාම, කෛත්තොළිල් අපිවිරුත්ති පතිල් අමෙච්චර්)

(The Hon. T. B. M. Herath—Acting Minister of Rural and Industrial Development)

ගරු සභාපතිතුමනි, සමුපකාර කටයුතු පිළිබඳව විවාද වන මේ අවස්ථාවේදී සමුපකාරිකයකු වශයෙන් මාද වචන දෙකතුනක් කථා කිරීමට අදහස් කරනවා. අද මේ රටේ සමුපකාර ව්‍යාපාරය උසස් තත්ත්වයකින් පවතීයයි කීම අතිශයෝක්තියක් නොවෙයි. ණය දෙන සමිතිවලට පමණක් සීමා වී තිබුණු සමුපකාර ව්‍යාපාරය අද ඉතා උසස් දියුණුවක් ලබා ඇති බව කවුරුත් අවිවාදයෙන් පිළිගත යුත්තක්. පිටරටින් බඩු ගෙන්වීමේ ආනයන බලපත්‍ර පවා ලබා ගෙන පිටරටින් බඩු ගෙන්වන සමුපකාර සංගම් කීපයක් මේ රටේ තිබීම ගැන සමුපකාරිකයකු හැටියට මම ආඩම්බර වෙනවා. සමුපකාරිකයන් විසින් නොයෙක් විධියේ කර්මාන්ත පවා ආරම්භ කර තිබෙනවා.

අද සාමාන්‍ය ගෙවියා දෙස බලන විට සමුපකාරය නොමැතිව ඔහුට ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති බැව් පෙනී යනවා. ඒ තරමටම ගොවියාට සමුපකාරය අවශ්‍යයයි. සමුපකාරය මඟින් ගොවියාට අවශ්‍ය පොහොර, බීත්තර වී පමණක් නොවෙයි; ගොවිතැනට වුවමනා කරන මුදල් පවා ණයට ලබාගන්න පුළුවනි. ඒ ගොවිතැනින් නිපදවන ද්‍රව්‍ය අලෙවි කර ගැනීමටද ඔහුට සමුපකාරය උදව් දෙනවා. ඒ නිසයි, අපේ ගම්බද ගොවියාට සමුපකාරය නැතිව ජීවත් වන්නට පවා අමාරුයයි මා කීවේ. වෙනත් විදියකින් කියනවා නම් අද ගොවීන්ගේ ජීවන තත්ත්වය රඳා පවත්නේ සමුපකාරය මතයි. එවැනි තත්ත්වයකට සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා මේ ව්‍යාපාරයේ මුල සිට අද දක්වාම කටයුතු කළ, කරන්නා වූ හැම දෙනකුටම මොන පක්ෂයේ වුවත් මහජන ආශීර්වාදය ලැබෙන බව මට හොඳටම විශ්වාසයි.

මේ ව්‍යාපාරයේ සුළු සුළු දුර්වලකම් තිබෙන්නට බැරි නැහැ. ඒ දුර්වලකම් පමණක් ගෙන සම්පූර්ණ ව්‍යාපාරයම හෙළා දකිනවා නම් එය සාධාරණ ක්‍රියාවක් හැටියට සැලකීමට අපට පුළුවන්කමක් ඇත්තේ නැහැ. මුතුර් පළමුවන ගරු මන්ත්‍රීතුමා (එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.) කථා කරමින් මුතුර් දෙවන ගරු මන්ත්‍රීතුමා (ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.) සමුපකාර සංගමයක සභාපති කෙනකුයයි චෝදනාත්මක ස්වරයකින් කිව්වා. මේ කථා කරන මාත් සමුපකාර සංගමයක—වලපනේ සමුපකාර සංගමයේ—සභාපති කෙනකු හැටියට සිටින නිසයි, මේ සම්බන්ධයෙන් මම කථා කිරීමට පෙළඹුනේ. මන්ත්‍රිවරයකුට කිසිම තහනමක් ඇත්තේ නැහැ, සමුපකාර සංගමයක සභාපති කෙනකු වීමට. මහජන නියෝජිතයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රිවරු සමුපකාර සංගම්වල සභාපතිවරුන් වීම කිසිම වරදක් නොවෙයි. සමුපකාරයත් මහජන ව්‍යාපාරයක්. මහජන නියෝජිතයකුට මහජන ව්‍යාපාරයක මුලසුන ලැබීම නිරායාසයෙන්ම විය යුත්තක්. [බාධා කිරීමක්] යම්කිසි මන්ත්‍රීවරයකුට මහජන ඡන්දයෙන් සමුපකාර සංගමයක සභාපතිකමක් ලැබෙනවා නම් අනික් මන්ත්‍රීතුමා විසින් කළ යුත්තේ ඊට ඊෂ්‍යා කිරීම නොවෙයි; තමනත් මහජන හොඳ හිත දිනාගෙන ඊළඟ වර්ෂයේදී එහි සභාපති වීමට උත්සාහ දැරීමයි. එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොකර ඒ සභාපති හැටියට සිටින මන්ත්‍රීතුමා ඉන් ඉවත් කරන්නයයි ගරු ඇමතිතුම ගෙන් ඉල්ලනවා නම් එය සාධාරණ ඉල්ලීමක් නොවන බව කිය යුතුයි.

මුතුර් පළමුවන ගරු මන්ත්‍රීතුමා සමුපකාර කළමනාකරුවන් පත් කිරීම හා අස් කිරීම ගැනත් කථා කළා. සමුපකාරයක සභාපති කෙනකු හෝ කළමනාකරුවකු අස් කිරීමට බලය ඇත්තේ ඇමතිතුමාට නොවෙයි; එම සංගමයේ කාරක සභාවටයි. කාරක සභාව යම් වරදක් කළොත් ඒ පිළිබඳව සමුපකාර කොමසාරිස්තුමා පරීක්ෂා කර බලනවා. සමුපකාරයක සභාපති කෙනකු හෝ කළමනාකරුවකු අස් කරන්න යයි යම් ගරු මන්ත්‍රීවරයෙක් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා නම් ඔහු සමුපකාර ප්‍රතිපත්තිය පිළිබඳව දැනුමක් නැති කෙනකු බවයි, හැගෙන්නේ. කොන්ත්‍රාත් පිළිබඳවත් ඒ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. සමුපකාර සංගම්වලට කළ හැකි වැඩ ටෙන්ඩර් කැඳවන්නේ නැතිව සමුපකාර සංගම්වලට දීම රජයේ ප්‍රතිපත්තියයි. ඒ ප්‍රතිපත්තිය අවුරුදු කීපයක් තිස්සේ ක්‍රියාත්මක වී තිබෙනවා. ඒ ගැනත් ඒ ගරු මන්ත්‍රීතුමා නොදැන කථා කිරීම ගැන මම කනගාටු වෙනවා. ඒ වගේම මෙම අමාත්‍යාංශය මගින් සතොසේ ව්‍යාපාරය පවත්වා ගෙන යනව. අප අවංකව කථා කරනව නම් සතොසේ ව්‍යාපාරයෙන් මේ රටේ මහජනතාවට විශාල සේවයක් සිද්ධ වී තිබෙන බව අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. නමුත් හැම ස්ථානයකම නිර්දෝෂය, වරදක් කෙරෙන්නෙ නැතැයි මම කියන්නෙ නැහැ. සමහර ස්ථානවල වැරදි කෙරෙනව. නමුත් අපේ ප්‍රදේශවල පෞද්ගලික වෙළඳුන් විසින් කරගෙන ගිය මහජන ගසා කෑම, දිගින් දිගටම කරගෙන යාම වළක්වා ගන්නට පුළුවන් වුණේ සතොසේ ව්‍යාපාරය නිසා බව අප අවංකව ප්‍රකාශ කරන්න ඕනෑ. නමුත් මම කියන්නෙ නැහැ හැම ස්ථානයක්ම සම්පූර්ණයෙන්ම නිර්දෝෂය කියා. ඇතැම් ස්ථානවල වැරදි කෙරෙන්නට පුළුවනි. එසේ වුණත් ඇගිල්ලක් කුණු වී තිබෙන නිසා පුද්ගලයකු මරා දැමීමට යෝජනා කරනවා නම් එය සාධාරණය කියා කවුරුන්වත් පිළිගන්න ලැහැස්ති නැහැ.

ගරු සභාපතිතුමනි, සතොසේ ශාඛා පිහිටුවීම සම්බන්ධයෙන් ඇතැම් දෙනා නොයෙක් අදහස් ප්‍රකාශ කරනව. ඇතැම් අය කියා සිටිනවා සමුපකාර සංගම්වලට අයත් ශාඛා තිබෙද්දී සතොසේ ශාඛා විවෘත කරන්න එපාය කියා.

ලක්ෂ්මන් රාජපක්ෂ මයා. (තිස්සමහාරාමය)

(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ—திஸ்ஸமஹாராம)

(Mr. Lakshman Rajapaksa—Tissamaharama)

ඇයි තමුන්නාන්සේ පිළිතුරු දෙන්නෙ ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ හරින්න.

ගරු ටී. බී. එම්. හේරත්

(கௌரவ ரீ. பி. எம். ஹேரத்)

(The Hon. T. B. M. Herath)

මගේ පළාතේ තිබෙන සමුපකාර සමිතියක සභාපතිවරයකු වශයෙන් මට බැරිකමක් නැහැ, මේ කාරණා ගැන කථා කරන්න, පැහැදිලි කරන්න.

සතොසේ ශාඛාත් සමුපකාර සංගම් ශාඛාත් අතර කිට්ටු සම්බන්ධතාවක් ඇතිව කටයුතු කරගෙන යාමට කිසි අපහසුවක් නැහැ. මගේ කොට්ඨාශයේ තිබෙන සමුපකාර සංගමයට අයත් ශාඛා හා සතොසේ ශාඛා අතර කිට්ටු සම්බන්ධතාවයකින් කටයුතු කරගෙන යාමට හැකි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපට පුළුවන්කමක් ඇති වී තිබෙනව, කුට වෙළඳුන් ගෙන් මහජනතාව බේරාගෙන මහජනතාවට සේවයක් වන පරිදි මේ ශාඛා සකස් කර ගන්ට. එවැනි ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් නොයෙක් නොයෙක් පළාත්වල සීනි, පිටි, කරවල ආදි ද්‍රව්‍යයන්ගේ හිඟයක් ඇති වුණු අවස්ථාවලදි මගේ කොට්ඨාශයේ ජනතාවට එබඳු අන්දමේ කිසිම අඩුපාඩුවක් නැතුව ඔවුන්ට අවශ්‍ය ද්‍රව්‍ය සපයා දෙන්නට පුළුවන්කම තිබුණා. ඇත්ත වශයෙන් එසේ කරන්නට හැකි වුණේ මේ කොටස් දෙක එනම්, සතොසේ ශාඛාත් සමුපකාර සංගම්වලට අයත් ශාඛාත් සහයෝගයෙන් කටයුතු කිරීම නිසා බව නැවතත් මතක් කර දෙන්නට කැමතියි. එම නිසා, කවුරුන් කොයි අන්දමේ අදහස් ප්‍රකාශ කළත්, සතොසේ ශාඛා පිහිටුවීමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ටී. බී එම්. හේරත්]

සමුපකාර සංගම්වලට කටයුතු කරගෙන යාමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙන බය කියා කීවත්, මගේ අත්දැකීමේ හැටියට මෙම කොටස් දෙකම සහයෝගයෙන් කටයුතු කරනවා නම් ජනතාවට කිසිම අන්දමක හිරිහැරයක් ඇති නොවන බව ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, සතොසේ ශාඛා, සමුපකාර සංගම්වල ශාඛා විවෘත කර ඇති ස්ථානවල විවෘත නොකරන ලෙස ඉල්ලා සිටිනව. මේ අදහස සම්පූර්ණයෙන්ම වැරදි බව කියන්න ඕනෑ. මන්ද? නගරයක දේශීය වෙළඳුන්ට මෙන්ම විදේශීය වෙළඳුන්ට අයත් පෞද්ගලික කඩ දෙතුන් සියයක් තිබෙනව. නමුත් සමුපකාර සංගමයකට අයත් එක ශාඛාවක් පමණයි තිබෙන්නෙ. මෙවැනි ස්ථානයක පෞද්ගලික වෙළඳුන්ට නම් ශාඛා ඕනෑ තරමක් විවෘත කරන්ට පුළුවනි. නමුත් සතොසෙ ශාඛාවක් විවෘත කළොත් ඒ ගැන විරුද්ධත්වය දක්වනව; තහනම් කරන ලෙස ඉල්ලා සිටිනව. පෞද්ගලික කඩ විවෘත කිරීම ගැන විරුද්ධත්වයක් නැහැ. තහනමක් නැහැ. නමුත් මෙහිදී මතක් කළ යුතු වැදගත් කාරණයක් තිබෙනව. එනම්, සතොසේ ශාඛා තව තවත් විවෘත කරන්න කරන්න පහසුවක් සැලසෙන්නෙ රටේ මහජනතාවටයි. මෙසේ විවෘත කිරීම නිසා යම් පාඩුවක් වෙනවා නම් එසේ පාඩු වෙන්නෙ පෞද්ගලික වෙළඳුන්ට මිස වෙනත් අයට නොවන බව, සමුපකාර සංගම්වලට නොවන බව, මතක් කර දෙන්න කැමතියි. යම් කෙනෙකු සතොසෙ ශාඛා විවෘත කිරීම ගැන විරුද්ධත්වයක් දක්වනවා නම්, එසේ දක්වන පුද්ගලයා පෞද්ගලික වෙළඳුන්ගේ නියෝජිතයකු මිස වෙනත් කෙනෙකු නොවන බවයි මට කියන්ට තිබෙන්නෙ. පුද්ගලික වෙළෙන්දන් ආරක්ෂා කිරීම ටයි ඒ කථාව කරන්නෙ. අපි කථා කරන්නේ, පුද්ගලික වෙළඳුන් ආරක්ෂා කිරීමට නොවෙයි. මේ රටේ ඉතාම සුළු ආදායමක් ලබා ගෙන බොහොම අමාරුවෙන් ජීවත් වන අසරණ මිනිසුන්ට සාධාරණ මිලකට බඩු ටිකක් ලබා දීමටයි. ස.තො.සේ. සහ සමුපකාර සංගම් සහයෝගයෙන් ක්‍රියා කළ යුතුයි. යම්කිසි විධියකින් එහෙම අමාරුවක් තිබෙනවා නම්, එය ඇති වන්නේ ස.තො.සේ. සහ සංගම් යන දෙකම එකම වැඩේ කරන නිසයි. හැමෝම මේ වෙළඳාම පමණක් කරන්න බලාපොරොත්තු වෙනවා නම්, සමුපකාරයේ දියුණුවට එය හේතු වන්නේ නැහැ. සංගම් ලැහැස්ති වන්න ඕනෑ, ඊට වඩා වැදගත් දේවලට අත ගහන්ටයි. වෙනත් දේවලට අත ගසා රටේ ආර්ථික දියුණුව සඳහා—බඩු වෙළඳාම පමණක් නොවෙයි—කර්මාන්ත, වැවිලි ව්‍යාපාර ආදිය මේ රටේ ආරම්භ කිරීමට සංගම් කටයුතු කළ යුතුය යන්නයි මගේ පෞද්ගලික විශ්වාසය.

ගරු සභාපතිතුමනි, මේ අයවැය ලේඛනය දෙවන වර කියවීමේ විවාදයේදී ගරු කොළොන්න මන්ත්‍රීතුමා (සිරිල් මැතිව් මයා.) විසින් මගේ සමුපකාර සංගමය ගැන අසත්‍ය ප්‍රකාශයක් මේ ගරු සභාවේදි කියා තිබුණා. ඒ අවස්ථාවේදී මා මෙම ගරු සභාවේ සිටියේ නැහැ. ඒ කොටස මම තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා කියවන්නම්:

"වලපනේ ගරු මන්ත්‍රීතුමා සභාපතිව සිටින සමුපකාර සංගමය 1963 සැප්තැම්බර් මාසය වන විට වෙළඳාමෙන් ලැබූ පාඩුව රු. 54,000 යි. ඒ සමුපකාර සමිති සංගමයට 1963 සැප්තැම්බර් මාස යේදී රුපියල් ලක්ෂ 5 ක ණයක් මහජන බැංකුවෙන් දී තිබෙනව. දැන් ඒ ණය මුදල රුපියල් ලක්ෂ 11 දක්වා වැඩි වී තිබෙනව. මේ ලක්ෂ 11 බෙදා හැරියේ ගොවීන් අතරද? මේ මුදල් යොදවා තිබෙන්නේ කොයි ආකාරයටද? මේ මුදල් ප්‍රයෝජනයට ගෙන තිබෙන්නේ ඒ සමිතියේ නිළධාරීන්, එක් එක් පළාත්වල කඩ ආරම්භ කර වෙළඳාම් කිරීමටයි."—[නිල වාර්තාව (අශොධිත), 1964 අගෝස්තු 13, කා. 56, තී. 2926]

ගරු සභාපතිතුමනි, මේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයක්. මේ සංගමය අපි නුවරඑළියේ සංගමයත් සමඟ ඒකාබද්ධ කර හදා ගන්නා අවස්ථාවෙදි මගේ සංගමයේ තිබුණේ හාල්, පිටි, සීනි, බේදා හැරීමේ මධ්‍යස්ථාන 4 ක් පමණයි. වෙන කිසිවක් ඒ සංගමයෙන් කෙරුණේ නැහැ. නමුත් මේ අවුරුදු දෙක ඇතුළත අපි හුඟක් වැඩ ආරම්භ කර තිබෙනවා. සමුපකාර සමිතිවල කඩ අපේ ප්‍රදේශවල තිබුණෙත් නැහැ. සමුපකාර සංගමයේ කඩ තිබුණෙත් නැහැ. පුද්ගලික වෙළඳුන් විසින් මහජනයා සූරාගෙන කනු ලැබුවා. ඒ අවස්ථාවේදී අපි සිල්ලර වෙළඳ ශාඛා 22 ක් ආරම්භ කළා. ඒ සෑම සිල්ලර ශාඛාවකම රෙදි අංශයෙකුත් ආරම්භ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එමෙන්ම යකඩ බඩු ශාඛාවක් කොන්ත්‍රාත් අංශයක් හා දුම්කොළ වැවීමේ අංශයක් අපි ආරම්භ කළා. ආහාර දෙපාර්තමේන්තුවෙන් පවත්වා ගෙන ගිය සැපයුම් මධ්‍යස්ථානය අපි බාර ගත්ත. එමෙන්ම දර ගබඩාවක් ඇති කිරීමෙන් පළාතේ මහජනයාගේ දර ප්‍රශ්නය අපි විසඳා තිබෙනවා. ලී මෝල් ඇති කිරීමට අපි දැනටමත් මූලික පියවර අරගෙන තිබෙනවා. වී මෝලක් ඇති කිරීම සඳහා කටයුතු කරගෙන යනවා. එමෙන්ම ඒ පළාතේ තිබෙන අමු ද්‍රව්‍යවලින් කර්මාන්ත කීපයක් ආරම්භ කිරීම සඳහා දැනටමත් මූලිකව කටයුතු කර තිබෙනවා. මෙන්න මේ විධියේ කටයුතු රාශියක් කළ මේ සමිතිය මේ කියන අවුරුද්දේ පාඩු ලබා තිබෙනවාලු. සමුපකාර දෙපාර්තමේන්තුව මගින් තවම මේ අවුරුද්දේ ගණන් පරීක්ෂා කර නැහැ. ගණන් බලා ගන්නට වාර්තාවක් 1962-63 අවුරුද්ද සඳහා තවම අපට ඉදිරිපත් කර නැහැ. තවමත් ගණන් බැලීමේ කටයුතු කරගෙන යනවා. එවැනි අවස්ථාවක ඒ අවුරුද්දේ රුපියල් 54,000 ක් පාඩුයි කියා මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් මේ වරප්‍රසාදවලින් අයුතු ප්‍රයෝජන අරගෙන මේ ගරු සභාවේදී කරන ප්‍රකාශ ඇත්ත වශයෙන්ම නින්දිතය කියා මට කියන්න සිදු වී තිබෙනවා. හරි ප්‍රකාශයක් නම් එය නියම විධියට සොයා ගෙන ඇවිත් වැකීමක් ඇතිව කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ ගරු ලේකම් හැටියට එතුමාට මේ කරුණ හරියට නීත්‍යනුකූලව, සත්‍ය කරුණු ඇතුව, කියන්නයි තිබුණේ. නමුත් ගරු මන්ත්‍රීවරයෙකුට මඩ ගැසීමේ චේතනාවක් ඇතිව මේ ගරු සභාවේදී මේ විධියේ අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් මන්ත්‍රීවරුන්ටත් සමුපකාර ව්‍යාපාරයටත් එතුමා කර තිබෙන ඒ නින්දනීය ප්‍රකාශය මේ ගරු සභාවේදී හෙළා දැකිය යුතුයි කියා මා කල්පනා කරනවා. මේ ප්‍රකාශය දැක්කාට පසුව මගේ ගණකාධිකාරීවරුන් ලවා සාමාන්‍ය පරීක්ෂණයක් කෙරෙව්වා. 1962-63 අවුරුද්දේ රුපියල් 1,53,000 ක මිශ්‍ර ලාභයක් සංගමය ලබා ගෙන තිබෙනවා. ගණන් බලා ඉවර නැති නිසා අපට සවිස්තරව යමක් කියන්න බැහැ. 1,53,000 ක මිශ්‍ර ලාභයක් ලබා තිබෙන සංගමයක්, 54,000 ක පාඩුවක් ලබාගෙන තිබෙනවාය කියා වගකීමකින් තොරව ප්‍රකාශ කළ මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේ සිටීම ගැන එක්සත් ජාතික පක්ෂය ලැජ්ජා විය යුතුයි.

අ. භා. 3.30

එපමණක් නොවෙයි. එතුමා කියා තිබෙනවා මේ බැංකු අයිරාව රුපියල් ලක්ෂ 11 යි කියා. අපේ දුම්කොළ වැවිල්ල ගැන මා කලින් සඳහන් කළා. එමෙන්ම හාල් වෙළඳාමට පමණක් මසකට රුපියල් ලක්ෂ 2 ක් පමණ අවශ්‍යයි. හාල් පොත් 87,000 කට පමණ හාල් සපයන්න තිබෙනවා.

ඒ වාගේම කොන්ත්‍රාත් අංශයේ රුපියල් දස ලක්ෂයක් පමණ කොන්ත්‍රාත් කරනවා. මේ අවස්ථාව වන විටත් ඒ කොන්ත්‍රාත් කරනවා. ඒ වාගේම දුම්කොළ පෝරණු 10කට අපි දුම්කොළ වවනවා. අපේ දුම්කොළ පෝරණුවල විටිනාකම පමණක් රුපියල් 60,000ක් පමණ වෙනවා. ලොරි අංශයේ ලොරිත් 6ක් තිබෙනවා. ඒ ලොරිවල විටිනාකමත් රුපියල් ලක්ෂයකට පමණ කිට්ටු වේය කියා මා කල්පනා කරනවා. මේ තරම් විශාල ව්‍යාපාරයක් ගෙන යන සමිතිය බැංකුවෙන් ණය ගෙන තිබෙන්නෙත් නිකම් නොවෙයි. ණය ගන්නෙ සියයට 6 පොළියක් ගෙවන්නයි. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ පුදුම වෙයි, 1962-63 වර්ෂයේ පොළී වශයෙන් පමණක් මේ සමිතිය රුපියල් 66,000ක් මහජන බැංකුවට ගෙවා තිබෙනවා. බැංකුවෙන් පොළියට මුදල් ගැනීම වැරැද්දක් හැටියට පෙන්වමින්, මේ ගරු සභාවේ මන්ත්‍රීන්ට මඩ ගසන්න ගෙන යන මේ ව්‍යාපාරය ගැන, ගරු මන්ත්‍රීන් සම්බන්ධයෙන් මෙවැනි ප්‍රකාශ කිරීම ගැන, මේ ගරු සභාවේ ගරුත්වය ආරක්ෂා කිරීමට සිටින ඔබතුමා, මේ ගරු සභාව මේ තරම් පහත් තත්ත්වයකට, නින්දිත තත්ත්වයකට පත් කරන්න උත්සාහ කරන ඒ මන්ත්‍රීන් සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගත යුතුය කියා මා කල්පනා කරනවා. කොළොන්නෙ ගරු මන්ත්‍රීතුමා (සිරිල් මැතිව් මයා.) දැන් මේ සභාවයෙ නැහැ. එතුමත් අල්ලස් චෝදනාවක් පිළිබඳව ඉතාමත් අසත්‍ය ප්‍රකාශයක් කර පසුව කිව්ව නැත කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

අල්ලස් චෝදනා ගැන කියා තිබෙන්නෙ ඇත්ත, නමුත් වෙච්ච දෙයක් නැහැ. මහ ලොකුවට දැන් කෑගහනවා. හය දෙනෙක් අහු වුණා. ඒ අයට මොනවද කරල තියෙන්නෙ? [බාධා කිරීමක්.]

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(Hon. T. B. M. Herath)

ඒව ඔප්පු කරන්න. උසාවියට හරි වෙන ඕනෑ තැනකට හරි අපි එන්න ලෑස්තියි. එක්සත් ජාතික පක්ෂය මහජන බැංකු වෙන් සල්ලි ගන්නව. ඒවා ගැන කියන්නෙ නැහැ. [බාධා කිරීම්] ගුරුවරුන් මරණ බවට ලියුම් ලියන ඔය මන්ත්‍රීතුමාට අපි ඇහුම්කන් දෙන්නෙ නැහැ.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

ජාත්‍යන්තර සම්මේලනවලට අරින්නෙ පගාකාරයෝ.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

සුගතදාස මන්ත්‍රීතුමා ලක්ෂ 10ක් අරන් තිබෙනව. ඒව දේන්නෙ නැහැ.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

මහියංගනයෙ සමුපකාර සමිති කාබාසිනියා කර තිබෙන්නෙ ඔය ගරු මන්ත්‍රීතුමා බව මා විගකිමක් ඇතිව මේ ගරු සභාවේ ප්‍රකාශ කරනව. [බාධා කිරීම්] මහියංගනය කම්කරු සමිති ඔය තත්ත්වයට වැටී තියෙන්නෙ ඔය ගරු මන්ත්‍රීතුමා නිසාය කියා මා ප්‍රකාශ කරනව.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

මට පෞද්ගලික ප්‍රකාශයක් කරන්ට ඕනෑ. මා ඒ සමිතියෙ සාමාජිකයෙකුවත් නොවෙයි.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

සාමාජිකයකු නොවී ඉදගෙන කඩා කප්පල් කරන්ට ලේසියි.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

මා ගරු ඇමතිතුමාට අභියෝග කරනව. එය මේ ගරු සභාවෙ ඔප්පු කරන තුරු වලපනේ මන්ත්‍රීතුමා සමග සටන ගෙන යනව. [බාධා කිරීම්].

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

ඔම්, අපි දන්නව එතුමා කොන්ත්‍රාත් කරුවන්ගෙ නියෝජිතයෙක් බව. [බාධා කිරීම්] මගේ ආසනයෙ ගම් කාර්ය සභා එකක් එකක් පාසා එක්සත් ජාතික පක්ෂය සටන් කළා. නමුත් ඇපත් රාජ සන්තක වුණා. අපි වලපනේ ආසනයෙන් එක්සත් ජාතික පක්ෂය අතුගා දැම්ම.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

ගම් කාර්ය සභාවකිනුත් පගා ගහල තියෙනව සිනමා ශාලාවකට. එක්සත් ජාතික පක්ෂයෙ පගාකාරයෝ නැහැ. [බාධා කිරීම්] සුගතදාස මන්ත්‍රීතුමා ලක්ෂ 20 ක දේපළ උකස් කරලයි මහජන බැංකුවෙන් ණය ගත්තෙ. යූ. කේ. එඩ්මන්ඩ්ට ණය දුන්නෙ නිකම්ම බැංකු මාගීයෙන්.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

ඔව්, අපි දන්නව ඒ ගැන. විස්තර වුවමනා නම් අපි ඉදිරිපත් කරන්නම්. එක්සත් ජාතික පක්ෂයෙ මන්ත්‍රීවරු ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍ර අප ළඟ තියෙනව. මේ ගරු සභාවෙ නිකම් ඕනෑ නැති ඒවා කියන්න එන්න එපා. වත්තල ගරු මන්ත්‍රීතුමාගේ අත් අකුරෙන්ම ලියපු එක අපි ළඟ තියෙනව. [බාධා කිරීම්] පිළිතුරු දෙන්න මා කථා කළාට පසුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

කට වහනව.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

මගේ කට වහන්න හම්බු වෙන්නෙ නැහැ. තමුන්නාන්සේ කට වහන්න කියන එක ඉල්ලා අස් කර ගන්න. [බාධා කිරීම්]

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

දැන් එළියට එනව පුළුවන් නම්. [බාධා කිරීම්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! No interruptions, please.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

සමුපකාර සමිති ව්‍යාපාර අරගෙන, මහජන බැංකුව අරගෙන, මේ පැත්තෙ මන්ත්‍රීවරුන්ට මඩ ගැසීමේ ව්‍යාපාරයක් ගෙන යන්න එක්සත් ජාතික පක්ෂය ලෑස්ති නම්, අපිත් ලෑස්තියි. අල්ලස් චෝදනාවක් තිබෙනව නම් අපේ නිර්දෝෂත්වය ඔප්පු කරන්න අපි උසාවියට යන්න ලෑස්තියි. නිකම් මේ වරප්‍රසාද ප්‍රයෝජනයට අරගෙන අහිංසක මන්ත්‍රීවරුන්ට මඩ ගැසීමේ ව්‍යාපාරයට ඉඩ දෙන්න අපි ලෑස්ති නැහැ. [බාධා කිරීම්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! The hon. Member has already spoken. There should be no interruptions.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

අපේ නිර්දෝෂත්වය පෙන්නුම් කරන්ට අපි අධිකරණයට හෝ වෙන ඕනෑ තැනකට යන්න ලෑස්තියි. වෙළඳ ඇමතිතුමාට විරුද්ධවත් තමුන්නාන්සේලා නොයෙ කුත් දේවල් කිව්ව. නමුත් අද එතුමා නිර්දෝෂ කෙනෙක් හැටියට අධිකරණය නිරණය කර තිබෙනව.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

පගාකාර හොරුන්ට විරුද්ධව අපේ සටන අපි ගෙන යනව.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! Hon. Member for Mahiyangana, please do not interrupt.

ගරු ටී. බී. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

පාගාකාරයා තමුසෙ [බාධා කිරීමක්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member for Hakmana should not interrupt.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

අප සංගමයට රුපියල් 11,00,000ක් මහජන බැංකුවෙන් ණය දී තිබෙනව නම් ඒ දී තිබෙන්නෙ අපේ පුද්ගලික බලපෑම් උඩ නොවෙයි; සමුපකාර කොමසාරිස් තුමාගෙ නිර්දේශ අනුවයි. සමුපකාර කොමසාරිස්තුමාගේ නිර්දේශයක් නැතිව අපට ණය දුන්නාය කියා එක්සත් ජාතික පක්ෂයට ඔප්පු කරන්ට පුළුවන් නම් ඒක චෝදනාවක් වශයෙන් භාර ගන්න අපි ලැහැස්තියි. සමුපකාර සංගමයකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ටී. බී. එම්. හේරත්]

සමුපකාර කොමසාරිස්තුමාගේ නිර්දේශ අනුව ණය දී තිබෙනට නම් ඒක චෝදනාවක් නොවෙයි. අපේ සමුපකාර සමිති සංගමයට රුපියල් 11,00,000ක ණයක් දී තිබෙන්නෙ සමුපකාර කොමසාරිස්තුමාගේ නිර්දේශ අනුවයි. මේ අවස්ථාවේදී ඒ ලිපිය මා ළඟ තිබෙනවා. සමුපකාර කොමසාරිස්තුමාගේ නිර්දේශ අනුව රුපියල් 11,00,000ක් සියයට 6 පොළියට ණයට දී තිබෙනවා. මේක වරදක්ද? මේක චෝදනාවක්ද? කියන්ට වෙන දේවල් නැතුව මෙතැන ඇවිත් මොකක් හෝ කියනවා.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
අයුතු බලපාල ගත්ත නම් වැරදියි.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
අයුතු බලපාල ගත්ත නම් ඒක චෝදනාවක්. මොන කරුණු උඩද මේ සමුපකාර සංගමයට රුපියල් 11,00,000ක් ණයට දී තිබෙන්නෙ? මේක දී තිබෙන්නෙ, ඇමතිවරුන්ට හෝ මන්ත්‍රීවරුන්ට හෝ මට නොවෙයි; සංගමයේ කටයුතු වලටයි. වෙළඳ අංශයට මෙපමණයි; කොන්ත්‍රාත් අංශයට මෙපමණයි. දුම්කොළ වැවීමේ අංශයට මෙපමණයි; පොහොර ගබඩා අංශයට මෙපමණයි; සැපයීම් අංශය ට මෙපමණයි ආදි වශයෙන් එක් එක් අංශයට මෙපමණ මුදලක් දිය යුතුය කියා, වෙන් වෙන් වශයෙනුයි කොමසාරිස්තුමා මේ ණය මුදල් අනුමත කර තිබෙන්නෙ. මන්ත්‍රීවරයෙක් සංගමයක සභාපති කෙනෙක් වූ පලියට කිසිම වගකීමක් නැතිව මේ සභාවට ඇවිත් පහර ගැසීම අසාධාරණයි. හැබැයි එක ප්‍රශ්නයක් තිබෙනවා. මා සමිති සංගමය භාර ගත්ත කාලයේ එහි වෙළඳාම මාසයකට රුපියල් 75,000 යි. දැන් රුපියල් 10,00,000යි. පුද්ගලික අංශයට පහර වැදිගෙන යන නිසයි, පුද්ගලික අංශයේ නියෝජිතයන්ට කැක්කුම් හැදෙන්නෙ. මේ වගේ වැරදි සහගත ප්‍රකාශ මේ ගරු සභාවේ ඉදිරිපත් කර, සමුපකාර ව්‍යාපාරයට හානි කරන්ට එපා. සමුපකාර ව්‍යාපාරයෙන් ඒ ආයතනයට හානියක් වෙනවා නම්, ඒක පුද්ගලයෙකුට කරන හානියක් නොව රටට කරන හානියක් බව මතක් කරන්ට ඕනෑ. මේ ව්‍යාපාරය යම්කිසි ඇමතිවරයකුගේ හෝ මේ කථා කරන මගේ හෝ වස්තුවක් නොවෙයි; ජාතික වස්තුවක්. සමුපකාර ව්‍යාපාරය පිහිටුවා තිබෙන්නෙ, ජාතියේ ප්‍රයෝජනය සඳහායි. හැම පක්ෂයකම උදවිය මේක ඇතුළේ සිටිනවා. හැම පක්ෂයකම උදවිය මේ ව්‍යාපාරයෙන් ප්‍රයෝජන ලබනවා. ඒ නිසා පුද්ගලයන්ට මඩගැසීමේ අදහසින් ව්‍යාපාරයට පහර ගැසීම නින්දිත වැඩක් බව කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා වුණත් පිළිගන්නවාට අඩමානයක් නැහැ. මිනිහෙක් වරදක් කරනවා නම් ඒක පෙන්වන්ට ඕනෑ. මිනිහට ගහන න්‍යායයෙන් ව්‍යාපාරයට ගහන්ට ලැහැස්ති වීම සම්පූර්ණයෙන්ම වැරදි බව කියන්න ඕනෑ.

නොයෙක් අමාරුකම් මැද සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යමින් මේ රටේ ජනතාවගේ ආර්ථික ප්‍රශ්න විසඳන්න රජය නොයෙක් විධියෙන් මහන්සි ගන්නවා. මා මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වන විට මගේ කොට්ඨාශයේ සමුපකාර ව්‍යාපාරයක් තිබුනෙ නැහැ. මා සමුපකාර ව්‍යාපාරය දියුණු කර තිබෙනවා. මගේ කොට්ඨාශයේ කුඹුරුවල බිත්තර වී සමුපකාරය මගින් සපයා දී තිබෙනවා; ණය මුදල් ලබා දී තිබෙනවා; පැළ සිටුවීමේ ක්‍රම ආරම්භ කර තිබෙනවා. ඒ අනුව මගේ ප්‍රදේශයේ ගොවීන්ට මම සමුපකාර ව්‍යාපාරය මගින් විශාල සෙනක් සලසා තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය ගොවියාගේ ජීවනය යයි මා කියන්ට කැමතියි. සමුපකාර ව්‍යාපාරය නැතිව අද ගොවීන්ට ජීවත් වන්ට බැරි තත්ත්වයක් උදාවී තිබෙනවා. ඔවුන් තම එළවලු විකුණා ගන්නෙ සමුපකාරය මගින්; වී ටික විකුණා ගන්නෙ සමුපකාරය මගින්, තමන්ට වුවමනා ණය මුදල් ලබා ගන්නෙ සමුපකාර ව්‍යාපාරය මගින්; පොහොර ටික ලබා ගන්නෙ සමුපකාරය මගින්. සෑම ගමකම ජනයා සමුපකාර ව්‍යාපාරයෙන් අද ප්‍රයෝජන ගන්නවා. සමුපකාර ව්‍යාපාරයෙන් අද ප්‍රයෝජන ගන්නවා. සමුපකාර ව්‍යාපාරයේ සුළු සුළු දුර්වලකම් නැතැයි මා කියන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අංග සම්පූර්ණ දෙයක් ලෝකයේ ඇති වන්ට බැහැ. ඒ නිසා සුළු සුළු දුර්වලකම් යම් යම් ව්‍යාපාරවල තිබෙනවා. ඒ නිසා මුළු ව්‍යාපාරයටම ගහන්ට ලැහැස්ති වීම වැරදියි. රත්න දේශප්‍රිය සේනානායක මහත්මයා—දේශපාලන විරුද්ධකාරයෙක්—සමුපකාර තොග වෙළඳායතනයේ සභාපති වශයෙන් සිටින නිසාම ඔහු කර තිබෙන යහපත් සේවය ගැන අමතක කර සමුපකාර ව්‍යාපාරයට පහර ගැසීමේ අදහසක් කා ළඟ හරි තිබෙනවා නම් ඒක වැරදියි.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
මම එහෙම කරන මිනිහෙක් නොවෙයි.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
මම කිව්වෙ එහෙම අදහසක් තිබෙනවා නම් කා ළඟ හරි ඒක වැරදි බවයි.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
මම ප්‍රශ්නයක් ඇසුව ඇමතිතුමාගෙ ප්‍රතිපත්තිය ගැන.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
මම හිටියෙ නැහැ තමුන්නාන්සේ ප්‍රශ්නය අසන වෙලාවෙ.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
හිටියෙ නැත්නම් ඇයි එහෙම් කියන්නෙ?

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
මම විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ගැන සඳහන් කෙළේ නැහැ. මම කිව්වෙ රත්න දේශප්‍රිය සේනානායක මහතා යම් කිසි දේශපාලන පක්ෂයකට අයිති නිසාම උන්නැහෙට පහර ගහන එක වැරදිය කියායි. තමුන්නාන්සේ එසේ කළාද කියා මා දන්නෙ නැහැ. නමුත් තමුන්නාන්සෙ කළත් එසේ කළා නම් එය වැරදි බවයි මම කියන්නෙ. වැරැද්දක් කර තිබෙනවා නම් ඒ වැරැද්දට පහර ගසන එක වෙන වැඩක්. නමුත් පුද්ගලයෙකු නුරුස්සන නිසා ඒ පුද්ගලයාට පහර ගැසීම වැරදියි.

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන්, මේ ගරු සභාව, එක එක පුද්ගලයාට මඩ ගසමින් ලබන මැතිවරණයට සූදානම් වීමේ ස්ථානයක්, වැදගත් පිළිවෙළට වාද විවාදවලට සහභාගි වීමට පුළුවන් ස්ථානයක්, බවට පත් කිරීමට තමුන්නාන්සේගේ බලය පාවිච්චි කරන්නය කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)
ගරු සභාපතිතුමනි, මෙම ඇමති අංශය ගැන වචන සවලාසයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම සන්තෝෂ වෙනවා. මෙම ඇමති අංශය භාරව සිටින ඇමතිතුමා මේ රටේ කිසිම කෙනෙකුට අමතක නොවන අමරණීය සේවයක් කළ ඇමතිවරයෙකු හැටියට මේ අවස්ථාවේ දී මා ප්‍රකාශ කරන්න කැමතියි. රක්ෂණ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ජනසතු කිරීමත්, කොයි තරම් බලපෑම් මධ්‍යයේ වුවද තෙල් සංගම් සම්පූර්ණයෙන්ම ජනසතු කිරීමත්, ඒ වාගේම හැකි තරම් හොඳ සංවිධානයකින් යුක්තව ස. තො. සෙ. ආයතනය නියම හැටියට සකස් කර මහජනයාට සාධාරණ මිළට බඩු සපයා දී ජීවන වියදම පහත හෙළීමට විශාල සේවයක් කිරීමත්, යනාදී ඉතාමත් වැදගත් කාර්යයන් කීපයක් මේ ගරු ඇමතිතුමා විසින් කර තිබෙන බව මුළු ලංකාවේ කවුරුත් දන්න කාරණයක් බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

අනිකුත් කරුණු සම්බන්ධයෙන් කථා කිරීමට කලින් මහියංගනේ ගරු මන්ත්‍රීතුමා (සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.) මා වෙත එල්ල කරන ලද චෝදනාව ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

පිළිතුරක් දීම මගේ යුතුකමක්ව තිබෙනවා. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔය විධියට කෑ ගැසීමට සිදු වී ඇත්තේ මහියංගනේ ගරු මන්ත්‍රීතුමාට ටිකක් වලිගෙ පැගී තිබෙන නිසා බව මම පළමුවෙන් ම සඳහන් කරන්න කැමතියි.

අ. භා. 3.45

ගරු සභාපතිතුමනි, බැස්ටියන් සිල්වා මහතා පස්සර ජීවත් වන එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක් වන මගේ ඡන්දදායකයෙක්. මේ මහත්මය පිටමාරුවෙ අවුරුදු ගණනාවක් කඩයක් පවත්වමින් වෙළඳාමක් කරගෙන සිටිය. ඒ කාල සීමාවෙදි එහි තිබුණ සමුපකාර සමිතිය සම්පූර්ණයෙන්ම පවත්වාගෙන යන්නට බැරි තත්ත්වයට පත් වුණ අවස්ථාවෙදි බදුල්ලෙ ආහාර පාලක විසින් නියෝගයක් කළා, ඒ හාල් කූපන් පොත් ටික භාරගෙන මහජනයාට හාල් ටික බෙදා දෙන්නය කියා. එය නිකම්ම ඇඟේ ගැහීමක් වගෙයි භාර දුන්නෙ. ඊට පසු ඒ මහතා තමාගේ වෙළඳ ව්‍යාපාරයට හාල් පොත් ටික භාරගෙන ඒ සේවය ඉටු කළා. එසේ කරගෙන යන අවස්ථාවේදි නැවතත් සමුපකාර කඩයක් ඇති කරන්න ඕනය කියන අදහස මහජනයාට ඇති වී—එසේ අදහසක් මහජනයාට ඇති වීම ගැන ඇත්ත වශයෙන්ම මා සන්තෝෂ වෙනව—ඒ මුදලාලි මහතාගෙ කඩය සමුපකාර සමිතියට අත්පත් කර ගැනීමට කට යුතු කළා. යම් කිසි අමාරු අවස්ථාවකදී ඒ මුදලාලි මහතා උදව් කළ එක ඇත්තක්. ඒ කඩය ඒ මුදලාලි මහතා විසින් දීර්ඝ කාලීන බද්දකට ගෙන තිබෙන ස්ථානයක්. එය දැන් සමුපකාර කඩයට අත්පත් කර ගැනීම සඳහා මුදල් කව්වේරියට බැඳ තිබෙනවා. සමුපකාර සමිතිය විවෘත කර මේ වෙළඳ මහතාට සම්පූර්ණයෙන්ම ඉවත් වෙන්න කටයුතු කර තිබෙනව. මගේ ප්‍රදේශයෙ කිසිවකුට පක්ෂපාතී නොවී මම සේවය කරනව. කවුරු වුණත් මට යම්කිසි දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කළොත් එම දුක්ගැනවිල්ල සුදුසු තැනට ඉදිරිපත් කිරීමයි, මගේ සිරිත. ඒ මහතා මට කීව, "මා වෙළඳාම් කළ කඩේ නැති වෙන්ට යනව; සමුපකාර අංශයට මුදල් තියෙනව නම් වෙනත් තැනක් සාදා ගන්න කියන්න; එසේ **ක්‍රියා කිරීම** සඳහා වෙන ඕනෑ තරම් ඉඩම් තියෙනව; මගෙ කඩේ තියෙන හාල් පොත් මම භාර දෙන්නම්; මගේ කඩේ විතරක් ඉතිරි කරන්නැයි කියන්න" යන ආකාරයට. සමුපකාර ව්‍යාපාරය ගෙනිච්චට එයාගෙ විරුද්ධතාවයක් නැති බවත් ප්‍රකාශ කළා. ඔහු මට ඉදිරිපත් කළ එම පැමිණිල්ල, මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන බවට ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. බදුල්ලෙ දිසාපතිතුමාට මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්නය කියා නියම කර තිබෙනව. සමුපකාර සමිතියට වෙන තැනක් සොයා ගන්න පුළුවන්කම තියෙනවද; මෙම ක්‍රියාව සාධාරණද, නැද්ද; වෙනත් ගොඩනැගිල්ලක් සාදා ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවද, යන කරුණු බදුල්ලේ දිසාපතිවරයා විසින් සොයා බලනව ඇති. බදුල්ලේ දිසාපතිතුමා, සාධාරණව යුක්ති සහගතව වැඩ කරන කෙනෙක්. ජනතාවට හාල් ටික බෙදා දෙන්න ගිය මුදලාලිගෙ කඩේ සම්පූර්ණයෙන්ම පවරා ගැනීම අසාධාරණයි, ඒ සඳහා වෙන තැනක් සෙයා ගන්න සමුපකාර සමිතියට මුදල් තියෙනව නම්.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)
කඩේ අයිති වත්තටයි.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)
වතුකාරයකුගෙ කඩයක් තවත් කෙනෙකුට මිළට ගන්න බැහැ. බද්දට නැති නම් කුලියට අරගෙන තමයි, වැඩ කරන්නෙ. අපේ රටේ දහස් ගණන් කඩ තියෙනව. ඒ කඩ සියල්ලම ඒවයෙ වෙළඳාම් කරන මුදලාලිලාට අයිති නැහැ. එම නිසා මෙය එතරම් ප්‍රශ්නයක් නොවෙයි. සාධාරණ ලෙස මෙම ප්‍රශ්නය බදුල්ලේ දිසාපතිතුමා විසඳනව ඇති.

ස. තො. සෙ. වෙළඳ ආයතනය ගැන නොයෙකුත් විධියෙ විවේචන ඉදිරිපත් වුණා. නමුත් සතොසෙන් සිදු වී තිබෙන සේවාව කුමක්ද යන්න ගම්බද මන්ත්‍රීන් වශයෙන් අපි හොඳ හැටි දන්නව. **පස්ස**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රට සතොසෙ ගබඩාවක් අවශ්‍ය කියා අවු රුදු තුනක පමණ කාල සීමාවක් තිස්සෙ ඒ ප්‍රදේශයෙ ජනතාව අපට කරදර කළා. ඒ සඳහා වත්තකින් ගොඩනැගිල්ලක් ගන්න තිබුණු අමාරුව කොතරම්ද කියන එක මා හොඳින් දන්නව. අධිරාජ්‍යවාදී සුද්දන් එක්තරා ගොඩනැගිල්ලක් අපට නොදෙන්න කටයුතු කළා. එම වත්තට අයිති කොළඹ මහ කාර්යාලයෙ සිටින නියෝජිතයින් එම ගොඩනැගිල්ල අපට දෙන්න පොරොන්දු වී සිටියදීත්, වත්තෙ පාලක තැන වෙනත් කෙනෙකුට එම ගොඩනැගිල්ල බද්දට දෙන්න උත්සාහ කළා. එවැනි අරියාදු බොහොම ඇති වුණා.

සෘජුව වැඩ කරන හොඳ නිලධාරීන් යම් යම් ආයතනවල සිටිනව නම් අපි ඒ අයට ප්‍රශංසා කරනව. සී. ඩබ්ලිව්. ඊ. එකේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තැන්පත් විජේරත්න මහතා නොහිටින්න, මගේ පස්සර ප්‍රදේශයට අවශ්‍ය කළ සතොසෙ ගබඩාව විවෘත කර ගන්න ලැබෙන්නෙ නැහැ. එතුමා සෘජුව වැඩ කර එම ගොඩනැගිල්ල ලබා ගත් නිසයි පස්සර සතොසෙ ගබඩාවක් ඇති වුණේ.

ගරු සභාපතිතුමනි, සතොසෙ ගැන කියන විට තව හුඟක් දේ කියන්න සිදු වෙනව. පසුගිය කාල සීමාවෙ පෞද්ගලික වෙළෙන්දො කොතරම් රෙදි පිළි සඟවා ගෙන සිටියද? ඒ කාලෙ ගම්බද අයට ලස්සනටත්, ලාබයටත් රෙදි ලබා දෙන්න මූලික වුණේ සතොසෙ ආයතනයයි. සිංහල අවුරුදු කාලෙදි පවා ගම්බද අයට ලස්සන චිත්තයක්, සරමක් අඳින්න අවසථාව ලැබුණෙ එම නිසයි.

අපේ ප්‍රදේශයෙ, පස්සර, යම් වෙළඳ ආයතනයක් මෙම සතොසෙ ව්‍යාපාරයට ඊර්ෂ්‍යාව උපදවාගෙන එය කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරයක් ගෙනිව්ව. ඒ ප්‍රදේශවාසීන් අතර සමුපකාර තොග වෙළඳ ආයතය කොයි තරම් දුරට ජනප්‍රිය වී තිබෙනවද කියතොත්, ටික කලක් ගියාට පස්සෙ එහි සී. ඩබ්ලිව්. ඊ. කියන ඉංග්‍රීසි අකුරු තුන යොදා ඔවුන් Customers Welcome Ever නමින් වෙනත් වෙළඳ ආයතනයක් පවා හැදුවා. සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛාවලට සේවකයන් ගත් ආකාරය ගැන කියන්න තිබෙන්නෙ අධිරාජ්‍යවාදීන්ට කත් අදින ඇතැම් අය එතන විශේෂ පක්ෂපාත භාවයක් සිදු වුණාය කියන නමුත් ස. තො. සේ. ව්‍යාපාරය කඩාකප්පල් නොකර අවංක ලෙස සේවය කරන බවට විශ්වාසය තබන්නට පුළුවන් අය බඳවා ගැනීමට අප හැකි තාක් වෑයම් කරන බවයි. පස්සර විවෘත කළ සමුපකාර තොග වෙළඳ ආයතන ශාඛාවේ මෙතෙක් කල් කිසිම හොරයක් මැරයක් තක්කඩිකමක් වෙලා නැති බව ආඩම්බරයෙන් කියන්න කැමතියි. එන්න එන්නම මහජනයගෙ සහයෝගය වැඩි වෙනව. ඒ නිසා ජනතාවට තව තවත් හොඳින් සේවය කරන්න පුළුවන් වන ආකාරයට එතන ගොඩනැගිල්ල තවත් වැඩි දියුණු කරන්න ඕනෑ බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. එතන තවත් තොග ගබඩාවක් ඇති කරන්න ඕනෑ, දැනට තිබෙන ඉඩකඩ මදි නිසා. දැනට ඒ ගොඩනැගිල්ල රාජසන්තක කරන්නට රුපියල් දහ දාහක්ද කොහෙද වෙන් කර තිබෙනව. එහෙත් රාජසන්තක කිරීමේ ප්‍රමාදය—acquire කිරීමේ ප්‍රමාදය—නිසා එහි වැඩ වඩාත් පුළුල් කිරීම ප්‍රමාද වෙනව. ගොඩනැගිලි තවත් පළල් කර පස්සර ප්‍රදේශයේ ඉන්න වෙළඳ මහතුන්ට තොග වශයෙන් බඩු ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

මේ ගැන සඳහන් කරන විට මට ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) මතක් වෙනව. එතුමා මේ ගරු සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකුවා පමණක් නොව කලක් මේ රටේ අගමැතිවරයා හැටියටත් හිටපු කෙනෙක්. රතු ලූනු සම්බන්ධයෙන් කථා කරමින් එතුමා කිව්වා, ගාලු පළාතේ දුප්පත් ජනතාවට අවුරුද්දක් තිස්සේ රතු ලූනු ගන්න හම්බ වුණේ නැහැයි කියල. මෙවැනි ගල් පැලෙන බොරු හෙවත් සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශ කරන්න එතුමා වැනි වෘඩ දේශපාලනඥයන් ඉදිරිපත් වීම ගැන මා කනගාටු වෙනව. අපේ ප්‍රදේශවල නම් එවැනි තත්ත්වයක් ඇති වුණාය කියන්න බැහැ. ඇත්ත වශයෙන්ම මෑතකදී ලැබෙන රතු ලූනු ප්‍රමාණය වැඩි වෙලා තියෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

ලුනුගල මහජනයා සෑමදාම ඉල්ලනවා එහාටත් බඩු බාහිරාදිය නියම සාධාරණ මිළට ලබා ගැනීම සඳහා ගබඩාවක් ඇති කරන්නය කියල. ඒ සඳහා අවශ්‍ය ගොඩ නැගිලි ලබා ගැනීමත් බොහොම දුෂ්කර කාරණයක්. එහාට ගබඩාවක් දීමේ අදහස සමුපකාර තොග වෙළඳ ආයතනයත් අනුමත කර තිබෙනවා. එහෙත් නගරය තුළ සුදුසු ගොඩනැගිල්ලක් නැති ප්‍රශ්නයයි දැන් තිබෙන්නෙ. ඒ නිසා ස.තො.සේ. ආයතනයේ ශාඛා විවෘත කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි අත්පත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් සකස් කර ගන්න පුළුවන් නම් එය මේ රටටත් ඒ ප්‍රදේශයටත් කරන විශාල සේවයක් බව කියන්න කැමතියි.

ස.තො.සේ. ආයතනය සම්බන්ධයෙන් මීට වඩා දීර්ඝ කථාවක් කරන්න මා බලාපොරොත්තු වන්නෙ නැහැ. යම් යම් විධියේ සුළු සුළු වැරදිත් ටිකක් ඇති. ඒ වගේම අඩුපාඩුත් එකක් දෙකක් ඇති. එහෙත් ඒ ආයතනයෙන් වන සේවය විශාලයි. ඇත්ත වශයෙන්ම අප පළාතට ස.තො.සේ. ආයතනයක් ලබා දීම ගැන අපේ ගම්බද ජනතාව අද වන තුරු මට කෘතඥ වෙනව. එසින් පැහැදිලි වන්නෙ නගරබද ප්‍රදේශවලට කෙසේ වෙතත් ගම්බද ප්‍රදේශවාසීන්ට නම් ප්‍රයෝජනවත් ලෙස ස.තො.සේ. ආයතනය සේවය කරන බවයි. සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ සභාපතිතුමා ගැන මහියංගනයේ ගරු මන්ත්‍රීතුමා ලොකු ප්‍රීතියක් පළ කළා. එක්සත් ජාතික පක්ෂයේ උදවිය ඒ මහත්මයා ගැන ප්‍රීතියක් දක්වනවා.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

ප්‍රීතියක් නොවෙයි, ප්‍රතිපත්තිය ගැනයි කිව්වෙ.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)

මා සඳහන් කරන්නේ මහියංගනයේ ගරු මන්ත්‍රීතුමා කී කරුණු ගැනයි. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සමග හැප්පෙන්නට මගේ අදහසක් නැහැ.

මෝටර් රථවාහනවලට අවශ්‍ය ටයර් සහ අමතර කොටස් ගෙන්වා ගැනීම ඉතා මත්ම අවශ්‍යව තිබෙනවා. ටයර් සහ "ක්ලච් රේසර්" එකක් නැතිකමින් මගේ මෝටර් රථය දැන් තිබෙන්නේ ගැරේජ් කරලයි. ටයර් ආදිය මේ රටට සැහෙන තරම් ගෙන්වනවා වෙන්නට පුළුවනි. නමුත් ඒවා ක්‍රමවත්ව බෙදී යන්නේ නම් නැහැ. පසුගිය සිංහල අවුරුදු සමයේදී මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට සාධාරණ පරිදි රෙදි බෙදා දෙන්නට පුළුවන් වුණා නම් සුළු ප්‍රමාණයක් තිබෙන මෝටර් රථ සඳහා අවශ්‍ය ටයර්ද සාධාරණ පරිදි බෙදා දෙන්නට බැරිකමක් නැහැ. ලංකාවේ තිබෙන මෝටර් රථ සියල්ලම ලියාපදිංචි කර තිබෙනවා. ධාවනය නොකරන මෝටර් රථ ගැනද දිසාපති කාර්යාලවල ලියවිලි තිබෙනවා. සෑම මෝටර් රථයක්ම ලියාපදිංචි කර තිබෙන නිසා ටයර් බෙදා දීම සාධාරණ ලෙසටත් පහසුවටත් කරන්න පුළුවනි. සතොසේ මගින් රෙදි බෙදා දීම සාධාරණව කළා නම් මේ වැඩේ සාධාරණව කරන්න බැරි මක්නිසාද? මේ වැඩේ කරදරයක් නැතිව කරන්න පුළුවනි. එම නිසා සතොසේ මගින් ටයර් සාධාරණ පරිදි බෙදා දීමට වැඩ පිළිවෙළක් යොදන ලෙස ඉල්ලා සිටිනවා. ටයර් නැතිකම නිසා විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ ලොරි හිමියන්ටයි. ලොරිවලට වුවමනා කරන ටයර් සොයා ගැනීම ඉතාමත් අමාරු නිසා ලොරි කුලීද වැඩි කර තිබෙනවා. එසින් ජීවන වියදමද වැඩි වෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! The Sitting is suspended till 4.30 P.M. On resumption the hon. Member for Nattandiya will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ.බී.ඊ., මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් කැවත පවත්වන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවේකය සඳහා විසිර යන අවස්ථාවේදී මා කථා කරමින් සිටියේ රථ වාහනවලට අවශ්‍ය ටයර් සම්බන්ධවයි. ටයර් බෙදා දීමේ වැඩ පිළිවෙල සමුපකාර තොග වෙළඳ ආයතනය අතට හෝ රැගෙන, එය නිසි පිළිවෙළට කිරීම ඉතාමත් කාලෝචිත බව මම කලින් ප්‍රකාශ කළා. මේ රටේ තිබෙන නීති රීති වල හැටියට ගෙවුණු ටයර් පාවිච්චි කරන රථ හිමියන්ට දඩුවම් කරනවා. ගෙවුණු ටයර් පාවිච්චි කිරීම නිසා රථ වාහන අනතුරුවලට භාජන වෙනවා. ඒ නිසා ගෙවුණු ටයර් පාවිච්චි කිරීම නීති විරෝධී වැඩක්. ඉදිරියට එන වර්ෂා කාලයේදී, මේ ගෙවුණු ටයර් පාවිච්චි කිරීම නිසා රථ වාහන අනතුරු රාශියක් සිදු වේය කියා අපට බලා පොරොත්තු වන්න පුළුවන්. ටයර් නැති නිසා බොහෝ දෙනෙක් අද ගෙවුණු ටයර් පාවිච්චි කරනවා. මගේ කාර් එකේ ටයරුත් දැන් ගෙවිල. ටයර් දෙකක් නැති නිසා ඒක ගරාජ් කරල තියෙනවා. ඒ ටයර් "රිබිල්ඩ්" කරන්න පුළුවන් තත්ත්වයක නැහැ. මේ ගෙවුණු ටයර් පාවිච්චි කිරීම නිසා අනතුරු සිදු වීමෙන්, ගරු ඇමතිතුමාගේ අංශයටම අයිති රක්ෂණ ව්‍යාපාරයටත් විශාල පාඩුවක් සිදු වන්න පුළුවන් කම තියෙනවා. රථ වාහන අනතුරුවලට භාජන වුණාම රක්ෂණ සංස්ථාව ඒ වාට වන්දි ගෙවන්න ඕනෑ. නමුත් ගෙවුණු ටයර් පාවිච්චි කර අනතුරුවලට භාජන වුණා නම් ඒ වන්දි ගෙවීමත් හරියාකාර කරන්නෙ නැහැ. අද තියෙන නීති රීති අනුව එවැනි අනතුරු සඳහා වන්දි ලබා ගැනීම අමාරුයි. මේ හේතුව නිසා අද රථ හිමියන් විශාල හිරිහැරයකට පත් වෙලා ඉන්නවා. මේ විධියට සිදු වී තිබෙන්නෙ ටයර් නැතිකම නිසා නොවෙයි. ගරු ඇමතිතුමා අවශ්‍ය තරමට ටයර් ලබා ගන්නවා. ටයර් "රිබිල්ඩ්" කිරීමත් හොඳට කෙරී ගෙන යනවා. නමුත් ටයර් බෙදා හැරීම පෞද්ගලික අංශයට භාර දී තිබෙන නිසයි, ටයර් කළු කඩයේ විකිණීමක් සිදු වන්නෙ.

කාර් පාවිච්චි කරන අයට පමණක් නොවෙයි, ලොරි පාවිච්චි කරන අයටත් ලොකු හිරිහැරයක් සිදු වී තිබෙනවා, ටයර් නැතිකම නිසා. ටයර් නොමැතිකම නිසා සමුපකාර සමිතිවල බඩු ගෙන යාමත් ඇණ හිට තිබෙනවා. එසේම බඩු ගෙන යාමට අය කරන මිළත් වැඩි වී තිබෙනවා. ලොරි ටයර් එකක මිල අද රුපියල් දාහක් පමණ වෙනවා. ලොරියකට ටයර් 6 ක් තියෙනවා. ඒ නිසා ලොරියකට අළුතෙන් ටයර් දැමීමට රුපියල් 6,000 කට වඩා වියදම් කරන්න සිදු වන බව ලොරි හිමියන් කීප දෙනෙක්ම මා සමඟ කීවා. එසේ ටයර් ගන්න පුළුවන් වන්නෙත් ටයර් ලැබුනොත් පමණයි. මේ ටයර් බෙදා දීමට වැඩ පිළිවෙලක් ඇති කර නවා නම් එය රෙදි බෙදා දීමට වඩා හොඳින් කරන්න පුළුවන්. මේ රටේ සෑම රථයක්ම ලියාපදිංචි කරල තියෙන නිසා—සෑම රථයකටම පොතක් තියෙන නිසා—ටයර් බෙදා දීමේ වැඩ පිළිවෙළ පහසුවෙන්, ඉක්මනින්, ක්‍රියාවෙ යොදවන්න පුළුවන්.

සමුපකාරය සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කරන්න මම අදහස් කරන්නෙ නැහැ. පස්සර ප්‍රදේශයේ සමුපකාර සමිති රාශියක් සාර්ථක ලෙස කටයුතු කරගෙන යනවා. මේ සෑම සමිතියක්ම බැඳී තිබෙන්නෙ, බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයටයි. මේ බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සාමාජිකයන් වශයෙන් බැඳී සිටින සමිතිවලින් වැඩි කොටසක් පස්සර කොට්ඨාශයේ සමුපකාර සමිති. නමුත් මෙම පස්සර කොට්ඨාශයේ තිබෙන සමුපකාර සමිතියට බදුල්ලෙන් බඩු ලබා ගැනීමට විශාල වියදමක් දරන්නට සිද්ධ වෙනවා. දැනට ශාඛාවක් පස්සර විවෘත කර තිබුණත් එහි වැඩ කටයුතු එතරම් සාර්ථක නැහැ. එම නිසා පස්සරටත් වෙනම විවිධ සේවා සමුපකාර සමිති සංගමයක් ඇති කළ යුතුය කියා මා දැනට මත් යෝජනා කර තිබෙනවා. මේ ගැන සමුපකාර උප කොමසාරිස්වරයා සමඟ කථා කර තිබෙන නිසා එම වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට සමුපකාර දෙපාර්තමේන්තුව ඉක්මනින් ක්‍රියා කරාවිය කියා අප බලා පොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුපකාර සමිති සංගම්වලින් නොයෙකුත් කොන්ත්‍රාත් වැඩ භාර ගැනීම සඳහා ඉදිරිපත් වෙනවා. ගොඩනැගිලි තැනීම, පාරවල් තැනීම, ආදී කටයුතු සඳහා කොන්ත්‍රාත් භාර ගන්න නමුත් එම වැඩ කටයුතු ගැන පරීක්ෂා කර බලන, වැඩ කටයුතු අනුමත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

කරන නිලධාරීන් නොයෙකුත් අවස්ථාවලදී මෙම සංගම්වලට හිරිහැර කරනව. වැඩ කට යුතු කර ගෙන යන්නට බැරි ආකාරයෙන්, පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ටවත් නොකරන අන්දමට නිතිරීති ක්‍රියාවෙ යොදවනව. මේ නිසා අප්‍රමාණ හිරිහැරවලට මෙම සංගම් භාජන වෙනව. සමහර විට ඒ අන්දමට ක්‍රියා කරන්නෙ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් වැඩ අනුමත කරන නිලධාරීන්ට යම් යම් පලප්‍රයෝජන ලැබෙන නිසා වෙන්නට පුළුවනි. නමුත් සමුපකාර සමිතියකින් වැඩක් භාර ගත්තාම ඒ අන්දමට ලාභ ප්‍රයෝජන නිලධාරීන්ට ලැබෙන්නෙ නැහැ. එහෙමත් නැති නම් සමුපකාර ව්‍යාපාරයට එරෙහිව කටයුතු කරන නිසා මේ නිලධාරීන් ඒ අන්දමට කටයුතු කරනවා වෙන්නට පුළුවනි. මේ අන්දමට නිලධාරීන් විසින් හිරිහැර කරන ලද අවස්ථා මම දන්නව. මට පැමිණිලි රාශියක් ලැබී තිබෙනව. එම නිසා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වේවා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ වේවා, වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ වේවා, යම් කිසි කොන්ත්‍රාත්තුවක් සමුපකාර සමිති සංගම යක් විසින් ගත්තාම, එම කොන්ත්‍රාත් වැඩ ගැන පරීක්ෂා කරන, අනුමත කරන නිලධාරීන් එම සමිති සංගම් ආරක්ෂා කිරීමට, එය පවත්වා ගෙන යාමට හැකි වන අයුරින් කටයුතු කරන්න ඕනෑ. බොහෝ අවස්ථාවල එම සමිතිවලට අවශ්‍ය සිමෙන්ති, වෙනත් උපකරණ ලබා දීමට නිලධාරීන් උදව් කරන්නෙ නැහැ. මේ නිසා බොහෝ විට එම සමිතිවල අය මන්ත්‍රීවරයා සොයා ගෙන එනව. මේ අන්දමට අපේ නිලධාරීන් කටයුතු කරන්නෙ මොන කාරණයක් නිසාද කියා මම ප්‍රශ්න කරනව. රජය මහජනතාවගේ මුදල් ගෙවා නිලධාරීන් පත් කරන්නෙ මහජනයාට සේවය කිරීමට නම් එම සේවය හරි හැටි ඉටු කරන්නෙ නැත්නම්, සෑම දෙයකටම මන්ත්‍රීවරයා සොයා ගෙන එන තත්ත්වයක් මහජනතාවට ඇති කරනව නම්, ජනතාව විසින් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා සකස් කරන ලද සමුපකාර සමිතිවලට සහයෝගය දක්වන්නෙ නැත්නම් එබඳු නිලධාරීන්ගෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද කියා මම අහනව. ඇත්ත වශයෙන් මෙම නිලධාරීන් උනන්දුවෙන් වැඩ කටයුතු කරන්නට ඕනෑ පමණක් නොවෙයි, සමුපකාර සමිතිවලට සහයෝගය දෙන්නත් ඕනෑ. සාමාන්‍යයෙන් සමුපකාර සමිතියකට පරීක්ෂක මහතකු—එක කොට්ඨාශයකට—පත් කර ඇතත්, ඒ තැනැත්තා තමා භාර දූර වැඩක් භාර ගත්තාය කියා උනන්දු වී, අවශ්‍ය උපදෙස් දී කටයුතු කරන්නෙ නැහැ. දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන්ගෙන්, වැඩ බැලීමට එන නිලධාරීන්ගෙන් සිදු වන යම් යම් අවහිරකම් ගැන සොයා බලා කටයුතු කිරීමට, අවශ්‍ය දේවල් සපයා ගැනීමට ආධාර දීමට ඉදිරිපත් වෙන්නෙ නැහැ. එම සමිතිවල සිටින ගරු සභාපති, ගරු ලේකම් වැනි අය හැම කට යුත්තටම දුව පැන වැඩ කරන්න ඕනෑ. එසේ වුණත් තමන්ගෙ වැඩ කටයුතු හරියාකාර කර ගැනීමට නොහැකි වීම නිසත්, නිලධාරීන්ගේ සහයෝගය නොදෙන නිසත්, ඒ අය නොයෙකුත් අවස්ථාවලදි අධෛර්යයට පැමිණ තිබෙනව.

මම දන්නව, එක සමුපකාර සමිති සංගමයක් එක අවුරුද්දක් තුළදී දියුණු කරලා කොන්ත්‍රාත් වැඩ කටයුතු පවා භාර ගැනීමට හැකි වන අන්දමින් සකස් කර ගත්ත. එසේ සකස් කර ගෙන තැපැල්ගොන්න කියන ස්ථානයේ පාසැල් ගොඩනැගිල්ලක් තැනීමට භාර ගත්ත. නමුත් එම ගොඩනැගිල්ල තැනීමට අවශ්‍ය ලී, සිමෙන්ති, ආදී ද්‍රව්‍ය ලබා ගැනීමේදී නිලධාරීන් අප්‍රමාණ කරදර මේ සමිතියට කළා. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මෙම සමුපකාර සමිතියට කළ හැකි සෑම උපකාරයක්ම මම කළා. එතරම් උනන්දුවෙන් ආරම්භ කළ කටයුත්ත කර ගෙන යාමට නිලධාරීන් සහයෝගය නුදුන් නිසත්, හැකි තරම් කර දර හිරිහැර කළ නිසත්, මේ කටයුත්ත බොහෝ දුරට ප්‍රමාද වුණා.

එක තැනකින් කැපුවොත් කියනවා, එතැනින් නොවෙයි, අතනින් කපන්නය කියා. අඩි 6 ක් කැපුවොත්, අඩි 6 ක් නොවෙයි, අඩි 7 ක් කැපිය යුතුය කියනව. ඒ විදියේ වැඩ නිසයි, වැඩ පමා වන්නේ. කොන්ත්‍රාත් වැඩක් බාරගෙන නියමිත කාල සීමාවට කරන්නට බැරි වුවොත් දඩ ගහනවා. නියමිත දිනට වඩා දින 10 ක් පමා වුවොත් තවත් වැඩිය දඩ ගහනවා. මේ අනුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව රුපියල් 400 ක් පමණ දඩ ගැහුවා. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දඩ මුදල් ගෙවන්න සිඛ වෙන්නේ මහජන මුදල්වලිනුයි. ඒ නිසා ඔවුන්ට නිලධාරීන් ගෙන් සහයෝගය නොලැබෙනවා නම් ඔවුන් අධෛර්යයට පත් වෙනවා. සමුපකාර ව්‍යාපාරය සාර්ථක කිරීම සඳහා යම් නිලධාරි කොටසක් පත් කර සිටිනවා නම් ඒ අය වැඩ කරන්නේ කෙසේද කියා සොයා බැලීම උසස් නිලධාරීන්ගේ යුතුකමයි.

තේ පානයෙන් පසු මට කථා කිරීමට දුන් කාලය විනාඩි 15 ක් නිසා දීර්ඝ වශ යෙන් කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් එක් කාරණයක් ගැන කීමට අදහස් කරනවා. බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) මේ අවස්ථාවේ මෙහි නොමැති නිසා එතුමාට එල්ල වුණු චෝදනාවක් ගැන වචනයක් කීම මගේ යුතුකමක් කියා මම අදහස් කරනවා. මහියංගන ගරු මන්ත්‍රීතුමා (සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.) විසින් නැගූ ඒ චෝදනාව මේ ගරු සභාවේදී කිය යුතු තරම් එකක් නොවෙයි. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම්වලදීත් මේ ගැන සඳහන් කරන නිසා, ඒ ගැන වචනයක් කීම උචිතයයි මම කල්පනා කරනවා. බදුල්ලේ මන්ත්‍රීතුමාගේ ඩිරයිවර්ට ස.තො. සේ. රක්ෂාවක් දුන්නාය කියායි, චෝද නාව. මන්ත්‍රීවරයා නම් කිපයක් යැව්වාම ඒ අයගෙන් කෙනෙක් තෝරාගන්නා බව කවුරුත් දන්නවා. බදුල්ලේ මන්ත්‍රීතුමා ගේ ඩිරයිවර් ඉතාම අවංක හොඳ ඉලන් දාරියෙක්. මැතිවරණ කාලයේදී ඔහු වැඩ කළේ නොකා නොබී ඉතා උනන්දුවෙන් බව බදුල්ලේ මන්ත්‍රීතුමා මෙන්ම මාත් දන්නවා. ඔහු ඩිරයිවර් කෙනකු වශයෙන් තබාගෙන පඩි ගෙවීමට තරම් පොහොසත් කෙනෙක් නොවෙයි, බදුල්ලේ ගරු මන්ත්‍රී තුමා. ඒ මන්ත්‍රීතුමාමයි, එතුමාගේ කාර් එක එළවාගෙන යන්නේ. ඒ නිසා ඒ තැනැත්තාට රක්ෂාවක් ලබා දීම මන්ත්‍රී තුමාගේ යුතුකමක්. මන්ත්‍රීවරයා වුවත් තමන් ළඟ සේවය කළ කෙනකුට අනුකම්පාවක් දක්වන්නේ නැති නම් වෙනත් කෙනකුට අනුකම්පාවක් දක්වන්නේ කොහොමද? අනික් අයට මෙන්ම මන්ත්‍රී වරුන්ටත් හිතක් පපුවක් තිබෙනවා. ඒ අනුවයි, ඒ මන්ත්‍රීතුමා ඒ තැනැත්තාට රක්ෂාවක් ලබා දී තිබෙන්නේ. මේ තැනැත්තා—ඩිංගිරි බණ්ඩා මහත්මයා—ගිය මාසෙ 27 වනදා විවාහ වුණා. මම ඔහුට මගේ කාර් එකත් දුන්නා. අදම මහියංගන මන්ත්‍රීතුමා මේ කාරණය මතක් කළ එකත් හොඳයි. ඒ තැනැත්තා අද උදේ වරුවේ ඔහුගේ අළුත් මනමාලියත් කැටුව අවුත් මේ ගැලරියේ සිටියා.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

මම කිසිවකුට පෞද්ගලික චෝදනාවක් කළේ නැහැ. මා කළේ සත්‍යයක් ප්‍රකාශ කිරීම පමණයි. මීට පසු සේවකයින් ගන්නා විට සම්මුඛ පරීක්ෂණයක් කරන්නටයි කියන්න. [බාධා කිරීමක්]

අ. භා. 4.45

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்னயக்க)
(Mr. Amarananda Ratnayake)

අපි දන්නවා සම්මුඛ පරීක්ෂණවලින් තේරෙන හැටි. සමහර විට සම්මුඛ පරීක්ෂණවලින් අසාධාරණ විධියට වැඩ කෙරෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම වෙළෙඳ සේවකයෙක් කම්කරුවෙක් තොග වෙළඳ ආයතනයට තෝරා ගැනීමේ දී විශේෂයෙන් එය කාබාසිනියා කරන කෙනෙකු තෝරා නොගත යුතුයි.

එක්සත් ජාතික පක්ෂයේ සිට දැන් පෙඩරල් පක්ෂයේ සිටින මුත්තුර් හි ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපි පිටරට වෙළෙන් දන්ටත් අනුකම්පා කරන්නට ඕනෑ. ඒ අය ගැනත් සොයා බලන්නට ඕනෑ ඒ අයට ආධාර කරන්න ඕනෑ, කියා [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

එක්සත් ජාතික පක්ෂයේ නොවෙයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)

එක්සත් ජාතික පක්ෂයේ සිටි දැනට පෙඩරල් පක්ෂයේ සිටින මුත්තුර් හි මන්ත්‍රීතුමා කිව්වා. විලිලැජ්ජා නැතිව මේ රටේ රටවැසියෙකු හැටියට එවැනි ප්‍රකාශයක් කිරීම ගැන කණගාටු වෙනව. සී. ඩබ්ලිව්.ඒ. එකට එරෙහිව වැඩ කරන ප්‍රතිගාමී වෙළෙන්දන් සිටිනවා. මා දන්නවා සී. ඩබ්ලිව්. ඒ. එකේ "කිව්" එකට මිනිසුන් එවා හොඳ හැටි බෙදා දෙන රෙදි ටික හංගලා යටිමඩි ගසාගැනීමට වෙළෙන්දන් වැඩ කළ බව, ඒ විධියෙන් ඒවාට ආධාර කරන ප්‍රතිගාමී ඉලන්දාරින් මේවා ඇතුළට ඇවිත් නැවත වරක් වෙළෙන්දන්ගේ මඩිය තර කර ගන්ට ආධාර කරන නිසයි, අපට හොඳ විශ්වාස අවංක අය තොග වෙළෙඳ ආයතනයට තෝරා ගත්තේ.

මේ ගරු වෙළඳ ඇමතිතුමා මේ භාර ගත් අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ අනුව මේ රටේ ප්‍රගතිශීලි වැඩ කටයුතු රාශියක් කරන්නට එතුමාට ආධාර දීමට අපි එතුමාගේ පිටුපසින් සිටින බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

ටී. සිවසිතම්පරම් මයා. (වවුනියාව)
(திரு. ரீ. சிவசிதம்பரம்—வவுனியா)
(Mr. T. Sivasithamparam—Vavuniya)

Mr. Chairman, the Debate in the House becomes really interesting when two hon. Members get up and start arguing. I for one do not propose to speak at length and thereby take away the time of hon. Members who are here to make valuable contributions.

Before I actually start speaking on the votes of the Ministry of Internal and External Trade and Supply, I think it is my duty to speak a few words on the points made by the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) and the hon. Member for Galle (Dr. W. Dahanayake) in connection with traders who have come here from outside. It is an accepted fact, when you go through the list of traders who are being given permission to import articles in order to do business in this country, that more than 75 per cent of them are from outside the country. It is also a welcome idea that we Ceylonese must aspire and endeavour as far as possible to see that the entire trade of our country is handled by Ceylonese, be they Tamils or Sinhalese. But there is an important fact which one should not forget, namely, that while these traders, whether they be Borahs, Indians or anybody else, came here to do a century old business, we Ceylonese really did not care to take to trade at the time that they came with capital and established their businesses here.

As a Ceylonese I really welcome the idea that we must endeavour to take over these businesses. The Ceylonese must handle all the trade, but at the same time I do not see any reason why we should blame the Hon. Minister of Internal and External Trade and Supply or the Department of Import Control for giving these traders a big slice of the import licences so that they may import their commodities into this country. As far as I am aware, the practice of giving permits to import articles is based on the entire amount of import trade which a particular trader has handled during the past few years. That is the only way in which the Department of Import Control or the Minister has been able to do it and is doing now.

If it is the desire of the Ceylonese that they should enter into the field of trade, we can then, whether it be from Indians or Borahs, buy over their businesses and tell them, "We are paying you the value of your business, please get back to your country". I think that is the only proper thing we can do. We would gain nothing by speaking here at length as to why we have given so much to traders from outside this country and why traders here have not been given the same concession. Without any hanky-panky we must boldly say, "We are prepared to take over your business, you have been in business here for so long, now the time has come when we must handle your trade and you must pack up and get back to your country". There-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

after, it should be the responsibility of the Cabinet and the Government as a whole to bring in legislation to carry that into effect. We would not gain anything by shouting here or making them suffer. We cannot eliminate these people who had started business here. I do not want to speak at length, but let us say to them that they have been here long enough and let us take over their business, buy their businesses, and they will go away.

Now, Sir, I would like to speak a few words on the question of the import of raw materials and machinery. If we are really interested in industrialization, we must help the industrialist by permitting him to import the raw material necessary for the production of the article, and we must also give him permits to import the necessary machinery.

Take the case of lathes. The people who want them to supply the needs of our country are not given permits to bring them down, whereas firms are given permits to import them and to sell them. I can cite concrete examples, but let me mention one case of Jafferjee Brothers. They were allowed to import 21 lathes each costing between Rs. 15,000 to Rs. 20,000. But when a single individual asks for a permit to import one lathe he is not given it.

I do not know whether the rules that ought to be followed in the issue of such permits are being adhered to strictly. It would appear that there is corruption, and the Hon. Minister would do well to investigate the matter, now that I have given a concrete example.

Hon. Members in the course of the Debate have spoken at some length on the urgent need of spare parts for motor vehicles. I would like to bring to the notice of the Hon. Minister another aspect of the problem.

One can say that the fishing industry is flourishing to a certain extent If it is flourishing, it is because of the introduction of mechanized boats. Today, the ordinary fisherman depends on his mechanized boat for his catch. But if one were to go along the coast of the Island today, be it north, south, east or west, one would find hundreds of mechanized boats idling ; they cannot be used for want of spare parts. At the same time we hear that the people who import spare parts are allowed a certain percentage of imports, which I understand is about 75 or 80 per cent. Where are these spare parts ? I think it is the responsibility of the Hon. Minister of Internal and External Trade and Supply to see that these essential spare parts imported by these traders are distributed in a proper way and not hoarded or sent to the blackmarket to be sold at very high prices. I do not really put the blame on the Hon. Minister. This practice has been going on for some time. We have heard hon. Members of this House off and on speaking at length on this question and stating that we will have to put an end to this practice. But still when we go to buy a tyre for a lorry we find that although the price of a tyre is Rs. 700, we have to pay Rs. 1,200 to Rs. 1,300 for it.

The fishermen and industrialists require tyres for their lorries for the transport of their products. They have to buy these tyres in the blackmarket. At the same time the traders who import these tyres are also getting a big slice on the import permits. I would appeal to the Hon. Minister to take action on this matter. Let us not just talk but let us do something for the country and arrest these bad tendencies.

We hear the same story in regard to fishing nets. The C. W. E. is importing the nets, but I know and I have heard that while fishing nets are not available in the north and in the east to the unions they are available in the private market to be bought at exorbitant prices. These poor fishermen who have to buy these nets have to pay a very high price for them. Why cannot you control the import and sale of these nets

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. සිවසිතම්පරම් මයා.]

through the C.W.E. or any other corporation you propose to establish? Why do you not do these things? These are matters which closely concern the fishermen and the industrialists.

The hon. Member who preceded me spoke about tractors. Today the tractor has taken the place of the buffalo. There are thousands and thousands of tractors in this country; there are wholesale importers of tractors; but you still see thousands of tractors idling without spare parts. When an owner of a tractor comes from Vavuniya to Colombo to buy spare parts for his tractor, he is told by the importer to bring the tractor to Colombo, that they would repair it here but that they could not sell spare parts. We are told that food production must be encouraged and we are asked to embark on food production and fishing. If you want the people to do this you must also see that they are provided with the necessary requirements without any difficulty and at reasonable prices.

අ. භා. 5

There is another matter that I would like to mention. As early as 1963, applications were called—this was even published in the papers—from those who wanted to import motor lorries, first preference being given to those who wanted them for an agricultural purpose, second preference to fish traders, and so on. I know that a number of these people who required lorries for the transport of their vegetables, their fish and other products, sent in their applications with a stamp and other particulars that were required. That was the end of the matter. These industrialists and others want the lorries for the transport of their goods which they cannot send by rail from areas where there are no railway facilities. These are perishables. They have to transport their fish, they have to transport their vegetables 40 to 50 or 60 miles away. For that purpose they require vehicles. What has happened to this matter? I ask the Hon. Minister to be good enough to give us a reply as to what has happened to all these applications, and whether he proposes to grant special permits to these people to import lorries.

On the C.W.E., I do not wish to speak at length. I only wish to make one reference. When the hon Leader of the Opposition spoke, we heard that the C.W.E. was really competing with co-operative institutions in opening up branches. Is it because the C.W.E. does not have other places to open their co-operative depots? I can cite an example in my own constituency.

About one and half years ago, in Vavuniya, a godown about 250 feet by 60 feet was constructed by the C.W.E. to open a depot. In that area there are 187 co-operative societies' retail shops and more than four unions. All these purchase their requirements from the C.W.E. in Colombo. Why has the C.W.E. not thought of opening this depot after spending so much money in constructing a godown?

The hon. Leader of the Opposition said that there is keen competition going on between the C.W.E. and co-operative unions in starting depots. Why does the C.W.E. not go into areas which are congested? I would ask the Hon. Minister to inquire into this matter and see that these depots are opened only in areas which really need them.

With regard to the co-operative movement I am very happy to say that the present Commissioner of co-operative Development is a gentleman who had been serving in my electorate. He is a very able and enthusiastic officer who is really conversant with the difficulties which have to be faced by people in the rural areas. When he was the Government Agent there for a couple of years and was in the Divisional Agricultural Committee, he realized some of the malpractices and corruption prevailing in the co-operative unions

digitized by noolaham.org | aavanaham.org

and societies, appointed a sub-committee of which he was chairman, and went into the whole problem.

The first and foremost recommendation of this sub-committee was that in the co-operative unions or societies no Government servant, whether it be the G.A. or the D.R.O. or co-operative inspector, should be the president or other office bearer. I am very glad to say that as chairman of that sub-committee he recommended that about 2 or 2½ years ago, and now he has come to execute his own recommendation.

It is with great pain of mind that I say that there are four unions functioning in my electorate. They are all running at losses ranging from Rs. 60,000 to Rs. 80,000. And the very practice where a Government servant is the president and a co-operative inspector is the secretary of these unions is still going on.

Co-operative institutions and movements are for the people and have to be run by the people. It is on this main principle that co-operative institutions were established. But, today, because the D.R.O. happens to be the president and the co-operative inspector happens to be the secretary of such an institution, the other members are unable to express their sentiments or their views, for they have to go to the D. R. O. the next day for some other purpose and they do not wish to go against him. Whatever he says is agreed to. As a result, these institutions are running at a loss. The people of the area are not able to get the benefit of the co-operative movement. They are not given the chance to run the co-operative institutions.

Now, these societies are being run by bureaucrats. We expect them to run them efficiently and profitably. But are they really doing so? No. This is a matter which I think the Hon. Minister will have to take up in order to see that the position is remedied.

In my electorate there are three types of co-operative societies: the middle-class co-operative societies, the lower middle-class co-operative societies and the peasants' co-operative societies. I wish to ask the Hon. Minister whether there should be such classes in the co-operative movement.

There are middle-class co-operative societies whose members are just a handful. They have taken lands, more than two to three hundred acres in extent, on annual permits and also loans to the tune of lakhs and lakhs of rupees. Most of these loans are outstanding for the last three to four years. But wherever the peasants' co-operative societies which have a membership of more than two to three hundred, apply for loans to put up buildings, they are told: "No loans". Of course, conditions have changed now and there is an improvement. Anyway, there is this discrimination.

The Divisional Agricultural Committee of the Vavuniya District appointed a sub-committee to go into the question of how we can rid the societies of the existing corruption and malpractices. The unanimous recommendation of that committee was that if a co-operative society is to function well, it must have its building, a skilled or trained manager, and its retail shop. It is only after that that a society could be run efficiently and profitably.

Then there are multi-purpose co-operative societies in the Vavuniya District which have taken 200 or 300 acres of paddy lands. Although they are called multi-purpose co-operative societies the only purpose they exist for is the purchase and sale of paddy. When you go into it, you will see that from 200 acres of paddy land we get about 6,000 bushels. The commission on the purchase of these 6,000 bushels comes to only about Rs. 3,000 or even less, and when labour and other charges are allowed for, the balance is about Rs. 1,000 to Rs. 1,500. Now, is it possible with this amount to employ a qualified manager to run a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගී. සිවසිතම්පරම් මයා.]

retail shop, re-pay a loan obtained for building purposes, etc.? It is impossible.

It was the unanimous decision of the sub-committee that these societies should be re-grouped into workable units. As it is, what happens is that in order to run the retail shop, to keep it going, they resort to black-marketeering in paddy and other corrupt practices. The entire blame has to be laid at the door of the department. You cannot blame the people. They are forced to resort to various malpractices and corrupt means in order to run their societies.

The sub-committee made its recommendations a couple of months back. I am sorry to say that nothing has happened since then. I would request the Hon. Minister to please go into these matters and see that justice is done. Let us not waste our time speaking, speaking and speaking at length. Let us actually start doing something to rectify this state of affairs.

I do not wish to speak at length. My earnest hope is that the Hon. Minister will really look into these matters and rectify them, so that the peasants, the poor farmers and the people of the area will really benefit.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, සමුපකාර සමිති සහ වෙළඳ කටයුතු භාරව සිටින ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කරුණු කීපයක් සඳහන් කරන්න තිබෙනව. සමුපකාර වැඩ පිළිවෙළ නියම ආකාරයට පවත්වා ගෙන යනවා නම් අපි එය අනුමත කරනව. දැන් සමුපකාර සමිති විවිධ අංශවලින් පිහිටුවා තිබෙනව. එහි දියුණුව සඳහා වැඩි ශක්තියක් යෙදෙව්වා නම් මගේ හිතේ එය හොඳ වෙන්න තිබුණ. නමුත් සමුපකාර තොග වෙළඳ සේවයත් සමුපකාර වැඩ පිළිවෙළ අඩපණ කිරීම සඳහා මේ ඇමතිතුමා විසින් යොදවා තිබීම ගැන අපි කනගාටු වෙනව. ඒ ම්‍යාද? විවිධ සේවා සමුපකාර සමිති වැඩ පිළිවෙළ මේ රටේ ටිකක් නැගගෙන ගියා. ඒ සමුපකාර සමිති මගින් ගම් ප්‍රදේශවල ගබඩා විවෘත කර ජනතාවට ප්‍රයෝජන ලබා ගැනීම පිණිස යම් සේවයක් කිරීමට ජනතාව වීර්ය කළා. නමුත් එසේ දියුණු වීගෙන යන අවස්ථාවේදී ඇමතිතුමා ඒ ස්ථානවල සමුපකාර තොග වෙළඳ ආයතනයේ ගබඩා විවෘත කරන්න පටන් ගත්ත. මම අහනව තමුන්නාන්සෙ මේ ගරු සභාවට කලින් කියලද එසේ කෙළේ, කියා. එහෙම නැත්නම් තමුන්නාන්සෙගෙ දූෂණ වැඩ පිළිබඳවත් මේ රටේ දියුණු කරන්නද එසේ කෙළේ, කියා මම අහනව. ඒ මන්ද? සමුපකාර තොග වෙළඳ පොදු ආයතනයෙ සෑම තැනම දූෂණ. තමුන්නාන්සෙයි ඒව පුරුදු කෙළේ. තමුන්නාන්සෙගෙ හිතමිත්‍රයන්, ඡන්දවලට ඉදිරිපත් වී පරාද වූවන්, තමුන්නාන්සෙගෙ මණ්ඩලවලට දැගෙන තමුන්නාන්සෙ මුල් වෙලා දූෂණය කරගෙන යනව. එක දවසක දේශප්‍රිය දානව; අනික් දවසෙ නවරත්න දානව; අනික් දවසෙ තවත් එක්කෙනෙක් දානව. ඔය විධියටයි තමුන්නාන්සෙ මණ්ඩල පවත්වාගෙන යන්නෙ. ඒ සේරම හොරු බව මම කෙළින් කියනව. ඔවුන්ට ඉඩ දෙන්නෙත් තමුන්නාන්සෙ නම්, තමුන්නාන්සෙත් ඊට ඉහළ මිනිහෙක් වෙන්න ඕනෑ. තමුන්නාන්සෙගෙ හිත මිත්‍රයන් ඡන්දයට ඉදිරිපත් වී ඇතැම් තැන්වලින් පරාජය වුණාම තමුන්නාන්සෙ ඒ අය අරගෙන මේ තැන්වලට දානව. ඊයෙ පෙරේදා තමුන්නාන්සෙ නැති වෙලාවෙ එක්කෙනෙක් අස් කළා. නමුත් තමුන්නාන්සෙ නැවතත් ඒ තැනැත්තා අරගත්ත. ඒ කියන්නෙ නවරත්න කියන අය. මොකද ඒක කෙළේ?

අ. භා. 5.15

තමුන්නාන්සෙලාගෙ දූෂණ ගැන 1964 ඔඩිටර් ජනරාල්ගෙ වාර්තාවෙත් සඳහන් වී තිබෙනව. නීති රීති අනුව ගබඩාවල පොත් පත් තබන්නෙ නැතිලු. එසේ පොත් පත් තබන්නෙ නැත්නම් ඒ හොරකම් කරන්න තමුන්නාන්සෙ අත දී තිබෙන බවයි මම කෙළින්ම කියන්නෙ. මේ පාර්ලිමේන්තුවෙ "පාර්ලිමන්ට්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිරිස්" අංක 19 දරණ 1964දේ 8 වෙනි සැසි වාර්තාවෙ මෙසේ සඳහන් වී තිබෙනව:

"'Register of shortages in stocks' and 'Register of losses' being two of the books that the Establishment is required to maintain in terms of regulation 3 of the Regulations made under section 17 of the Co-operative Wholesale Establishment Act, (Cap. 126) were not maintained."

තමුන්නාන්සෙ මේ බව දන්නෙ නැද්ද? තමුන්නාන්සෙ දන්නව. යාළු මිත්‍රයො දෙපාර්තමේන්තුවට දැම්ම. ඒ ගොල්ල පොත් පත් තිබ්බෙ නැහැ. ලක්ෂ ගණන් හොරකම් කළා. ලක්ෂ ගණන් නොවෙයි කෝටි ගණන් හොරකම් කළා. ඒ මුදල් රත්රන් කළාද කියා මා දන්නෙ නැහැ. ඒක හොයල බලන්න ඕනෑ. ව්‍යවස්ථානුකූලව පොත් නොතබා වෙළඳෙළඳාම් කට යුතු කරගෙන යනවා නම්, ඇයි ඒ ගැන කෙළින්ම චෝදනා කෙලේ නැත්තෙ? ඒ අය තවම එතන තබා ගෙන ඉන්නේ ඇයි? තමුන්නාන්සේ විසින් හොරකම් වර්ධනය කරන්න, දූෂණය වර්ධනය කරන්න, අල්ලස් වර්ධනය කරන්න ආදී අක්‍රමිකතාවන් වර්ධනය කරන්න නොවේ නම් තවම ඔවුන් තබා ගෙන ඉන්නේ ඇයි කියා මා අහනව. උසාවිවලත් නොයෙක් විධියට ගන්න සමහර වචන තිබෙනව. ඊයෙ පෙරේදා මම දැක්කා, පොලිස් වාර්තාවක ලියල තිබුණු එකක් මට හරියට වචනත් මතක නැහැ. ලාභ ගන්න ගෙන ගිය එකට, අලාභ ලැබුණේ නැහැ, කියා තිබුණා. එහෙම පිළිගන්න නඩුකාරයොත් සිටිනව. අලාභ ලැබුණේ නැත කියා කවුරුවත් ලියන්නෙ නැහැනෙ. ලබා ගන්නේ ලාභයි. ඔහොමත් අකුරු වෙනස් කර තින්දු දෙන නඩුකාරයොත් සිටිනව. තමුන්නාන්සෙත් හොඳට දන්නව. ඒ විධියේ දූෂණවලට උසස් තැන්වල සිට—නඩුකාරයින්ගේ සිට—ඉඩ තිබෙනවා නම් මේ කොටස් දමා වැඩ කරන තැන්වල තමුන්නාන්සේගෙන් එය අඩු වේය කියා මා විශ්වාස කරන්නෙ නැහැ.

පොත් පත් තබන්නේ නැහැ. රටේ මහජනයාගේ ඇඟ උඩට බදු බර වැටෙන්නෙ ඔය නිසයි; හොරකම නිසයි. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් අද සී. ඩබ්ලිව්. ඊ. එකට බඩු ගෙන්වන විට හෙට දෙකෙන් පංගුවක් පිටකොටුවේ වෙළෙන්දන් ළඟ. අද සී. ඩබ්ලිව්. ඊ. එකේ හෙට හොර වෙළෙන්දන් ළඟ. ස. තො. සේ. ගබඩාවලට නැහැ; විවිධ සේවා සමුපකාර සමිතිවලට නැහැ; සමුපකාර සංගම්වලට නැහැ. තමුන්නාන්සේ ඔතන ඉඳගෙන හොරකම, දූෂණය, අල්ලස, පඟාව, සේරම වර්ධනය කරනවා. නිලධාරීන්ට බනින්න ඕනෑ නැහැනෙ.

මේ වාර්තාවේ මේ විධියටත් තිබෙනවා, තවත් එකක්. පුදුම දේවල්. "ඕවර් ටයිම්" ගැන හොඳ එකක් තිබෙනවා.

"Payment of overtime had been made by the establishment in excess of 12 hours in a week contrary to the provisions of regulation 6 of the Shop and Office Employees' (Regulation of Employment and Remuneration) Regulations 1954, and female employees had been employed on overtime in excess of 9 hours a day and after 6 p.m. and payment made for such overtime in contravention of regulations 2 and 3 of the above regulations."

තමුන්නාන්සේ එක කලක් කම්කරු ඇමති වශයෙන් සිටිය. තමුන්නාන්සෙ මේ නීතිරීති දන්නව. එසේ දැනගෙනත් තමුන්නාන්සෙගෙ දෙපාර්තමේන්තුවේ ගැහැණු උදවියට ඕවර්ටයිම් දුන්නෙ 6න් පසුවයි. අහන්න දේශප්‍රියගෙන්, හයෙන් පස්සෙ ගෙනිච්චෙ කොහේද කියා අහන්න. මා එය කෙළින්ම කියනව. රෙස්ට් හවුසස්වලට ගෙන ගිය බව මා දන්න නිසයි කියන්නෙ. ඒ දෙපාර්තමේන්තුවල වැඩ කරන සේවකයන්ගෙන් අපට අනන්තවත් ආරංචි එනව. මේව හංගන්න බැහැ. මේ විධියට නීච, නින්දිත වැඩ පිළිවෙළක් තමුන්නාන්සේගෙ දෙපාර්තමේන්තුවෙ ගෙන යන්න තමුන්නාන්සෙ ඉඩ දුන්න. හයෙන් පස්සෙ ගැහැණුන්ට ඕවර්ටයිම්. 1954, 1955 මදුරාසියෙ චිත්‍රපටි හදන කොට තමුන්නාන්සෙත් කොයි විධියට ඕවර්ටයිම් කළාද කියා මා දන්නෙ නැහැ. ඔය විධියටයි එතන වැඩ ගෙන ගියෙ. මේව රහස් නොවෙයි. ඒ වැඩ පොළවල සේවය කරන දහස් ගණන් සේවකයන්ගෙන් ගිහින් අහා බලන්න. අපට දැනගන්නට ලැබෙන කරුණුයි මේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

මේව කියන කොට අර වලපනේ ඇමති තුමා එහෙම නැහැ. එතුමා බොහොම තදින් කථා කළා. ඔව්, සමුපකාරය දියුණු කරනව නම් අපිත් සතුටුයි. තමුන්නාන්සේල ඒව කරන්ට දෙන්නෙ නැහැ නොවැ. රටට ප්‍රයෝජනවත් වැඩක් සංවිධානය කරන විට, බඩු මිල පහත හෙලීමට සංවිධානයක් ඇති කරන විට තමුන්නාන්සේලා ඒකට අල්ලස්, දූෂණ, හොරකම් ගැබ් කරනව. ඉතින් කොහොමද ඒවා ගෙන යන්නෙ? මේ පුද්ගලයන් ගැන මා දන්න නිසයි කියන්නෙ. අගමැතිනිය ඊයෙ පෙරේදා කෑගල්ලෙදි කිව්වලු මෙයා තමයි අහවල් ආසනයට ඉදිරිපත් කරන්නෙ කියා. තමන්ගෙ දෙපාර්තමේන්තුවේ ගෙන යන නින්දිත වැඩ ගැන පරීක්ෂා නොකර රෙදි කැල්ලවත් කරවල කැල්ලවත් හාල් මැස්සන් කාලවත් ලබා ගන්න බැහැ. අද අමුඩ ලේන්සුව රුපියල් 3.25යි. මෙතන බේරෙන්න කියනව මගේ පපුව අමාරුයි, මට බෙහෙත් විදගන්න වුවමනාය කියා. ඒ අසනීප ගැන අපි අනුකම්පා කරන්නෙ නැහැ. වංචා සහගත, දූෂණයෙන් පිරි කිසිම කෙනෙකුට මගේ නම් අනුකම්පාවක් නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

It is not correct to make personal references to the Hon. Minister.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

I am referring to people who are directly under him, therefore the Hon. Minister is responsible to the House for their conduct.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

But the hon. Member should not refer to the Hon. Minister personally.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

I may have to refer to certain matters personally too. If a commission is appointed to inquire into how they have been carrying on work as Ministers in this country for the last ten or twelve years, I shall have many personal references to make. We caught many of them in the past: those bribe-takers, those corrupt people in the House. They are the big people in their party now.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

Sir, may I know whether the hon. Member is insinuating something against me? If so, I appeal to you to give us protection.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

I have told the hon. Member that he must not make personal references to the Hon. Minister and he has stated that his references are to people working in the departments under the Hon. Minister and not to the Hon. Minister personally.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

I accept that.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මා දන්න හඳුනන හොඳ නිලධාරීන් කීප දෙනෙකුත් ඒ දෙපාර්තමේන්තුවේ ඉන්නව. එහෙත් වැඩියෙ වැඩ කෙරෙන්නෙ දේශපාලන යාළු මිත්‍රකම් උඩයි. නවරත්න මා හොඳට දන්න කෙනෙක්. ඉස්සර හිටිය ඔල්පාට් වාලි කියල කෙනෙක්. කවුරුත් දන්නව ඇති. ඔල්පාට් වාලිව ඉන්දියාවට යැව්ව, කරවල ගෙන්වන්ට. ඔහු නුවර පැවිලියන් හෝටලේ ළඟයි නිතරම ඉන්නෙ—එක් ගෝලය. මෙහා පැත්තෙ ක්ලබ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකට ඇවිත් අඩිය ගහන කොට, චාලි මෙහායින් නිකම් බලාගෙන ඉන්නව; නුවර පැවිලියන් එකට මෙහා පැත්තෙ හෝටලේ ළඟ. ඒ මිනිහාව තමයි කරවල හොයන්ට ඉන්දියාවට ඇරියෙ. තමුන්නාන්සෙ පාලනය ගෙන යන්නෙ කොහොමද? යම් පාටියක් බලයට එනව නම් ඒ බලය ආව තැන චාලි ඇති.

ඒකයි ඕල්පාටි චාලි කියන්නෙ. නුවර පැත්තෙ ඕල්පාටි චාලි හොඳට ප්‍රසිද්ධයි.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

කොහෙද ඉන්නෙ අපිත් දැනගන්ට සතුටුයි.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

ඕල්පාටි චාලි තමුන්නාන්සෙ හොඳහැටි දන්නව. ඇයි නැහැයි කියන්නෙ? අපේ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා හොඳහැටි ඔහු දන්නව. මා මතක් කළේ ඒ දෙපාර්ශ්ව මේන්තුවේ සිදුවන දේවල් ස්වල්පයක්. මේවායේ ගණන් හිලව් හරියාකාර තියල නැහැ. මෙතැනින් ලොරි 10 ක බඩු පටවල ඇරියොත්, බාන තැනදි ලොරි 5 ක බඩු නැහැ. ඔඩිට් වාර්තාවෙ මේව තිබෙනව. අතරමඟදි නැති වුණාම අර පොතේ ලියනව; අනික් පැත්තෙ ලියනව—එතකොට හරි. ඒකයි, තමුන්නාන්සේ කළේ. අර රත්තරන් ගෙම්බ පැන්න කථාවට හපන්. රත්තරන් ගෙම්බො නම් නිතරම පනිනව ඇති, තමුන්නාන්සේගෙ අතින්. ඒ විධියට තමයි, මේ බඩු නැති වෙන්නෙත්. රටේ මිනිස්සු හැමදාම කෑ ගහනව, ස.තො.සෙ. ට ගියා බඩු නැහැ; විවිධ සමුපකාරයට ගියා බඩු නැහැ; අර ඩිපෝව ළඟට ගියා බඩු නැහැ; කියා. අපට තිබෙන අමාරුව ඒකයි.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

පිටකොටුවෙ තියෙනව.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

පිටකොටුවට ගියාම තොග ගණන් ගත්ත හැකි. පහුගිය දවස්වල සමුපකාර තොග වෙළඳායතනයෙ එක්කෙනෙක් පිට කොටුවේ කන්තෝරුවකුත් දමාගෙන හිටිය. මට ඔහුගේ නම හරිහැටි මතක නැහැ. මෙතැනින් කරවල පර්මිට් එක දීල ඒ කන්තෝරුවෙ ඉඳගෙන ජාවාරම ගෙන යනව. ඕල්පාටි චාලි නොවෙයි; වෙන කෙනෙක්. රාජපක්ෂද කියා මා දන්නෙ නැහැ. මෙහෙන් තුන්ඩු කෑල්ල උඩ කරවල ටොන් ගණන් ගෙන ගිහින් අනික් පැත්තෙන් එතැන විකුණනව. මා මේ කිව්වෙ එක්කෙනෙක් දෙන්නෙක් ගැනයි. විශේෂයෙන් ඇමතිතුමාගෙ මිත්‍රයන් විශාල පිරිසක් එහි සිටිනව. මා සමුපකාර තොග වෙළඳායතනයේ කම්කරු සමිතියේ ටික කලක් වැඩ කළා. ඒ කාලයේ මට දැන ගන්ට ලැබුණා [බාධා කිරීමක්] හයෙන් පස්සෙ වැඩ කරන අයට ඕවර්ටයිම් ලැබෙන්නෙ කොහොමද කියා. රාජපක්ෂද, දේශප්‍රියද මා දන්නෙ නැහැ, මේව කරන්නෙ. මේ කරුණු පසුගිය දවස්වල වහගෙන හිටිය. අදත් ඒව නැත්තෙ නැහැ.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

මොන රාජපක්ෂද?

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

රෝයි රාජපක්ෂද මා දන්නෙ නැහැ. තමුන්නාන්සේව මා ටිකක් ඒකෙන් ඈත් කරන්නම් පාර්ලිමේන්තුවෙ නිසා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, සමුපකාර තොග වෙළඳායතනයට රට පුරා කඩ අරින්ට ඉඩ දී තිබෙන්නෙ ඇයි කියා මා අහනව. විශේෂයෙන් ගම් ප්‍රදේශවල විවිධ සේවා සමුපකාර සමිති තිබෙනව. වලපනේ විවිධ සේවා සමුපකාර සමිතිය තිබෙනව. දැන් ඒ මන්ත්‍රීතුමා කිව්ව, එයින් බොහොම ලාභ තිබෙනවා කියා. මා දන්නෙ නැහැ; ලාභ ඇති. ඒ ප්‍රදේශවල ජන කාර්යාතු වෙලා ඔය ආකාරයට වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

කරනව නම් අපි සන්තෝෂයි. නමුත් ණය බොහොම අරගෙන තියෙනවය කියා ආරංචියි. එතුමාම කීව, ණය බොහොම අරගෙන තියෙනවය කියා. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේව අනුමත කරලා—

අ. භා. 5.30

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

ණය ගෙවලත් තියෙනව.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

60 දාහක්ද කොහේද පොළී වශයෙන් ගෙව්වය කියා ආරංචියි. ගත්ත මුදල් වලින්ම වෙන්න ඇති පොලි ගෙවන්න ඇත්තෙ, වැඩ කරන්න පෙර. එහෙම තමයි, බොහොම තැන්වල වැඩ කෙරෙන්නෙ. ණය ගන්නව; ඒකෙන්ම පොලිය ගෙවනව කටයුත්තෙ දියුණුවක් නැහැ.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

සමුපකාර ප්‍රතිපත්ති ගැන දන්නෙ නැතුවයි, ඔහොම කියන්නෙ.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මම හොඳට දන්නව. [බාධා කිරීම්] තමුන්නාන්සේ දන්නව වැඩි නිසා තමයි, අර ශ්‍රාවස්තියෙ ඉදගෙන තොග ගබඩාවට —wholesale එකට—ටෙලිෆෝන් කර කියන්නෙ, "නුවරඑළියෙ ඉඳල මගේ ලොරිය අව; ඒක හිස්ව අරින්න බැහැ; එම නිසා සීනි මිටි 50ක් දෙන්න" කියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නිසා තමුන්නාන්සෙට එහෙමත් බලයක් තියෙනව. මා දන්නෙ නැහැ, අනික් අයට කොහොම බලයක් තියෙනවද කියා.

ටෙලිෆෝන් කර කියනව, "මගෙ ලොරිය ආපසු "එම්ටි" විදියට අරින්න එපා." කියා. ඔය ආයතනවල මුල් තැන් ගත් අයගෙ බලපෑම් අනුව වැඩ කෙරෙනවය කියන්නෙ ඕකයි. අයුතු බලපෑම් අර ලක්ෂ ගණන් ණය මුදල් ගත්තද කියලත් කියන්න බැහැ.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

කිසි දිනක අයුතු බලපෑම් කර සීනි අරගෙන ගිහින් නැහැ.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මා දන්නෙ නැහැ, අයුතු බල පාලද කොහොමද කියල.

ගරු ටී. බී. එම්. හේරත්
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

මගෙ ගෞරවය ඇතුව, එසේ නැත කියා මා කියනව.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මම තමුන්නාන්සෙට බොහොම ගෞරව කරනව. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

You will have to accept what the hon. Member says, and please come on to another point.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මා කිවෙ එක සිද්ධියක් ගැනයි. අයුතු සිටීමෙ බලයද කියා මා දන්නෙ නැහැ; පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටීමෙ බලයද කියා මා දන්නෙ නැහැ ඒක විසඳගන්න. ඒ ගැන මා මීට වඩා කතා කරන්න යන්නෙ නැහැ. මේව විශේෂයෙන් වෙළඳ ඇමතිතුමාට කියන්නෙ මේ රටට ආහාර යනාදිය ගෙන්වන ඇමතිතුමා එතුම නිසයි. මේ රටේ ජීවන අංකය තගින්නෙ ඒ ඇමතිතුමාගෙ වැඩ පිළිවෙළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උඩයි. [බාධා කිරීමක්] අද කියනව, "උතුරු මැද පළාතට හෝ යාපනයට හෝ මඩකලපුවට හෝ හෙට ඉදල හාල් දෙන්නෙ නැහැ, දෙන්නෙ වී" කියා. එසේ කීවාම සිදු වන්නෙ කුමක්ද? වී යුද්ධ කරන මෝල් කාරයො ඔක්කොම එකතු වෙලා, "අපොයි මේක කරන්න එපා; එසේ කළාම අපේ හාල් මෝල් ටික වහන්න වේවි" කියනව. ඔහොම—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ආහාර ඇමතිතුමාට—

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

ආහාර ඇමතිතුමා හරි, තමුන්නාන්සෙ හරි, වී සම්බන්ධව "රෙගියුලේෂන්ස්" අරිනව. "මීට පස්සෙ ඔය පැත්තට දෙන්නෙ වී" කියනව. හාල් මෝල් කාරයො ලක්ෂ ගණනින් සිටින බව අපි දන්නව. [බාධා කිරීම්]

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මොනවද මේ කියන්නෙ? [බාධා කිරීමක්] කවුද ගත්තෙ? කාටද දුන්නෙ? මොනවද ඔය කියන්නෙ?

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මම දන්නෙ නැහැ. මේ රටේ කියන එකයි, මම කියන්නෙ. තමුන්නාන්සෙ අද නියෝගයක් ඇරියොත්—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ, ඇරියොත්. මා ඇරල නැහැ.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මා විස්තර කර කියන්නම්. යම් පළාතකට ප්‍රසිද්ධ කර යවනව, "ඔය පළාතෙ ගබඩාවලට, විවිධ සේවා සමුපකාර සමිති වලට එහෙම හාල් එවන්නෙ නැහැ; මීට පස්සෙ එවන්නෙ වී" කියා. එතකොට වී මෝල්කාරයො රත් වෙනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මා එහෙම නියෝග කරල නැහැ. එහෙම නියෝග කරන්න මට බලයක් නැහැ. ආහාර බෙදා හැරීම පිළිබඳ නියෝග කිරීම මට අයිති එකක් නොවෙයි.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

දැන් නොවෙයි; ඉස්සෙල්ල ටිකක් තිබුණ. දැන් තියෙන්නෙ අනික් ඇමති අතේ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

දැනුත් නැහැ; ඉස්සරත් නැහැ. කවදාවත් එහෙම නියෝග කරල නැහැ. [බාධා කිරීමක්]

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

හාල් මෝලාකාරයො රත් වෙනව. කරපු ඒවත් නොකළ ඒව හැටියට මෙතන කීවම පිළිගන්න එපායැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මම ප්‍රකාශ කරන්නෙ අවංකවයි. ඒ අවංකව පිළිගන්න ඕනෑ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

අපිට අවංක දේවල් පිළිගන්න පුළුවනි. නමුත් ඉතිහාසය හොයාගෙන යනකොට බොහොම සැක සහිත දේවල් පෙනී යනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මගෙ ඉතිහාසයෙ කිසිම සැකයක් තියෙනවා නම්, මම තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනවා ඒ ගැන නිරාකරණය කරන්නය කියා, මෙම සභාව තුළදී. [බාධා කිරීම්]

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
අවුරුදු ගණන් තිස්සෙ—

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Will you please listen to me? There is a certain procedure if you want to make an allegation, and you know it.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

I know. If it is necessary I shall bring a substantive Motion.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I was trying my very best to ignore, him but what he says goes on record. Therefore it will not be fair by anybody here that he should be allowed to go uncontradicted. That is why I got up. Otherwise I know how to treat him. I will simply ignore him, but as it appears in HANSARD, it is our duty to contradict him.—[*Interruption*].

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Will the hon. Member please listen to me. It is all out of Order.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

We have asked for a Select Committee to go into the activities of the Co-operative Wholesale Establishment. We have not got that yet.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

This has been going on for a long time. It is time these things are stopped.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

Quite right. Corruption and bribery must be stopped in this country.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

There is a certain procedure laid down in this House.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

There are so many things that can be said about all sorts of people, but we do not want to resort to it.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

There are certain conventions and there are certain Standing Orders. If every hon. Member abides by them we can finish our work earlier and then also gain the point. There is a procedure laid down and it must be followed. Please go on.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
I shall then come on to another point.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)
Please go on.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, විවිධ සේවා සමුපකාර සමිති තිබෙන ප්‍රදේශවලින් වැඩ කටයුතු කරගෙන යන තැන්වලත් සමුපකාර තොග වෙළඳ ආයතන යෙන් ගබඩා දමන එක මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක්ද කියල අපට දැන ගන්න වුවමනා කරනව.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

මහජනයා ඉල්ලුවොත්, මහජනයා වෙනුවෙන් පළාතේ මන්ත්‍රීවරයා ඉල්ලු වොත් දෙනව. අපි එහෙම ඉල්ලල අරන් තියෙන නිසයි කියන්නෙ.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

විවිධ සේවා සමුපකාර සමිති තිබෙන ප්‍රදේශවල ගබඩාවල් විවෘත කරනවට ඒ සමිතිවලින් විරුද්ධත්වය ප්‍රකාශ කරන්න යෙදුනත් ඒ ගැන නොසලකා දෙනවා නොවෙයිද? සමහර තැන්වල ස්ටාfප් එකට වැය වූ මුදල් අනුව ඒක අපට දැනගන්න ලැබී තිබෙනව.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

සමහර විවිධ සේවා සමුපකාර සමිති වලත් තියෙනව.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
අනේ, නිකම් ඉන්නව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, වරකා පොල ප්‍රදේශයේ ස. තො. සේ. ගබඩාවක් අරින්න චිත්‍රපටි ශාලාවක් ගන්න හැදු බව මේ ගරු සභාවේදි ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කර තිබෙනව. ඒ විධියෙ දෙයක් කරන්න උත්සාහ කළේ පළිගැනීමක් හැටියට බවත් එදා ගරු මන්ත්‍රීවරු කිප පොළක්ම කියා සිටියා. රටටත්, ප්‍රදේශවලටත් අවංකව සේවය කරන්න මේ ආණ්ඩුව ලැස්ති නැහැ. දූෂණ ඉවත් කර පිරිසිදු පාලනයක් ගෙන යන්න මේ ආණ්ඩුව ලැස්ති නැහැ. මා එහෙම කියන්නෙ දූෂණ කළ අය හැටියට ආණ්ඩු පක්ෂයේ ඇතැම් උදවිය අල්ලා දුන් නමුත් අද වන තුරු ඒ අය ආණ්ඩු පක්ෂයෙන් ඉවත් කරලා නැති නිසයි. දූෂණ ඇති වන මූලික තැනක් හැටියට තොග වෙළඳ ආයතනයෙ වැඩ කටයුතු කරගෙන යන්න ඉඩ දීම ගැන කවුරුත් විරුද්ධයි. කළුකඩේ ඇති වෙන්නෙ එයිනුයි. මේ රටේ කළුකඩ කාරයා තර කිරීමට වැරදිකාරයා තමුන්නාන්සේ තමයි. ගරු ඇමතිතුමාට මා ඒ චෝදනාව කරනව. ඒක තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ. පිටකොටුවෙ වෙන ඕනෑම තැනකට ගියාම සමුපකාර ආයතනයෙන් ගන්න බැරි බඩු ගන්න පුළුවනි.

ගිනිපෙට්ටියක් ශත පහකට ගන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. ඒ ගණනට අද ගිනිපෙට්ටියක් ගන්න ලැබෙන්නෙ නැති බව ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) පැහැදිලි ලෙස කිව්වා. ඒක හරිගස්සන්නත් බැහැ. නිෂ්පාදනය කරන හැටි ගැන බැලුවත් ගිනි කූරු පණහක් තියෙන්න ඕනෑ පෙට්ටියෙ තියෙන්නෙ ගිනි කූරු විසි පහයි. ඒවත් පත්තු වෙන්නෙ නැහැ. හැම ද්‍රව්‍යයක්ම ඔය ආකාරයටයි. රෙදි සම්බන්ධවත් කිව්වා. රෙදි බෙදා දෙන ආකාරයත් අසාධාරණයි. "කෝටා" එක හැටියට සරොම් දහ දාහ, පහළොස් දාහ තිබුණු සමහර තැන්වල තිස් දාහ දක්වා වැඩි කර තිබෙන බව දැනගන්න ලැබී තිබෙනව. එක් මන්ත්‍රීතුමෙක් කියනව, එතන මගෙ යාළුවෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

මිත්‍රයෙක් ඉන්නවා; ඔහු නිසා මට සරෙම් 32,000ක් එව්වා කියල. මේ ගැන විස්තර ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනව.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

I rise to a point of Order. The hon. Member is not in his seat.

යූ. බී. වන්නිනායක මයා. (යාපහුව)
(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)
(Mr. U. B. Wanninayake—Yapuhuwa)

Which Member?

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

He is referring to the hon. Member for Colombo North. He is not speaking now.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මේක කාරක සභා අවස්ථාවයි. හරියටම ආසනයේ නොසිටියත් කමක් නැහැ. ටිකක් ආසනෙන් එහාට මෙහාට වෙලා කථා කළාට කමක් නැහැ.

සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ ගබඩාවල නිසි පරිදි ගණන් පොත් තබා නැති බව ඔඩිට් වාර්තාවේ සඳහන් වෙනවා. අතිකාල දීමනා දුන් ආකාරය ගැනත් මා කිව්වා. නියම විධියට ගණන් තැබීමක් කර නැත්නම් ලාභ අලාභ සොයන්නේ කොහොමද? නියම විධියට ගණන් පොත් නොතිබ්බා නම් මූලින්ම අස් කළ යුතුව ඇත්තේ ඒ උදවියයි. ඒක මූලික වැඩක්. නියම විධියට ගණන් පොත් නැති විට අර පොලිස්කාරයා "ලාභ" කියන වචන "අලාභ" කියා ලිව්වා වගේ වැඩ සිදු වෙන්නට පුළුවනි. උසාවිවලට ගියාම ඒ විධියට පැත්ත වෙනස් වීම් ඇති වෙනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සුප්‍රීම් උසාවියේ නඩුවක් ගැන ගරු මන්ත්‍රීතුමාට එහෙම කථා කරන්න පුළුවන්ද? උසාවියේ කරුණු ගැනි මෙතැනි ඇවිත් ඔය විධියට විවේචනය කිරීම යුක්ති සහගතද?

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

නඩුව හමාර වුණාට පස්සෙ ඕනෑ දෙයක් කියන්න පුළුවනි. වැඩේ අවසාන වුණාට පසුවයි කිව්වෙ. නඩුව විභාග අවසාන වුණාට පසුව මෙතැනදී ඒ ගැන කියන්න බැරි මොකද? සමහර නඩුකාරයන්ට මහජන බැංකුවෙන් රුපියල් විසි දාස් ගණන් ලබා දීම ගැනත් මා කලින් සුළුවෙන් සඳහන් කළා. දැන් ඒ ගැන වැඩිපුර කියන්නට යන්නෙ නැහැ. ඒ ගැන එළිදරව් නොකළ කරුණු තවත් තියෙනවා. අපි ඔව දන්නෙ නෑ කියලද හිතාගෙන ඉන්නෙ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I wish to raise a point of Order. Can an hon. Member of this House refer to any judgment that has been given by the Supreme Court——

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

He can once the case is over.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

—in a way which casts a reflection on the judge or the judgment?

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

He cannot refer to the judge or the judgment in a way which casts a reflection on the judge or the judgment.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

What he has done is pointedly to cast a reflection on the judgment and on the conduct of the judge.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමනි ජයසූරිය මයා (හෝමාගම)
(திரு. காமணி ஜயசூரிய—ஹோமகம)
(Mr. Gamani Jayasuriya—Homagama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිව යුතුව ඇති සෑම දෙයක් ගැනම මාගේ මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් විසින් සඳහන් කරන ලද නිසා මා මේ වැය ශීර්ෂය ගැන වැඩි යමක් කියන්නට අදහස් කරන්නෙ නැහැ. පස්සර ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙනුත්, දැනට වැඩ බලන ඇමතිවරයකු වූ වලපනේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙනුත් එක්සත් ජාතික පක්ෂය සමුපකාර ව්‍යාපාරයට විරුද්ධ බවත්, එසේ විරුද්ධ වන්නේ පුද්ගලික අංශය ආරක්ෂා කිරීමේ අදහස නිසා බවත් ප්‍රකාශ වුණා. මෙය වැරදි අදහසක් බව කියන්න කැමතියි. සමුපකාර ව්‍යාපාරය ලංකාවේ පටන් ගත්තේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ පියායි. එම නිසා ඒ ව්‍යාපාරය මේ රට තුළ හොඳින් ක්‍රියත්මක කිරීම සඳහා අපටත් ලොකු වුවමනාවක් තිබෙනවා. අප කිසියම් විවේචනයක් කළොත් එසේ කරන්නේ ඒ ව්‍යාපාරය කඩා කප්පල් කිරීමේ අදහසින් නොව ඒ ව්‍යාපාරය තව දුරටත් දියුණු කර ගැනීමේ අදහසිනුයි. දුප්පත් ජනතාවගේ යහපත සඳහායි, අප යමක් කියනවා නම් එසේ කියන්නේ.

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ රියැදුරු මහතාට සමුපකාරයේ රක්ෂාවක් ලබා දීම ගැන අප අකමැත්තක් ප්‍රකාශ කළ බව පස්සර ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. යම්කිසි දුප්පත් පුද්ගලයකුට කොහෙන් හෝ රක්ෂාවක් ලැබීම ගැන අපේ කිසිම අකමැත්තක් නැහැ. නමුත් ඒ රියැදුරු මහතා පසුගිය මැතිවරණ කාලයේදී බොහොම මහන්සියෙන් වැඩ කළ කෙනෙකු බවද පස්සර ගරු මන්ත්‍රීතුමා කිවා. අපට වුවමනා කරන්නේ පත්වීම් දීමේදී කාටත් සාධාරණය ඉටුවන පරිදි කටයුතු කරනවා දැකීමයි. මන්ත්‍රී කෙනෙකුගේ ඩ්‍රයිවර් කෙනෙකු වූ පලියට—රෑ දවල් දෙකේ කෑම නැතිව පක්ෂය සඳහා වැඩ කළ පලියට රක්ෂාව දීම නොවෙයි යුතුකම. සමහර විට ඒ පුද්ගලයා අනික් පුද්ගලයන්ට වඩා සුදුස්සෙකු වන්න පුළුවනි. සුදුස්සෙකු තියෙනව නම් රක්ෂාව දුන්නට කමක් නැහැ. සුදුසු නම් පත්වීම ලබා ගැනීමට මන්ත්‍රීවරයකුගෙ ඩ්‍රයිවර් කෙනකු වීම බාධාවක් නොවෙයි.

අ. භා. 5.45

සතොසේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ගැන නොයෙක් අවස්ථාවලදී අප චෝදනා කරන්නෙ, ඒ මහත්මයා විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සමඟ දේශපාලන භූමියේ සටනක් කළ නිසාය කියා වලපනේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඇත්ත එය නොවෙයි. මන්ත්‍රීතුමනි, ඒ අදහස අයින් කර ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ තිබෙන ලොකුම වෙළඳ ව්‍යාපාරය සතොසේ බව අපට පෙනෙනවා. සී. ඩබ්ලිව්. ඊ. කියන්නෙ ඉතා විශාල වෙළඳ ව්‍යාපාරයක්. ලංකාවේ පමණක් නොවෙයි, අනික් රටවල තත්ත්වය ගැන බැලුවත්, මේක ඉතා විශාල වෙළඳ ව්‍යාපාරයක් බව පෙනෙනව. ඒ තරම් විශාල වෙළඳ ව්‍යාපාරයක් නියම පිළිවෙලට—නියම ප්‍රයෝජන ලැබෙන පිළිවෙලට—ගෙන යාමට හොඳ දක්ෂ, උගත් මහත්මයෙකු පත් කරන්න ඕනෑ. අද සභාපති ධුරය දරන මහත්මයගෙත් එක්තරා දක්ෂකමක් තියෙනව. ඒ මහත්මය මෝඩයෙක්ය කියා මම කියන්නෙ නැහැ. නමුත් ඊට වඩා වෙළඳාම ගැන තේරුමක් ඇති "බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන්" පිළිබඳව දැනීමක් ලැබූ ඉගෙනීමක් ඇති පුද්ගලයකු ඒ තනතුරට පත් කළොත් දැනට වඩා හොඳට ඒ කටයුතු කරන්න පුළුවන් වේය කියා මම කල්පනා කරනව. ඒ ආයතනය ලංකාවේ තිබෙන ලොකුම වෙළඳ පොළ. ඊට වඩා පොඩි වෙළඳ පොළවලට ඊට වඩා විභාග පාස් කළ උදවිය, ඉගෙන ගත් උදවිය, පත් කරගෙන කටයුතු කරගෙන යනව. පටන් ගත්ත කාලයෙදි වගේ නොවෙයි, අද සතොසේ ඉතා විශාල ව්‍යාපාරයක්. ඒ ව්‍යාපාරයේ කටයුතු නිසියාකාර කරන්න පුළුවන් දක්ෂ පුද්ගලයකු පත් කිරීම ආණ්ඩුවේ යුතුකමක්—ඇමතිතුමාගෙ යුතුකමක්. ඔඩිටර් ජනරාල් තුමාගේ—ගණකාධිකාරි තුමාගේ—වාර්තාව දෙස බැලුවම—

ගරු ටී. බී. එම්. හේරත් මයා.
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

දැක්කයන් හිටපු කාලයේ සී. ඩබ්ලිව්. ඊ. එකෙන් අලාභයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
දැන් ?

ගරු ටී. බී. එම්. හේරත් මයා.
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
දැන් ලාභයි.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
තමුන්නාන්සෙ පාර්ලිමේන්තු ලේකම් කෙනෙක්. ළඟදී වැඩ බලන ඇමති කෙනෙක් වුණා. ඔඩිටර් ජනරාල්තුමාගේ වාර්තාව කියවා බැලුවොත් තමුන්නාන්සෙට පෙනෙයි, සතොසේ ගණන් හිලව් විභාග කර බැලීමටවත් පුළුවන් තත්ත්වයක නැති බව. නියම විධියට ගණන් ලියා තබන්නෙ නැහැ. තමුන්නාන්සෙගෙ දැන ගැනීමට වුවමනා නම්, මේ වාර්තාවෙන් මම ටිකක් කියවන්නම්. කාලය ගත වීම ප්‍රමණයි, සිදු වන්නෙ. මේ වාර්තාවෙන් විශේෂ කරුණු දෙකක් කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා කියෙව්ව.

ගරු ටී. බී. එම්. හේරත් මයා.
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
ඒ ප්‍රශ්නය ගණන් හිලව් ගැන. අපි කිව්වෙ ලාභ පාඩු ගැන.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
ගණන් හිලව් හරියට තියන්නෙ නැත්නම් ලාබද, පාඩුද කියා කියන්නෙ කොහොමද ? තමුන්නාන්සෙගෙ හිත සතුටු වන්න කිව්වම පිළිගන්නව.

ගරු ටී. බී. එම්. හේරත් මයා.
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
ඒ කාලයෙ දක්ෂයන් හිටිය නම් ඔයිට වඩා දක්ෂ විධියට වැඩ කළාද කියන එකයි අපි අහන්නෙ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
ඇමතිතුමා හැමදාම කියන්නෙ අදට වඩා හෙට හොඳයි කියලයි. අප කාටත් වුවමනා කරන්නෙ ඒකයි.

ගරු ටී. බී. එම්. හේරත් මයා.
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)
ඒක ඇත්ත. එහෙම වෙලා තියෙනව.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
වෙලා තියෙන හැටි මේ වාර්තාවෙන් පෙනෙනව. මේ වාර්තාව කියවා බලා ඒක වත් තේරුම් ගන්න බැරි නම්, අද මේ රටට මේ විධියේ විපතක් සිදු වී තිබීම පුදුමයක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය පාලනය කළ කාලය ගැන කථා කරනව නම් තමුන්නාන්සෙලාගේ දැන ගැනීම පිණිස කියන්න කැමතියි, මේ රටේ දුප්පත් උදවියට ඒ කාලයේ බඩ පුරා කන්නට තිබුණා. නමුත් අද එබදු තත්ත්වයක් තිබෙනවද ?

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
ශත හැත්තෑවටයි හාල් සේරුව ගත්තෙ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
ශත 70ක් දීලා ගත්තත්, අදට වඩා එළවලු සමඟ, රසට බත් පිඟානක් කන්නට තත්වයක් තිබුනා රටේ ජනතාවට. පස්සර මන්ත්‍රීතුමා (අමරනන්ද රත්නායක මයා.) කියා සිටිය එතුමාගෙ කොට්ඨාශයෙ සෑම තැනම රෙදිපිළි ඕනෑ තරම් තිබෙනවාය කියා. ඇත්ත වශයෙන්ම අප ඒ ගැන සන්තෝෂ වෙනව. නමුත් මේ වාර්තාව ලොකු අකුරෙන් පත්‍රයෙ පළ වුණොත් සමහර විට පස්සර ජනතාව ඒ මන්ත්‍රීතුමාව කොයි ආකාරයෙන් සලකාවිද යන්න ගැන අමුතු වෙන් කියන්න වුවමනා කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ටී. බී. එම්. හේරත් මයා.
(கௌரவ ரீ. பி. எம். ஹேரத்)
(The Hon. T. B. M. Herath)

එක්සත් ජාතික පක්ෂයෙන් කිව්වොත් නම් වාර්තාව ලියැවේවි [බාධා කිරීමක්].

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මගේ කථා වෙදි කලින් මම සඳහන් කළා, සතොසෙ ආයතනය ආරම්භ කළේ අපේ පක්ෂයේ නායකතුමාගේ පියා බව. එම නිසා මෙම ආයතනය දියුණු වෙනවා දකින්නට අප ඉතාමත් සන්තෝෂයි.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

එදා ජනගහණය කොච්චරද? අද ජන ගහණය කොච්චරද?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

ඊළඟට, ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශ යේ වැඩ කටයුතුවලින් රටට සහනයක් සැලසී තිබෙනවාද, ඇමතිතුමා අනුගමනය කරන වෙළඳ ප්‍රතිපත්තිවලින් මහජනතා වට ප්‍රයෝජනයක් සැලසී තිබෙනවාද කියා දැනගත හැක්කේ මහජනතාවගෙන්මයි. දුප්පත් ජනතාවට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය, රෙදි පිළි හා වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය එදාට වඩා පහසු අන්දමින් ලබා ගන්නට පුළුවන් වී තිබෙනවාද කියන කාරණය, සොයා බැලීමෙන් අපට තේරුම් ගත හැකි වෙයි. දැනට අනුගමනය කරන වෙළඳ ප්‍රති පත්තිවලින් සහනයක් සැලසී තිබෙනවාද, අපේ වෙළඳ ප්‍රතිපත්තිවලින් ප්‍රයෝජන යක් ජනතාවට සිදු වී තිබෙනවාද කියන කාරණය මැන බැලීමට ඇති හොඳම මිම්ම එයයි. ඒ අන්දමට බලාගෙන ගියාම මට පෙනී යන්නෙ, රජයේ මෙම වෙළඳ ප්‍රති පත්තිය නිසා රටේ ජනතාවට සහනයක් සැලසී නැති බවත්, මහජනයා විශාල දුෂ්කරතාවකට මුහුණ පා සිටින බවත්ය. ඇත්ත වශයෙන්ම මේ රටේ සිටින සිංහල වෙළඳ මහත්වරුන්, ලාංකික වෙළඳ මහත්වරුන්, පළමුවැනි වරට කළුකඩ කාරයන් හැටියට, නරක පුද්ගලයන් හැටි යට, හඳුන්වා ඒ අයට නිග්‍රහ කිරීම කනගාටු වට කරුණක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ලංකාව කෘෂි කාර්මික රටක්. ගොවිතැන් කරන්නෙ නැති උදවිය කරන්නෙ වෙළඳාම. අපේ ගම්බද උදවිය සුළු සුළු කඩ දමාගෙන වෙළ ඳාම කරනව. මධ්‍යම පංක්තියේ උදවිය යම්කිසි දියුණුවක් ලබාගෙන වෙළඳාම කරනව. ඒ අය සතුව තිබෙන ලොකු වෙළඳ ව්‍යාපාරවල ඉතිහාසය දිහා බැලුවොත් පෙනී යාවි, එම වෙළඳ ව්‍යාපාර ඉතාමත්ම සුළු වෙන් ආරම්භ කර ක්‍රම ක්‍රමයෙන් දියුණු තත්ත්වයකට ගෙන ගොස් ඇති බව, නොයෙකුත් හිරිහැර බාධක මධ්‍යයේ අධි රාජ්‍ය වාදීන්ගේ යුගයේදී ආරම්භ කළ එබඳු වෙළඳ ව්‍යාපාර ක්‍රම ක්‍රමයෙන් දියුණු කර සෑහෙන තත්ත්වයකින් පවත්වා ගෙන යන විට ඒ අයට කළුකඩ කාරයන්ය කියා නිග්‍රහ කිරීම මම හිතන හැටියට කනගාටුවට කරුණක්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කළුකඩකාරයින්ට පමණයි, කළුකඩ කාරයින්යයි කියන්නෙ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

කළුකඩකාරයින් ඇති කළේ කවුද, මේ මේ රටේ? මේ රජයයි. කළුකඩකාරයින් ඇති වුණේ බඩු හිඟයක් ඇති වුණු නිසයි. මේ ඇමතිතුමා මුදල් ඇමති වශයෙන් අය වැය ඉදිරිපත් කළාට පසු සීනි මිල හුඟක් ඉහළ ගියා. පවුම් 25 ට, 30 ට තිබුණු සීනි ටොන් එක පවුම් 100ට 102ට නැංගා. කොහේද, ඒ සීනි මිල ඒ විදියට නැංගේ? සමාජවාදී නායකයෙක් ලෙස සිටින කැස්ට්‍රෝගේ රටේ—කියුබාවේ. එහි ඇති වූ විශාල කුනාටුවක් නිසා උක් වගාව විනාශ වීම හේතු කොටගෙන සීනි මිල නැංගා. සීනි සියලුම දුප්පත් මිනිසුන්ට වුවමනා දෙයක්. එහෙම නම් අන්තිම දුප්පත් මිනිහා පවා පාවිච්චි කරන සීනිවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

මිල පවුම් 25 සිට 102 දක්වා වැඩි කිරීම හරිද? ඒකත් කළුකඩ ව්‍යාපාරයක් විය යුතුයි, ඔය තර්කය අනුවම. ඔය තරම් සමාජවාදී රටක් එහෙම මිල නංවනවා නම් අපේ දුප්පත් වෙළෙන්දෙක් බඩු හිඟ වූ විට තුට්ටු දෙකක් වැඩි කළොත් ඔහුට කළුකඩකාරයායයි කීම හරිද? ඒ තර්කය අනුව කියුබාවේ කැස්ට්‍රෝත් රුසියාවේ කෘෂෙප් අගමැතිත් කළුකඩකාරයන් විය යුතුයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අපි ගිනිපෙට්ටිකාරයින්ට කළුකඩ කාරයින්යයි කියන්නේ නැහැ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

පවුම් 25ට තිබුණු සීනි, උක් වගාව විනාශ වූ නිසා පවුම් 100ට නැංවුවා. එය වරදක්යයි මම කියන්නේ නැහැ. ඒ විදියටම බඩු හිඟයක් ඇති වූ විට බඩු මිල ඉහළ ගියාම අපේ සිංහල මිනිහාට කළුකඩකාරයායි කියන්නේ ඇයි?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குரஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

ඒ අය කළුකඩකාරයින් නොවේද?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

ඒ තර්කය උඩ කොහොමද, ඒ අය කළුකඩකාරයින් වෙන්නේ? ඒ අය කළුකඩකාරයින් නම් කැස්ට්‍රෝත්, කෘෂේප් අගමැතිත් කළුකඩකාරයින් විය යුතුයි.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Order, please! You are going outside the subject—

[බාධා කිරීමක්]

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

මම කියාගෙන ආ කාරණයත් මට මතක නැහැ.

අ. භා. 6

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

When you stray from the subject you are bound to forget the point you were developing.

Order, please! The hon. Appointed Member, Mr. R. S. V. Poulier will now take the Chair.

අනතුරුව ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ.බී.ඊ., මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ආර්. එස්. වී. පොලියර් මයා., ඕ.බී.ඊ., මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

සභාපතිතුමනි, අපේ ලාංකික වෙළෙන්දා, මේ රට නිදහස ලබාගත්තාට පසු ක්‍රම ක්‍රමයෙන් වෙළඳාම දියුණු කර ගනිමින් පළපුරුද්දක් ලබාගෙන එන අවස්ථාවේදී —සාමාන්‍ය කඩකාරයකුට වඩා තේරුමක් ඇතිව කටයුතු කිරීමට පුරුදු වේගන එන අවස්ථාවේදී—අවසානාවකට මෙන් ඔහුට නොයෙකුත් හිරිහැර රාශියකට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා.

"කොමර්ස්" දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාගේ වාර්තාව දෙස බලන විට පැහැදිලිව පෙනෙන දෙයක් තිබෙනවා. එහි කියා තිබෙනවා වෙළඳාමෙන් අපි සෑහෙන ලාභයක් ලබා ගෙන තිබෙනවාය කියා. ඒ ගැන අපි සන්තෝෂයි. නමුත් ඒ ලබා ගත් ලාභයට, ඒ සල්ලිවලට, මොනවා වුණාද කියලයි අපි දන්නෙ නැත්තෙ. වාර්තාවල තිබෙනවා ලාභයි කියා. නමුත් වෙළඳාමෙන් ජීවිකාව ගෙන යන උදවිය ටත්, සාමාන්‍ය පාරිභෝගිකයාටත්, කොයි අන්දමකින්වත් කිසිම සැනසිල්ලක් ලැබුණු බවක් නම් පෙනෙන්නට නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ වෙළඳාම කරන උදවියට, අද බඩු ගෙන්වීම කරන ලාංකිකයින්ට—පුරුදු වේ ගෙන ආ උදවියට—අද නොයෙක් හිරිහැර වලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. යම්කිසි බඩුවක් ගෙන්වන්නට වුව මනා වුණොත්, ඒ සඳහා නොයෙක් විධියේ පෝරම කොළ පුරවන්න ඕනෑ. ඒවා පුරවන්නත් ඒ සඳහා විශේෂ දැනීමක් ඇති කෙනෙකු වුවමනා කරනවා. සාමාන්‍ය කෙනෙකුට, සාමාන්‍ය ලිපිකරුවකුට, ඒවා පුරවන්න අමාරුයි. ඒවා පුරවන්න නම් හොඳ තේරුමක් ඇති කෙනෙකු වෙන්න ඕනෑ. එවැනි කෙනෙකු සොයා ගන්නත් ඔහුට ලොකු පඩියක් ගෙවන්න ඕනෑ. අර ගෙවන්න බඩුවෙන් ලැබෙන ප්‍රයෝජනය පෝරම කොළය පුරවන තැනැත්තාට ගෙවන මුදල නිසා නැති වී යනවා. වෙළඳාම් කරන අයට ඇති වී තිබෙන්නේ එවැනි තත්ත්වයක්. විශේෂයෙන්ම ලාංකික සිංහල වෙළඳ මහත්වරුන්ට අමාරුකම් ඇති වී තිබෙනවා. "එක්ස්චේන්ජ් කොන්ට්‍රෝල්" එකට ගොස් ඒ කටයුතු කර ගන්න ගියාමත් නොයෙක් අමාරුකම්, කරදර ඇති වෙනවා. ඩිරෙක්ටර්ගේ රපෝර්තුවේ හැටියට වෙළඳාම සතුටුදායක නම් හැකි තරම් පහසුකම් ලබා දෙන්නට අපි මහන්සි ගන්න ඕනෑ.

"ස්වේච්ඡා විරේඛිං කෝපරේෂන්" කියා අලුත් ආයතනයකට තොග වෙළඳාම භාර දීමට රජයේ අදහසක් තිබෙනවාය කියා අපට ආරංචියි. ඒවා ගැන ලොකු අකුරෙන් පත්තරවල දැමූ විට පත්තර කියවන අයට නම් සතුටු වෙන්න පුළුවන්; නමුත් ඒවා ක්‍රියාත්මක කරන්න ගියාම ගමේ සිටින දුප්පත් මිනිහාගේ බඩටයි වදින්නේ. ලස්සණට ලියන්න පුළුවන්. නමුත් අමාරුව ඇති වන්නේ දුප්පත් මහජනයාටයි. ඒ දුක විඳින්නට සිදු වන්නේ ඔවුන්ටයි. අද අපේ රටේ තත්ත්වයේ හැටියට අපි කල්පනාවෙන් කටයුතු කරන්නට සූදානම් වන්නට ඕනෑය කියා මම හිතනවා. අද ලොරියක් සොයා ගන්න පුළුවන්කමක් නැහැ. ලොරියකට ටයර් එකක් සොයා ගන්න පුළුවන්කමක් නැහැ. රටේ තිබුණු ලොරි හුඟ හරියක් පරණ වී අද කැඩී ගොස් තිබෙනවා. බඩු එහා මෙහා ගෙන යන ලොරි ඒ අන්දමට නැති වූ විට එයින් රටේ ජනතාවට ඇති වන විශාල හිරිහැරය කොතරම්ද කියා කල්පනා කරන්න ඕනෑ. මේවා කඩා කප්පල් වී යන්න කලින් කල්පනා කර බලා යම්කිසි පිළියමක් ඇති කිරීම රජයෙ යුතුකමක්.

ඒ සමගම අවසාන වශයෙන් තවත් එක කරුණක් මතක් කරන්න ඕනෑ. අපේ විදේශික මුදල් වෙන් කරන්න යන අවස්ථාවලදී එක්තරා ප්‍රමාණයක නාස්තියක් සිදු වෙනවාය කියා අපට පෙනී ගොස් තිබෙනවා. උදාහරණයක් හැටියට මා කාරණයක් පෙන්වන්නම්. විටමින් බී සෑදන්න මේ රටේ කර්මාන්ත ශාලාවක් ඇති කර තිබෙනව. විටමින් බී සෑදීම සඳහා ඒ කර්මාන්ත ශාලාව මේ රටේ නොයෙක් නොයෙක් අමු ද්‍රව්‍ය ඉල්ලනව. නමුත් ඒ ඉල්ලන ප්‍රමාණය තමුන්නාන්සේලා දෙන්නෙ නැහැ. තමුන්නාන්සේලා දෙන්නෙ එක්තරා කොටසක්. නමුත් ඒ සමගම තවත් අයට පිටරටින් විටමින් බී ගෙන්වන්නත් තමුන්නාන්සේලා විනිමය මුදල් වෙන් කර තිබෙනව. ඒ අනුව, වැඩි පුර මුදලක් වියදම් කර පිටරට සෑදූ විටමින් බී පෙතිත් මේ රටට ගෙන්වනව. නමුත් මේ රටේ නිෂ්පාදකයන්ට වුවමනා අමු ද්‍රව්‍ය ප්‍රමාණය දෙන්නෙ නැහැ. මේ එක කරුණක්. තවත් මේ විධියෙ කරුණු රාශියක් තිබෙනව. මේවා ගැන විශේෂ සැලකිල්ලක් දක්වුවොත් සෑහෙන ප්‍රමාණයකින් අපේ විදේශීය මුදල් ප්‍රමාණය ඉතිරි කර ගැනීමට පුළුවන් වෙනව. මීට වඩා මා කථා කරන්නෙ නැහැ. මෙපමණ කාලයක් තුළවත් කථා කරන්ට ඉඩ දීම ගැන තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පී. ජී. බී. කෙනමන් මයා. (මෑද කොළඹ දෙවන මන්ත්‍රී)

(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)

(Mr. P. G. B. Keuneman—Second Colombo Central)

Mr. Chairman the Hon. Minister of Internal and External Trade and Supply has a few departments and corporations under him and it is quite possible to dwell at length on many of them, but I do not intend to do so. The Co-cperative Department and the C. W. E. have already been rather exhaustively discussed and what is really needed is not to repeat the obvious but to take some kind of action to clear up the mess.

Mr. Chairman, I wish to deal with a corporation that is under the Hon. Minister which has received no attention at all in this Debate. I refer to the Ceylon Insurance Corporation. I cannot understand why the Ceylon Insurance Corporation should be under the Minister of Internal and External Trade and Supply, but for some reason or other, best known to the Prime Minister, it is placed under him.—[*Interruption.*]

ආර්. ජී. සේනානායක මයා. (දඹදෙණිය)

(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)

(Mr. R. G. Senanayake—Dambadeniya)

For recruitment.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

This corporation is under the Ministry of Internal and External Trade. I am sorry that the Hon. Minister is not here because I want to say that I am not at all satisfied with the way in which things are developing in the Insurance Corporation. I feel that if the Minister does not take immediate steps to look into the state of affairs there and put things right he will find this corporation blowing up in his face in the same way as the People's Bank and the C. W. E. have blown up in his face.

If you want to know when a take-over is not a take-over the answer is to be found in the Ceylon Insurance Corporation. I would pose the question, now that the Hon. Minister is coming back to his seat: Have we really nationalized insurance? No, Sir. From 1st January this year the Ceylon Insurance Corporation nominally became the sole insurer in Ceylon, the sole organization to transact not only life insurance but general insurance. But I wish to make the charge that this so-called nationalized Insurance Corporation is in practice making concessions all along the line to the foreign agency houses who are supposed to have been supplanted as insurers. I think there were about 45 various insurance companies and agency houses handling insurance before the so-called take-over and a large number of the agency houses in Ceylon functioned as the principal agencies for British insurance companies and some for Indian and other Insurance companies. Now what has happened? The Ceylon Insurance Corporation that should have taken over their work has not done so but has made them principal agents of the corporation. Does the Hon. Minister deny that? He will find that most of these agency houses are now functioning as agents of the Ceylon Insurace Corporation where they previously functioned as agents of insurance companies in Britain, India, Canada, Australia, and so on. This is particularly so in the case of the British and the Indian companies.

First of all, does the Hon. Minister know that these agency houses are paid a commission by the Ceylon Insurance Corporation for acting as

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

agents ? Does he know that commission was recently increased from 10 per cent to 15 per cent—an increase which will bring them about Rs. 1 million a year more? What was the reason for this ? When these agency houses were functioning as principal agents for British and Indian firms they were getting 15 per cent as commission. On that 15 per cent commission they ran big establishments, paid their staff, put up buildings and had a rollicking good time. What are they doing today ? Today, they are being paid a commission of 15 per cent for introducing to the corporation business already on their books. What is the meaning of this ? Is this socialism ? Is this your concept of the nationalization of insurance ? For whose benefit is the Ceylon Insurance Corporation being run ? Is it for the benefit of Ceylon or for the benefit of some British and Indian agency houses ?

Does the Hon. Minister know that the actual affairs of this corporation are not being determined by the board of directors of this corporation but by a so-called co-ordinating committee that has been set up ? Does he know that ? Some of the directors are such that it may be well that they have nothing to do with the affairs of the corporation. There are people like Mr. U. K. Edmund. But I am not going to discuss the merits of the directors. Does the Hon. Minister know that many of the major decisions are in fact taken by this so-called co-ordinating committee ? With whose authority was this set up ? Does the Hon. Minister know who are the members of this committee ?

අ. භා. 6.15

First of all, there are certain representatives of the corporation who are distinguished only by their total lack of knowledge about insurance. There are also representatives of the big agency houses handling insurance sitting in that co-ordinating committee and deciding policy. I will give you the names. One is Mr. A. D. Sykes, till recently Manager of the Alliance Assurance Co., Ltd., whose agents were Bois Brothers. There is Mr. A. C. L. Bayne, a Director of Leechman & Co., Ltd., and Carson Cumberbatch Co. Ltd. Another is Mr. L. Jesudasan, a brother of a *coup* suspect ; he was an insurance officer in Carson Cumberbatch & Co., Ltd., and General Manager of the Agricultural and General Insurance Co., Ltd., and there is Mr. L. S. A. de Soysa, former Director of Mahajana Insurance Limited, and Secretary of an organization, to which I shall refer in a moment, the so-called Insurance Officers' Association, and a Director of de Soysa & Company, who were agents for several British insurance firms.

This co-ordinating committee, in which there are the representatives of former agency houses, takes decisions not only on insurance policy, not only on rating, not only on the liability of risks, but even on how individual departments of the corporation are to function. I have read some of the minutes of the meetings of this committee. It is most pathetic. The total lack of knowledge of insurance of the persons who represent the corporation from the General Manager upwards is such that they spend most of their time asking these gentlemen for their advice and their opinions.

Here is an extract from the minutes of the co-ordinating committee's meeting of 4th March, 1964 :

"The Chairman, Mr. Rafik ....."

I believe he is not merely the Chairman but one of the leading representatives of Lake House.

"..... requested the members present ....."

that is, Messrs. Sykes, Bayne, Jesudasan and de Soysa——

"..... to give their opinion as to how the marine department is functioning, and was assured by Mr. Bayne that there was satisfactory progress."

This is the way in which this nationalized corporation is run.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I am grateful to the hon. Member for his remarks. I do not want to stop the hon. Member from disclosing these facts. I merely want to say that the facts have been brought to my notice and I have appointed a committee to go into the matter. I myself am ignorant of liabilities of an organization called about the manner in which this enterprise is being conducted.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I hope the committee will go into ce in other facts which I want to bring to the notice of the House and of the Hon. Minister. I want to ask the Hon. Minister to get this committee to make a very close investigation of a certain transaction which strikes me as one that needs to be carefully looked into, and that is a decision of the Insurance Corporation to buy for a sum of about Rs. 135,000 the so-called assets and liabilities of an organisation called the Insurance Officers' Association of Ceylon.

I do not know whether the Hon. Minister is aware of the history of this organization. This body was formed by the incorporation, in January, 1963, of three other associations. One was the Fire Insurance Association of Ceylon ; another was the Ceylon Accident Insurance Association ; and the third was the Colombo Marine Insurance Agents' Association. It was an association, principally, of the British, Indian and other firms and also one or two Ceylonese firms. This association was mainly working for the benefit of the 45-odd British firms and agencies representing British firms in this country. It is curious that all the members of the co-ordinating committee that I mentioned were prominent members of this association. Mr. L. S. A. de Soysa was the former secretary, and Messrs. Sykes, Bayne and Jesudason were prominent members of the committee.

The Hon. Minister will find, if he goes into the matter, that executive officers of the corporation protested against this purchase. Nevertheless, it went through. Some of the officials who were working in this association are now employed by the Insurance Corporation. There was a British fire or marine inspector taken over, and I believe he is being paid a big salary running into some Rs. 7,000 a month. You find a number of persons of the so-called association now being absorbed into the Insurance Corporation. The only reason given for this was that they had made certain reports on tea factories.

As far as fire insurance is concerned, I am reliably informed that Ceylonese executives of the corporation, who have nearly 20 years experience, have shown that the maximum value of those records is about Rs. 10,000 and they were the only things they had. Nevertheless, a sum of Rs. 135,000 was paid for their so-called assets and liabilities. Does the Hon. Minister know what policies are being followed in the matter of the charges which are being made for insurance ? A good number of these persons deal with problems of import and export.

I forget a very small matter which concerns potatoes. Does the Hon. Minister know that in 1963, claims on the Insurance Corporation in relation to potatoes damaged, etc. were in the region of Rs. 5 lakhs ? Are there any surveyors, and are there any ways of checking this ? Does he know that the Insurance Corporation charges only 8 per cent for insuring potatoes in gunny bags, and that is what is called " all risks " covering, including loss or damage however caused ? This sort of thing never existed anywhere. The only other place I know of is Holland where there is some sort of underwriting clause like this. But there they charge 17½ to 20 per cent. Very nice for those

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

businessmen who are importing potatoes and covering their risks, or rather the corporation covering their risks, and buying them.

I am glad the Hon. Minister has begun to realize that the situation needs a thorough probe. I want to read to the House the remarks made by Messrs. B. R. de Silva & Co., Chartered Accountants, who are the accountants of the corporation. They were asked to give a report on the General Insurance Department of the Corporation. This was a report dated 17th October, 1963 and deals with the work for 1962. They start of by saying,

"As the final accounts of the Corporation for the year ending December 31, 1962, have not yet been submitted to us, our report will inevitably be delayed further. As such we submit to you some of our observations in this interim report."

I am not going to read the whole report because they go into matters department by department. But these are the accountants of the corporation itself revealing certain matters after studying the state of affairs.

"We have studied the work of this department"—

That is the General Insurance Department.

—"for 1962. There are irregularities and shortcomings. If serious repercussions are to be avoided, we feel that immediate action should be taken to remedy this unsatisfactory state of affairs. An early review by competent technical personnel becomes specially important in view of the fact that all general insurance business of the Island is likely to be handled by this Corporation from January, 1964."

Then they go on later to say :

"We would, therefore, suggest that the working of the entire general insurance section be reviewed, re-organized and co-ordinated wherever necessary. The necessity for an adequate system of checking at various stages cannot be too strongly advocated."

They give a lot of details to show that there has not been any checking in many departments :

"It is such a complete system that we would like to see incorporated in the manual of procedure."

—and they go on and say, "Please do not get angry with us, because what we have said is absolutely true."

Now, unfortunately, there are a lot of bungling amateurs at the top, and some of the professional advisers are worse. But there are a number of patriotic executives, persons with experience in the insurance business, who are anxious to help and, I think, the Hon. Minister would be well advised to try and get their assistance. Unfortunately, there seems to be some policy of recruiting to the Insurance Corporation persons from the top rungs of the Administrative Service. They may be very good people, but they do not know insurance. The moment this charge is brought, the answer of the corporation is : "Well, we made a profit." If that Insurance Corporation does not make a profit all the directors should be shot. It is one of the corporations where you cannot possibly make a loss unless you are having a whole set of rogues in that place. But you will be making far greater profits, several times greater profit." If that Insurance Corporation run. It is a real money spinner ; but, unfortunately you are spinning the money into other people's pockets and not into the exchequer where it should belong.

I am glad the Hon. Minister has announced that he is going to appoint some committee.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have already appointed ; and I also have directed that——

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

May I know whom you have appointed ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have appointed Dr. Kannangara, the Economist; the Controller of Insurance, Mr. M. S. Perera who is the Head of the Department; Mr. Giragama, one of those Commercial Assistants who has done some insurance work. I had to make a change because Dr. Kelegama who was a member of the board had tendered his resignation, and, instead of him, I have appointed Dr. Kannangara. I have now re-constituted the committee with Mr. M. S. Perera as the head, the commercial assistant to assist him and the actuary also to advise him; a three-member committee.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Let us hope that something will come out of it. I do not know the qualifications of some of these gentlemen.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I have also directed the chairman to co-opt the members of the union, not as such, but as members who are in a position to advise the co-ordinating committee. I regret it has not yet been done.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

What I want to suggest to the Hon. Minister is that he should scrap this co-ordinating committee and have a committee consisting of either the Directors or the General Manager, plus the heads of all the departments who can co-ordinate the work. Why do you want to co-ordinate the work with De Soysa and Jesudasan ? Why do you not co-ordinate the actual work itself ? I want to know.

There may be many departments where the General Manager has not even stepped into, and I think some of the Directors too have not stepped into some of these new departments. If the Hon. Minister goes to the new departments which are near the harbour, he will see—I went there to insure my car—that they are in a state of utter confusion. I do not know how anybody could work under those conditions. I think it is absolutely necessary that action should be taken now, because, if you do not take action now, you will have the whole thing blowing up in your face in an year or so.

අ. භා. 6.30

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අද අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති ධුරයේ වැඩ කරන මේ ඇමතිතුමා මෑත කාලයේදී ඇමති කාර්‍යාල කීපයකම වැඩ කර තිබෙනවා. එතුමාගේ අහේතුවකටද කියා මම දන්නෙ නැහැ එතුමා භාරගත් හැම අංශයක්ම—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
සාර්ථකයි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අන්ත විධියේ අවුල් තත්ත්වයකට වැටී තිබෙනවා. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කාලයේදී මෙතුමා කම්කරු අංශය භාරව සිටිය. ඒ කාලයේදී එක අවුරුද්දක් ඇතුළත වැඩ වර්ජන 300 ක් ඇති වී තිබෙනවා. ඒ අනුව රටට වුණ අලාභය කොතරම්ද කියා මනින්න පුළුවන්. මෑත කාලයේදී එනම් 1963 වර්ෂයේදී ඇතිවුණ වර්ජන සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාගෙ තක්සේරුව කෝටි 10 ක පාඩුවක් ඇති වුණ බවයි. වැඩ වර්ජන අංශයෙන් බලන විට 1963 ඒ තරම් භයානක අවුරුද්දක් නොවෙයි. එයට පෙර ඉතාමත් පුදුම අන්දමට වැඩ වර්ජන සිදු වුණා. නමුත් භයානක නොවන ඒ අවුරුද්දේ සිදු වූ වැඩ වර්ජන වලින් කෝටි 10ක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අලාභයක් වුණාය කියා මුදල් ඇමතිතුමාගේ කථාවේම සඳහන් වී තිබෙනවා. එහෙම නම් වැඩ වර්ජන 300 ක් සිදු වුණ කාලයේදී ඇති වුණු පාඩුව මොන තරම් විශාල ප්‍රමාණයක් වෙන්නට ඇද්ද?

කෙසේ වුණත් මෙතුමා වෙළඳ ඇමතිකම භාරගත් දා සිටම වෙළෙඳාම අවුලෙන් අවුලට පත් වුණා. බඩු හිඟයක් ඇති වුණා. පිට රට යවන බඩුවල මිල වැටුණා. පිට රටින් ගෙනෙන බඩුවල මිල වැඩි වුණා. හැම දෙයක්ම අවුලෙන් අවුලට පත් වුණා. ඒ අවුල්වලින් කරවල අවුල කාටත් නිතරම කල්පනා වන අවුලක් බව මා ප්‍රකාශ කරන්න කැමතියි. ඊට පසු—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
පැවිරල් අවුල?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
මම පස්සෙ ඒ ගැන කියන්නම්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
රක්ෂණ අවුල?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
රක්ෂණ අවුල ගැන දැන් කිව්ව නොවේද? තමුන්නාන්සේ මහා ඉහළ ව්‍යාපාරයක් කළාය කියා, සුළු වශයෙන් වත් රක්ෂණ කටයුතු කරමින් යම් පිරිසක් ලංකාවෙ සිටියා නම් ඒවා සේරම කඩා දමා සුද්දන්ටත් ඉන්දියන් කාරයන්ටත් මුදල් ටික ගෙන යන්න භාර දුන්නය කියා මැද කොළඹ දෙවන මන්ත්‍රීතුමා (පී. ජී. බී. කෙනමන් මයා.) ප්‍රකාශ කළා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඒ මන්ත්‍රීතුමා එහෙම කිව්වෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
අද වැඩි පුර මුදල් යන්නෙ ඉන්දියාවට නොවෙයිද? "ෆි-ඉන්ෂුවරන්ස්" මුදල් යන්නෙ ඉන්දියාවට නොවෙයිද? හොඳයි තමුන්නාන්සෙගෙ පිළිතුරු කථාවේදී ඒ ගැන කියන්න.

හිටපු මුදල් ඇමතිතුමාගෙන් අලුත් මුදල් වැඩ භාර ගත්තට පස්සෙ එතුමගෙ කථාවෙදි කියනවා, ලංකාවෙ ඉතිහාසයේම විනිමය මුදල් පිළිබඳ තත්ත්වය පහත බැස තිබෙන්නෙ ඒ කාල සීමාවේදිය කියා. තව ටික කාලෙකින් අපේ සහල්වලට මුදල් ලබා ගන්න පුළුවන් වේවිද කියන සැකයක් දැන් ඇති වී තිබෙනවා. මීට වඩා පහත බැස්සොත් අපට වුවමනා කරන ආහාර ටිකවත් ලබා ගැනීමට ඉඩක් ලැබෙන්නේ නැහැ. විදේශීය වත්කම මේ තරම් පහත බැසීමට හේතුව මොකක්ද? අපි පිට රටට විකුණන බඩුවල මිල වැටී තිබෙනවද? ඒත් නැහැ. අනික් අවුරුදු හා සංසන්දනය කරන විට ඒ තරම් පහත බැස නැති බව අපට පෙනී යනවා. 1956, 1957, 1958 වර්ෂවලදී වාගේම අපේ තේ රබර්, පොල් ආදී ද්‍රව්‍ය එකම මිලටම වාගේ විකුණා තිබෙනවා. ඒ නිසා මේ රටට එක වාගේම ආදායමක් තිබෙනවා. එහෙම නම් අපි මේ ලබාගත් මුදල බඩු ගැනීමට වියදම් කළාද? කිසිම කල්පනාවක් නැතිව අපි අතදිග හැර ඒ මුදල වියදම් කළා? ආදායමට වඩා වියදම් කළ නිසා අපේ ගබඩාවල එනම් මධ්‍යම බැංකුවේ තිබුණු මුදල් ප්‍රමාණයත් අඩු වුණා කියහැකිද? මේ තරම් බඩු සීමා වූ යුගයකුත් නැහැ. අද බලපත්‍ර යක් ගන්න ඉතාමත් අමාරුයි. තමාගේ දරුවන් පිටරට අරින්න, වෙළඳ ව්‍යාපාරිකයකුට පිටරට යන්න, එහෙම නැත්නම් කර්මාන්තයකට අමු ද්‍රව්‍ය ගෙන්වන්න බලපත්‍රයක් ලබා ගන්න අද ඉතාමත් අමාරුයි. විනිමය නැහැ, කියනවා. අද තිබෙන්නෙ බොහොම භයානක තත්ත්වයක්. 290 නොවැ තියෙන්නෙ. ඉතින් කොහොමද? ඒ නිසා හැම විටම අපි අනවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වීම සීමා කළා නම්, අවශ්‍ය දේත් සීමා කළා නම්, අවශ්‍ය දේත් ගෙන්වීම සීමා කළා නම්, අපි ඉතාමත්ම අවශ්‍ය ප්‍රමාණය පමණක් ගෙන්වා ගත්තා නම්, රෙදිපිළි පවා පලානය කළා නම්, අපි ඉතා මත්ම ප්‍රවේසමින් වියදම් කර තිබෙනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

කියා කල්පනා කරන්ට පුළුවන්. එහෙම නම්, පසුගිය අවුරුදුවල වගේම අපට ආදායම ලැබුණා නම්, දැනට විශාල මුදලක් ඉතිරි කර තිබෙන්න ඕනෑ නොවේද? මහ බැංකුවෙත් අනික් බැංකුවලත් මේ වන විට විශාල මුදලක් ඉතිරිව තිබෙන්න ඕනෑ. නමුත් මුදල් ඇමතිතුමා කියනව, කවදාවත් මේ තරම් පහළට ඒ වත්කම වැටුණෙ නැත, කියා. එහෙම නම් මේ මුදල්වලට මොනවා වුණාද?

මහ බැංකුවේ වාර්තා ටිකක් කියවා බැලුවොත් තමුන්නාන්සේලාට පුදුම සහගත කරුණු පෙනෙයි. කරුණා කර මේ 36 වන වාර්තාව බලන්න. එය ඉතාමත් වැදගත් එකක්. 1960 දී ආහාර සහ බීම වර්ගවලට අංක 105 ක ගණනක් වියදම් වුණාය කියා මෙහි සඳහන් කර තිබෙනව. ඒ වාගේම රෙදිපිළිවලට අංක 93 ක ගණනක් වියදම් වුණාය කියා තිබෙනව. ඒ කාලෙ බඩු ගෙන්වීම සීමා කර තිබුණෙ නැහැ. ඕනෑ විධියට බඩු ගෙන්වන්න පුළුවන්කම තිබුණා. අංක 140 ක ගණනක් ඊළඟට තිබෙනව. ඒ වගේම සඳහන් වී තිබෙනව කර්මාන්තවලට යෙදීම පිණිස ගෙන්වූ කාර්මික යන්ත්‍ර, උපකරණ, ආදී අවශ්‍ය දේවලට අංක 120 ක ගණනක් වියදම් වුණාය කියා. ඒ අනුව බලන විට 1960 දී සම්පූර්ණයෙන් අංක 109 ක බඩු තොගයක් මේ රටට ලබාගෙන තිබෙනව. 1963 දී ආහාර හා බීම වගී සම්බන්ධ අංකයත් 69 ට අඩු කර තිබෙනව, අපේ වෙළඳ ඇමතිතුමා. කලින් 93 ක් ව තිබුණු රෙදිපිළි අංකයත් 1963 දී එතුමා 46 ට බස්වා තිබෙනව: භාගය දක්වා බස්වා තිබෙනව. 1960 දී අනවශ්‍ය ද්‍රව්‍ය අංක 140 ක ප්‍රමාණයක් ගෙන්වා තිබෙන අතර මුන්නහේ එය 1963 දී අංක 19 ට බස්වා තිබෙනව. කොයිතරම් පරිස්සමින් එතුමා වැඩ කර තිබෙනවාද? ඒ වගේම කර්මාන්ත දියුණුවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ, මෝල් ආදී දේවල් මෙරට ගෙන් වූ ප්‍රමාණය. 1960 දී අංක 120 ක්ව තිබුණ. ඒ ප්‍රමාණයත් මුන්නැහේ අඩු කර තිබෙනව, 86 ට.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සේ කථා කරන්නෙ මුදල් ඇමති අංශය ගැන නේද?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

නැහැ; වෙළඳ අංශයේ පාලනය ගැනයි කථා කරන්නෙ. විනිමය පාලනය කරන්නෙ තමුන්නාන්සේ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

විදේශ විනිමය ලබා දුන්නාම ඒවා ප්‍රයෝජනයට ගැනීම මගේ වැඩක්.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මෙපමණ කලක් මුදල් ඇමති වශයෙන් හිටියෙත් තමුන්නාන්සේයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

දැන් අපි සාකච්චා කරන්නෙ මුදල් ඇමති අංශය ගැන නොවෙයි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සේ එදා මුදල් ඇමති වශයෙන් කළ මෝඩකම් තමුන්නාන්සේ අද විඳින්න ඕනෑ වෙළඳ ඇමති වශයෙන්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

On a point of Order, Sir, we are now on the Votes in respect of the Ministry of Internal and External Trade and Supply, and the hon. Member is now referring—I have no objection to that; I can stand all that—to the Ministry of Finance or rather to the period during which I was Minister of Finance.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

The Hon. Minister is the one who says that certain things are inessential when the public go to him for a permit—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මූලාසනාරූඪ මන්ත්‍රී

(தலைமை தாங்கும் அங்கத்தவர்)

(The Presiding Member)

Please be very brief.

ආර්. ජී. සේනානායක මයා.

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

ඒ වගේම කර්මාන්ත යුගයක් ඇති කිරීමට වුවමනා මෝල් ආදි උපකරණ ගෙන්වීමේ මුදලත් අඩු කර තිබෙනව, අංක 86 දක්වා. ඔය සියල්ලම කර අන්ති මේදි බලන විට විදේශ විනිමය, විදේශ ධනය තිබෙන්නෙ 290 යි. මක් වුණාද? කෝ තමුන්නාන්සෙ එකතු කළ මුදල? වෙළඳ ඇමතිතුමාට කඩයක් භාර වී තිබෙනවා යයි හිතමු. තමුන්නාන්සේ කඩකාරයෙක් වශයෙන් බඩු තොගයක් ගෙන්වා ඉතා පරිස්සමින් ඒවා විකුණනවා නම්, බඩු ඉතුරු විය යුතුයි නොවේද? පරිස්සමින් විකුණනව නම් ඉතුරු විය යුතුයි. එසේ නම් මේ විදේශ විනිමයට වුණේ කුමක්ද කියා මා අහන්ට කැමතියි. තමුන්නාන්සේ කොයි තරම් උත්සාහ කළත්, තමුන්නාන්සේට හොයා ගන්න බැහැ විනිමය නැති වන ආකාරය. මා එන්නෙ එතැනටයි. සමුපකාර සමිතිවල පොත්වල බලන විට ඉතුරුවට බඩු තිබෙන බව පෙනී යන නමුත්, ගබඩාවල බලන විට බඩු නැහැ. එසේ සිදු වෙන්නෙ හොරකම් නිසයි. සමුපකාර මීයො මුදල් අංශයේ ගබඩාවටත් ගිහින් තිබෙනව. පොත්වල නම් තිබෙනව මුදල් තිබෙන්න ඕනෑ කියා. හැම අතින්ම විනිමය රකිනව; ආරක්ෂා කරනව. ගණන් බලන විට විනිමය නැහැ. ඇයි? තමුන්නාන්සෙගෙ සමුපකාර පළ පුරුද්ද අනුව මුදල් අංශය පාලන කරද්දිත් පුළුවන් තරම් ජාවාරම්වලට ඉඩ දී තිබුණු නිසයි. ඒ ජාවරම් නිසා විශාල මුදල් තොගයක් මේ රටින් පිට වෙනව. මේ රටේ තේ අපේ වෙළඳ පොළට ගෙනෙන්නෙ නැතුව පිට කරන්න දුන්න අවසරය එක ජාවාරමක් හැටියට හඳුන්වන්න පුළුවනි. එංගලන්තයට ගිහින් තේ විකුණන්න තියෙන බලය නිසා තමුන්නාන්සෙලාගෙ විනිමය තවත් අඩු වෙනව. ඒක, මූලික ජාවාරමක්. තමුන්නාන්සෙ සෑම විටම මේකට වග කියන්න ඕනෑ. මේ චෝදනාව ගරු මුදල් ඇමතිතුමාට එල්ල කරන විට "මම නොවෙයි; මම නොවෙයි; ඔවැනි මෝඩකම් මම කරන්නෙ නැහැ" කියන හැඟීම දුන්න. එතුම නොවෙයි, මේ සිටින්නෙ: මේ සිටින්නෙ වෙළඳ ඇමතිතුමයි. සාමාන්‍යයෙන් මොලේ පාවිච්චි කරන කෙනෙකුට පේනව, මේක භයානක ව්‍යාපාරයක් බව. බ්‍රෝකර් කෙනෙකුට මගෙ තේ භාර දීල, "මේක විකුණා දෙන්න; පුළුවන් නම් එනන සල්ලි ඉතිරි කර ගන්න" කියා මා කීවොත්, ඒ බ්‍රෝකර් මගේ කීම අනුව වැඩ කරන්නෙ නැද්ද? සුළු "ඇඩ්වාන්ස්" එකක් දෙනව. තේ තොගය එංගලන්තයට ගෙන ගොස් බොරු වියදම් දමනව. "මෙච්චර ගෙවල් කුලී ගියා; මෙච්චර ස්ටෝරු කුලී ගියා; මේ තේ ගැන අළුත් පරීක්ෂණයක් ඇති කරන්න වුවමනා වුණා; අපේ තේ පෙට්ටි හදා තිබුණ හොඳ මදි; වරායෙ යම් යම් කරදර ඇති වුණා; එම නිසා මේ ප්‍රමාද ඇති වුණා." ඔය ආකාරයට කරුණු ඉදිරිපත් කර බොරු ගණන් දමා පුළුවන් තරම් මුදල් එහෙ තියාගන්නව. තමන්ගෙ ස්වාමියා සතුටු කරන්න වුවමනා නිසා කොටසක් පමණක් තමුන්නාන්සෙට එවනව. එම නිසා මේ මුදල් ඇදගන්න ඇති එකම ක්‍රමය, ඉතා හොඳ ක්‍රමය, තමුන්නාන්සෙ කපා තිබෙන මේ අළුත් පාරයි කියා මා ප්‍රකාශ කරනව.

අ. භා. 6.45

අපේ වෙළඳ පොළට බඩු නොගෙන පිට වෙළඳ පොළකට බඩු යැවීමයි, තමුන්නාන්සෙලගෙ විනිමය නැති වීමෙ මහ මග. මේ රටේ තේ වෙන්දේසි කරන විට ඒවයෙ මිල මේ රටේදි ගෙවන්න ඕනෑ. එතකොට අපි දන්නව, විකුණූ මිල ගැන. තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

නාන්සෙගෙ මධ්‍යම බැංකුවට කියන්න පුළුවනි, "තේ රාත්තලකට රුපියල් 3.50ක් වියදම් වුණා; එම නිසා තේ ගෙනියන්න පෙර 3.50 ගණනෙ ගෙවන්න" කියා. එසේ නැතිව එහාට ගොස් තේ විකුණන්න බලය දුන්නාම කොච්චර මිල වුණාද කියන්න දන්නෙ නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

දැන් තිබෙන වාර්තාවල හැටියට, වාසියක් මිස අවාසියක් වෙලා නැහැ.

ආර්. ජී සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙගෙ ක්‍රියා මාර්ග හැම එකේම තියෙන්නෙ, වාසිය. අන්තිමේ බලන විට, රට බංකොලොත්. තමුන්නාන්සෙගෙ එකම ව්‍යාපාරයකින්වත් අවාසි වුණාය කියනවද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத්න)
(The Hon. Ilangaratne)

ඔය විධියට පිටරට තේ යැවීමෙන් දැනට වාසියක් මිස අවාසියක් වෙලා නැහැ.

ආර්. ජී සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඔය වාර්තා මගේ කාලෙත් තිබුණා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத්න)
(The Hon. Ilangaratne)

ඒවත් වැරදිද?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඔය සුද්දොම මගේ කාලෙත් බොහොම භීෂ්‍ම කළා, ඕවට අවසර ගන්න. මම සුද්දන්ගෙ වාර්තාවලට නැමුණෙ නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத්න)
(The Hon. Ilangaratne)

මේව සුද්දන්ගෙ ඒව නොවෙයි; මේව අපේ ඒව.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මැද කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) චෝදනා කළා තමුන්නාන්සෙ සුද්දන්ට, ඉන්දියන්කාර යන්ට ප්‍රයෝජනවත් වන විධියට සංරක්ෂණ මණ්ඩලය සකස් කළාය කියා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத්න)
(The Hon. Ilangaratne)

එහෙම චෝදනාවක් නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙගෙ සෑම ව්‍යාපාරයකින්ම බොරු හඬක් නග්ගනව, අධිරාජ්‍ය විරෝධිය කියා. යටින් සුද්දගෙ පක්ෂයට අවස්ථාව දෙනව, සෑම විටම.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத්න)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙගෙ ව්‍යාපාර හොඳට ගෙනිච්චද?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මගෙ කාලෙ එතරම් විනිමය වෙනස් වුණේ නැහැ. මගෙ කාලෙ—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத්න)
(The Hon. Ilangaratne)

මොකවත් කළේ නැහැ, එහෙමම හිටිය මිනිස්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මා නේද, තේ වෙන්දේසි පොළ ඇති කළේ? තේ විකිණීම තහනම් කළේ [බාධා කිරීමක්] මගෙ කාලෙයි, මේ තේ වෙළඳ පොළ ඇති කළේ. මුන්නැහෙගෙ කාලෙයි, එය නැති කළේ. මා නිකම් සිටියය කියනව, මෙච්චර කල්. උන්නැහේ කළ හරිය මොකද—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අධිරාජ්‍යවාදි විධියට තමුන්නාන්සෙගෙ කාලෙ ක්‍රියා කර ගෙන ගියා. අපට ඒව වෙනස් කරන්න වුණා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අධිරාජ්‍යවාදීන්ට සල්ලි ඇද ගන්න මග සැලැස්සුව. ඒ බව තමුන්නාන්සෙලාගෙ වාර්තාවලින් පේනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ විධියට නොවෙයි, ඇඟ්‍රිමන්ට් පවා ඇති කරගෙන තිබුණා. ඒ ප්‍රතිපත්තිය අද ක්‍රියාවේ යොදන්න අමාරුයි. මේ කාලේ එහෙම කරන්න බැහැ. මම පස්සෙ නියම වෙලාවට උත්තර දෙන්නම්.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

එතුමගෙ ක්‍රමය නම් බොහොම හොඳා තමයි. එතුමගෙ ක්‍රමය එතුමටත් බොහොම හොඳවා වෙන්න ඇති. ඒ කොයි හැටි වෙතත් ඒ ක්‍රමයෙන් රටට බොහොම අලාභ වෙනව. ගරු වෙළඳ ඇමතිවරයාට නම් පෞද්ගලිකව බොහොම ලාභ ලැබෙනව වෙන්න ඇති. ඒ ගැන මම තර්ක කරන්නෙ නැහැ. පෞද්ගලික වශයෙන් නම් හොඳයි වෙන්න ඇති.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මට පෞද්ගලිකව බොහොම පාඩුයි. තමුන්නාන්සෙට වැඩිය පාඩුයි. ඒ නිසා තමයි ඔය හැටි නඩු එහෙමත් හැමදාම තියෙන්නෙ මට.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

එතුමට නම් පාඩු නැතුව ඇති. එහෙත් රටට පාඩු වන බව මුදල් ඇමතිතුමාගේ වාර්තාවෙනුත් කියනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙට නම් ලාභයක් වෙලා තිබුණත් මට නම් ලාභයක් වෙලා නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙට ලාභ ඇති. මොකක්ද වුණු පාඩුව?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මාව ඉලෙක්ෂන් එකෙනුත් පරද්දන්ට මුදල් දුන්නෙ නැද්ද, වෙළෙන්දෝ එකතු වෙලා? ලක්ෂ 6ක් දුන්නයි කිව්වෙ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙව පරද්දන්න ලක්ෂ හයක්ම වැවමනා කරනවද?

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ලක්ෂ 6ක් දුන්නයි කියල තමුන්නාන්සෙම නේද වරක් කිව්වෙ?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
ඒ තරම් මුදලක් වුවමනා කරන්නෙ නැහැ තමුන්නාන්සෙව පරද්දන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
දැනටමත් කෝටියක් පමණ වියදම් වෙන්න ඇති නඩුවලටත් එක්ක, ඔක්කොටම. ඒත් තවම පරද්දන්න නම් බැරි වුණා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තොන්ඩමන් උන්නැහේ ගියාම තමුන්නාන්සෙ පරාදයි. තොන්ඩමන්ගෙ ඡන්ද වලින් තමුන්නාන්සේ දිනුවා වගේම තොන්ඩමන් නාවොත් හෙට පරාදයි. ඒ වගේම තොන්ඩමන්ලා සල්ලිත් දෙන්න ඇති. එයාලට ඕනෑ නම් පරද්දන එකත් වැඩක් නැවෙයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
කවුරු කවුරුත් ආධාර දෙන්න ඇති. සල්ලි නම් දුන්නෙ නැහැ. ඒ වගේම ව්‍යාපාරික සමිතිවලිනුත් අපට බොහොම ආධාර දෙන්න ඇති. ඒ වුණාට තමුන්නාන්සෙට දෙන්නෙ ඔක්කොම කළුකඩ කාරයෝ. වීදුරු ගෙවල්වල ඉදගෙන ගල් ගහන්ට එපා මනුෂ්‍යයා. මට විරුද්ධව වියදම් කරන්න රුපියල් ලක්ෂ හයක් එකතු කරගෙන ලෑස්ති වුණෙ නැද්ද අහනව.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
කවුද එකතු කළේ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තමුන්නාන්සෙමයි කිව්වෙ ඒ කතාව මිට ඉස්සර වෙලා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තොන්ඩමන්ලා නැතුවත් තමුන්නාන්සෙව පරද්දන්න බැරි නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තමුන්නාන්සෙ ඔළුවෙන් හිට ගත්තත් මා පරද්දන්න බැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
අපේ වෙළඳ ඇමතිතුමා විශේෂ ආහාර වර්ග කීපයක්ම එතුමගෙ අතට ගත්තා. මොකටද ගත්තෙ? දුප්පත් රටවැසිය ගෙන් කුට කළුකඩකාරයො අනිසි, අසාධාරණ මිළ ගණන් අය කරනව; ඒ නිසා මගේ ආයතනවලින් මම බඩු බෙදනව කියලයි කිව්වෙ. බොහොම හොඳයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඒකයි අමාරුව එතකොට?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
ඒක බොහොම හොඳයි කියලයි කිව්වෙ. මේවා බෙදුවෙ කෙ හොමද කියල බලමු අපි. එතුමගෙ අතට පමණක් බඩු එනව නම්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ බඩු එතුමගෙ ආයතන මගින් පමණක් බෙදනව නම්, ඒ බඩු සාධාරණ ලෙසත් සාධාරණ මිළ ගණන්වලටත් බෙදා දීම කළ යුතුයි. මහජනයට එයින් සහනයක් ලැබෙනව. එහෙම නම් හොඳයි. එහෙත් අද බඩු මිළ ඉස්සරට වැඩිය නැගලා. ඒ විධියට කෙරෙනව නම් අපි මොකද කරන්නෙ? තමුන්නාන්සෙට විරුද්ධව චෝදනා කරන්න ඕනෑ නේද? අද ආණ්ඩුව පමණයි ඒ බඩු ගෙන්වන්නෙ. උම්බලකඩ ගෙන්වන්නෙ ආණ්ඩුව පමණයි නේද අද? හැම දෙනාම උම්බලකඩ ගෙන්වන කාලෙ හැම දෙනාටම ගන්න උඩබලකඩ තිබුණා. එදා එහෙමයි. අද කොහොමද? අද අවුන්ස දෙකයි දෙන්නෙ. මොකද අවුන්ස දෙක? ආහාරයට ඉතා අවශ්‍ය දෙයක් වන උම්බලකඩ වැඩිපුර ගෙන්වන්නෙ නැත්තෙ ඇයි? අවුන්ස දෙකකට පමණක් සීමා කරන්නෙ ඇයි? කරවල ජාවාරම නවත්තන්න මහා විශාල සටනක් අපේ වීරයා කළාය කියනව. කරවල මුදලාලිලා නැතිකර ජයගත් ඇමතිවරයාය කියනව. ඒ වුණාට අද බංගසාල වීදියට ගිහිල්ල බලන්න. එදා හිටියෙ සිංහල වෙළෙන්දන් තුන් දෙනයි එතන. ඉද ඉන්නෙ එන්. එම්. කුමාරස්වාමි—සී. ඩබ්ලිව්. ඊ. එකේ—පමණයි. එතන අද ඉන්නෙ පිච්චෙලා, ලෙබ්බෙලා, නාඩාර්ලා පමණයි. අදත් එතන ඉන්නෙ ඉන්දියන්කාරයෝ පමණයි. මොකද මෙහෙම වෙන්ට හේතුව? ජය ගත්තා නම් ඒ මිනිස්සු යන්නෙ නැත්තෙ මොකද? ජය ගත්තෙ මේකයි: එදා ඒ වෙළෙන්දෝ ලංකාවේ වෙළෙන්දන්ට කරවල බෙදුවා. අද මෙතුමා කරන්නෙ ඒ වෙළෙන්දන්ගෙන් කරවල අරන් එතුමාම බෙදන එකයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒක වැරදියි. බොරු ගොතල කියන්න එපා.

ආර්. ජී. සේනානායක මයා
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

පරණ වෙළෙන්දො තවම එතන.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒක සම්පූර්ණ බොරුවක්. සම්පූර්ණ අසත්‍යයක්.

ආර්. ජී. සේනානායක මයා
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අද සම්පූර්ණයෙන් කෙරෙන්නෙ ඒ විධියටයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඔය කියන්නෙ සම්පූර්ණ බොරුවක්.

ආර්. ජී. සේනානායක මයා
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

එදා හාල්මැස්සො සත පණහයි. වාර්තා වුවමනා නම් මම තමුන්නාන්සෙට දෙන්නම්.

පී. බී. බාලසූරිය මයා. (ගලිගෙමුව)
(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)
(Mr. P. B. Balasuriya—Galigomuwa)

තමුන්නාන්සෙගෙ කාලෙ කොහොමද?

ආර්. ජී. සේනානායක මයා
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

භාෂා ප්‍රශ්නය උඩ සටින ඇති වුණු කරදර කාලයේදී ගම්කාර්ය සභා 400 කට මම ටෙලිග්‍රෑම් ගැහැව්ව. ඒ කාලයේදී හැම පැත්තකටම විදුලි පණිවුඩ යවා වාර්තා ලබා ගත්ත. ඒ අනුව එදා හාල්මැස්සන් රාත්තලක මිළ ශත 50 යි. නමුත් අද එය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

රුපියල් 1.20 දක්වා නැගි තිබෙනවා. ඇයි මේ තරම් මුදලක් වැඩි වුණේ? අද එදාට වඩා තුන් ගුණයකින් මිළ නැඟලා.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

එදා අදට වඩා තුන් ගුණයක් සල්ලි පිට රට යවන්න ඇති.

ආර්. ජී. සේනානායක මයා.

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

ඒකෙන් පෙනෙන්නේ එදා විදේශ ධනය හොඳින් තිබුණු බව නොවැ. හොඳයි, මේ මුදල් පිට නොකරන යුගයේදි පහසුවෙන් ඒ බඩු ගෙන්වා ගන්න පුළුවන් නොවැ. [බාධා කිරීමක්].

මූලාසනාරූඪ මන්ත්‍රී

(தலைமை தாங்கும் அங்கத்தவர்)

(The Presiding Member)

May I suggest again that you address the Chair?

ආර්. ජී. සේනානායක මයා.

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

I am sorry, Mr. Chairman. You see the point is that at that time there had been leaks and a certain amount of exchange had been pushed through.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

And you were responsible for it.

ආර්. ජී. සේනානායක මයා.

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

Now due to the special action of the Hon. Minister he was able to prevent that outflow of exchange. Then there should be a greater accumulation of foreign exchange because all the leaks have ben stopped. But the net result is that never in the history of Ceylon have we got into this position of such low external assets.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

On that commodity there is a saving.

ආර්. ජී. සේනානායක මයා.

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

On every commodity it is the same. We will take the other one, *Suduru*.

ඊළඟට සූදුරු ගැන සලකා බලමු. ටික කාලයකට පෙර සූදුරු හොඬරයක මිළ රුපියල් 48 යි. ලේඛන අනුව ඒ බව පෙනී යනවා. නමුත් දැන් සූදුරු හොඬරයක මිළ රුපියල් 148 යි.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

සූදුරු ගෙන්වන්නේ ඉරාකයෙන්. අප ඉරාකයෙන් සූදුරු ගැනීම සඳහාත්, ඉරාකය අපෙන් තේ ගැනීම සඳහාත් ගිවිසුම්කට අත්සන් කර තිබෙනවා. ඒ නිසා අප ඒ රටින් සූදුරු ගත්තෙ නැත්නම් අපේ තේ ඒ රටට විකුණන්න බෑ. අපට ඒ රටට තේ විකුණන්න බැරි වුණොත් තේ මාකට් එක වසා දැම්මාය කියා අපට චෝදනා එල්ල වන්නට පුළුවනි.

ආර්. ජී. සේනානායක මයා.

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

අපේ තේ ඉරාකයට විකුණන්න වුවමනා නිසාද රුපියල් 48 ක් වූ සූදුරු හොඬරය රුපියල් 148 බැගින් ගන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

එහෙම නැත්නම් තේවලින් ලොකු පාඩුවක් සිදු වෙනවා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඔන්න ඇමතිවරයගේ පණ්ඩිතකම්! අපේ තේ විකුණන්නය කියා අප ඉරාක යෙන් රුපියල් 148 බැගින් සූදුරු ගන්නවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සූදුරු ගෙන්වන්නට වියදම් කරන මුදලට වඩා සිය ගුණයක තේ අප ඉරාකයට විකුණනවා. අප ඉරාකයෙන් සූදුරු ගන්නෙ නැත්නම් අපේ තේ ඒ රටට විකුණා ගන්න බැහැ. අපොයි තමුන්නාන්සෙගෙ දැනීම නම්?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඊළඟට රතු ලුනු ගැන කල්පනා කර බලමු. එදා රතු ලුනු හොඬරයක මිළ රුපියල් 8 සි. නමුත් මෙදා රුපියල් 26 සි. යාපනය ප්‍රදේශයේ රතු ලුනු වවනවා. ඒ වැවිලිකරුවන්ට ආණ්ඩුවෙන් ආධාර මුදල් කුත් ගෙවනවා. නමුත් එහි නිෂ්පාදනය කරන රතු ලුනු ප්‍රමාණවත් නැහැ. ඉන්දියාවෙනුත් රතු ලුනු හොරෙන් ගෙන් වනවා. ඒ වාගේම ඉන්දියාවෙන් රතු ලුනු ගෙන්වනවා. හැබැයි, එසේ ගෙන් විත්තේ වැල්වැටිතුරේ පැත්තෙනුයි. අනික් පැත්තෙන් ගෙන්නුවොත් වැවිලි කරු ආධාර මුදල් ලැබෙන්නේ නැහැ. වැල්වැටිතුරෙන් ගෙන්වන රතු ලුනු සඳහා රුපියල් 26 ක් ගෙවනවා. මේ යකි? ලුණු කොහොමද? අපේ රටේ ක්‍රමය නිසා ඉන්දියාවේ සිටින වැවිලි කරුවන්ට ආධාර මුදලක් ලැබෙන බව පේනවා. අපේ වැවිලිකරුවන්ට නියම වන ආධාරමුදල් ඉන්දියානු වැවිලිකරු වන්ට ලැබෙනවා.

දැන් සියඹලාවල තත්ත්වය කුමක්ද? දැන් තිබෙන සියඹලා පැණිරසට හුරුයි. එසේ වී තිබෙන්නේ මක්නිසාද? ඉරාක යෙන් ගෙන්වන රට ඉදිවලින් වැඩි කොට සක් කුණු වී යනවා. එසේ කුණු වී යන විට ඊට සියඹලා මිශ්‍ර කොට හොඳට පාගනවා. සියඹලාවලට රට ඉදි මිශ්‍ර වීම නිසයි, ඒවා පැණිරස වී තිබෙන්නේ. ඕව තමයි, වේලන්නෙ. ඕනෑ කෙනකුගෙන් අහලා බලන්න ඇත්තද, නැත්තද කියා. හැම තැනම කරන්නෙ ඒකයි. එදා රුපියල් 12 යි. අද පාගපු සියඹලා රුපියල් 39 යි. බලන්න මේකෙ අලාභය. කළුකඩ කාරයා කියනව. කවිද කළුකඩ කාරයෝ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අන්න ඇවිල්ල ඉන්නව උඩ, කුමන්ත්‍රණයට උදව් දෙන අය; ඔය ගණන් හිලව් දෙන අය.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

May I request the Hon. Minister not to refer to anybody in the Gallery?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I am sorry.

ආර්. ජී. සේනානායක
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මේව බොරුද? තමුන්නාන්සෙ හොරකම් කරන විට මේවා අල්ලන්න එපා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

හදන ලුණු. එදා රුපියල් 6.65 යි අද රුපියල් 11.52 යි. අපේම ලුණු. හම්බන්තොට පළාත්වල කඩවල විකුණන්නෙ 11.52 ට. වෙරළෙ තියෙනව, ආණ්ඩුවට අයිතිය. ගැනීම නීති විරෝධිය කියනව. පරිප්පු ගැන කොහොමද? ඒකත් ආණ්ඩුවෙන්ම ගෙන්වන දෙයක්. ඔය ආකාරයට බඩු හුගක් ගැන තමුන්නාන්සෙට කියන්න පුළුවනි. අබ හොණ්ඩරය එදා රුපියල් 20 යි. දැන් සී. ඩබ්ලිව්. ඊ. එක අබ හොණ්ඩරය ගන්නව රුපියල් 48ට. මහ ජනයාට විකුණනව, රුපියල් 175 ට. බලන්නකො මේක මහා අපරාධයක් නේද කියල. කවිද කළුකඩකාරයො? ලොකුම කළුකඩ කාරයො මෙතනයි, ඉන්නෙ. ව්‍යාපාර ගද ගැහීම පුදුමයක් නොවෙයි. උද්ඝෝෂණයක් ඇති වුණාම මාස තුන හතරකට පෙර රුපියල් 65 ට බැස්සුව. සී. ඩබ්ලිව්. ඊ. එක පුළුවන් තරම් අයුතු ලාභ ලබා ගන්නව. සී. ඩබ්ලිව්. ඊ. එක වගේ මහජනයා මිරිකා මුදල් ලබා ගන්න ව්‍යාපාරයක් අද නැහැ.

අ. භා. 7

මූලාසනාරූඪ මන්ත්‍රී

(தலைமை தாங்கும் அங்கத்தவர்)

(The Presiding Member)

Order, please! Mr. Speaker will now take the Chair.

අනතුරුව පෝලියර් මයා. මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.

ආර්. ජී. සේනානායක

(திரு. ஆர். ஜீ. சேனநாயக்க)

(Mr. R. G. Senanayake)

ගරු සභාපතිතුමනි, අද සක්කර සම්බන්ධයෙන් සම්පූර්ණ ඒකාධිකාරය තියෙන්නෙ ඇමතිතුමා අතෙයි. එතුමා සක්කරවලට මිළ නියම කරල තියෙනව. 1964 අප්‍රේල් මස 9 වැනිදා අංක 14,007 දරණ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරල තියෙනව, පිට රටින් බඩු ගෙන්වන තැනැත්තට විකුණන්න පුළුවන් හොණ්ඩරය රුපියල් 45 ගණනෙය කියා. බඩු ගෙන් වන්නන්ගෙන් බඩු අරගෙන විකුණන තොග වෙළෙන්දට විකුණන්න පුළුවන් හොණ්ඩරය රුපියල් 47 ටයි. රුපියල් 2ක වෙනසයි, තියෙන්න පුළුවන්. මේ වෙළඳාම පිළිබඳ සම්පූර්ණ අයිතිය තියෙන්නෙ සී. ඩබ්ලිව්. ඊ. එකටයි. එක ගෙන්වා විකුණන්නෙ රුපියල් 47 ගණනෙයි. මා ළඟ ටිසිට් තිබෙනව. වුවමනා නම් පෙන්වන්නම්. ගෙන්වන තැනැත්තට විකුණන්න පුළුවන් පාලන මිළ රුපියල් 45 ය කියා ඇමතිතුමාම ගැසට් නිවේදනයේ කියා තිබෙනව. එකම සුමානෙම සී. ඩබ්ලිව්. ඊ. එකේ විකුණනව 47 ට. ඇයි මේ විධියෙ ඒවට නඩු දමන්නෙ නැත්තෙ? තමුන්නාන්සෙ සී. ඩබ්ලිව්. ඊ. එක කොයි ආකාරයෙන්ද විනාශ කර දමා තිබෙන්නෙ? නමුත් මේ සී. ඩබ්ලිව්. ඊ. එකෙන් හොඳ සේවයක් කරන්ට තිබුණ.

මා කල්පනා කරන අන්දමට මේ ගරු සභාවෙ සිටින බොහොමයක් මන්ත්‍රීවරුන් ඒකාධිකාරයකට විරුද්ධයි. හේතුව, ඒකාධිකාරයක් තිබුණාම, තනි පුද්ගලයකුට බලය තිබුණම එයින් මහජනයාට හිරිහැර ඇතිවන නිසා. හැම විටම මහජනතාවට කිකරුව රජයේ ආයතන කටයුතු කළ යුතුය යන හැඟීමක් රටවැසියා අතර තිබෙනව. වෙළඳ ප්‍රතිපත්තියද ඒ ආකාරයෙන් ගෙන යන්නට ඕනෑ. වෙළඳ තරඟයක් තිබෙනවා නම්, තනි පුද්ගලයකුට හිතුවක්කාර අන්දමින් වැඩ කරගෙන යන්නට විධියක් නැහැ. එසේ නමුත් තනි පුද්ගලයකුට ගෙන්වන්නට ඉඩ හැරියාම ඒ පුද්ගලයා බඩුවේ මිල රුපියල් සියයක්ය කියා නියම කළොත් ඒ මිලටම ලබා ගන්න ඕනෑ. රජයෙන් මොන මොන අන්දමේ නීති සකස් කර තිබුණත් සී. ඩබ්ලිව්. ඊ. එක ඒ නීතිවලට පයින් ගසා හිතුමතේ ක්‍රියා කරනව. නමුත් මේවායින් දුක් විඳින්නෙ දුප්පත් මහජනතාව නොවෙද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සී. ඩබ්ලිව්. ඊ. එකට තනි බලය පවරන විට ගරු ඇමතිතුමාට නියම කරන්නට බැරිද, සියයට දහයකට වඩා ලාභයක් ගන්නට එපා කියා? ඒ විධියට සාධාරණ අන්දමේ ලාභයක් නොවෙද ලබා ගන්නට වුවමනා කරන්නෙ? නමුත් අද කොයි අන්දමේ වැඩ පිළිවෙලක්ද ගෙන යන්නෙ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කුමන්ත්‍රණ මණ්ඩලවලට ඉඩ දෙන්නෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

සියයට තුන් සියයක් හාර සියයක් ලාභ ලබාගෙනයි මහජනතාවට ද්‍රව්‍ය බෙදා දෙන්නෙ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කොයි තරම් අසාර්ථක වුණත් සී. ඩබ්ලිව්. ඊ. එක කුමන්ත්‍රණ මණ්ඩලයට ආපසු ලැබෙන්නෙ නැහැ; ආපසු දෙන්නෙත් නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙ මේ දේ අත්හැරියොත් තමුන්නාන්සෙගෙ පණ යයි. ජීවිතයත් නැති වෙයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ජීවිතය ගියත් කවදාවත් ආපසු දෙන්නෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙ මැරෙයි මේක නැති වුණොත්!

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙ නැහුණත් ඒක කරන්නෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඔව්, දුන්නොත් තමුන්නාන්සෙගෙ ජීවිතයත් නැති වේවි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මගේ මළකද උඩින් තමයි තමුසෙට ඒක කරන්න පුළුවන් වෙන්නෙ. අපි යන සමාජවාදී ගමන ආපසු හැරී යන්නෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මේකෙ තව ටික කලක් හිටියොත් ජීවිතේටම හරි යයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මොකක්ද තමුසෙ කියන කථාව? ජීවිතේටම හරියයි කියන්නෙ මොකද?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඔක ගැන සුඛ කරන්න ඕනෑ නැහැ. කරුණා කරල වාඩි වෙන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුසෙ නැහුණත් ආපසු කුමන්ත්‍රණ මණ්ඩලයට දෙන්නෙ නැහැ. තමුසෙගෙ පරම්පරාවම ආවත් දෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

යූ. එන්. පියට දුන්නත් දෙන්නෙ නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ධනපති ක්‍රමයේ පන්දම්කාරයාට කවදාවත් ආපසු දෙන්නෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ගරු සභාපතිතුමනි, සුළුවෙන් ආරම්භ කළ බීඩි කර්මාන්තය ටික කලකින් මේ රටේ පැතිර ගියා. මේ රටේ බීඩි කර්මාන්තය දියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අවුරුදු පහකට පමණ පසු පිටරටින් බීඩි ගෙන්වීම තහනම් කරන්ට පුළුවන් වුණා. ඊට පසු මෙරට බීඩි කර්මාන්තයේ යෙදී සිටින අයට සහනයක් සැලසීම සඳහා තමුන්නාන්සෙලාගේ ආණ්ඩුවෙන්ම කාරක සභාවක් පත් කළා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙලාගෙ කුමන්ත්‍රණ මණ්ඩලයෙන් රුපියල් ලක්ෂ 6ක් එව්වා මාව පරද්දන්න.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මම කථා කරන්නෙ බීඩි කර්මාන්තය ගැනයි. ඉන්දියානුවන් සතුව තිබුණු බීඩි වෙළඳාම ලාංකික කිරීම සඳහාත්, ඉන්දියාවෙන් බීඩි ගෙන්වීම නතර කර ලංකාවෙ බීඩි කර්මාන්තය දියුණු කිරීම සඳහාත් උත්සාහ කළ අවසථාවෙදි රජය අනුගමනය කළ ප්‍රතිපත්තිය කුමක්ද? ඒ අවසථාවෙදි රජය ඉන්දියානුකාරයන්ට තව අවුරුදු දෙකක් ඉඩ දුන්න, ඉන්දියාවෙන් බීඩි ගෙන්වීමට. ඒ අන්දමට ඉන්දියානුවන්ට සහනය සලසා දීම නිසා මෙරට බීඩි කර්මාන්තය ඇණ හිටියා. ඉන්දියාවෙන්, රාජ බීඩි, කුමාර බීඩි ගලා එන්න පටන් ගත්ත. අද ලංකාවෙ ඕනෑම තැනක තියෙන්නෙ ලංකාවෙ නිපදවන බීඩි නොවෙයි, ඉන්දියාවෙන් ගෙන්වන දැනට මෙරට තිබෙන බීඩි කර්මාන්ත අල්ලාගෙන සිටින්නෙ ඉන්දියානුවන්. මෙරට බීඩි කර්මාන්ත ශාලාවල අයිති කරුවන් කවුරුන්ද කියා සොයා බැලුවොත් පෙනී යාවි වැඩි හරියක් ඉන්දියානුකාරයන් බව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙ කටින් විතරයි ලාංකික කිරීම ගැන කථා කරන්නෙ. නමුත් බලයෙ සිටි අවුරුදු 10ක් තිස්සෙ ඒක කළේ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙලාගෙම ආණ්ඩුවෙන් පත් කළ කොමිසමේ වාර්තාව බලන්න. මෙරට බීඩි කර්මාන්තය ඉන්දියානුවන්ට භාර දී තිබෙනවාය කියා එහි සඳහන් වෙන්නෙ නැද්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒක සම්පූර්ණයෙන් වැරදියි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඇමතිතුමා දන්නෙ නැද්ද බීඩි ගෙන්වීම සම්පූර්ණයෙන්ම තහනම් කළ බව? එහෙම තහනම් කර ඉන්දියානුකාරයන් ගෙන් බීඩි කර්මාන්තය ලාංකිකයන්ට පවරා, ලාංකික ව්‍යාපාරයක් ඇති කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
මුළු උපදේශක මණ්ඩලයේම සිවියේ ඉන්දියානුකාරයො.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තමුන්නාන්සේගේ මණ්ඩල ගැන බලනවා නම් ඊට වඩා හෙදයි. සභාපති තුමනි, මහජන බැංකුව ඇති කළේ විශාල බලාපොරොත්තුවක් පිටයි. මහජන බැංකුව ඇති කරන විට බොහොම දෙනෙක් කල්පනා කළ, මේ රටේ දුප්පත් මිනිසුන්ට ඉන් සහනයක් ලැබේය කියා. රුපියල් 1,000 ක 2,000 ක 3,000 ක ණයක් ලබාගන්න පුළුවන් වේයයි හිතුවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තමුන්නාන්සේ මහජන බැංකුවට විරුද්ධ වුණා නේද?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තමුන්නාන්සේට පුළුවනි, මට පසුව කථා කරන්න. ඒ නිසා දැන් කෑගහන්නේ නැතිව පසුව ඕන තරම් බොරු කියන්න. මම නිශ්ශබ්දව ඉන්නම්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තමුන්නාන්සේ බොරු කියන කොට නම් මට නිශ්ශබ්දව ඉන්න බැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
කෑගහන්නේ රිදෙන කොට.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
බොරු කියන කොට රිදෙනව.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
මේ මහජන බැංකුව අළුත් නීතියක් හදා තිබෙනවා. ණය ගන්නා උදවියට ඉඩමක් තිබෙනව, නම් ඇපය විශයෙන් එය, ඒ නීතිය අනුව බඳින්න බැහැ. පිට පළාත්වල තිබෙන ඉඩම් බලන්න යාමට බැරිය කියනවා. ඒ නිසා විගකිය යුතු නැනැත්තකු ඇපකාරයා විශයෙන් අත්සන් කළ යුතුය කියනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
Order, please! How is it relevant? Is it really connected to this?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
Yes, because trade and finance are both connected. You cannot take one completely away from the other. It is not a small matter. It is connected with our trade.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
Order, please! Your time is almost up.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
Only one point more.

අපේ සුළු වෙළෙන්දන්ට තම වෙළඳාම දියුණු කර ගැනීම සඳහා මුදල් ණයට ගැනීමට වුවමනා වෙනව. එවැනි කෙනෙක් මහජන බැංකුවෙන් ණයක් ගැනීමට බලාපොරොත්ත වුවොත් ඔහට කියනවා, ඉඩම් ඇපයට තබන්නේ නැතිව ඇපකාරයකු සොයා ගෙන එන්නය කියා. ඇපකාරයා කියනවා, ණය ගන්න නැනැත්තා යම් කිසි විදියකින් ණය නොගෙවීවෙත් ඇපකාරයා විසින් එය ගෙවිය යුතු නිසා ඉඩම් ඇපකාරයාට කොන්දේසි ඇතිව පවරන්නය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

ඉඩම ඔහුට පැවරුවාම තමයි, ඔහු ඇපකාරයා වශයෙන් අත්සන් කරන්නේ. දුප්පත් අයට වෙන කරන්න දෙයක් නැති නිසා, තම කටයුත්ත හෝ වෙළඳාම කළ යුතු නිසා තමා සතු ඉඩම ගමේ සිටින ධනවතාට ඒ විදියට පවරා ඔහුගෙන් ඇපකාරයා වශයෙන් අත්සන ලබා ගන්නවා. මේ ණය ගන්න තැනැත්තාට යම් විදියකින් ඒ ණය ගෙවාගන්න බැරි වුවොත් ඇපකාරයාට පැවරූ ඉඩම ඔහුට අහිමි වෙනවා. එය ඇපකාරයා හිමි කරගන්නවා. අත්සන් කළ පළියට ඔහු ඉඩම ගන්නවා. ඉස්සර හෙට්ටි ඒ විදියට ඉඩම් අයිති කර ගත්තා. නමුත් ඔවුන් එසේ කළේ තමන්ගේ මුදල් දීලයි. මේ ක්‍රමය යටතේ ධනවතුන් ඉඩම් අයිති කරගන්නේ ඔවුන්ගේ මුදල් දී නොවෙයි. ආණ්ඩුවේ මුදල්. ඇපකාරයගේ අත්සන පමණයි. මේ නිසා මහජන බැංකුවේ පහසුකම් ලැබෙන්නේ දුප්පත් මිනිසුන්ගේ ඉඩම් කොල්ල කන විදියකටයි.

මේ ක්‍රමය නිසා දුප්පත් අයගේ ඉඩම් කැලි තුන හතර මුදලාලිලා වැනි අයට හිමි වූ අවස්ථා අනන්තයි. මෙයින් සහනයක් ලබා ගන්න යම්කිසි ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. හෙට්ටින්ට වඩා අන්ත විධියට මහජන බැංකුව රෙගුලාසි යොදා තිබෙනවා. මෙය පටන් ගත්තේ මොන පරමාර්ථයක් ඇතුවද? මෙය පටන් ගත්තේ මහජනයා ණය බරින් මුදා ගැනීමටයි. නමුත් මේ ඇප අත්සන් කිරීමේ වැඩපිළිවෙළ නිසා දුප්පත් අයගේ ඉඩම් ටික අල්ලා ගන්නට, ඒ පළාත්වල සිටින බලවතුන්ට හෙට්ටින්ට ලැබුණට වඩා හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා. මෙය කරන්නේ තමන්ගේ මුදල්වලින්ද? නැහැ. ආණ්ඩුවේ මුදල්වලින්ම දුප්පතාගේ ඉඩම් ටික අල්ලා ගන්නවා.

ළ. භා. 7.15

අනික් කාරණය මේකයි. මේ අලුත් බදු ක්‍රමය නිසා මැද රට සහ පහත රට තේ වලට පහරක් වදිනවාය කියා තමුන්නාන්සේට මතක් කළා. දැන් මැද පළාතේ තේවලට ගෙවන ගණන තමුන්නාන්සේ දන්නවාද? හිස්පත්තුව, හිනිගත්හේන, උඩ පළාත උඩුනුවර, යටිනුවර යන පළාත්වල තේ දළුවලට ගෙවන ගණන තමුන්නාන්සේ දන්නවාද? දළුවල මිල දැනටම බැහැලා. මැද රට තේවලට තමයි ඉතාමත්ම අමාරු කාලයක් ලබන්නෙ. මා එසේ කියන්නෙ මේ නිසයි. උඩ රට තේ හොඳ වර්ගයට අයත් නිසා ගැනුම්කාරයින් අතර ඒවා ගන්නට තරඟයක් ඇති වෙනව. ඒ නිසා ඒවායේ මිල නගිනව. නිෂ්පාදනය අක්කරයකින් රාත්තල් 1,000 ක් පමණ ලැබුණත් වැඩිපුර මිලක් ලැබෙනවා. ඒ නිසා සැලකිය යුතු ආදායමක් ලැබෙනව. පහත රට තේ නිෂ්පාදකයින්ට වැඩි මිලක් නොලැබුණත් අක්කරයකින් රාත්තල් 1,500 ක් හෝ 2,000 ක් පමණ ලැබෙනවා. දුප්පත් මැද රට තේ හිමියන්ට උඩරට හොඳ වර්ගයේ තේවල මිල ලැබෙන්නෙත් නැහැ; පහත රට වැඩි නිෂ්පාදනය අනුව ලැබෙන ආදායම ලැබෙන්නෙත් නැහැ. ඒ නිසා මැද රට තේ හිමියන් ඒ අංශ දෙකෙන්ම මිරිකෙනවා. උඩ රට තේවල මිල මැද රට තේවලට ලැබෙනවා නම්, එය උසුලන්න පුළුවන්. එහෙම නැතිව තේවලට අඩු මුදලක් ලැබුණත් පහත රට තේවල වගේ වැඩි නිෂ්පාදනයක් ලැබෙනවා නම්, එයත් උසුලන්න පුළුවන්. නමුත් මැද රට තේවලට ඒ දෙකම නැහැ. ඒ නිසා ගරු වෙළඳ ඇමතිතුමාගේ ගම් පළාත්වල අද ඉතාමත්ම අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනව. තමුන්නාන්සේගේ ආණ්ඩුවෙන්ම මේ යොදා ගත් ක්‍රමය නිසා, වතු හිමියන් සියළු දෙනාම මාස තුනෙන් තුනට අලුත් බද්දක් ගෙවන්නට ඕනෑ බව ඔවුන් දන්න නිසා ඒ සඳහා දැන්ම සිටම ඔවුන් සූදානම් වෙනව. ඒ අනුව හැම අක්කරයකින්ම රුපියල් 60 ක් දෙන්නට සිදු වෙනව. ඒ නිසා ඒ මුදල අද සිටම එකතු කිරීමේ බලාපොරොත්තුවෙන් දුප්පත් දළු හිමියාගේ දළුවලට ගෙවන මිල අඩු කර තිබෙනවා. තමුන්නාන්සේ වෙළඳ ඇමතිවශයෙන් සිටියදී තේ fපැක්ටේරියක් නැත්නම් මෝලක් පිහිටුවනවාය කියා පොරොන්දුවුණා. නමුත් ඒවා කථාවට පමණයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

පාස් කර තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

පාස් තමයි. තවම ලැබිලා නැහැ. ලැබී තිබෙනවද කියා අර මන්ත්‍රීවරුන්ගෙන් අසා බලන්න. අවුරුදු 5 ක් වෙනව තවම පාස්.

අක්කරයකට බදු විශයෙන් රුපියල් 60 ක් ගෙවීම සඳහා දැන් සිටම එය එකතු කිරීමට ඔවුන්ට සිදු වී තිබෙන නිසා මෙප මණ කලක් දළුවලට ගෙවූ මුදල දැන් ගෙවන්න බැරි නිසා දැන් දළු රාත්තලක් සත 12 ට බැස තිබෙනවා. ඒ නිසා දුප්පත් දළු හිමියන් අමාරුවට පත් කරන්නේ නැතිව, ඒ අයට දළු දෙන්න මධ්‍යස්ථාන යක් නියම කරන්න. ඒ අනුව සාධාරණ මිලක් හැටියට දළු රාත්තලකට සත 25 ක් වත් ගෙවනවා නම් ඒ උදවියට ජීවත් වන්න පුළුවන් කම ලැබේවි.

මෙපමණ කාලයක් තුළ ලැබුණු පෝර ටික අද නැහැ. වෙන මොකුත් ඇත්තෙත් නැහැ. නිකම් සමුපකාර සමිති වශයෙන් සකස් කළා පමණයි. පැක්ටරිත් නැහැ. මෙලෝ දෙයක් නැහැ. තමුන්නාන්සේලා අද ශත ගණනට තේ මිල බස්වා තිබෙනව. එපමණයි.

මට තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. එක්තරා කාලයක උඩරට සිංහල පෞද්ගලික වෙළඳුන් රාශියක් හිටිය. උඩරට සිංහල සටනක් ගෙන යන්න පුළුවන්, ඒ වාගේම ගම්බද දුප්පත් සිංහල ජනතාවට උදව් දෙන්න සිටියෙ, මේ වෙළඳුන් පිරිසයි. තමුන්නාන්සේ මේ වෙළඳුන් සමග ඇතිකර ගෙන තිබෙන වෛරය නිසා, වෙළෙන්දෙක් තමුන්නාන්සේ සමග සටන් කළාය කියා මුළු වෙළඳ සංහතියම වැනසීමේ අදහසින් ක්‍රියා කරනව නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. තමුන්නාන්සේ අද උඩරට වෙළඳුන් සියලු දෙනාම නැති කර දමන්න වැඩ කරනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙ කොපමණ කෑගැහුවත් කළු කඩකාරයින්ට ඉඩ දෙන්නෙ නැහැ. හොඳ වෙළඳුන්ට ඉඩ දෙනව. [බාධා කිරීමක්]

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මම මෙහාට ආවෙ පගා කාරයින්ට දඬුවම් කරන්න බැහැ කියා කිව්ව නිසයි. නැද්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සෙ පගා කාරයොත් එක්ක එක වේදිකාවෙ ඉන්නව. තමුන්නාන්සෙ මරික්කාර්, තල්ගොඩපිටිය, එක්ක එක වේදිකාවෙ ඉදගෙන ගැමුණු වෙන්න කථා කරනව. ඒක හොඳයි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මම මල් පුදන්න යන පන්සලට මරික්කාරුත් මල් පුදන්න යනවද? මරික්කාරුත් ඒ පන්සලට ගිය නිසා මම මල් පූජා කරන පන්සල අත්හරිනවද? මම ගියෙ ඉන්දියානු සටන ගෙන යන්නයි. මම මරික්කාර් නොවෙයි. අයි. ආර්. සී. කාරයො එක්ක වුවත් එක වේදිකාවෙ ඉඳ ගෙන ඒ සටන ගෙන යනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ජය වේවා.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

මරික්කාර් ගියෙ කොයි පන්සලටද? [බාධා කිරීමක්]

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සේලා මරික්කාර් මේ තරම් පිළිකුල් කරන්නෙ මොන යුතුකමක් අනුවද? මොකක්ද තමුන්නාන්සේලා මරික්කාර් අස් කරන්න, මරික්කාර්ට දඬුවම් දෙන්න, ගත් පියවර?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

ගරු සභාපතිතුමනි, අද උඩරට ගම්බද ප්‍රදේශවල සාමාන්‍ය කුඹුරු වැඩ කරන මිනිසුන් ඉන්නව. ඔවුන්ට වතුවල වැඩ ලැබෙන්නෙ නැහැ. උඩරට ඡන්ද බලය තිබෙන්නෙ මේ උදවියටයි. නමුත් ක්‍රමක්‍රමයෙන් මේ උදවියගේ ඉඩකඩම් වතුකරයෙන් ඉන්දියානුන්ගේ සංවිධාන අල්ලා ගන්නව. වතුකරයේ ඉන්දියානුවන් සෑම දෙනාම තමන්ගේ පඩිය කන්ගානිට දෙන සිරිතක් තිබෙනව. කන්ගානි තමයි වත්තෙ බැංකුව. ඉන්දියානු සංවිධාන ඒ විධියට මුදල් රැස් කරගෙන සිංහල ගැමියෙක් අමරුවෙ වැටුණු වහාම ඔහුගේ ඉඩම් කැබැල්ල බැඳගෙන මුදල් දෙනව. වැඩි කාලයක් යන්ට පෙර, අර මුදල් ගෙවා ගන්න බැරි වූ හැටියෙම ඉඩම් කැබැල්ල අත්පත් කරගන්නව. ඉස්සර නම් සිංහල ගැමියකු අමාරුවෙ වැටුණාම, තමාගෙ දුක කියා ණය මුදලක් ලබා ගන්න ඒ ප්‍රදේශවල සිංහල වෙළඳුන් සිටිය. අද ඒ සිංහල වෙළඳුන් සම්පූර්ණයෙන්ම වනසා දමා තිබෙනව. දෙමළුන්ගෙ සමුපකාර සමිති දැන් ඒ ප්‍රදේශවල පිහිටුවා තිබෙනව. මෙන්න ඇමතිතුමාගෙ වීර ක්‍රියා. සමුපකාර දියුණු කරනවාය කියා උඩරට සිංහල වෙළඳුන් පන්නා දමා දෙමළ වෙළඳුන්ට බලය අත් කර දී තිබෙනව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අලි බොරු ඔය කියන්නෙ. පව්ටපල් බොරු. හතරැස් බොරු.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අද ඒ සිංහල වෙළෙන්දාට යන්න තැනක් නැහැ. ඉස්සර සාමාන්‍ය සිංහල ගැමියෙකුට ණයක් ගන්න හිටිය සිංහල වෙළෙන්දා අද පොළොන්නරුව, මින්නේරිය, ආදී ප්‍රදේශ සොයා යනව. මේක සුළු දෙයක් නොවෙයි. ඔය යන්නෙ උඩරට ඡන්දදායකයන්. ඔවුන්ගේ ඉඩකඩම් අත්පත් කර ගන්නෙ ඉන්දියානුවන්. ඒ නිසා ටිකක් ප්‍රවේසමින් මේ ගැන කල්පනා කරන්නට ඕනෑ. මොකද, මේ විධියට ක්‍රම ක්‍රමයෙන් සිංහල කුඩා වතු හිමියන් පන්නා ගෙන යන විට භයානක තත්ත්වයක් ඇති වෙන්න පුළුවනි. මැතිවරණයක් ඇති වූ යම් අවස්ථාවක තමුන්නාන්සේලාට පෙනෙයි තමුන්නාන්සේලාගෙ ඡන්ද දායකයන් ඒ ප්‍රදේශවල නැති බව. මෙම ව්‍යාපාරය වහාම නවත්වන්ට ඕනෑ. ඉතා ඉක්මනින් මුදල් ලබාගෙන උඩරට පළාත්වල උදවියගේ කුඩා ඉඩම් කැබලි ආරක්ෂා වන ආකාරයට නීතියක් පනවන ලෙස මා ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනව. වැඩි කල් යන්ට පෙර නීතියක් මේ සභාවට ගෙනෙනවා යයි අපට දන්වා තිබෙනව. ඒක එන තුරු අපි බලා සිටිනව. මක්නිසාද? මේ ඉඩම් කැබලි විකිණීමෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට විශාල පහරක් වදින නිසයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒවාට අපි පිළියම් යොදා තිබෙනව.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සේ යෙදූ පිළියම් කෙසේ දැයි කිව්වොත් විදේශ විනිමය තිබෙන්නෙ දශලක්ෂ 290 යි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තමුන්නාන්සේ තමයි, ඉන්දියානු පුර වැසියන්ට මේ රටෙන් යන්ට ඉඩ නොදී හරස් කැපුවේ. තමුන්නාන්සේ තමයි, කැබිනට් එකේ ඉන්දැද්දී ඔවුන් යවන්ට ඉඩ නොදී හැමදාම විරුද්ධ වුණේ. අන්ති මේදි දිවංගත අගමැතිතුමා තමුන්නාන්සෙට බැන්න.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඉන්දියානු ඡන්දවලින් මෙහෙ ඇවිත් තමුන්නාන්සේ කියන ඒව පිළිගන්නෙ කවුද? රැස්වීම්වල ගිහින් කියන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අපි භය නැතිව ගිහින් කියනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තොන්ඩමන් තරහ වුණු දැට තමුන්නාන්සෙට මෙහි ආසනයක් නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තොන්ඩමන් උන්නැහේලා තරහ වෙලා, මාව තල්ලු කරන්ට බැහැ. හැබැයි කළුකඩ කාරයො නැත්නම් තමුන්නාන්සේ මෙලඟ කට අවීචි මහා නරකයේ.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
I rise to a point of Order. We also must have the opportunity of speaking.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඉන්දියානුවන් මේ රටින් පිට කිරීමට හරස් කැපුව එකම නැනැත්තා තමුන්නාන්සේයි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
ඉන්දියානුවන්ගෙ පිහිටෙන් ඇවිත් සිටින මන්ත්‍රීතුමෙක් කරන ඔය චෝදනා කවුරුවත් පිළිගන්නෙ නැහැ. රැස්වීම්වල ගිහින් කියන්න. [බාධා කිරීම්]

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තමුන්නාන්සේ [බාධා කිරීමක්] මූදට තල්ලු කරන්ටද හදන්නෙ කියා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
හෙළයි කැක්කුමක් ඇති තමන්නාන්සෙ මේක කරන්ට. මේ පිරිස ආරක්ෂා කරන්ට වහාම වැඩ පිළිවෙළක් යොදන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangatne)
ඒක නිසා තමයි, සියයට සියයක බද්දක් පනවා තවත් නීති පනවන්ට අදහස් කරන්නෙ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
ඇයි, මෙපමණ කලක් පැනෙව්වේ නැත්තෙ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
පනවල තමයි, තියෙන්නෙ; කනවෙල නම් කරන්ට දෙයක් නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
මා කියන්නෙ මේ රටේ ඉඩම් ටික විකිණීගෙන යන බවයි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
Now, please come back to the point. You have five minutes more.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
අනික් උදවිය කොයි තරම් කථා කළත් උන්නැහේ මොකවත් කියන්නෙ නැහැ. නමුත් මා කථා කරන විට අහගෙන ඉන්ට ටිකක් අමාරුයි. මම අහන ප්‍රශ්න මේවායි. මොකද මේ රට බංකොලොත් කළේ? මොකද, මේ රටේ බඩු හිඟ වුණේ? මොකද, ස.තො.සේ. කුණු ගඳ ගහන්නෙ? මොකද මේ රටේ බඩු නැත්තෙ? මෙන්න අපි අහන ප්‍රශ්න. ඉතින් මේවට උත්තර දෙන්නකො. මේ සම්බන්ධයෙන් කථා කරන්ට අවසථාවක් ලබා දීම ගැන තමන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. පී. වික්‍රමසිංහ මයා. (මාවතගම)
(திரு. டீ. பீ. விக்ரமசிங்ஹ—மாவத்தகம)
(Mr. D. P. Wickramasingha—Mawatagama)

සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ වචන සවලාපයක් කථා කිරීමටයි, මා බලාපොරොත්තු වෙන්නෙ. සමුපකාර ව්‍යාපාරය හා රජයෙන් පාලනය කරන ස. තො. සෙ. ව්‍යාපාරය පිළිබඳවත් අදහස් කීපයක් ප්‍රකාශ කරන්ට මා බලාපොරොත්තු වෙනව. පසුගිය කාලයේ පත්‍ර මාගීයෙන් ලැබුණු ආරංචි අනුව ලංකාවේ සමුපකාරිකයන් අතර විශාල කුතුහලයක් ඇති වී තිබෙනව, සමුපකාර ව්‍යාපාරයේ වැදගත් අංශ කීපයක් රජයට ගැනීමට බලාපොරොත්තු වෙනවාය යන කියමන උඩ. මගේ කථාවෙන් පසු ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලැබේ යයි බලාපොරොත්තු වෙනව. එම භය නැති කිරීම සඳහා මගේ කථාවෙන් කරුණු කීපයක් ඉදිරිපත් කරන්ට සිද්ධ වී තිබෙනව. ලංකාවේ මා හිතන්නෙ සමුපකාර සංගම් 122ක් පමණ තිබෙනවාය කියායි. මේ සමුපකාර සමිති සංගම් එකසිය විසිදෙකේ සභාපති මහතුන්ගේ රැස්වීමක් ළඟදී පවත්වා ඔවුන් ඒ පිළිබඳව සාකච්ඡා කළා. මා කලින් සඳහන් කළ ප්‍රකාශයෙන් පසු සමුපකාර සම්බන්ධයෙන් ඔවුන් දැක්වූ උනන්දුව අඩු වී තිබෙනව. එනම් සමුපකාර රජයට පවරාගෙන ස. තො. සෙ. මාගීයෙන් පාලනය කරාවි යයි සැකයක් තිබෙනව. මේ පිළිබඳව ස්පිර ප්‍රකාශයක් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

සමුපකාර සංගම් ව්‍යාපාරය මේ රටේ බිහි වුණේ මීට අවුරුදු 10කට 15 කට පමණ පෙරදීයි. මෙම ව්‍යාපාරය බොහොම සාර්ථක ලෙස අපේ රටේ දියුණු වී තිබෙනව. මෙම ව්‍යාපාරය මගින් ලංකාවෙ සිටින දහස් ගණන් පාරිභෝගිකයන්ට විශාල සේවයක් කර තිබෙනව. මෙම ව්‍යාපාරයත් සතොසේ ව්‍යාපාරයත් අතර සටනක් ඇති කරන්නය කියා මා මොහොතකටවත් කියන්නෙ නැහැ. එම ව්‍යාපාර දෙක එකාබද්ධ කොට උනන්දුවෙන් ක්‍රියා කර ගෙන ගියොත් පමණයි, ලංකාවෙ පාරිභෝගිකයන්ට පහසු මිලට බඩු ලබා ගැනීමේ පුළුවන්කම ලැබෙන්නෙ. අවුරුදු ගණනාවක් තිස්සෙ සමුපකාර සංගම් ව්‍යාපාරිකයන් ගෙන ගිය කටයුතු දැන් මදක් දුරට උදාසීන වී තිබෙනව. එසේ වන්න හේතුව සමුපකාර සමිති සංගම් සියල්ල රජයට ගන්නවාය කියන ප්‍රකාශය පැතිර යාමයි. සතොසෙ ව්‍යාපාරය මගින් ලංකාවෙ සෑම ප්‍රදේශයකටම බඩු බෙදා හැරීමෙ ක්‍රමයක් සකස් කරන්න පුළුවන් කම තිබෙනව නම් ඊට අපි කැමතියි. නමුත් එවැනි ක්‍රමයක් සකස් කරන්න බැරි බව අපට පේනව. දැනට තිබෙන සමුපකාර සමිති සංගම් 122 ට සම්බන්ධ විවිධ සේවා සමුපකාර සමිති වැනි කුඩා සමිතිත් දහස් ගණනක් තිබෙනව. මෙම සංගම් බලය වැඩියෙන් තියෙන ප්‍රදේශවල විවිධ සේවා සමුපකාර සමිති විශාල වශයෙන් තියෙනව. සතොසෙ ආයතන යෙනුත්, ආහාර අමාත්‍යාංශය මාර්ග යෙනුත්, වෙනත් ක්‍රමවලිනුත් බඩු ලබා ගෙන බලය ලත් වෙළෙන්දන්ටත්, වෙනත් වෙළෙන්දන්ටත්, විශෙෂයෙන්ම විවිධ සේවා සමුපකාර කඩ සමිතිවලටත් ඒවා බෙදා හැරීමයි. එම සමුපකාර සංගම් මගින් කෙරෙන්නෙ.

අ. භා. 7.30

එම සංගම්වල ක්‍රමානුකූල පාලනයක් තිබෙනව. සමුපකාර දෙපාර්තමේන්තුව යටතෙ ඒවා පාලනය කෙරෙනව. එම නිසා ඒවායෙහි අත්තනෝමතික ක්‍රියාවන් කෙරෙනවාය කියා මොහොතකටවත් කල්පනා කරන්න බැහැ. සමුපකාර කොමසාරිස්තුමාගෙ ව්‍යවස්ථාවන් උඩ ඒ ඒ ප්‍රදේශවල සිටින සහකාර සමුපකාර කොමසාරිස්තුමන්ලගෙ පාලනය යටතෙ මෙම සංගම්වල කටයුතු කෙරෙනව. ඒව ගැන සොයා බලන්න පරීක්ෂකවරුන් සිටිනව. මගේ පළාතෙ තියෙන සමුපකාර සංගමය ගැන කල්පනා කර බැලුවාම මට මේ ගැන ලොකු හැඟීමක් ඇති වෙනව. එහි කාරක මණ්ඩලයක් සිටිනව. වේතනයක් ලබන පාලක ලේකම්වරයකු සිටිනව. නොයෙකුත් අංශ භාරව ක්‍රියා කරන තවත් නිලධාරීන් සිටිනව. එම ප්‍රදේශයේ සිටින සහකාර කොමසාරිස්තුමාටත්, සමුපකාර පරීක්ෂකවරුන්ටත්, කාරක මණ්ඩලයටත් අවස්ථාව තියෙනව, එම සංගමයෙ ඇති අඩුපාඩුකම් සොයා බලා සුදුසු පිළියම් යොදන්න. මේ අනුව බලන විට බොහොම පැහැදිලි පාලනයක් මෙම සමුපකාර සංගම්වල පවතින බව අපට පෙනී යනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමහරවිට, ගරු ඇමතිතුමා නැති නම් දෙපාර්තමේන්තුව කල්පනා කරනව ඇති, වංචා සහගත වැඩ කරන සමුපකාර සංගම් තිබෙනවාය කියා. කුරුණෑගල වැඩවිල්ලි සංගමයෙ සභාපති හැටියට මා දන්නව එම සංගමයෙ කටයුතුවලදී අපට බොහෝ කරදරවලට මුහුණ පාන්න සිදු වූ බව. ගරු ආහාර ඇමතිතුමා දැන් මෙහි සිටින නිසා ඒ ගැන යමක් කියන්න මා කැමතියි. රජයේ ආහාර ගබඩාවලින් බඩු ලබා ගැනීමෙදි, අපට බොහෝ අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වී තිබෙනව. මීට සති තුනකට පමණ ප්‍රථම රජයේ ගබඩාවෙන් හා මුට්ට 229ක් නැති වීම පිළිබඳ ප්‍රවෘත්තියක් පත්‍ර මාර්ගයෙන් දකින්න ලැබුණ. එය සත්‍ය සිද්ධියක්. ඇත්ත වශයෙන්ම අපේ ගබඩාවල ඒ විධියේ බඩු නැතිවීමක් වුණා නම් දවසක් දෙකක් ඇතුළත අපට ඒවා සොයා ගන්න පුළුවන් වෙනව. නමුත් රජයේ ගබඩාවල බඩු ගණන් ගැනීම නොහොත් මාසයක් පාසා "ස්ටොක්" ගැනීම ක්‍රමානුකූල නොවන නිසා මේ හොරකම ගැන සුමාන ගණනක් යන තුරු සොයා ගැනීමට බැරි වුණා. එය සොයා ගත්තෙත් අපේ සංගමයේ නිලධාරි මහත්මයෙක් ප්‍රදේශයේ දිසාපතිතුමාට කළ ප්‍රකාශයක් අනුවයි. මෙවැනි සිද්ධීන් ගැන බලන විට සමුපකාර සමිති සංගම් රජයට භාර ගෙන ඒවායේ තත්ත්වයත් අඩපණ කළොත් මා හිතනවා ඒකෙන් දුක් විඳින්නට සිදු වන්නේ සාමාන්‍ය මහජන තාවටය කියා.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
නරක ඒවත් තිබෙනව.

ඩී. පී. වික්‍රමසිංහ මයා.
(திரு. டீ. பீ. விக்ரமசிங்ஹ)
(Mr. D. P. Wickramasingha)
නරක ඒව තිබෙනව නම් අන්න ඒව ගන්න. ඒවා අරගෙන කොමසාරිස්තුමාගේ පාලනය යටතට පත් කරන්න.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක (කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க—விவசாய, உணவு, கடற்றொழில் அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. F. R. Dias Bandaranaike—Minister of Agriculture, Food and Fisheries and Parliamentary Secretary to the Minister of Defence and External Affairs)
දැන් කරන්නෙ එහෙම තමයි.

ඩී. පී. වික්‍රමසිංහ මයා.
(திரு. டீ. பீ. விக்ரமசிங்ஹ)
(Mr. D. P. Wickramasingha)
වංචා සහගත චේතනාවෙන් කටයුතු කරගෙන යන පුද්ගලයන් යම් සමිතියක ඉන්නවා නම්, ඒ වාගේම ඒ සමිතිය නරක ලෙස කටයුතු කරගෙන යනවා නම්, කරුණා කර ඒවා රජයේ පාලනයට ගන්න. නමුත් හොඳින් වැඩ කරගෙන යන සංගම්වලට ධෛර්‍යය දී බඩු බෙදා හැරීමට ඉඩ දෙන්න ඕනෑ කියා මම ඉල්ලනව. මේ සම්බන්ධයෙන් තවත් මන්ත්‍රීවරු විවිධ අදහස් දක්වන්න පුළුවනි. මා ඉදිරිපත් කෙළේ මගේ පෞද්ගලික අදහසයි.

ඒ වාගේම හොඳින් කටයුතු කරගෙන යන සමුපකාර සමිතිවල දැන් තිබෙන සැකය නැති වන පරිදි ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් ප්‍රකාශයක් කෙරෙනවා ඇති කියා අපි බලාපොරොත්තු වෙනව.

මෙන්න මේ ප්‍රශ්න තුනට ඇමතිතුමා පිළිතුරු දෙන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලනව. පළමුවෙනි කාරණය නම් මා මොහොතකට කලින් සඳහන් කළ කාරණයයි. දැනට තිබෙන සමුපකාර සංගම් සියල්ලම රජයට ගන්නවාද කියන ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න ඕනෑ. දෙවැන්න සමුපකාර සංගම් මගින් ගෙන යන තොග වෙළඳ කටයුතු සතොසෙන් පවත්වාගෙන යන්නට බලාපොරොත්තු වෙනවද නැද්ද කියන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ඕනෑ. එසේ කිරීමට බලාපොරොත්තු වෙනවා නම් ඒ සංගම්වල කටයුතු කරන සමුපකාරිකයන්ගෙ අනාගත තත්ත්වය මොකක්ද? මහජනයා විසින් කොටස් මුදල් යෙදවීමෙනුයි ඒ සංගම් ඇති කර තිබෙන්නෙ? රජයෙන් මුදල් ණයට අරගෙන තිබෙන බවත් අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. වික්‍රමසිංහ මයා.]

දන්නව. දැනට ඒ ණය ගෙවාගෙන යනව. නමුත් එතකොට සමුපකාරිකයන් හැටියට ඒ අයගෙ අනාගත තත්ත්වය මොකක්ද? ඔන්න ඔය කරුණු තුනට දැන් මේ ගරු සභාවෙදි හෝ වෙනත් ක්‍රමයකින් හෝ පිළිතුරු ලැබෙන්නට සලස්වන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව.

සතොසෙට වඩා සාධාරණ ලෙස මේ සංගම් මගින් බඩු බෙදා දෙනවාය කියා මට නිදර්ශනයකින් පෙන්වන්න පුළුවන්. සිංහල අවුරුදු සමයේදී ලංකාවේ විශාල රෙදි හිඟයක් තිබුණ බව අපි දන්නව. සතොසෙ මගින් රෙදි ගෙන්වා බෙදා හැරීමට පටන් ගත්ත. ඒ අවස්ථාවෙදි ලංකාවෙ සංගම් රාශියක්, කොළඹ, වැලිසර, ජාවත්ත, ආදි සංගම් රාශියක්, සිංහල අවුරුද්ද හෙට කියා තිබෙන අවස්ථාවෙදි, රාත්‍රි සිටම රෙදි බෙදා දී මහජනතාවගේ අවශ්‍යකම් පිරිමසා දුන්න. සතොසේ මගින් කරන්න ගියා නම් මේ කටයුත්ත කවදාවත් කරන්න බැහැ. ඒ නිසා අවංක සමුපකාරිකයින් ඉන්න සමිති සමාගම් මගින් දැනට කෙරෙන සේවය ඉතාමත් විශාල බව පැහැදිලි වෙනව. ඒ තරම් විශාල සේවයක් සිදු වන සේවාවකට කිසි පහරක් නොවදින පිළිවෙලට ක්‍රියා කරන්නට බලාපොරොත්තු වන බවට ප්‍රකාශනයක් මේ විවාදය පවතින අවස්ථාවේදී හෝ මේ විවාදය අවසානයේදී හෝ ගරු ඇමතිතුමාගෙන් ලැබුණොත් ඒ අයට මහත් ධෛර්‍යයක් ඇති වන බව සඳහන් කරන අතර, ඒ ගැන ගරු ඇමතිතුමාගෙන් සතුටුදායක පිළිතුරක් ලැබේය යන බලාපොරොත්තුවෙන් මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනව.

මගේ කථාව අවසන් කරන්න පෙර ගරු ඇමතිතුමාට එක් කාරණයක් සම්බන්ධ යෙන් ප්‍රසංශා කරන්න තියෙනව. ළඟදී හැම දිස්ත්‍රික්කයකම ඉන්න දිසාපති වරුන්ට නියෝජ්‍ය සමපකාර කොමසාරිස් වරුන්ගෙ බලතල දී තිබෙනව. ඒ ගැන අපි එතුමට ස්තුතිවන්ත වෙනව. එයින් අපට විශාල ප්‍රයෝජනයක් තිබෙනව. කොළඹට පැමිණ සමපකාර කොමසාරිස්වරයා හෝ සමපකාර නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ හම වෙන්න දැන් අපට වුවමනාවක් නැහැ. පළාත්වල ඉන්න සහකාර කොමසාරිස්වරුන්ගේ මාර්ගයෙන් කර ගන්න බැරි වැදගත් දේවල් අපට තියෙනව. සහකාර කොමසාරිස්වරුන්ගෙන් කර ගන්න බැරි වැදගත් තීරණයන් හදිසියෙම, ස්වල්ප වේලාවක් ඇතුළතම කර ගැනීමට දැන් අපට ඉඩ ලැබී තිබෙනව, මේ අලුත් ක්‍රමය නිසා. අන්න ඒ වැදගත් කාරණය ගැන, මා නියෝජනය කරන ප්‍රදේශයේ සමුපකාර සමිති සමාගම් වෙනුවෙනුත්, මගේ ප්‍රදේශවාසීන් වෙනුවෙනුත් ගරු ඇමතිතුමාට අපේ අවංක ස්තුතිය ඉතා ආදරයෙන් පිරිනමමින් මගේ කථාව අවසන් කරනව.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මා කැමතියි. අනෙක් දෙපාර්තමේන්තු ගැන යම් දෙයක් කියන්න ප්‍රථමයෙන් සමුපකාර දෙපාර්තමේන්තුව ගැන සාමාන්‍ය යෙන් යමක් ප්‍රකාශ කරන්න මා කැමතියි.

සමුපකාර තොග වෙළඳ ආයතනය හෙවත් ස. තො. සේ. ගැනත් එහි වැඩ කරන කොටස් ගැනත් වචන ස්වල්පයක් ප්‍රථමයෙන්ම කියන්න මා කැමතියි. සමුපකාර තොග වෙළඳ ආයතනයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දෙන බවට ස. තො. සේ. සභාපති මහත්මයා විසින් දෙන ලද පොරොන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා මෙතෙක් දුරට මෙම ආයතනය විසින් අනුගමනය කොට ඇති ක්‍රියා කලාපය කුමක්ද? මගේ මතකයේ හැටියට ගරු ඇමතිතුමත් ඉන්න දවසක සභාපතිතුමා ස. තො. සේ. සේවකයන්ට මේ සම්බන්ධයෙන් පොරොන්දුවක් දුන්නා. මට මතක හැටියට නම්, මා ඒ රැස්වීමට ගිය අවස්ථාවේ නමයි සභාපතිතුමා සහ දැනට ඒ කටයුතු භාරව වැඩ කරන ගරු ඇමතිතුමත් ඔය විධියෙ පොරොන්දුවක් දුන්නෙ. එය අද වන තුරු ක්‍රියාත්මක වී නැති නිසා දැන් අහන්න කැමතියි කවදද එය ක්‍රියාවෙ යොදන්නෙ කියා.

දෙවැනි පොරොන්දුව මෙයයි: "තෙමාසික විශේෂ දුම්රිය බලපත්‍ර ලබා දෙන බවට සභාපති මහත්මයා විසින් මේ සේවකයන්ට ප්‍රතිඥාවක් දෙන ලදි." මේ වන තෙක් එය ක්‍රියාත්මක වී නැත්තෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුමන හේතුවක් නිසාද කියා මම ගරු ඇමතිතුමාගෙන් අසන්න කැමතියි.

මෙම ආයතනයේ සේවකයන් ණය බරින් මුදවා ගැනීම සඳහා මාස හයක වැටුප් ප්‍රමාණයට සමාන මුදලක් ගෙවීමේ ක්‍රමයක් පිළියෙල කර තිබුණු නමුත් එය ක්‍රියාත්මක කළ අන්දමට එම මුදල් ලබා ගත හැකි වී තිබෙන්නේ සීමා සහිත පිරිසකට පමණක් බැවින්, සෑම සේවකයෙකුටම එම වරප්‍රසාදය නොලැබීමට හේතුවක් ඇත්නම් එය කුමක්දැයි කියා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි.

1958 දී, මා ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේදී, ලැබුණු ලාභයෙන්, ඒ කියන්නෙ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් ලැබුණු ලාභයෙන්, සියේට විසිපහක් පාරිතෝෂික මුදලක් හැටියට සේවකයන්ට ලබා දෙන්න පොරොන්දු වුණා. අවුරුද්දක් දෙකක් බෙදා දුන්නා. විශාල වශයෙන් ලාභ තිබෙනවය කියල පත්‍රවල එහෙම කාරිය ප්‍රසිද්ධ කිරීම පමණයි කරන්නෙ. එහෙත් සේවකයන්ට මුදලක් එයින් නොදෙන්නෙ මන්දැයි අහන්න කැමතියි. එම පිළිවෙළ අනුව පාරිතෝෂික මුදල් ගෙවා නැතිවා පමණක් නොව, ලැබුණු ලාභය කොපමණද යන්න පවා සේවකයන්ට දැනුම් දී නැති බැවින්, කරුණා කර සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් ලැබුණු ලාභය මහජනයාට දැන ගැනීම පිණිසත් සේවකයන්ගෙ දැන ගැනීම පිණිසත් ප්‍රසිද්ධ කරන්නෙයි කියා මා ඉල්ලනවා. ඒ පාරිතෝෂික මුදල් යම් කොටසකට ගෙවනවා නම් එසේ ගෙවන්නේ මොන ප්‍රතිපත්තියක් උඩද කියා මා අහනවා. ඇමතිතුමාත්, සමුපකාර තොග වෙළඳ ආයතනයේ සභාපතිතුමාත් ගණන් නැතිව පොරොන්දු නම් වෙනවා. නොයෙකුත් රැස්වීම්වලදී නොයෙකුත් විධියේ දේවල් පොරොන්දු වෙනවා. නමුත් පොරොන්දු වන ඒ එකක්වත් අද වන තුරු නියම පිළිවෙළට ක්‍රියාත්මක කර තිබෙනවාද කියන එක සැක සහිතයි.

මුලින්ම සමුපකාර තොග වෙළඳ ආයතනය ගැන කථා කරන්න අදහස් කෙළේ, මාත් ඒ ගැන යමක් දන්න නිසයි. 1956 සිට 1959 දක්වා සමුපකාර තොග වෙළඳ ආයතනය ගැන මාත් මේ ගරු සභාවට වග කිව්වා. සමුපකාර තොග වෙළඳ ආයතනය භාර ගන්න විට එය තිබුණේ ඉතාමත් නරක තත්ත්වයකයි. නමුත් එය ශුද්ධ කර නියම තත්ත්වයට ගෙන අවුත් ලාභ පෙන්වන්නට මට පුළුවන් වුණා. ඒ කල යේ මේ ආයතනයේ සභාපතිවරයා වශයෙන් පත් කර සිටි වින්සන්ට් සුබසිංහ මහත්මයා ම සමඟ අමනාප වී ගිය බව සමහර ඇමතිවරුන් සහ මන්ත්‍රිවරුන් කියනත්, එහි කිසිම සත්‍යතාවයක් නැති බව මතක් කරන්න කැමතියි. ඒ මහත්මයා සමුපකාර තොග වෙළඳ ආයතනයේ සභාපතිවරයා වශයෙන් සිටියදී මා සමඟ කිසිම ඝට්ටනයක් ඇති වුණේ නැහැ. යම් ඇමතිවරයකු හෝ මන්ත්‍රිවරයකු හෝ ඒ මහත්මයත් මාත් අතර ඝට්ටනයක් තිබුණාය කියනවා නම් ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බව නැවතත් මතක් කරන්නට කැමතියි. ඒ මහත්මය සමුපකාර තොග වෙළඳ ආයතනයේ වැඩ කෙළේ බොහෙම සන්තෝෂයෙනුයි. එසේ සතුටින් නියම විධියට වැඩ කළ අතර එතෙක් කල් බෙහොම නරක තත්ත්වයක තිබුණු ඒ ආයතනය නියම තත්ත්වයට ගෙනැවිත් එය ලාභ ලබන ආයතනයක් බවට පත් කළ බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

අ. භා. 7.45

ගරු සභාපතිතුමනි, මේ සභාගය ආණ්ඩුව පිහිටුවූ දිනවල සියලුම සමුපකාර සමිති ගැනීමක් ගැන ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. නමුත් සති කීපයක් ගියට පස්සේ ඒ කීම ටිකක් වෙනස් කළා. සමහර සමිති පමණක් ගන්න බවයි, දැන් කියන්නේ. ඒ නිසා මාවතගම ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කළාක් මෙන්, මේ ඇමතිතුමාගේත් ආණ්ඩුවේත් ප්‍රතිපත්තිය කුමක්ද කිය මා ප්‍රශ්න කරනවා. කරුණා කර ඒ ගැන පැහැදිලි කරන්න. මෙකක්ද ප්‍රතිපත්තිය? පාරිභෝගිකයන්ට නියම විධියට භාණ්ඩ බෙදා දෙන්නේ නැතිව රට අඳුරේ තබමින් සමුපකාර ව්‍යාපාරය නැති කිරීමටද මේ ඇමතිතුමා ක්‍රියා කරන්නේ? මේ ඇමතිතුමා මීට කලිනුත් මේ අංශය භාරව සිටියදී ක්‍රියා කෙළේ ඒ විධියටයි. මට ඒ බව කරුණු ඇතිව ඔප්පු කරන්න පුළුවනි. සමුපකාර තොග වෙළඳ ආයතනය නියම පිළිවෙළට සකස් වී තිබුණු අකාරයටම ඉදිරියට ගෙන යන්නේ නැතිව දුෂණ වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

වලට ඉඩ දෙමින් දැන් එය පවත්වාගෙන එනවා නේද? මෙසේ කියන විට ඇමතිතුමා හිනාවෙලා පමණක් හරි යන්නේ නැහැ. යමක් කිවට පමණක් මදි. කියන විධියටම කරන්නටත් ඕනෑ. මා එක් දවසක් සමුපකාර තොග වෙළඳ අයතන යේ එක්තරා පුද්ගලයකු ගැන ප්‍රශ්න කළ අවස්ථාවේදී ඒ පුද්ගලයාට විරුද්ධව චෝදනා 8 ක් තිබුණු බවත් ඔහු එයින් 7 කින්ම වැරදිකාරයා වී සිටින බවත් ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. නමුත් අද ඒ වැරදිකාරය ඉහළ තත්ත්වයකට පත් කර සිටිනව නේද? රෙදිපිළි හොරකමකට අසු වූ කෙනෙකු එක අංශයක මැනේජර් තැන හැටියට පත් කර තිබෙනවා නේද? ඔළුව වැනුවාට හරි යන්නේ නැහැ. **හැන්සාඩ්** එක අරගෙන බලන්න.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කවුද පුද්ගලයා? මම එහෙම කරලා නැහැ.

ඩී. පී. ආර් ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

එක පුද්ගලයකුට විරුද්ධව චෝදනා 8ක් තිබුණු බවත්, එයින් චෝදනා 7 කින්ම ඒ පුද්ගලයා වැරදිකාරයා වූ බවත් ඇමතිතුමා කිව්වෙ නැද්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කිව්ව එක ඇත්ත. නමුත් ඉහළ තනතුරු දුන්නෙ නැහැ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

අද ඒ වැරදිකාරයාට ඉහළ තනතුරක් දී තිබෙනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කරුණා කරල නම කිව්වොත් හොඳයි.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

මම නම කියන්නම්. නමුත් මතක නැත්නම් ගිහින් බලන්නය කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලනව. ගුණරත්න කියා කෙනෙක් නැද්ද කියා මම අහන්නට කැමතියි. සමුපකාර තොග වෙළඳ ආයතන යේ තියෙන දූෂණ ගැන—මේ ඇමතිතුමා ගේම විශේෂ ක්‍රියා නිසා ඇති වී තිබෙන දූෂණ ගැන—මට කරුණු ඇතිව කියන්න පුළුවන්. යම් යම් අය වැඩ කරන අධ්‍යක්ෂ වරුන් හැටියට පත් කරල, ඒ මඟින් සිදු වී තිබෙන දූෂණ ගැන මට කියන්න පුළුවන්. අපි මේවා කියන්නෙ නිකම් ව්‍යායාමයට නොවෙයි. කරුණු ඇතිවයි. කියන්නෙ. ඊයෙ පෙරෙයිදා සමුපකාර තොග වෙළඳ ආයතනයේ උසස් පත්වීම් දුන්න අය ගැන සොයා බැලුවොත් මේව හොඳට පැහැදිලි වෙයි. මොන ප්‍රතිපත්තියක් අනුවද, මොන උගත්කමක් අනුවද, මොන පුහුණුවක් අනුවද ඒ අය උසස් කළේ? මා ළඟ ලැයිස්තුව තියෙනව. මම ඒක කියවන්නෙ නැහැ.

ඊළඟට රක්ෂණ සංස්ථාව ගැන මම වචනයක් කියන්න කැමතියි. මැද කොළඹ ගරු දෙවැනි මන්ත්‍රීතුමා කී දේ මම අනුමත කරනව. රක්ෂණ සංස්ථාව ඉතාම අමාරු තත්ත්වයකයි අද තියෙන්නෙ. පාලනය ගැන කිසිම දෙයක් දන්නෙ නැති අය වෙන අයගෙ උපදෙස් පිට එය පාලනය කරල, අද ඉතාම අමාරු තත්ත්වයක තියෙන බව මට කියන්න පුළුවන්. එපමණක් නොවෙයි, පාලනයේ දූෂණ ගැන කල්පනා කර බැලුවම, රුපියල් 500, 600 පඩි ලැබූ අය එක වරටම රුපියල් 1,000ක් පඩි ලැබෙන නිලවලට පත් කිරීම ගැන කල්පනා කර බලන විට එතන සිටි සාමාන්‍යාධිකාරීතුමා එතැනින් ඉවත් වී යාම ගැන මම පුදුම වන්නෙ නැහැ. එතැන ඉන්න බැරි තත්ත්වයක් ආ නිසා වන්න ඇති, සාමාන්‍යාධිකාරීතුමා එතැනින් අස් වෙලා ගියේ.

වැඩ කරන අධ්‍යක්ෂවරුන්ය කියා සමහර කොටසක් හදාගෙන තියෙන පිළිවෙල ගැනත්, නුවර සිට කොළඹ මධ්‍ය ස්ථානයට ආ විට ඔවුන් ලබාගෙන තිබෙන ගණන් ගැනත් කල්පනා කරන විට, ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංස්ථාව දූෂණයෙන් තොරව වැඩ කටයුතු කෙරෙන පිළිවෙළට සකස් වී තිබෙනවය කියා අපට කිසිසේත් කියන්නට පුළුවන්කමක් නැහැ. පසුගිය ජූලි මස 29 වැනිදා ප්‍රශ්නයක් ඇසූ විට මේ ඇමතිතුමා දුන්න පිළිතුර මට මතකයි. වැඩ කරන අධ්‍යක්ෂතුමා යම් යම් තනතුරු වලට යම් යම් නිලධාරීන් පත් කළේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලයක්, අවසරයක්, ඇතිවද කියා ඇසූ ප්‍රශ්නයට ඇමතිතුමා දුන්න පිළිතුර මතකද කියා මම දන්නෙ නැහැ. ඒ පිළිතුර සත්‍යයක් හැටියට පිළිගැනීම අමාරු බව ඇමතිතුමාට මෙතනදි මතක් කරන්න පුළුවන්. ලිපිකරු කොටස් වලට යම් යම් තනතුරු දීමටත්, ඒ තනතුරුවලින් උසස් තැන් දීමටත් පමණයි, මේ අධ්‍යක්ෂවරයට බලය දී තිබුණෙ. නමුත් ලිපිකරු අංශයේ අයට නොවෙයි තනතුරු දුන්නෙත්, ඒ අය නොවෙයි ඉහළ තත්ත්වයට දැම්මේත්, මාසයකට රුපියල් දහස් ගණනක් ලැබෙන විධියට පත් කර තිබුණෙත්, කියා කියන්නට පුළුවනි. එම නිසා මේ ඇමතිතුමා යටතේ තිබෙන කොයි සංස්ථාව වේවා, කොයි ආයතනය වේවා, දූෂණවලින් තොරව පාලනය කර තිබෙනවාය කියා කියන්නට පුළුවන්ද? මට තවමත් මතකයි. ආණ්ඩුව කර වල වෙළඳාමට බහින අවස්ථාවේදී රාජපක්ෂ කියන මහත්මයකු සිටි බව. මේ තැනැත්තා ඇවිත්, කරවල ගඳ ගහන එක නවත්වා හොඳට සුද්ධ කරනවාය කියා කී නමුත්, වැඩි දවසක් යන්නට ඉස්සර ඒ තැනැත්තාට මොනවා වුණාද කියා කියන්නට දන්නෙ නැහැ. එම තත්ත්වයටයි අනික් ඒවා ගැන බැලුවත් පෙනී යන්නෙ. මේ ඇමතිවරයා යටතේ පාලනය වන කොයි ආයතනය දිහා බැලුවත්—මුදල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී හෝ වේවා වෙළඳ ඇමතිවරයා වශයෙන් සිටින කාලයේදී හෝ වේවා වෙනසක් නැහැ—ඇමතිවරයාගේ පාලනයෙහි ඇති දුර්වල කම නිසා, කෙරෙන දූෂණ වැඩ නිසා, රටට සිදු වී ඇති හානිය ඉතාමත්ම බරපතළ බව කියන්නට පුළුවනි.

රක්ෂණ සංස්ථාව අරගෙන බලමු. මෙම රක්ෂණ සංස්ථාවේ වැඩ කටයුතු ගැන ප්‍රශ්න කළාම ඇමතිවරයා කීවෙ මොකක්ද? 1964.7.29 වන දින දරණ හැන්සාඩ් වාර්තාවේ 1555 පිටුවේ පළ වී තිබෙන ඇමතිතුමාගේ පිළිතුර මොකක්ද? එම පිළිතුරෙහි සඳහන් වන කාරණා, මා කලිනුත් සඳහන් කළ කාරණා වාගේම සත්‍යයෙන් තොර බවයි මට කියන්නට සිදු වී තිබෙන්නෙ. මෙන්න ඇමතිතුමා දුන් පිළිතුර:

"As an ordinary director he drew a travelling allowance from his home to his working place. After he was elected a Working Director, he has not been paid any travelling allowance, and the allowance drawn by him from May to November has been refunded. In fact he has refunded a little more than what he ought to have refunded. Those are the facts with regard to the travelling allowance and there is no question whatsoever of corruption or malpractice."

But what are the facts? They are very different.

The answer given by the Hon. Minister is not correct. The powers delegated, if at all, were only regarding clerical services. The Working Director realizing that staff appointments required board approval minuted that he had got the approval of two directors, Dr. Kelegama and Mr. U. K. Edmund. Thereafter, he ordered payments at end of 1963. When the lists of appointments were put up to the board early in 1964, for covering approval, the two directors denied having given verbal approval.

The fact is that, at the time this statement was made in the House, the board had not confirmed the minutes. They were confirmed at a meeting held on the 31st July 1964, a few hours after Mr. Wijeratne was removed, or asked to go. In fact the chairman had dissented and he also had conveyed to the board that Dr. Kelegama who was absent also dissented and that Treasury approval was not sought in time for the appointments. The fact is that, Treasury approval was sought in about April 1964 and not earlier. The correct procedure is to obtain Treasury approval before appointments to posts carrying a salary of Rs. 1,000 per

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

month and over are made. Further, these appointments have been queried by the Treasury and the question is yet answered.

The Hon. Minister stated on the 7th July that there was no question whatsoever of corruption or mal-practice. Mr. P. C. Tittawela was appointed as Working Director for a period of three months only, ending February 1962. Later he drew with retrospective effect pay for exclusive full time work and, as admitted by the Hon. Minister, he refunded travelling and subsistence for attending board meetings from Kandy. The Auditor-General pointed out that the payment of subsistence indicated that the Working Director could have been a full time working director in Colombo and thus not entitled to the full allowance he had drawn as Working Director. This query has not been replied for 20-odd months despite several reminders. I wonder whether there is any other word than "corruption" for practices of this type!

It is incorrect to say that the board differed on appointments of agency houses as agents of the corporation. The board agreed that it differed only in regard to the rates of commission.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1946 සැප්තැම්බර් 3 වන බ්‍රහස්පතින්දා.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

There is a regulation which I promised the House some time ago I would table as early as possible for the purpose of giving compensation to police officers killed—

කේ. එම්. පී. රජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මෙය ඉදිරිපත් කරන්නට පෙර මට කාරණයක් කියන්න තිබෙනවා. මෙවැනි දේ සලකා බැලීම පිළිබඳව පක්ෂ නායකයින් තීරණයක් ගත්තා. ඒ තීරණය උල්ලංඝනය කර තිබෙන බව අපට පෙනෙනවා. ඒ නිසා මෙය අද නොගන්නා හැටියට මම ඉල්ලා සිටිනවා. හෙට නැති නම් අනිද්ද ගන්න පුළුවනි. [බාධා කිරීමක්] අපි එදා ගත් තීරණය අනුව ඉදිරියටත් වැඩ කරන්න කැමතියි. නමුත් ඒ පැත්තෙන් ඒ තීරණය කඩනවා නම් ඒකට ඉඩ දෙන්න අපට බැහැ.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

Then I will take it up later.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග ස විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)
(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාගිමුඛ කරන ලදි.

ලීලානන්ද වීරසිංහ මයා. (කටුගම්පොළ)
(திரு. லீலானந்த வீரசிங்ஹ—கட்டுகம்பொல)
(Mr. Leelananda Weerasinghe—Katugampola)

ගරු කථානායකතුමනි, පසු ගිය මාසේ 10 වන සිකුරා මේ ගරු සභාවේදී මා නැති අවස්ථාවක නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(කේ. හේරත් මයා.) මට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාට කරුණු ඉදිරිපත් කළ බව ඔබතුමාට මතක ඇති. ඒ අවස්ථාවේදී ඔබතුමා කියා සිටියා, ගරු ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිතුමා ඒ පිළිබඳව වර්තාවක් ලබා ගැනීමට කටයුතු කර තිබෙනවාය කියා. මගේ විශ්වසයේ හැටියට ඒ වාර්තාව දැන් ලැබී තිබෙනවා. ඒ නිසා එය ඉදිරිපත් කරන ලෙස මම ඒ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අතර පොලිසිය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කරුණු පිළිබඳව රාජ්‍යරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශයක් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

ගරු කථානායකතුමනි, කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මම ඉතා සතුටින් බාර ගැනීමට කැමතියි. ඒ චෝදනා ඉදිරිපත් කරමින් මාත් ඉල්ලා සිටියේ විභාගයක් කර බලන ලෙසයි. ඒ අමාත්‍යාංශය භාර මාසයක් ගත වන තුරුම මෙවැනි චෝදනාවක් විභාග නොකිරීම ගැන මම කනගාටු වෙනවා. ඊයෙත් මම ඒ ගැන තමුන්නාන්සේට මතක් කළා. මෙම ගරු සභාවේ මන්ත්‍රීවරයෙකුට විරුද්ධව ඇති මෙවැනි චෝදනාවක් සම්බන්ධයෙන් භාර මාසයක් ගත වීවත් පරීක්ෂා කර බලා ප්‍රකාශයක් කරනවා නම් මාත් බොහොම සන්තෝෂයි. එවිට මෙහි ඇත්ත නැත්ත කුමක්ද කියා තෝරා ගැනීමට—කවුද ඇත්ත කියන්නේ, කවුද බොරු කියන්නේ කියා දැනගැනීමට—පුළුවන් වන නිසා ඒ ගැන මම සතුටු වෙනවා.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
මොකක්ද, චෝදනාව?

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)
තමන්නාන්සෙ දන්නෙ නැති එක ගැන කට විහගෙන ඉන්න.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
දන්නෙ නැති නිසා තමයි, අහන්නෙ.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)
දැනගන්න මෙතන ඉන්න ඕන. කථානායකතුමනි, මා නැගී සිටියේ තවත් භයානක සිද්ධියක් ගැන කීමටයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටගමු නමැති පාසලේ දැන් සුමාන තුනකට පමණ පෙර හදිසියෙන්——

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නය පිළිබඳව කල් දී තිබෙනවාද?

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)
නැහැ කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
කල් දුන්නා නම් බොහොම ලෙහෙසියි; ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාට විස්තර සපයාගන්න පුළුවනි. ප්‍රශ්න ඇසීම සම්බන්ධයෙන් ඒ වැඩ පිළිවෙලයි, පසු ගිය දිනවල කරගෙන ආවේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් කල් දී පසුව ප්‍රශ්නය අසනවා නම් හොඳයි.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)
එහෙම නම් මම හෙට ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 8.6

ජයසූරිය මයා.

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

ගරු කථානායකතුමනි, ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ අවධානයට යෙමු කළ යුතු කරුණක් තිබෙනවා. ඒ මේකයි. තමුන්නාන්සේලා කවුරුත් දන්නවා අද නීතියක් තිබෙනවා කොස් ගස් කපන්න තහනම්ය කියා. මා මේ කියන්නට යන්නේ කොස් ගස් කපන්න බලය දෙන්න කියා නොවෙයි. නමුත් ඒ නීතිය නිසා සමහර අවස්ථාවල දුප්පත් උදවියට අසාධාරණ තත්ත්වයක්, යුක්තිසහගත නොවන තත්ත්වයක්, ඇති වෙනවා. යම්කිසි දුප්පත් මිනිහෙකුගේ ඉඩමේ කොස් ගස් 10 12 ක් තිබෙනවා නම්, ඒ තැනැත්තාගේ ගෙයත් කඩා වැටෙන්නට එනවා නම්, තමාගේ කොස් ගස් කපා තමාගේ ගෙය අලුත්වැඩියා කර ගන්නට ඉඩක් නැත්නම්, එය තරමක් දුරට අසාධාරණයක්ය කියා සමහර විට කල්පනා කරන්න සිදු වෙනවා. එවැනි තත්ත්වයක් ඇති වූ විටක ඒ පළාතේ ඩී. ආර්. ඕ. මහත්මයා ලවා ඒ ගැන විභාග කර, ගෙය අලුත්වැඩියා කරන්නට වුවමනා කරන ප්‍රමාණය තක්සේරු කර, ගෙය "රෙපයාර්" කරන්ට පමණක් ඒ කොස් ගස් කපා ගන්නට අවසර දීමේ ක්‍රමයක් ඇති කරන්නට පුළුවන් නම් හොඳයි කියා මට කල්පනා වෙනව. ඒ නිසා ඒ කරුණ ගැන ගරු කෘෂිකර්ම ඇමතිතුමා විසින් කල්පනා කර බලා යම් කිසි විධියක සහනයක් ලබා දෙනවා නම් හොඳයි. රටේ තිබෙන කොස් ගස් ඔක්කොම කපන්නය කියා මා කියනවා නොවෙයි. එවැනි සාධාරණ යුක්තිසහගත ඉල්ලීමක් දුප්පත් කෙනෙක් ඉදිරිපත් කළොත් එයට අවසර දෙන්නට යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියා මම කෘෂිකර්ම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අද ලී සොයා ගැනීමට බොහොම අමාරුයි. සල්ලි දී ලී ගන්නත් දුප්පත් මිනිසුන්ට මුදල් නැහැ. ඒ නිසා යම් මිනිසකුගේ ගෙය කඩා වැටෙන්න හදනවා නම්, ඔහුගේ ඉඩමේ තමාට අයිති කොස් ගස් තිබෙනවා නම්, ඒ ගෙය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කරන ලී ප්‍රමාණය තක්සේරු කර ඒ සඳහා පමණක් කොස් ගස් කපා ගැනීමට අවසරයක් දෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි. ඒ නිසා මේ කාරණය ගැන කල්පනා කර බලා යම්කිසි සහනයක් ලබා දෙන හැටියට ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා ඉල්ලනව.

අ. භා. 8.9

එම්. සමරවීර මයා. (මාතර)

(திரு. எம். சமரவீர—மாத்தறை)

(Mr. M. Samaraweera—Matara)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදි ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ නොසිටීම ගැන මා කණගාටු වෙනව.

කථානායකතුමා

(சபாநாயகர்)

(Mr. Speaker)

සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් අහනවා නම්—

සමරවීර මයා.

(திரு. சமரவீர)

(Mr. Samaraweera)

මා මුලින්ම කියන්නේ, මා වැඩිය කථා කරන්නේ නැහැ. ඒ නිසා මා කථා කරන අවස්ථාවේදී මට ටිකක් ඉඩ දෙන්නය කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

මේ ප්‍රශ්නය අහන්නේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන්, මා කලින් කීවා වගේ එතුමා නොසිටීම ගැන මා කනගාටු වෙනව. මා එසේ කනගාටු වෙන්නේ, අද මේ අය වැය ලේඛනය කාරක සභා අවස්ථාවේ සාකච්ඡාව කෙරෙන හැටි බලනවිට සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබෙන බවක් නොපෙනෙන නිසයි. මා මාතර සිටින්න ඕනෑ කෙනෙක්, දැන් මෙහි සිටින්නෙ. මා බලාපොරොත්තු වුණා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කටයුතු සාකච්ඡාවට ගනීවිය කියා. ඒ නිසයි අද පැමිණුණේ. තමුන්නාන්සේට පෙනෙනවා අද මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථා කරන්නේ පිටුපස ආසනයක ඉද ගෙනයි. අපේ සෞඛ්‍ය ඇමතිතුමා සිටින්නේ ඉස්සරහ පෙළේ. එපමණක් නොවෙයි, තමුන්නාන්සේ පත්තරවලත් දකින්න ඇති, උන්නැහේ කියා තිබුණා, මාතර ගැන කිසිම දෙයක් කියන්නට එපා.ය, මම මාතර මහත්මයාගේ පුතාය කියා. මාතර මහත්මයාගෙ පුතාගෙ ප්‍රශ්නයක් මෙතන ඇත්තෙ නැහැ. තාත්ත මහත්මය වුණත් පුතා වලත්තය නම් ඒක ගැන ප්‍රශ්නයක් නැහැ. මම මේ කියන්නෙ බදිඋද්දීන් ඇමතිතුමා ගැන නොවෙයි. සාමාන්‍යයෙන් අපේ පළාතේ කියන කියමනක්.

ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජාඇල)
(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)
(Mr. G. J. Paris Perera—Ja-Ela)
ගැමි කථාවක්.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)
ඔව්. තාත්ත මහත්මය වුණත් පුතා වලත්තය නම් වැඩක් ඇත්තෙ නැහැ.

මට වැඩි වෙලාවක් නැහැ. ඔබතුමාට ගරු කර මා වැඩි වෙලාවක් ගන්නෙත් නැහැ. තමුන්නාන්සෙත් ගරු මන්ත්‍රීවරුත් පත්‍රවලින් දකින්න ඇති මාතර ආරෝග්‍යශාලාව සඳහා අක්කර 30 ක ඉඩමක් ආණ්ඩුවෙන් ගත්ත බව. මේ ඉඩම ඩොනල්ඩ් රණවීර මහත්මයගෙයි. ඩොනල්ඩ් රණවීර මහත්මය ධනපතියෙක් නොවෙයි; ලක්ෂ පතියෙක් නොවෙයි; ඔහු කෝටිපතියෙක්. මා වැඩිදුර කියන්නේ නැහැ. අවස්ථාවක් ආවොත් විස්තර සහිතව කියනව. මා මේව කියන්නෙ සම්පූර්ණ වගකීමක් ඇතුවයි. මේ මහත්මයගෙන් ගන්න තිබුණු ඉඩම සම්බන්ධයෙන් අද නියෝගයක් යවා තිබෙනව නැවතත් ඒ ඉඩම ඒ මහත්මයාටම දෙන්නය කියා. මේ අක්කර 30, අයිනිවාසිකම් ප්‍රශ්නය ගැන පමණක් සලකා දෙන්න පුළුවන් ඉඩමක් නොවෙයි. මේක පාට්ෂන් නඩු කියල ගත් ඉඩමක්. නමුත් අද එම පාට්ෂන් ඔප්පුව උඩ, ඒ වටිනාකම අනුව, මේ ඉඩම ආපසු දෙන්නය කියා නියෝගයක් කර තිබෙනව. එපණක් නෙවෙයි. එසේ කරනවා නම් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙ කාර්යාලයත් වෙනුවෙන් ඉඩමක් ගන්න ඕනෑ. දැන් ගන්න යන්නෙ කාගෙ ඉඩමක්ද? බදිඋද්දීන් මහත්මයගෙත් ජබාර් මහත්මයගෙත් නෑදෑයෙකුගෙ විකුණන්න බැරි ඉඩමක් ගන්න යනව. මම වගකීමක් ඇතුවයි මේ කියන්නෙ; ලිය කියවිලි ඇතුවයි. කිසිසේත් ම විකුණන්න බැරිව තිබෙන ඉඩමක් අද ගන්න යනව. අපේ සෞඛ්‍ය ඇමතිතුමා—බදිඋද්දීන් මහත්මයද බඩඋඩින් මහත්මයද මා දන්නෙ නැහැ, මොන මහත්මයෙක් වුණත්—මාතර මහත්මයගෙ පුතාය කියා ඔය කියන්නෙ, මේ විධියේ කැත, නින්දිත, වැඩ කර කර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවේ රුකඩයක් හැටියට——

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
On a point of Order, Sir, are you allowing these obscene remarks to be made in the House?

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
The hon. Member cannot refer to an Hon. Minister in that way.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)
I have not mentioned the Minister concerned. There is a proverb—[බාධා කිරීමක්] මොකක්ද? මම කාටවත් කිව්වේ නැහැ. තමුන්නාන්සෙ දොස්තර කෙනෙක්. මම නීතිඥයෙක්. [බාධා කිරීමක්] මම අහුවෙන්න කියන්නෙ නැහැ. තමුන්නාන්සෙ මට රුපියල් 25,000 ක එන්තරවාසියකුත් එව්වෙ. මමත් නීතිය දන්නව [බාධා කිරීමක්] මම කිව්වෙ මේ රටේ කථාවක් තියනව, තාත්තා මහත්තය වුනත් පුතා වලත්තයාය කියා. ඒකට අකුරුස්සෙ ගරු මන්ත්‍රීතුමාට තියෙන අමාරුව මොකක්ද? මම දොස්තර මහත්මයට නොවෙයි කිව්වෙ; සාමාන්‍ය කථාවක්.

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
කථානායකතුමනි, මා තමුන්නාන්සෙගෙන් ප්‍රශ්නයක් ඇසුවා මිසක් මේ කෙනෙක්ද් සමග කථා කළේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

එහෙම නම් තමුන්නාන්සෙ වාඩි වෙන්න. මා ඒකට කථානායක තුමාට පිළිතුරු දුන්න. කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගයක් දෙනවා නම්, මොන අවස්ථාවකදී වුවත්, පෞද්ගලික වශයෙන් හෝ නිලය අනුව හෝ සෑම අවස්ථාවකදීම මා ඒ නියෝගය භාර ගන්නව. මම කාට වත් වැරැද්දක් කිව්වෙ නැහැ. වැරැද්දක් තියෙන මිනිහෙක් මෙතන නැහැ. ඇයි දෙවියනේ——

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
Yes.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

දිවංගත අගමැතිතුමාගේ කාලයෙ මමත් අර ඉස්සරහ පේළියෙ හිටිය. උප ඇමති කෙනෙක් වුවත්, අධිකරණ උප ඇමති හැටියට මා ඉස්සරහ පේළියේ හිටියා. බැරි වුණු වෙලාවෙ ඇවිත් පිටුපස ආසනයක වාඩි වුණා. මා විශේෂ අයිතිවාසිකම්, විශේෂ ආරක්ෂා ඉල්ලන්නෙ නැහැ. මට ඒ විධියෙ වුවමනාවක් නැහැ. අකුරැස්ස ගරු මන්ත්‍රීතුමාට විශේෂ ආරක්ෂා ඇතුව අකුරැස්සට යන්න ඕනෑ නම් එහෙම යන්න. ආරක්ෂා නැතුව මට ඕනෑ තැනකට යන්ට පුළුවන්. ගරු කථානායකතුමනි, මා කලින් ප්‍රකාශ කළාක් මෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ කටයුතු සාකච්ඡා කරන්ට අවස්ථාවක් ලැබේවි කියා බලාපොරොත්තු වුණා. එහෙත් ඒ සාකච්ඡාව ලැබෙන්නෙ නැත්නම් මොනව කරන්ටද? සෞඛ්‍ය ඇමතිතුමාට හෝ වේවා, සෞඛ්‍ය ඇමතිතුමාට පන්දම් අල්ලන සෞඛ්‍ය ඇමතිනොවුණත්, ඒ ඇමතිකම බලාපොරොත්තුවෙන් සිටින අකුරැස්සේ මන්ත්‍රීතුමාට—

පාරිස් පෙරේරා මයා.
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)
ජයවේවා.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

ජය වේවා කියමින් [බාධා කිරීමක්] හැබැයි ජය වෙන්නෙ නැහැ.

පාරිස් පෙරේරා මයා.
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)
ප්‍රපාතයට වැටෙනව.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටින්නෙ මේකයි. මා කී දේවල් කොලොප්පමට කී දේවල් නොවෙයි. මේව හිතුවක්කාර විදියට කිව්ව දේවල් නොවෙයි. මේ පිළිබඳ ලියකියවිලි ආදිය මා ළඟ තිබෙනව. ඉන්ජිනේරු මහත්වරුන්ගේ වාර්තා මා ළඟ තිබෙනව.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஷ)
(Mr. Roy Rajapakse)
කීයකටද ඒ ඉඩම ගන්ට යන්නෙ?

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

කීය වුණත් ඒ ගොල්ල කියන හැටියට. ඇයි දෙයියනේ මස්සිනාට කරන්නෙ නැත්නම් බදිලද්දීන් මහත්තය කාට කරන්ටද? ඇයි තමුන්නාන්සේලා දන්නෙ නැද්ද, සහිරා විද්‍යාලය පිටුපස්සේ තිබුණු රංකුඹුර නමැති කුඹුර සම්පූර්ණයෙන් මට්ටම් කරල පිට්ටනියක් කළේ ඔය උන්නැහේ බව. මෙපමණ වේලාවක් කථා කිරීම ගැන ඔබතුමාගෙන් මා සමාව ඉල්ලනව. මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටත්, විරුද්ධ පාර්ශ්වයේත්, ආණ්ඩු පක්ෂයේත්, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා ඇතුළු කාටත් ස්තුති කරන අතරම, දෙවනුව විස්තර ඇතිව මේ ගැන කථා කරන්ට අවස්ථාවක් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසාන කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 8.20

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

There are two matters that have been raised.

There is, firstly, the matter raised by the hon. Member for Homagama (Mr. Jayasuriya). I am looking into the question of the problems arising from the felling of jak trees, and I appreciate his concern and the pressures which he has been subject to in his own constituency. I am afraid I am not in a position to give a categorical answer to the question now, but I am certainly looking forward to settling the policy on this question as early as possible.

Secondly, in regard to the question raised by the hon. Member for Katugampola (Mr. Leelananda Weerasinghe), I should like to read out the contents of a report received by the Permanent Secretary to the Ministry of Defence and External Affairs from the Inspector General of Police.

This is what it says.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

The Inspector General of Police has not replied to my letter of the 14th—

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I do not know about the letter of the hon. Member for Nikaweratiya. I am replying to a question raised by the hon. Member for Katugampola.

I am reading now the whole of the report. I would normally have tabled the document but as this is a confidential document I do not want to create a precedent by tabling it. I am reading the whole of the document, omitting nothing.

"Mr. L. Weerasinghe and some others had applied for land at Kirindigala under the Marginal Lands Scheme and they had been allocated a total of 80 acres of land. The boundaries of this land were shown to them in February 1964 and from then onwards they became entitled to this property.

2. Mr. Rajapakse who is a resident of this area—"

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

Not I!

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

No, not you!

"2. Mr. Rajapakse who is resident of this area apparently had other ideas and he decided to collect a group of 17 other local persons and occupy this land on his own without any authority from the Government Agent. He decided to do this in February and it would appear that his decision was made after the Government Surveyors had shown the boundaries to Mr. Weerasinghe and the others.

3. On 11.3.64 the first act of obstruction by Mr. Rajapakse took place. Shortly thereafter the G. A. wrote to S. P., N. W. P. informing him that this land had been given to Mr. Weerasinghe, M.P. and some others and to ensure that they were not obstructed. Mr. Weerasinghe too complained to S. P., N. W. P. that his men were being harassed and he asked for Police protection. S. P., N. W. P. therefore had instructed A. S. P., Kurunegala, to explain the situation to Mr. Rajapakse and his followers and to prosecute them if they continued to trespass on this land.

4. On 22.3.64 Mr. Rajapakse had informed O. I. C., Nikewaratiya, that he would not give up this land even if so directed by the Government Agent and the Police were therefore compelled to take this "dispute to Court. A report was sent to Court on 3.4.64 and on 24.4.64 the Court ordered Mr. Rajapakse and his men not to enter this land. Mr. Rajapakse had apparently undertaken to comply with this order.

5. Thereafter nothing further had occurred till 30.6.64 on which day Mr. Rajapakse and his men have again trespassed on this land. As a serious breach of the peace was imminent the O. I. C., Nikeweratiya, had taken Mr. Rajapakse and nine others into custody and they were produced in Court

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

on the following day. Since Mr. Rajapakse and his men again undertook not to enter this land hereafter, the Magistrate had discharged them with a warning.

6. As regards the written complaint of Mr. Herat, it would appear that Mr. Herath is not aware of the true facts of this case. Mr. Rajapakse and his men were neither legal allottees nor squatters. Had they been genuine squatters, this land would never have been allocated to anyone else as I believe it is Government land policy not to alienate Crown land when it is being occupied by squatters. Mr. Rajapakse and his men were pure and simple trespassers and action was taken against them to prevent a very serious breach of the peace. Mr. Herat also seems to be unaware that on a previous occasion too these parties had been produced in Court and that the Magistrate had ordered them not to enter this land again. On the second occasion they were not only trespassing, but also violating a Court order. Mr. Herat also does not seem to be aware that on this occasion the Magistrate had 'warned and discharged' Mr. Rajapakse and his men as they undertook not to enter this land again.

7. As regards the statement made by Mr. Herat in Parliament, the Magistrate did not 'discharge' these accused. He 'warned and discharged' them after they undertook not to enter this land again."

The report is signed on behalf of the Inspector General of Police, and it has been sent to the S. D. and E. A.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

What is most surprising is that the Inspector-General of Police sends a report to the Permanent Secretary to the Ministry of Defence and External Affairs, but he does not have the courtesy to reply to my letter to him dated the 14th July, 1964. May I, with your permission, read it?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I am still on my feet. I have not finished.

In regard to this matter I was able to give the answer because the hon. Member for Katugampola raised it earlier. He gave the Government notice of the question he was asking; he drew our attention to this particular matter and I was therefore able to lay my hands on this report and bring it here to Parliament. If the hon. Member for Nikaweratiya wishes to have elucidation on the particular matter as to why the I.G.P. had or had not replied to some letters, I am certainly prepared, if he would extend the same courtesy of giving me notice, to give the reply tomorrow.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

In reply to the Hon. Minister, I wish to state——

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

This is a matter which requires notice. I think this is a matter where the good name of the hon. Member is at stake because of the allegations made by the hon. Member for Nikaweratiya and if the hon. Member is not satisfied with the reply given by the Hon. Minister, he can ask for a more detailed inquiry in respect of the whole case and place all the facts before the House.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I have no objection at all to any inquiry being held anywhere. I was seeking to reply to a complaint of which I had been given notice and in regard to which I was asked whether I might table the document submitted by the police. I am not prepared to table it and I have therefore read it.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

In fairness to both the hon. Member for Katugampola and myself, I would request the Hon. Minister himself to hold an inquiry and I am

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

prepared to place all the facts before him. The statement of the I.G.P. is as completely inaccurate as some of the statements made on the Floor of this House. I am prepared to substantiate and stand by the charges made by me. What beats me is that these reports can come to the Minister but the man who actually made the allegations and sent a letter informing the I.G.P. of this situation is not even given a reply. In the concluding part of that letter I have said:

"I have already raised this question in Parliament and the Hon. Minister of Lands has ordered an immediate inquiry. I would be very glad if you will hold an early inquiry into this matter. I would be very glad also if you would help me to be present at this inquiry by fixing a date for the inquiry in consultation with me."

Not only did I want an inquiry, but I also wanted him to inform me of the date of the inquiry early so that I could place all the facts before him.

It is most surprising that one of the most senior officials responsible for the preservation of peace and order should take such shabby action as to just report behind somebody's back. Would it not have been common courtesy—courtesy that he should accord not only to a Member of this House but to any citizen of this country—that before he made that statement and submitted the report to the Minister to have first consulted the petitioner and found out from him the facts? I am not blaming the Minister.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I do not think it is correct for the hon. Member for Nikaweratiya to say that. The position is this. He may have made a complaint to the I.G.P. The I.G.P. does, in fact, refer in the report which has come here to the written complaint of Mr. Herat. So there is no denial of the receipt of the document. The only point is this. If the hon. Member is asking me to hold an inquiry, all I can say is that I would personally decline to usurp the functions of a magistrate once a case has been taken to court. I do not think it proper for the hon. Parliamentary Secretary or anyone else, even the I.G.P., to seek to usurp the functions of a court once a case has been taken there. The appropriate evidence must be fully placed before the court. I do not think it is correct for us in this House to seek to hold inquiries now. I am prepared to go into the question as to why a written reply was not sent to the Member for Nikaweratiya. That certainly is wrong. That certainly is a matter of which I am prepared to take notice and to answer tomorrow. If I had been given notice I would have already answered it. But with regard to the question of holding an inquiry as between the Member for Katugampola and the Member for Nikaweratiya, that is one where once it has gone to the court neither of us can seek to, in my humble opinion, usurp the functions of the court.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

The hon. Member can submit his questions in advance to the Hon. Minister and he can receive a reply.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

I would like to inform the Hon. Minister that it is not *sub judice*.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

It is not *sub judice*; it is worse. The case has already been decided upon.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

If the hon. Member would give notice to the Hon. Minister he could get a reply. The matter is not yet ended, I think.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

As far as I am concerned, the magistrate has concluded the case.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

As far as I am concerned, the matter is not yet ended.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

As far as I am concerned, I am prepared to attend any inquiry at this House or at any other place.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

What do you wish me to do ? What do you wish done in this matter ?

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

The Hon. Minister is helpless in this matter unless we know for certain on what grounds the hon. Member for Nikaweratiya is asking for a fresh inquiry.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I do not know whether the hon. Member for Nikaweratiya wants to move the Supreme Court against a decision or something.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

I am not asking for a fresh inquiry. I am asking for the inquiry that was not held.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

Two inquiries were held and the details were given. The people said they are ready to go out of the land.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

Inquiries were held but we do not know what the results of those inquiries are. Government officers hold inquiries—[*Interruption*]. I am prepared to substantiate it.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

The magistrate has warned these people not to enter the land.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

The report of the inquiry is available to the Minister. Is not that what was read ?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

The magistrate has twice ordered these people not to enter the land again. They have agreed not to do so.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herat)

I challenge that statement.

වීරසිංහ මයා.
(திரு. வீரசிங்ஹ)
(Mr. Weerasinghe)

The case No. is 12030/C Kurunegala M. C.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

I will go into it further.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon C. P. de Silva)

With regard to the question raised by the hon. Member for Matara (Mr. Samaraweera), I shall bring it to the notice of the Hon. Minister of Health.

සමරවීර මයා.

(திரு. சமரவீர)

(Mr. Samaraweera)

If he continues to be Minister of Health.

කල් තැබීම

එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන් කතානායක තුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදි.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව 1964 අගෝස්තු 27 වන දින සභා සම්මතිය අනුව, 1964 සැප්තැම්බර් මස 3 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

சபையினது 1964, ஓகஸ்ட் 27 ஆம் தேதிய தீர்மானத்திற் கிணங்க, பி. ப. 8.30 மணிக்கு 1964, செப்ரெம்பர் 3 ஆம் தேதி வியாழக்கிழமை மு. ப. 10 மணி வரை சபை ஒத்திவைக்கப் பெற்றது.

Adjourned at 8.30 p.m. until 10 a.m. on Thursday, 3rd September 1964, pursuant to the Resolution of the House of 27th August 1964.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

விஞக்களுக்கு எழுத்துமூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

ඩබ්ලිව්. චාර්ල්ස් මහතාට ගංවතුර සහනාධාර මුදලක්

டப்ளியு. சார்லிஸ் அவர்கட்கு வெள்ள நிவாரணம்

MR. W. CHARLE:: GRANT OF FLOOD RELIEF

155/64

ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)

(திரு. இலக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)

(Mr. Lakshman Jayakody—Divulapitiya)

සංස්කෘතික කටයුතු හා සමාජ සේවා සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ දිස්ත්‍රික්කයේ හුනුමුල්ලේ පදිංචි ඩබ්ලිව්. චාර්ලිස් මහතාගේ ගෙය 1964 මැයි මාසයේ පැවැති ගංවතුරෙන් කැඩී ගිය බව එතුමා දන්නවාද? (ආ) ඔහුට කිසිම සහන මුදලක් දී නැති බව එතුමා දන්නවාද? එසේනම්, ඒ මන්ද?

கலாச்சார விவகார, சமூகசேவைகள் அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு மாவட்டத்தைச் சேர்ந்த ஹுனுமுல்லவில் உள்ள திரு. டபிள்யு. சார்லிஸ் என்பவரின் வீடு 1964, மே மாதத்தில் ஏற்பட்ட வெள்ளப் பெருக்கின்போது இடிந்து விழுந்ததென் பதை அவர் அறிவாரா? (ஆ) அவருக்கு நிவாரணமெதுவும் வழங்கப்படவில்லையென் பதை அவர் அறிவாரா? அவ்வாறாயின், ஏன்?

asked the Minister of Cultural Affairs and Social Services: (*a*) Is he aware that the house of Mr. W. Charles of Hunumulla in the Colombo District collapsed during the floods in May, 1964? (*b*) Is he aware that no relief has been granted to him and if so, why?

ගරු ඩී. එස්. ගුණසේකර (සංස්කෘතික කටයුතු හා සමාජ සේවා ඇමති)

(கௌரவ டீ. எஸ். குணசேகர—கலாச்சார விவகார, சமூகசேவை அமைச்சர்)

(The Hon. D. S. Goonasekera—Minister of Cultural Affairs and Social Services)

(අ) ඔව්. (ආ) ඔව්. මුදල් නොමැතිකම නිසා කලින් මෙකී ගෙවීම කළ නොහැකි විය. අවශ්‍ය මුදල් දැන් ලබාගෙන ඇති හෙයින් ඔහුට ආධාර ගෙවීමට කටයුතු කර ගෙන යනු ලැබේ.

(அ) ஆம். (ஆ) ஆம். பணம் இல்லாமையினால் முன்பே நிவாரணம் அளிக்க முடியவில்லை. இப்பொழுது பணம் பெறப்பட்டு நிவாரணம் அளிப்பதற்கு வேண்டிய நடவடிக்கை எடுக்கப்பட்டுவருகிறது.

(*a*) Yes. (*b*) Yes. Payment could not be made earlier due to lack of funds. Necessary funds have since been obtained and action is being taken for the payment of relief.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දශක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අඟේඩිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට හාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ, හාටු මුවදොර මහ ලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் செலுத்திய தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு சுற்றுலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment **Rs. 32 00** (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part **30 cents, by post** 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாணைழச்சேனை ஈஸ்டேர்ண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org